

# ඒකක්ඛරකෝෂය



# එ ක ක්ඛ ර කො ස ය.

—oo—

ආචාර්ය සද්ධම්මකිත්ති මහා සථ්විරපාදයන් විසින්
වි ර චි ත යි.

ර න් දො ඹේ
ආචාර්ය පදුමාරාමතිස්ස මහා සථ්විරපාදයන්ගේ
ප්‍ර ධා න ශි ෂ්‍ය වූ

# වැ ලි තො ට

පුෂ්පාරාමයෙහි-විද්‍යොභාෂ ශාස්ත්‍රශාලාධිපති.
**“අරියවංසධජ” ඤාණතිලකතිස්ස ස්වාමීන්විසින්.**
ස න්හ ලි ය න ල දි.

එච්. ඇස්. ඩී. සිල්වා වන මා විසින්
**කොළඹ**
ශාස්ත්‍රාලොක යන්ත්‍රාලයෙහි
මුද්‍රාඞ්කණය කරවනලදි.

ශ්‍රී බුද්ධවර්ෂ 2429.

1886

# සංඥපනය.

——oo——

එකාක්‍ෂරයන්ගේ අනෙකාර්‍ථයක්වූ මේ මාගධී එකක්ඛර කොසය—තම්බදිපරටේ. සද්ධම්මකිත්තිනම් මහා ස්ථවිර කෙනෙකුන් විසින් කරණලදී—ඒ ස්වාමීහු වනාහි 'ලිඞ්ගාර්‍ථවිවරණ. එකනන්තධාතුරූපමුඛ. අර්‍ථවිශෙෂ ශූපකාදි විශිෂ්ට ග්‍රන්ථකාරකවූ—මාගධී සංස්කෘතාදියෙහි අතිදක්‍ෂවූ මහා ස්ථවිර කෙනෙක්වූහ—ඒ ස්වාමීන් විසින් මේ මාගධී එකක්ඛරකොසය කුමක් පිණිස කවරකලෙක කරණලදදැයත්?–සංස්කෘත භාෂායෙන් කරණලද ස්වල්පමාත්‍රවූ පූරාතන එකාක්‍ෂරකොෂය සර්‍වඥශාසනයෙහි ශුද්ධ මාගධිකයන්ගේ අර්‍ථසාධකභාවයෙන් සංස්කෘත භාෂාව හැර පාලානුරූපවූ එකාක්‍ෂරයන් ගෙණ ශුද්ධ මාගධිකයන්ගේ ශ්‍රවණොද්ග්‍රහණාදිය සඳහා මාගධී භාෂායෙන් මෙම කරණලදැයි එකක්ඛරකොසාරම්භයෙහි කියනලදී—මෙහි කාලය ඒ ඒ තැන්වල නොයෙක් ලෙස කියා තිබුන නුමුත් බුද්ධවර්‍ෂ දෙදහස් සැටනවය පමණයයි හැගේ—මෙහි නාමය 'කච්චායන වණ්ණනා. සූත්‍රනිද්දේශ. නිරුත්තිසාර මඤ්ජූසා. කච්චායනභෙදටීකා'දි බොහෝ පොත්වල සඳහන්ව තිබෙනහෙයින් ඒ පොත්වලට පූරණ බැව් පෙණේ—මෙය වනාහි අකාරාදි ඒ ඒ අක්‍ෂරයන්ගේ අර්‍ථාවබොධය ප්‍රධාන ප්‍රයොජනය කොට ඇත්තේය—යලිත් මාගධී භාෂා තත්ව විජානනයෙහි හා සර්‍වඥවචනාවබොධයෙහිද මහොපකාරියි—මෙය නොදත් කෙනෙකුට මාගධී භාෂාවෙහි වචනයක අක්‍ෂරයක් මේ අර්‍ථයයි කියා විනිශ්චයකරන්ට අවස්‍යයෙන්ම නොහැකිය—මාගධී භාෂාවෙහි උත්සාහවතුන්ට 'අභිධාන ප්‍රදීපිකා ධාතු මඤ්ජූසාදිය මෙන් ඉතා ප්‍රයොජන වත්ය—මීට ටීකාවක්ද තිබේ.—එහෙත් මෙයින් ආධුනිකයන්ට සන්නයක් නැතිව ප්‍රයොජන ගැන්ම අපහසු හෙයින් ඔවුන්ගේ සුඛාවබොධය පිණිස මෙම සන්නය ලියන ලදී—මේ සන්නය බලන කල මෙහි අනර්ඝත්වය වැටහෙන හෙයින් ග්‍රන්ථ ප්‍රශංසනය කුමට වනමුද?—තවද මෙහි අක්‍ෂර යොජකයන්ගෙන් වූද. ප්‍රමාදභ්‍රමාදිය භජනය කළාවූද. යම් යම් දොෂයෝ ඇතිවෙත්ද. ඒ ඒ දොෂයෝ විදග්ධයන් විසින් ශුද්ධකරණු ලැබෙත්වා.–වචන කීපයක් සුද්ධිපත්‍රයට ඉඩනැතිහෙයින් ඇතුළත් නොකෙළෙමු.—මුද්‍රරය නැති පොතක් යම් විධියකින් අසූළුනී නම් නඩුමාගීයට පමුණුවන බවද දන්වමු-

මෙම්වගට, H. S D. SILVA.

i

# ශුද්ධ පත්‍රං.

——00——

| පිටුවෙ සංඛ්‍යා | පංක්ති සංඛ්‍යා | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 6 | 1 | අභිමුඛසම්පාදී | අභිමුඛසම්පාදී. |
| 8 | 2 | පටඨානෙසම්භවුගහනෙ | පඨානෙසම්භවුගහනෙ. |
| 2 | 16 | විවෙචය | විවෙචය. |
| 5 | 15 | රූපා–කාපිනී | රූපා–කාමිනී. |
| 6 | 14 | ආසිසනා | ආසීසනා–අශෙෂපූ. |
| 7 | 21 | හම්රෙන | තම්රෙන–අශෙෂපූ |
| ,, | 22 | තං | තං. |
| 8 | 16 | නිෂෙධෙ | නිසෙධෙ. |
| ,, | 26 | සිඛරණී | සිඛරාණී. |
| 9 | 13 | උබ්භාගිතො | උබ්භාසිතො. |
| ,, | 24 | උදිසෙනි | උදීසති. |
| ,, | 28 | උදිරණෙ | උදීරණං. |
| 10 | 14 | බිවෙජනි | කිවෙජනි. |
| 11 | 34 | සම්භූතෙ | සම්භූතො. |
| 12 | 8 | වඩෙඩනිති | වඩෙඪනීති–අශෙෂපූ. |
| ,, | 11 | පාලිතො | සාලිතො. |
| 14 | 29 | කරසසති | කරිසසති. |
| 16 | 26 | භාවෙන | භාවෙන |
| ,, | 32 | ගනනි | හනති. |
| 30 | 19 | ගම්සසනෙනාජොවා | ගම්සසනෙනාජොවාසබ්බාසු. |
| 40 | 24 | සක්‍යපුත්තානං | සක්‍යපුත්තානංවඩ්ඪකී. |
| 43 | 20 | අනාගාර | අනගාර. |
| 48 | 18 | පරිභාසිංසු | පරිභාසිංසු. |
| 57 | 23 | සභායං | සහායං. |
| 59 | 11 | නවාහං | නවාහං. |
| ,, | 32 | කසමාගිතුමෙහ | කසමාගිතුයහං. |
| 74 | 23 | (සමාදිහිථමා) | (   ) වැඩිසි. |
| 85 | 9 | නීරංරෙ | නීරෙ |
| 09 | 27–29 | සාසන් | සසති |
| 102 | 33-34 | සෙවති | සෙති. |

| පි. | පෙ. | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 2 | 7 | අසහායවූවිමුක්තිරසඇති | විමුක්තිරසයෙන්එකරසවූ |
| ,, | 10 | දූදනලද්වූ | පූදනලද්දාවූ. |
| 3 | 9 | ශ්‍රෙෂටවූ | ශ්‍රෙෂ්ඨවූ-වෙනත්. |
| 5 | 9 | ශූන්‍ය | ශූන්‍ය-වෙනත්. |
| 5 | 32 | ඊෂ | ඊශ. |
| ,, | 27 | අර්ථයෙහි | අර්ථයන්හි |
| 10 | 3 | අර්ථයෙහි | |
| 7 | 19 | හැදූරීමය | හැදූරීමය-වෙනත්. |
| 8 | 17 | පටඨානෙ, යාමෙහිද | පධානෙ, ප්‍රධනබවෙහිද |
| 9 | 10 | යාමෙහි | ප්‍රධානබවෙහි. |
| 10 | 22 | පදච්ඡෙයි | පදච්ඡෙදයි. |
| ,, | 29 | වඩාතූයි | වැඩේතූයි. |
| 11 | 15 | කශබ්දතෙමේ | කො, කශබ්දතෙමේ |
| 13 | 26 | යූකෙත්තූයි | යූතේතේතූයි-වෙනත්. |
| ,, | 29 | කෙරෙතූයි | කරණුලැබේතූයි. |
| 15 | 15 | මෙමනයි | මෙමනයයි. |
| ,, | 19 | පවූ | පදවූ. |
| ,, | 29 | උකුතු මකුතු පතු | උකුණු මකුණු පණු. |
| 16 | 10 | සබනධ | ස්කනධ-වෙනත්. |
| 24 | 21 | වෛරී | වෛරි-වෙනත්. |
| 26 | 8 | ශ්‍රොතෘ | ශ්‍රොතෲ-වෙනත්. |
| 32 | 6 | අමන්ත්‍රනය | ආමන්ත්‍රණය-වෙනත්. |
| ,, | 34 | හෘස්ව | හ්‍රස්ව-වෙනත්. |
| 34 | 31 | අතවැසි | අතැවැසි. |
| 35 | 12 | තියුනු | තියුණු-වෙනත්. |
| 37 | 4–8 | පැවැත්වීමෙන් | පැවැත්මෙන්. |
| 39 | 20 | මහාරන්‍යයි | මහාරණ්‍යයි. |
| 44 | 16 | ශ්‍රිගාල | ශෘගාල. |
| 49 | 28 | සිෂ්‍ය | ශිෂ්‍ය. |
| 53 | 17 | විමයි | වීමයි. |
| 64 | 29 | පූධාතුතෙමේවනාහ් | පූධාතුතෙමේ, |
| 68 | 4 | ප්‍රසංසා | ප්‍රශංසා-වෙනත් |

**40–42** පිටුදෙකේ 'මාපති' මාධවො,යන පදද්වය ඊශ්වරවාචක 'ඊ' ශබ්ද 'ධ' ශබ්දද්වයට විශෙෂණව තිබුනහෙයින් උමයඟනගේ සැමිවූ කියා අර්ථ දක්වූ නුමුත් 'මාපති-මාධවො' යනු විෂ්ණු වාචක ශබ්දද්වයෙකි—මෙහි 'උමාපති-උමාධවො' යි කිය යුත්තෙහි වෘත්තය පිණිස ආදි උකාරයලොප් කොට 'මාපති-මාධවො' යි කියනලද්දයි හැඟේ.

# පුබ්බාරම්භො.

1 විසුද්ධ දෙහං නයනාභිහාරිනං
ජිතින්ද්‍රියං සන්ති පදප්පදායිනං,
මහිමතිං මඤ්ජු මනාලයද්දසං
නමාමි බුද්ධං නරදම්ම සාරථිං.

2 සමච්චිතං තෙන තිලොක භත්තුනා
සුදුද්දසං ඝොර භයප්පහායිනං,
විසුද්ධචිත්තබ්බනථෙහි සෙවිතං
නමාමි ධම්මං මුනිරාජ සම්භවං.

3 සමාහිතක්ඛං මුනිපුඞ්ගවත්‍රජං
විමුත්තිදං වග්ගු ගුණෙණ ස සම්භවං,
සුපුඤ්ඤ ක්ඛෙත්තං භවනිස්ස සඤ්චයං
නමාමි සඞ්ඝං අනඝං නිරඞ්ගණං.

4 නිරුත්ති සද්ධම්ම නයෙසු කොවිදො,
මමංවිනෙතාකවියො සු සඤ්ඤමො,
යතිස්ස සෙට්ඨො පදුමාදිරාමහු
නමාමි තං සාධු ගරුං ගරුං මමං.

5 යතිස්සසීහෙන සධම්ම කිත්තිනා
කතස්ස එකක්ඛරකොස සඤ්ඤිනො
යථාබලං බාල මමොහ වුද්ධියා
කරොමි ව්‍යාඛ්‍යාණ මිමං සහාසයා.

6 රිතෙන් සම්මාමනිභෙද ජානිනා
පරෙනජානන්ති යථාපභෙදකං,
තථාහි ගන්ථෙසු ගුණෙච දොසකෙ
විදන්ති විඤ්ඤූවනචාප්‍ය විඤ්ඤුනො,

7 ඉධත්ථව්‍යාඛ්‍යාණ වරම්හි දොසකා
භවන්ති යෙකෙචි භමාදි සෙවිනො,
හිතාය ඉසසුනන්ති අච්ඡයෙහිමෙ
විසොධනීයාකම්බුකඤ්ජරෙහිතෙ.

8 සුබාලකාලම්හි සසුනුනාකතං
පදීසච්කාමල්ලං රුචිරා යථාබලුතං,
පියන්ති මාතා පිතරො තථෙවමෙ
භවන්තු සන්තාපියකාම්‍යෙනා ඉතො.

සන්නසහිත

එ ක ක්ඛ ර කො ස ය.

# නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

1 එකන්තසාරදං සෙට්ඨං වන්දෙ'කන්ත ගුණාකරං
එකක්ඛරාදිනාධම්මං දෙසිතාරං ජිනම්බුධිං.

---

(ඉක්බිති මේ ග්‍රන්ථකාරකතෙමේ ශ්‍රද්ධාජීවන සර්වාර්ථ පරාර්ථසාර ගවෙෂක ශාසනික ශුද්ධමාගධික ලජ්ජිපෙසල ප්‍රශස්තතරාචාර්‍ය්‍යයන්ගේ පාල්‍යර්ථ කථාදි සංවර්ණනා රචනා සාමර්ථ්‍යයට හෙතුවූ මේ ප්‍රකරණය ප්‍රාරම්භකරණු කැමැත්තේ ප්‍රථමකොට ඒතාක් රත්නත්‍රය ප්‍රණාම ආචාර්‍ය්‍යප්‍රණාමතත්ප්‍රයොජන පුනරුක්තිදොෂ පරිහරණ සාඥනිමිත්ත කර්තෘ ප්‍රමාන ප්‍රයොජනකරණ ප්‍රකාර නිශ්‍රයන් දක්වන්නේ එකන්තසාරදං සෙට්ඨං යනාදිකීය)

1 එකන්තසාරදං (විනෙයබන්ධූන්ට මාර්ගඵල නිර්වාන සඞ්ඛ්‍යාත) එකාන්ත සාරය (සාමුක්කංසික ධර්මදෙශනාවෙන් ගෙණ) දෙන්නාවූ; සෙට්ඨං, අතිශයින් ප්‍රශස්තාවූ; එකන්ත ගුණාකරං, අත්‍යන්තවරවූ (සර්වඥතාඥානාවරණාදි) ගුණයන්ට උත්පත්තිස්ථානවූ; එකක්ඛරාදිනා, එකාක්ෂර ව්‍යක්ෂරාදියෙන්; ධම්මං, (පර්‍ය්‍යාප්ති) ධර්මය; දෙසිතාරං, දෙශනාකළාවූ; අම්බුධිං, (ගම්භීරත්ව මහාන්තත්වාදියෙන්) සාගරය බඳුවූ; ජිනං, (පඤ්චමාරයා ජයගත්හෙයින් ජින නම්වූ) සර්වඥයන් වහන්සේ; වන්දෙ, වඳිමි.

2 විමුත්තෙකරසං ධම්මං වන්‍දෙක ජින සම්භවං
එකන්තපූජිතං තෙන මුනීනාදිච්ච බන්ධුනා.

3 එකන්තපුඤ්ඤක්ඛෙත්තගං එකන්තසාර සම්භවං
එකන්තසෙවිතං සංඝං වන්‍දෙකගුණ සාගරං.

4 සඞ්ගීතාච වණ්ණිතාකතා ගන්ථන්තරාදිච්චක්කිකා
ආරුළ්හාපොත්ථකං යෙපි ගරවො ගරවොචමෙ.

2 විමුත්තෙක රසං, අසහායවූ විමුක්තිරසය ඇති; එකජින සම්භවං; අසදෘශවූ සර්ඥයන් වහන්සේගෙන් උපන්නාවූ; ආදිච්ච බන්ධුනා, සූර්‍ය්‍යබන්ධුවූ; තෙනමුනිනා, ඒසර්ඥයන් වහන්සේ විසින්; එකන්ත පූජිතං, එකාන්තයෙන් පුදනලද්දූ; ධම්මං, ධර්මය (ද) වන්‍දෙ, වඳිමි.

3 එකන්තපුඤ්ඤක්ඛෙත්තං, (කුසලාර්ථිකයන්ගේ කුසල්නමැති බිජු මහත්ඵලකිරීමට සමර්ථවූ මාර්ගඵලාදි ගුණ යොගය හෙතුකොටගෙණ) එකාන්තයෙන් පුන්‍යක්ෂෙත්‍රවූ; අග්ගං, උතුම්වූ; එකන්තසාරසම්භවං, එකාන්තසාර (සීල සමාධි ප්‍රඥාදි) යට උත්පත්තිස්ථානවූ; එකන්ත සෙවිතං, (චිවෙර්‍ය්‍යාදනං දත්ථබං යනාදි වචනයන්ගින් කුසලාර්ථිකයන් විසින් තමාගේ ග්‍රාහ ප්‍රතිග්‍රාහ භාවයෙන්) එකාන්තයෙන් සෙවියයුතුවූ; එකගුණ සාගරං, (බාහිරජනයන්ගේ ගුණයන්හා) අසදෘශවූ ගුණයන්ට සාගරය බඳුවූ; සංඝං, (ආර්‍ය්‍ය) සංඝයාවහන්සේ (ද) වන්‍දෙ, වඳිමි

4 සඞ්ගීතා, (පඤ්චසතිකාදි ධර්ම) සඞ්ගායනා කළාවූද; වණ්ණිතා, (අට්ඨවා ටීකාදි) වර්ණනා කළාවූද; ගන්ථන්තරා කතා, (පටිසම්භිදාමාර්ගී අභිධර්මාවතාර ශබ්දනීත්‍යාදි) ග්‍රන්ථ විශෙෂ කළාවූද, ආදිච්චක්කිකා, (අරිමද්දනසඞ්ඛ්‍යාත පූක්කාම * ග්‍රාමයෙහි පෙර නොපැවති සර්ඥ ශාසනය) පළමුකොට බබුළුවනලද්දාවූද; පොත්ථකං, ආරුළ්හා, (අට්ඨවාසහිතවූ සියළුම සර්ඥවචනය) ප්‍රකරණාරූඪ කළාවූද; ගරවො, (ගුණයෙන්)ගරුකටයුතුවූ; මෙ, මාගේ; ගරවෝච, ගුරුවූද; යෙ අපි, යම් ආචාර්‍ය්‍ය කෙනෙක් ඇද්ද.

* පූණ්ණාච-සමහර

5 වන්දෙහං සිරසා සෙට්ඨ සද්ධම්ම වංස පාලකෙ
යාවජ්ජසොපකාරෙනෙ සාධුජනම්මාසිතෙ.

6 ඉච්චෙවකන්තවිහිතස්ස පණාමස්සානුභාවතො
හතන්තරායො සබ්බත්ථ හුත්වාහං සුද්ධචෙතසා.

7 දුබ්බිඤ්ඤෙය්‍යමලිනාය සක්කතාය නිරුත්තියා
පොරාණෙකක්ඛරකොසෙ රචිතං කිඤ්චිමත්තකං

8 පාලියට්ඨකථාදීනං වණ්ණනෙවාචකෙපිසො
සාසනෙ ගරු සෙට්ඨානං නත්ථං සාධෙති සබ්බසො.

---

5 සෙට්ඨසද්ධම්මවංසපාලකෙ, ශ්‍රෙෂ්ඨවූ සද්ධර්මවංශයරක්නාවූ; යාවජ්ජ, අදදක්වා (ද) සොපකාරෙ, (ශාසනයාගේ නොසිඳ පැවැත්මට කාරණහෙයින්) මනාවූ උපකාරඇති, සාධුජනම්මාසිතෙ, සත්පුරුෂ ජනයන් විසින් මමත්වය කරණලද්දාවූ; තෙ, ඒ, (යථොක්ත) සඞ්ග්‍රහකාරාචාර්‍ය්‍යයන්; අහං, මම; සිරසා, මස්තකයෙන්; වන්දෙ, වඳිමි.

6 ඉති, මෙසේ; සුද්ධචෙතසා, පිරිසිදුවූ සිතින්; ඒකන්තවිහිතස්ස, නිරන්තරයෙන් කරණලද්දාවූ; පණාමස්ස, ප්‍රණාමයාගේ; ආනුභාවතො, ආනුභාවය හෙතුකොටගෙණ; සබ්බත්ථ, සියළු (ග්‍රන්ථකරණයාගේ ආදිමධ්‍ය පර්‍ය්‍යවසාන) කාලයෙහි, සියළු ඊර්‍ය්‍යාපථයෙහි හෝ, අහං, මම; හතන්තරායො හුත්වා, නසනලද උපද්‍රවයන් ඇතිව.

7 පොරාණෙකක්ඛරකොසෙ, (යම්හෙයකින් යම්) පුරාතන ඒකාක්‍ෂරකොෂයෙක්හි; දුබ්බිඤ්ඤෙය්‍ය මලිනාය, දුර්විඥෙය මලයෙන් යුක්තවූ; සක්කතාය නිරුත්තියා, සංස්කෘත නිරුක්තියෙන්, කිඤ්චිමත්තකං, ස්වල්පමාත්‍රයක්; රචිතං, රචනාකරණ ලද්දේද.

8 සො, (එසේහෙයින්) ඒ පුරාතන ඒකාක්‍ෂරකොෂතෙමේ; සාසනෙ, (සර්වඥ)ශාසනයෙහි; ගරුසෙට්ඨානං, (ශුද්ධ මාගධික) ගුරුවරයන්ගේ; පාලි යට්ඨකථාදිනං, පෙල අටුවාදීන්ගේ; වණ්ණනෙ, වර්ණනාකිරීමෙහිද; වාචකෙඅපි, කීමෙහිද; අත්ථං, (ශබ්ද ඥාන සඞ්ඛ්‍යාත) අර්ථය; සබ්බසො, සියළු ප්‍රකාරයෙන්; නසාධෙති, සිද්ධනොකෙරේ.

9 භාසන්තරං තතො හිත්වා පාලිධුත්තකමාදිය *
ජිනපාඨාදිකෙ සන්තං විවිච්චෙකක්ඛරං තථා.

10 සම්පුණ්ණෙකක්ඛරකොසං සුද්ධසජ්ජනගොචරං
සුද්ධසුමතිදාතාරං කුමතිද්ධංසකං වරං.

11 සාසනෙ ව්‍යොමෙ රවින්දුව ඤාණාලොකකරං සුභං
විරචිස්සමහං දානි සාසනත්ථං මහෙසිනො

12 නිස්සාය ගරුවරානං මතං විබුධවණ්ණිතං
ජිනපාඨාදිකෙ සාධුං ඔගාහෙත්වා යථාබලං.

---

9 තතො, එසේහෙයින්; ඒ පුරාතන එකාක්ෂරකෝෂයෙන් හෝ; භාසන්තරං, (මලින) සංස්කෘත භාෂාව; හිත්වා, හැර; පාලිධුත්තකං, පෙළට සුදුසුවූ එකාක්ෂර, ආදිය, ගෙණ; තථා, එසේම; ජිනපාඨාදිකෙ, පෙළඅටුවාදියෙහි; සන්තං, ඇත්තාවූ; එකක්ඛරං, එකාක්ෂර; විවිච්ච, සොයා.

**10-11-12**—සුද්ධසජ්ජන ගොචරං, පිරිසිදුවූ සත්පුරුෂයන්ට විෂයවූ; සුද්ධසුමතිදාතාරං, පිරිසිදුවූ යහපත් ප්‍රඥාව දෙන්නාවූ; කුමතිද්ධංසකං, (අඥාන මිථ්‍යාඥාන සඞ්ඛ්‍යාත) කුත්සිතඥාන විධ්වංශනය කරන්නාවූ; වරං, උතුම්වූ; ~ ව්‍යොමෙ, ආකාශයෙහි; රවින්දුව, සූර්‍ය්‍යචන්ද්‍රයන් මෙන්; සාසනෙ, (සර්වඥ) ශාසනයෙහි; ඤාණාලොක කරං, ඥානසඞ්ඛ්‍යාත ආලොකය කරන්නාවූ; සුභං, යහපත්වූ; සම්පුණ්ණ, සම්පූර්ණවූ; එකක්ඛරකොසං, එකක්ඛරකොසනාම් ප්‍රකරණයක්; මහෙසිනො, සර්වඥයන්වහන්සේගේ; සාසනත්ථං, ශාසනය පිණිස; ~ ගරුවරානං, ගුරුවරයන්ගේ; විබුධවණ්ණිතං, විශිෂ්ට බුද්ධිමතුන් විසින් වර්ණනා කරණලද්දාවූ; මතං, (ලබ්ධි) අභිප්‍රාය; නිස්සාය, නිශ්‍රයකොට; ජිනපාඨාදිකෙ, පෙළ අටුවාදියෙහි; සාධුංඔගාහෙත්වා, (එහි විද්‍යමානාක්ෂරයන්ගේ අර්ථවිශෙෂ සංලක්‍ෂණ වශයෙන්) ඥානයබස්වා; යථාබලං, ශක්තිපරිද්දෙන්; ඉදානි, දැන්; අහං, මම; විරචිස්සං, රචනා කරන්නෙමි.

(දැන් කච්චායනාදියෙහි කියනලද අක්ෂරයන්ගේ අනුක්‍රම වශයෙන් "අනෙකජාති සංසාරං" යනාදි ප්‍රථමතර සර්වඥවචනයාගේ අකාරම ආදිකොට වදාළබැවිද, අනුවගොස් අකාරයාගේම අර්ථ ප්‍රභෙද පළමුකොට දක්වනපිණිසද එහි ආදි මඞ්ගලාර්ථවශයෙන් වෘද්ධි අර්ථයම මුල්කොට දක්වනපිණිස ද වුඩ්ඪිනබ්භාවසදිස යනාදිකීය)

---

* පාලිධුත්තකතාදියාතිපි පාඨො.

13 වුඩ්ඪිතබ්භාවසදිස නිසෙධඤ්ඤප්පකෙරජෙ
නින්දාවිරුද්ධවිරහ සුඤ්ඤෙඤ්ඤඅපදපූරණෙ.

14 ඊසානුස්සත්‍යෙත්ථකොධෙ මුදට්ටපදපූරණෙ
නිපාතභූතොආසද්දො භවතිතිපකිත්තිතො.

---

13 අ, අකාරතෙමේ; වුඩ්ඪි, වෘද්ධිය; තබ්භාව, තද්භාවය; සදිස, සදෘශය; නිසෙධ; ප්‍රතිෂෙධය, අඤ්ඤ, අන්‍යය; අප්පකෙ, ස්වල්පය යනමෙහිද; අජෙ, (අජසඞ්ඛ්‍යාත)විෂ්ණුහු කෙරෙහිද; නින්දා, නින්දාය; විරුද්ධ, විරෝධය; විරහ, විරහය; සුඤ්ඤ, ශූන්‍යය යනමෙහිද; පදපූරණෙ, පදපූරණයෙහිද (වේ)

(එහි "අසෙඛාධම්මා" යනාදියෙහි අකාරතෙමේ වෘද්ධියෙහිවැටේ "අනවජ්ජමරියඨං" යනාදියෙහි තද්භාවයෙහි වැටේ "අමනුස්සො" යනාදියෙහි සදෘශයෙහි වැටේ "අකත්වා" යනාදියෙහි ප්‍රතිෂෙධයෙහි වැටේ "අබ්‍යාකතා" යනාදියෙහි අන්‍යාර්ථයෙහි වැටේ "අනුදරුකඤ්ඤ" යනාදියෙහි අල්පාර්ථයෙහිවැටේ "අමෙහාරු පාමයෙනත්වා දෘපිපයසිකාපිනී" යනාදියෙහි අජ සඞ්ඛ්‍යාත විෂ්ණුහුකෙරෙහි වැටේ (මෙහි විෂ්ණුවාචක අශබ්දයාකෙරෙන් චතුර්ථී එකවචන සවිභක්තිව, ඕහටයෙයනාදෙශකළ කල්හි අයෙයතු සිද්ධයි) "කුම්භීරම්නම කාරානමඳුගහවාරි" යන්නෙහි අද්‍යන මෙහිද අශබ්දතෙමේ විෂ්ණුවාචකය, "අරාජා" යනාදියෙහි නින්දාවෙහි වැටේ "අකුසලාධම්මා" යනාදියෙහි විරෝධ යෙහි වැටේ "අපුත්තකං සාපතෙය්‍යං" යනාදියෙහි විරහයෙහි වැටේ "අභාවො අභිකඛුකො ආවාසො" යනාදියෙහි ශූන්‍යයෙහි වැටේ "බිපිඅනන්තකා" යනාදියෙහි පදපූරණයෙහි වැටේ (මෙහි අජාර්ථයෙහි වැටෙන්නාවූ අශබ්ද තෙමේ "ඉවණ්ණු වණ්ණාජඩලා, තෙඉත්ථිඛ්‍යාපො" යනාදියෙහි ඝලපශබ්දාදීන් මෙන් රූඪිශුද්ධ නාමපදයෙක, සෙසුඅර්ථයෙහි වැටෙන්නාවූ අශබ්දතෙමේ නිපාතපදයයි දතයුතු)

(දැන් ආකාරයාගේ අර්ථවිශෙෂ දක්වනපිණිස ඊසානුස්සත්‍යෙත්ථකොධෙ යනාදි කීය)

14 නිපාතභූතො, නිපාතවූ; ආසද්දො, ආ යනමේ ශබ්දතෙමේ; ඊස, ඊෂාර්ථය; අනුස්සත්‍යෙත්ථ, අනුස්සරණාර්ථය යනමෙහිද; කොධෙ, ක්‍රොධයෙහිද; මුද, සන්තොසය; අට්ට, පෙළීමය; පදපූරණෙ, පදපූරණය යනමෙහිද; භවතිඉති, වේයයි; පකිත්තිතො, කියනලද්දේය.

15 අභිමුඛසමීපාදිකම්මා ලිඞ්ගනපත්තිසු
මරියාදුද්ධඞ්ගමිච්ඡා, බන්ධනාභිවිධීසු ආ
නිවාසව්හානගහණ පෙසනාදෙව දිස්සති

(එහි "ආමණ්ඩො" යනාදියෙහි ආ ශබ්දතෙමේ ඊෂදර්ථයෙහි වැටේ, (ආ, මඳක්; මණ්ඩො, තෙල් ඇත්තේ; ආමණ්ඩො, ආමණ්ඩනම්; ඒනම් ඒරණ්ඩයි) "ආතුමා ඉත්ථීභූතාය" යනාදියෙහි අනුස්සරණාර්ථයෙහි වැටේ "ආසජ්ජබොධස්සාමි ආඝාතනං" යනාදියෙහි ක්‍රොධයෙහි වැටේ, (ආසජ්ජබො, ක්‍රොධවශයෙන් එළැඹැ; ධස්සාමි, ධහන්නෙමි; ආකොධවසෙනඝාතෙන්තිසත්තෙ එත්ථාති ආඝාතනං, එත්ථ, මෙහි; ආයිසේයි කොධවසෙන, ක්‍රොධවශයෙන්; සත්තෙ, සත්වයන්; ඝාතෙන්ති ඉතිනසාන්නුයි ආඝාතනං ආඝාතනනම්) "ආසිසො, ආසිසනා" * යනාදියෙහි සන්තොසයෙහි වැටේ (ආමොදන්තො පරෙසං හිතසුඛස්සසිසනා පත්ථනා ආසිසො ආසිසනා, ආයිසේයි; මොදන්තො සතුටින් පරෙසං, අනුන්ගේ හිතසුඛස්ස, හිතසුවය, සීසනායිසේයි, පත්ථනා, පැතීම; ආසිසො ආසිසනම්, ආසිසනා, ආසිසනානමුදුවේ) "ආපන්නො ආපදා" යනාදියෙහි පෙළීමෙහි වැටේ (ආපීළනං පජ්ජන්තිආපන්නො, ආයිසේයි පීළනං, පෙළීමට; පජ්ජන්තිඉති, යේන්නුයි; ආපන්නො, ආපන්නනාම්; ආපදා, යනුද මෙසේයි) "යදානං මක්ඛති" යනාදියෙහි පද පූරණයෙහි වැටේ (මෙහියං ආනංකියා පදඡෙදයි; යං, යම්හෙයකින්; ආනං, එය; මක්ඛති, සිතාද)

(දැන් උපසර්ගවූ ආකාරයාගේ අර්ථවිශෙෂ දක්වනපිණිස
අභිමුඛ සමීපාදි යනාදිකීය)

15 ආ, ආයනමේ ශබ්දතෙමේ; අභිමුඛ, අබිමුවය; සමීප, සමීපය; ආදිකම්ම, ආදිකර්මය; ආලිඞ්ගන, වැලඳගැන්මය; පත්තිසු, ප්‍රාප්තිය යනමෙහිද; මරියාද, මර්‍යාදාය; උද්ධඞ්ගම, ඌර්ධ්වඞ්ගමය, ඉච්ඡා, ඊප්සාය; බන්ධන, බැඳීමය; අභිවිධීසු, අභිවිධිය යනමෙහිද; නිවාස, විසීමය; අව්හාන, කැඳවීමය; ගහණ, ගැන්මය; පෙසනාදෙව, මෙහෙයීමය යනමේආදියෙහිද; දිස්සති, දක්නාලැබේ.

(එහි "ආගච්ඡති" යනාදියෙහි ආශබ්දතෙමේ අබිමුවයෙහි වැටේ "ආසන්නං" යනාදියෙහි සමීපයෙහි වැටේ "ආරම්භො"

* ආසිංසො ආසිංසනාතියාද පාඨයි.

16 ඉකාමෙඅතික්කමෙච අජ්ඣෙසනෙචදිස්සති
පවත්තෙගමනෙපත්තෙ ආගතෙචසජ්ඣායනෙ

යනාදියෙහි ආදිකර්මයෙහි වැටේ “ආලිඞ්ගති” යනාදියෙහි වැලඳගැන්මෙහි වැටේ “ආපජ්ජති, ආපන්නො” යනාදියෙහි ප්‍රාප්තියෙහිවැටේ “ආපබ්බතා ඛෙත්තං” යනාදියෙහි මර්‍යාදාවෙහිවැටේ “ආරොහති, ආරොපෙති” යනාදියෙහි ඌර්ද්ධ්වගමයෙහි වැටේ “ආකඩ්ඪති” යනාදියෙහි ඊප්සාවෙහි වැටේ “ආබන්ධනං” යනාදියෙහි බැඳීමෙහි වැටේ “ආකුමාරයසො කච්චායනස්ස” යනාදියෙහි අභිව්‍යාප්තියෙහි වැටේ “ආවසථො, ආවාසො” යනාදියෙහි විසීමෙහි වැටේ “ආමන්තෙසි” යනාදියෙහි කැඳවීමෙහි වැටේ “ආදියති, ආදාය” යනාදියෙහි ගැන්මෙහි වැටේ “ආණත්ති, ආණාපෙති” යනාදියෙහි මෙහෙයීමෙහි වැටේ)

(දැන් ඉකාරයාගේ අර්ථවිශෙෂ දක්වනපිණිස
ඉකාමෙ අතික්කමෙච යනාදිකිය)

16 ඉ, ඉයනමේ ශබ්දතෙමේ; කාමෙ, කාමයෙහිද; අතික්කමෙච, අතික්‍රමයෙහිද; අජ්ඣෙසනෙච, අධ්‍යෙෂණයෙහිද, පවත්තෙ, පැවැත්මෙහිද; ගමනෙ, යාමෙහිද; පත්තෙ, පැමිණීමෙහිද; ආගතෙච, ඊමෙහිද; සජ්ඣායනෙ, හැදෑරීමෙහිද; දිස්සති, දක්නා ලැබේ.

(එහි “අවිසා මහම්රෙන” යනාදියෙහි ඉ ශබ්දතෙමේ කාමයෙහි වැටේ (මෙහි අවියනුදු සා මයනුද හංයනුද ඉයනුද එනයනුද පදච්ඡෙදයි) “ඉතො, ඉහො” යනාදියෙහි දකාමයෙහි වැටේ, (ඉති කාමයති ධනානි ඉතොඉතිපි සේයි ධනං, ධනය; කාමයති ඉති, කැමතිවේනුයි; ඉතො, ඉතනම්; (ඉතනම් ගෘහපතියි) ඉතිකාමයති තරුණිතිණයොජාදකානීති ඉහො, ඉතිපිසේයි; තරුණිතිණයොජාදකානි තරුණතෘණ ජොදිකයන් කාමයති ඉති කැමතිවේනුයි ඉහො ඉහනම් (ඉහනම් ඇතුයි මෙහි ඉයනධාතුහු කෙරෙන් පච්චයාදනිට්ඨායනාදින් හප්‍රත්‍යයව ඉහයනුසිද්ධයි) “අතිරෙකො අච්චයො” යනාදියෙහි අතික්‍රමයෙහි වැටේ “අජ්ඣෙසති, අජ්ඣාය” යනාදියෙහි අධ්‍යෙෂණයෙහි වැටේ “ඉතායංකොධරූපෙන” යනාදියෙහි පැවැත්මෙහි වැටේ (මෙහිඉති අයංයිපදච්ඡෙදයි අයං, මේතෙමේ; කොධරූපෙන, ක්‍රොධස්වරූපයෙන්; ඉති, පවතී;) අපෙති අපෙති” යනාදියෙහි යාමෙහි වැටේ “අත්ථමෙනාතම්හි සූරියෙ” යනාදියෙහි පැමිණීමෙහි

17 ඊලක්ඛීපෙම්වාක්‍යෙසු ඌසිවෙදුක්ඛලාභකෙ
නිසෙධෙරොගමුත්තෙච පට්ඨානෙසම්භවූග්ගතෙ
උද්ධගම්මවියොගත්ත ලාභතිත්තිසමිද්ධිසු

18 පාතුභාවච්චයාභාව පබලත්තෙපකාසනෙ
දක්ඛඟ්ගතාසුකථනෙ සත්තිමොක්ඛාදිකෙසුච.

---

වැවේ (සූරියෙ, හිරු; අත්‍ථං, අස්තගමනයට, එනතමහි, පැමිණි කල්හි) “අයංසො සාරථීඑති” යනාදියෙහි ඊමෙහි වැවේ “අජ්ඣායකො මන්තධරො” යනාදියෙහි හැදෑරීමෙහි වැවේ (අව්සාම්භම්රෙනායන මෙහි ඉකාරතෙමේ ශුද්ධනාම පදයෙක සෙසුතැන්හි ඉකාරතෙමේ ධාතුපදයයි දතයුතු)

(දැන් ඊකාර ඌකාරයන්ගේ අර්ථවිශෙෂ දක්වනපිණිස ඊලක්ඛීපෙම්වාක්‍යෙසු යනාදිකිය)

**17** ඊ, ඊයනාමේ ශබ්දතෙමේ; ලක්ඛී, ලක්ෂ්මීය; පෙම්වාක්‍යෙසු, ප්‍රෙමනීය වචනය යනමෙහි (වේ)ඌ, ඌකාරතෙමේ, සිවෙ, ඊශ්වරයා කෙරෙහිද; දුක්ඛලාභකෙ, දුක්ලැබීමෙහිද; නිසෙධෙ, ප්‍රතිෂෙධයෙහිද; රොගමුත්තෙච, රොගමුක්තියෙහිද; පට්ඨානෙ; යාමෙහිද; සම්භවෙ, සූතකයෙහිද; උග්ගතෙ, නැගීමෙහිද; උද්ධගම, ඌර්ධ්වගමය; වියොග, වියොගය; අත්තලාභ, ආත්මලාභය, තිත්ති, තෘප්තිය; සමිද්ධිසු, සමෘද්ධිය යනමෙහිද.

18 පාතුභාව, පහළවීමය; අච්චයාභාව, දෘෂ්ණාභාවය; පබලත්තෙ, ප්‍රබලත්වයයනමෙහිද; පකාසනෙ, ප්‍රකාශකිරීමෙහිද දක්ඛ, දක්ෂබවය; අග්ගතාසු, අග්‍රබවය යනමෙහිද; කථනෙ, කීමෙහිද; සත්ති, හැකිවීමය; මොක්ඛාදිකෙසුච, නිර්වාණය යනමේ ආදියෙහිද (වේ)

(එහි “සිඛරිණී, කුම්භිරමීන මකරගම දුග්ගවාරී” යනාදියෙහි ඊකාරතෙමේ ලක්ෂ්මීකෙරෙහි වැවේ (මෙහි සිඛරී, ඊකියාද; කුම්භී, අං, ඊ, ඉනං, කියාද පදවෙජදයි) “ඊසුනවාපීණී නාජනා” යනාදියෙහි ප්‍රෙමනීයවචනයෙහි වැවේ “විනාය කොහිතපීති සබ්බදං රුම්පූජයෙ” යනාදියෙහි ඌකාරතෙමේ ඊශ්වරයා කෙරෙහි වැවේ (මෙහිඌං අපූජයෙකියා පදවෙජදයි) “ඌරෙ” යනාදියෙහි දුක්ලැබීමෙහි වැවේ (දුක්ඛලාභෙස තිරන්ති පහරන්ති එත්ජනාති ඌරෙ, දුක්ඛලාභෙසති, දුක්ලැබීමක් ඇතිකල්හි, එත්, මෙහි; ජනා, ජනයෝ;

රන්තිසිසේසි, පහරන්ති ඉති, ගසත්නුයි, උරෙ, උරනම්;) ''උප්පථො, උරබ්භො'' යනාදියෙහි ප්‍රතිෂේධයෙහි වැටේ (නප්පථො නමගෙහා උප්පථො, නපථොයි සේයි, නමගෙහා, මගී යනොවන්නේ; උප්පථො, උප්පථනම්; බාධියමානොපි නරවතිති උරබ්භො, බාධියමානොපි, පෙළනුලබන්නේද, නරවති ඉති, නොහඬානුයි, උරබ්භො, උරබ්භනම් (උරබ්භනම්එළුයි, මෙහි උප්පීච්චූරු යනධාතුනුකෙරෙන් භප්‍රත්‍යයද රකාරයත්උකාරයහට අකාරද විනතදකොට උරබ්භයනු සිද්ධයි) ''උලොඝො'' යනාදියෙහි රෝගමුක්තියෙහි වැටේ ''ලොකුත්තරො'' යනාදියෙහි යාමෙහි වැටේ ''උච්චිති ඔචෙච්චත්‍යං'' යනාදියෙහි සූක්තියෙහි වැටේ ''උග්ගච්ඡති උදෙති'' යනාදියෙහි නැගීමෙහි වැටේ ''ආසනා උට්ඨිතො උක්කෙබපො'' යනාදියෙහි ඌර්ධ්වගමයෙහි වැටේ ''උබ්භාගිතො'' යනාදියෙහි වියොගයෙහි වැටේ ''උප්පන්නං උප්පත්ති'' යනාදියෙහි ආත්මලාභයෙහි වැටේ ''ඵලානං උගිතො උතිතෙතා උතප්පිතො'' යනාදියෙහි තෘප්තියෙහි වැටේ ''ඔසාරෙති ඔසාරණීය කම්මං'' යනාදියෙහි සමෘද්ධියෙහි වැටේ (මෙහි ඔසාරෙතියනු වචනසමෘද්ධියෙහි ප්‍රවේශකරවයි යනඅර්ථයි,) ''තප්පරුකෙබා සමුට්ඨිතො'' යනාදියෙහි පහළවීමෙහි වැටේ ''ඔසාරෙති ඔසාරණීයකම්මං'' යනාදියෙහි දෘෂාභාවයෙහිද වැටේ (මෙහි ඔසරෙතියනු ඔසාරණීය කර්මයට සුදුසුවූ වචන සමෘද්ධියෙහි දෘෂාභාවයෙන් ප්‍රවේශකරවයි යනඅර්ථයි) ''උස්සොළ්හි උක්කෙබපනීයකම්මං'' යනාදියෙහි ප්‍රබලත්වයෙහි වැටේ ''උදිසෙති'' යනාදියෙහි ප්‍රකාශකිරීමෙහි වැටේ ''උමාදෙවී'' * යනාදියෙහි දක්ෂබවෙහි වැටේ (දක්ඛාජෙ කාමා ලක්ඛීඋමා දක්ඛායිසේයි, ජෙකා, දක්ෂවූ; මා, ලක්ෂ්මීනොමෝ උමා උමානම්) ''උත්තමො උලාරො'' යනාදියෙහි අග්‍රත්වයෙහි වැටේ ''උදීරණෙ උදීරිතං'' යනාදියෙහි කීමෙහි වැටේ ''උස්සහති ගන්තුං'' යනාදියෙහි හැකිවීමෙහි වැටේ ''තෙසං වූපසමො සුඛො'' යනාදියෙහි නිර්වාණයෙහි වැටේ (නිබ්බාන ශබ්දයාගේ නිශබ්දය නිර්වාණාර්ථවය මෙන් මෙහි උශබ්ද තෙමේ නිර්වාණාර්ථයි ආදිශබ්දයෙන් සමුදයො යනාදිය ගැණේ මෙහි උකාරසමූහාර්ථයි මෙහිඊශ්වරාර්ථවූ උකාරතෙමේ ශුද්ධ නාමපදයෙක දුක්ලැබීමෙහිද ප්‍රතිෂෙධයෙහිද රෝගමුක්තියෙහිද වැටෙන්නාවූ උකාරතෙමේ නිපාතපදයෙක

* උම්මාදෙවී සමහර

19 ඌ පුච්ඡායං දුසෙසාධිතෙ ඒකාරෙතු අජෙහවෙ
ඔපනාවෙනුමත්‍යත්ථෙ බ්‍රහ්ම විණ්හු මහිස්සරෙ.

---

ඉන්පිටත් අර්ථයෙහි වැටෙන්නාවූ උකාර තෙමේ උපසර්ග පදයෙක කර්තෘ අර්ථවූ උකාරතෙමේ ධාතුපදද උපසර්ගපදදවේ පාවති පාවනති යනාදියෙහි පපුච් උධාතු කර්තෘ අර්ථයි)

(දැන් ඌකාර ඒකාර ඔකාරයන්ගේ අර්ථ විශෙෂ දක්වනපිණිස ඌ පුච්ඡායං දුසෙසාධිතෙ යනාදිකිය)

19 ඌ, ඌකාරතෙමේ; පුච්ඡායං, ප්‍රශ්නයෙහිද; දුසෙසාධිතෙ, ක්‍රොධවචනයෙහිද; ඒකාරෙතු, ඒකාරතෙමේ වනාහි අජෙ, එළුවාකෙරෙහිද; ඔ ඔකාරතෙමේ; පනාවෙ, පනාබෙර යෙහිද; අනුමත්‍යත්ථෙ, අනුමත්‍යර්ථයෙහිද; බ්‍රහ්ම, බ්‍රහ්මයා; විණ්හු, විෂ්ණුයා; මහිස්සරෙ, ඊශ්වරයා යනමොවුන් කෙරෙහිද; භවෙ, වන්නේය.

(එහි "කයාතෙඌසජ්ජනෙහි නිත්තකබ්බොධනිසබ්බසො
රතිකොධජනොඌච ධම්මතෙවසදාසතො"

යනාදියෙහි ඌකාරතෙමේ ප්‍රශ්නයෙහිද ක්‍රොධවචනයෙහිද වැටේ)සජ්ජනෙහි, සත්පුරුෂයන්විසින්;ඌකයාතෙ,ප්‍රශ්න කරණු ලැබේ, අතිකොධ ජනො, අධිකක්‍රොධඇති ජනතෙමේ, ඌච, ක්‍රොධවචනයද; ධම්මනිච්ච, ඉවසාම්ය) "අරෙබව ගහිමෙසිනං, * සොතුකංමෙසඉත්ථියො" යනාදියෙහි ඒකාර තෙමේ, එළුවාකෙරෙහි වැටේ (මෙහි අරී එ ආඛු අග්ගි මා ඉසිනං සා ඔතු කං මෙස ඉත්ථියො යනු පදච්ඡෙදයි සා, බල්ලා; ඔතු, බිඩාලයා; කං, ජලය; මෙස, මෙෂයා; ඉත්ථියො, ස්ත්‍රීයයන මොහු; එ, එළුයා; ආඛු, මූසිකයා; අග්ගි, ගින්න; මා, චන්ද්‍රයා; ඉසිනං, ඍෂීයයනමොවුන්ට; අරී, සතුරෝය, (ආයතෙ නසරෙණ රවනෙනා එසති මාතාපිතාද යොගවෙසති වඩ්ඪති ගච්ඡතිවාතිඑ, ආයතෙන සරෙණ, දීර්ඝස්වරයෙන්; රවනෙතා, හඬනනාවූ; මාතාපිතාදයො, මව්පියආදින්; එසතිසිසේයි, ගවෙසති ඉතිවා, සොයාතුයිහෝ; වඩ්ඪතිඉතිවා, වඩාතුයිහෝ, ගච්ඡති ඉතිවා, යාතුයිහෝ, එ, එනම්; (මෙහි එසගවෙසන වුඩ්ඪිසුයන ධාතුහුකෙරෙන්හෝ එසුගතියංයන ධාතුහුකෙරෙන් හෝ ක්විප්‍රත්‍යයව ධාතුවනාන්‍යහටලොප්ව එයනු සිඬයි.)

"වජ්ජරෙඔමනනාණානො, සහම්පතෙනඌමාපතෙනා †
සතතසුඛකාරෙඔච; අච්චියනොතතයොඉමෙ"

---

* අරාජාබවගහිමෙසිනංකියාද පාඨයි

† ඌම්මාපතෙනා-සමහරා.

**20** කොබ්‍රහ්මත්තානිලක්කග්ගිමොරපුමෙසුභූමියං
කංසුඛෙචජලෙසීසෙ කොපකාසෙතිලිඞ්ගිකො·

---

යනාදියෙහි ඔකාරතෙමේ යථාක්‍රමයෙන් පනාබෙර අනුමත්‍යර්ථ බ්‍රහ්ම ඊශ්වර වාසුදෙවයන්කෙරෙහි වැටේ,)ඔ, පනාබෙරය; වජ්ජරෙ, වාදනයකරත්; ආමන්ත්‍රණානං, ආමන්ත්‍රණය කළවුන්ට, ඔ, අනුදත්තේය; සභාපති, සභාපතිනම්වූ; ඔ, බ්‍රහ්මයාද; සත්තසුඛකරො, සත්වයන්ට සුවකරන්නාවූ; ඔච විෂ්ණුද; උමාපති, උමාවගේ සැමිවූ; ඔ, ඊශ්වරයාද යන; ඉමෙතයො, මේ දිව්‍යරාජයෝතුන්දෙන; අච්චීයන්තෙ, (බාහිර ජනයන්විසින්) පුදනුලැබෙත්·

(මෙසේ ජිනවචනානුරූපවූ අර්ථප්‍රභෙදඇති, අෂ්ටස්වර යන් සම්බන්ධවූ එකාක්ෂරයන්ගේ; අර්ථවිශෙෂ දක්වාදැන් ක කාරාදිව්‍යඤ්ජනයාගේ අර්ථවිශෙෂ දක්වනපිණිස කොබ්‍රහ්ම ත්තානි ලක්කග්ගි යනාදිකීය)

**20** කො, (පුල්ලිඞ්ග ශබ්දනාමපදවූ) කශබ්දතෙමේ, බ්‍රහ්ම, බ්‍රහ්මය; අත්ත, ශරීරය; අනිල, වාතය; අක්ක, හිරුය; අග්ගි, ගිනිය; මොර, මොණරය; පුමෙසු, පුරුෂය යනමොවුන් කෙරෙහිද; භූමියං, පෘථිවියෙහිද (වේ) කං, (නපුංසකලිඞ්ග ශබ්ද නාමපදවූ) කශබ්දතෙමේ; සුඛෙච, සුවයෙහිද; ජලෙ, ජලයෙහිද; සීසෙ, සීෂයෙහිද (වේ) පකාසෙ, ප්‍රකටාර්ථයෙහි (වැටෙන්නා) වූ, කශබ්දතෙමේ, තිලිඞ්ගිකො, ත්‍රිලිඞ්ගික (වේ)

(එහි "ජිනනයෙන ආනීතංලොකස්සඅමිතංහිතං"
තස්සපාදම්බුජංවන්දෙ කමොලිඅලිසෙවිතං"

යනාදියෙහි කශබ්දතෙමේ, බ්‍රහ්මයාකෙරෙහි වැටේ; (වන්දන්තානං අනෙක සතානං කානං බ්‍රහ්මානං මොලීහි මකුට සඞ්ඛාතෙහි අලීහි භමරෙහිසෙවිතො කමොලි අලිසෙවිතො, වන්දන්තානං, වඳිනාවූ; කානංයිසේයි, අනෙකසතානං බ්‍රහ්මානං, නොයෙක්සියගණන් බ්‍රහ්මයන්ගේ; මොලීහියිසේයි, මකුටසඞ්ඛාතෙහි, කිරීටසඞ්ඛ්‍යාතවූ; අලීහියිසේයි, භමරෙහි, භෘඞ්ගයන්විසින්; සෙවිතො, සෙවිනාලද්දේ; කමොලිඅලිසෙවිතො, කමොලිඅලිසෙවිතනම්; විතියාඅංව කමොලිඅලි සෙවිතංයිවේ) "කරජකායො" යනාදියෙහි ශරීරයෙහිවැටේ; (කෙ සරීරෙ පවත්තත්තා රජො කරජො තෙන හෙතුභූතෙන සම්භූතො කායො කරජකායො, කෙයිසේයි, සරීරෙ, ශරීරයෙහි; පවත්තත්තා, පැවතී; රජො, රජස; කරජො, කරජනම් (කරජනම් ශුක්‍රරුධිරයි) තෙන හෙතුභූතෙන, ඒහෙතුවීමෙන්; සම්භූ

තො, සම්භූතවූ; කායො, දෙහය; කරජකායො, කරජකා යනම්;) "කකුධරුක්ඛො, කුම්භණ්ඩො, කලිඞ්ගරො" යනාදියෙහි වාතයෙහි වැටේ, (වාතරොගාපනයන වසෙනකං වාතංකුච්ඡති * නිවාරෙතීතිකකුධො, වාතරොගාපන යනවසෙන, වාතරොගය පහකිරීම්වශයෙන්; කංයිසේයි, වාතං, වාතය, කුච්ඡතියිසේයි, නිවාරෙති ඉති, වලකාතුයි; කකුධො, කකුධනම්; (කකුධනම් කුඹුක්රුකයි) "කංවාතං උහෙති වඩ්ඪතීති කුම්භණ්ඩො, කංයිසේයි, වාතං, වාතය; උහෙතියිසේයි, වඩ්ඪතිඉති, වඩාතුයි; කුම්භණ්ඩො, කුම්භණ්ඩනම්; (කුම්භණ්ඩනම්. කොමඩුයි) කෙනවාතෙන ඉඞ්ගති සුධපාලිතො අපගච්ඡතීති කලිඞ්ගරො, කෙනයිසේයි, වාතෙන, වාතයකරණකොටගෙණ; සුධසාලිතො, පිරිසිදුවූසාලින්; ඉඞ්ගතියිසේයි, අපගච්ඡතිඉති, පහවයේතුයි; කලිඞ්ගරො, කලිඞ්ගරනම්; (කලිඞ්ගරනම් ව්‍රීහිපලාසයි)

"කරංකුකොකකුරරං කලහංකරිරංවිතො
සරොජකොමලොකාරං, නිරසංසහමාරුතො"

යනාදියෙහි හිරුකෙරෙහි වැටේ ("සරොජ කොමලොකාරං" යනමෙහි කකාරයි) "කොලුම්පො † කුම්භි" යනාදියෙහි වහ්නියෙහි වැටේ, (කෙනඅග්ගිනා ලුම්පතීති කොලුම්පො කෙනයිසේයි, අග්ගිනා, ගින්නෙන්; ලුම්පතිඉති, නසාතුයි; කොලුම්පො, කොලුම්පනම් (කොලුම්පනම් බත්පිසනමහසැලයි) කෙනඅග්ගිනා භනතීතිකුම්භි, කෙනයිසේයි, අග්ගිනා, ගිනිකරණකොටගෙණ; භනතිඉති, ශබ්දකෙරේතුයි; කුම්භි, කුම්භිනම්) "කරවීරෙකෙකා" යනාදියෙහි මයූරයා කෙරෙහි වැටේ (කාමයූරරවනති එත්ථාතිකරවීරො, කායිසේයි, මයූර, මොණරු; එත්ථ, මෙහි; රවනතිඉති, හඬත්තුයි; කරවීරො, කරවීරනම් (කරවීරනම් එනම් පර්වතයෙක) කායති කායනංවා කාකෙමයූරෙ පවත්තාකාතිකෙකා, කායතිවා ශබ්දකෙරේතුයිහෝ; කායනංවා, ශබ්දකිරීමහෝ; කා, කානම්, කෙයිසේයි, මයූරෙ, මොණරුකෙරෙහි; පවත්තා, පැවැත්තාවූ; කාඉති, ශබ්දයතුයි, කෙකා, කෙකානම් (කෙකානම් මොණරුන්ගේ හඬනශබ්දයි) "කක්ඛු" යනාදියෙහි පූරුෂයාකෙරෙහි වැටේ (කංපූරිසංඛෙති නොසෙතීතිකක්ඛු,

* කුධති — සමහර.

† කොලම්බො යීත්පාඨයි.

කංයිසේයි, පූරිසං, පුරුෂයා; ශෝතියිසේයි, තොසෙතිඉති,
සතුටුකෙරේනුයි, කඤ්ඤා, කඤ්ඤානම් (කඤ්ඤානම්. පුරුෂයන්
විසින් අපරිභොග පූව් තරුණස්ත්‍රීයි) "කෙදාරං" යනාදියෙහි
පෘථිවියෙහි වැටේ, (කෙපඨවියං දාරණං කසසන වසෙනදා
ලනං එත්ථාතිකෙදාරං, කෙයිසේයි, පඨවියං, පෘථිවියෙහි; දා
රණංයිසේයි, කසසනවසෙන, සීසෑම්වශයෙන්; දාලනං, ප්‍ර
දාලනයකිරීම; එත්ථඉති, මෙහිනුයි; කෙදාරං, කෙදාරනම්;
(කෙදාරනම් පුබ්බනන අපරනත විරූහනස්ථානයි) "කාරුණා
කනෙද නාකො" යනාදියෙහි සුවයෙහිවැටේ (කංසුඛං රු
න්ධතීති කරුණා, කංයිසේයි, සුඛං සුවය; රුන්ධතිඉති, වල
කානුයි, කරුණා, කරුණානම්; කංසුඛංදෙතීතිකනෙද, කායි
සේයි, සුඛං, සුවය; දෙතිඉති දේනුයි; කනෙද, කනදනම්
(කනදනම්අලයි) නකංසු ඛනතිඅකං තංනත්ථි එත්ථාතිනාකො;
කංයිසේයි, නසුඛංඉති, සුවයනොවේනුයි, අකං, අකනම්; (අ
කනම් දුකයි) තං, ඒතෙමේ; එත්ථ, මෙහි; නත්ථිඉති, නැත්
තේනුයි; නාකො, නාකනම් (නාකනම් ස්වර්ගීයි) "කමලංක
ලසො, කන්තාරෙ කන්දරෙ කෙවට්ටො කෙසරෙ" යනාදි
යෙහි ජලයෙහි වැටේ (කංඋදකං අලඞ්කරෙතීති කමලං, කං
යිසේයි, උදකං, ජලය; අලඞ්කරෙතිඉති අලඞ්කාරකෙරේනු
යි; කමලං, කමලනම්; (කමලනම් පද්මයි) කෙන උදකෙ
න ලසතීතිකලසො, කෙනයිසේයි, උදකෙන, ජලයකරණ
කොටගෙණ; ලසතිඉති, බබලානුයි; කලසො, කලස නම්
(කලසනම් මනාසටහන්ඇති මඞ්ගල්‍යඝට විශෙෂයෙක)කෙ
නඋදකෙන තරිතබ්බො අතික්කමිතබ්බොති කන්තාරෙ,
කෙනයි සේයි, උදකෙන ජලයෙන්, තරිතබ්බොයි සේයි, අ
තික්කමිතබ්බො ඉතිඉක්මිය යුතුකෙතනුයි; කන්තාරෙ, කන්තා
රනම්; (කන්තාරනම් නිරුදක ප්‍රදෙශයි) කෙනඋදකෙන දරී
යති පදාලීයතීති කන්දරො, කෙනයිසේයි, උදකෙන, ජල
යෙන්; දරියති යිසේයි, පදාලීයති ඉති, ප්‍රදාලනය කෙරේ
නුයි කන්දරො, කන්දරනම්, කෙඋදකෙ මච්ඡ ගහණත්ථාය,
වට්ටති පරිවට්ටතීති කෙවට්ටො, කෙයිසේයි, උදකෙ, ජලයෙ
හි, මච්ඡ ගහණත්ථාය, මත්ස්‍යයන් ගැන්ම පිණිස, වට්ටතියි
සේයි, පරිවට්ටතිඉති, හාත්පසින් වැටේනුයි, කෙවට්ටො,
කෙවට්ටනම්, කෙඋදකෙ සරන්ති ඔසරන්තීති කෙසරෙ, කෙ
යිසේයි, උදකෙ, ජලයෙහි; සරන්තියිසේයි, ඔසරන්තිඉති, රැ
ස්වෙත්නුයි, කෙසරෙ, කෙසරනම්,) "කොසාතකණ්ඩා" යනා

21 නින්දානියමපුච්ඡාසු, නිප්ඵලෙසම්පටිච්ඡනෙ
සබ්බනාමිකපදංකිං, ජලජෙසදිසෙතුකි.

---

දියෙහි, සිඝ්‍රියෙහි වැටේ, (කෙසිංසෙසෙන්ති උප්පජ්ජන්තීති කෙසා, කෙයිසේසි, සීසෙ, හිසෙහි; සෙන්තිසිසේයි, උප්පජ්ජන්තීඉති, උපදිත්නුයි, කෙසා, කෙසනම්වෙත්; කංසීසං තිට්ඨන්ති එත්ථාතිකණ්ඨෝ, කංයිසේසි, සීසං, හිස; එත්ථ, මෙහි; තිට්ඨන්තීඉති, සිටිනුයි; කණ්ඨෝ, කණ්ඨනම්)

“පුමොසබ්බත්ථකොනාරී, දෙතිසබ්බත්ථකාකුලං
දානංසබ්බත්ථකාසාධු, ජනානංසබ්බදාවරං”

යනාදියෙහි ප්‍රකටාර්ථයෙහි වැටේ

සබ්බත්ථ, සියළුදෙශයෙහි, කො, ප්‍රකටවූ; පුමො, පුරුෂ තෙමේද; සබ්බත්ථ, සියලුදෙශයෙහි; කා, ප්‍රකටවූ; නාරී, ස්ත්‍රී තොමෝද; සබ්බත්ථ, සියලුදෙශයෙහි; කං, ප්‍රකටවූ; කුලං, කුලතෙමේද; සාධුජනානං, සත්පුරුෂජනයන්ට; වරං, උතුම්වූ; දානං, දානය; සබ්බදා, සියලුකාලයෙහි; දෙති, දෙයි)

21 සබ්බනාමිකපදං, සර්වනාමික පදවූ; කිං, කිංශබ්දතෙමේ; නින්දා, නින්දාය; අනියම, අනියමය; පුච්ඡාසු, ප්‍රශ්නය යන මෙහිද; නිප්ඵලෙ, නිෂ්ප්‍රයොජනයෙහිද; සම්පටිච්ඡනෙ (වචන) පිළිගැන්මෙහිද; (වේ) කිතු (ශබ්දනාමපදවූ) කිශබ්ද තෙමේ වනාහි; ජලජෙ, පද්මාදියෙහිද; සදිසෙ, සදෘශාර්ථ යෙහිද (වේ)

(“කිංරාජායොලොකං නරක්ඛති කින්නුඛොනාම තුම්හෙ මං වත්තබ්බංමඤ්ඤථ’ යනාදියෙහි කිංශබ්දතෙමේ නින්දාවෙහි වැටේ “යංකිඤ්චිරූපං අතීතානාගත පච්චුප්පන්නං” යනාදියෙහි අනියමයෙහි වැටේ “කිංසූධ විත්තං පුරිසස්ස සෙට්ඨං කිංසීලං කොසමාධි” යනාදියෙහිද “කිංඛාදසිකිංපිවසි” යනාදියෙහිද “කිංසු සන්තරමානොව කාසුංඛණසිසාරථි, කින්නු ජාතිං නාරොවෙසි, කෙනාතෙතාදිසො වණ්ණො” යනාදියෙහිද “කිංකාසූයාකරස්සති” යනාදියෙහි දයථා ක්‍රමයෙන් ස්වරූප වස්තු ක්‍රියා කාරක කෘත්‍ය ප්‍රශ්නයන් හි වැටේ “කිංනෙතවක්කලි ඉමිනා පූතිකායෙන දිට්ඨෙන යොඛො වක්කලි ධම්මං පස්සති සොමංපස්සති” යනාදියෙහි නිෂ්ප්‍රයොජන යෙහි වැටේ “කින්නුකාහාමි දෙවතෙ” යනාදියෙහි වචන පිළිගැන්මෙහි වැටේ “කිංඤ්ජකෙඛා” යනාදියෙහි

**22** කිතුහිංසාවික්කිණෙසු, කුකෙසද්දෙපකිත්තිතො
කුභූමිපාපසජ්ඣෙසු, කුවජ්ජිතෙඅප්පකෙබ්‍යයං.

---

කිශබ්ද තෙමේ පද්මාදියෙහි වැටේ (කෙ උදකෙ ජායතීති කිතස්මිං ජායති ජලතීතිවා කිඤ්ජක්ඛො කෙයිසේයි, උදකෙ, ජලයෙහි; ජායති ඉති, උපදීනුයි කි; කිනම්, (කිනම් පද්මාදියයි) තස්මිං, එහි; ජායතීඉතිවා, උපදීනුයිහෝ; ජලතීඉතිවා, බබලානුයිහෝ; කිඤ්ජක්ඛො, කිඤ්ජක්ඛනම් (මෙහිධාතුහුකෙරෙන් ඛප්‍රත්‍යයද නකාරයහටහෝ ලකාරයහටහෝ කකාරාදෙශද නිග්ගහීතං ගමදකොට කිඤ්ජක්ඛොයි සිඩයි) “කිම්පුරිසො” යනාදියෙහි සදෘශාර්ථයෙහි වැටේ (කිනාතිස මෙතීතිකි. කිසදිසො පුරිසෙනාති කිම්පුරිසො. කිනාතියිසේයි. සමෙතීඉති, සමානවේනුයි, කි. කිනම් කියිසේයි, පුරිසෙන, පුරුෂයාහා. සදිසොඉති, සදෘශනුයි; කිම්පුරිසො, කිම්පුරිසනම් (මෙහි කිපුරිසොයි කියයුතෙතහි නිග්ගහීතා ගමව කිම්පුරිසොයිවේ; කින්නරෙ, කින්නරීයනාදියෙහිද මෙමනයි)

**22** කිතු, කියනධාතුතෙමේ වනාහි; හිංසා, හිංසාකිරීමය; වික්කිණෙසු ක්‍රයවික්‍රය යනමෙහි (වේ) කු, කුයනධාතුතෙමේද; කෙ, කෙයනධාතුතෙමේද; සද්දෙ, ශබ්දාර්ථයෙහි (වේයයි) පකිත්තිතො, කියන ලද්දේය; කු; (ශුඩනාමපවූ) කු ශබ්දතෙමේ; භූමි, පෘථිවිය; පාප, පාපය; සජ්ඣෙසු, (ඛඩනාදි) අශුබය යනමෙහි (වේ) අබ්‍යයං, නිපාතවූ කුශබ්ද තෙමේ, කුවජ්ජිතෙ, නින්දිතාර්ථයෙහිද; අප්පකෙ අල්පාර්ථයෙහිද (වේ)

(“පච්චාමිතෙනකිනාති, කිමි, කාරුණි” යනාදියෙහිකියන ධාතුතෙමේ හිංසාකිරීමෙහි වැටේ, පච්චාමිතෙන, පසමිතුරන්ට; කිනාති, හිංසාකෙරේ; කීයති හිංසීයති කිපිල්ලිකාදිහි, කිනාතිවා පරසත්තෙති කිමි, කිපිල්ලිකාදිහි, කිපිල්ලිකාදින්විසින් කීයති යිසේයි, හිංසීයතිඉති; හිංසාකරණුලැබේනුයි, වා, නොහොත්; පරසත්තෙ, අන්‍යසත්වයන්ට; කිනාති ඉති, හිංසාකෙරේනුයි; කිමි, කිමිනම්; (කිමිනම් උකුනු මකුනු පනු ආදියයි) කාරුණිකෙකිනාති හිංසතීතිකාරුණි, කාරුණිකෙ, කරුණාඇත්තවුන්ට; කිනාතියි සේයි, හිංසතීඉති, හිංසාකෙරේනුයි; කරුණි, කරුණිනම්) “කයවිකකයෙපාචිත්තියං, කිනාති, විකකිනාති” යනාදියෙහි ද්‍රව්‍යවිනියොග සඞ්ඛ්‍යාත ක්‍රයවික්‍රයෙහි වැටේ “කවි” යනාදියෙහි කුයනධාතු තෙමේ ශබ්දාර්ථයෙහි වැටේ, (කවතිවදති පෙමනීයවචනං

සීලෙනාතිකවි, කවතීති සේයි, සීලෙන, ස්වභාවයෙන්, පෙමනීයවචනං, ප්‍රෙමනීයවචනය; වදතීඉති, කියාතුයි; කවි කවිනාම්, (කවිනාම් කාව්‍යකාරකපණ්ඩිතයි) "ජම්බුකාරුකඛා ජාතකං" යනාදියෙහි කෙයනධාතුතෙමේ ශබ්දාර්ථයෙහි වැටේ, (ජම්බුනි කෙයනති සද්දියතීති ජම්බුකා, කෙයනතීයි සේයි, ජම්බූඉති, ජම්බූයයි, සද්දියතීඉති, ශබ්දකරණුලැබේනුයි, ජම්බුකා, ජම්බුකානම්; ජාතංපුබ්බභවෙභූතං පුබ්බංබන්ධපක්ඛකං, තප්පටිබද්ධක්ඛ කයතී කථෙතීති ජාතකං ජාතංයි සේයි, පුබ්බභවෙභූතං, පූර්වභවයෙහිවූ පුබ්බං, පූර්වවූ බන්ධපක්ඛකං, සබන්ධපක්ඛකයද; තප්පටිබද්ධ,ක්ඛ ඒ සබන්ධපක්ඛකය පිළිබඳදෙයද; කයතීයිසේයි, කථෙතීඉති, කියාතුයි, ජාතකං, ජාතක නම්;) "කුජෝ, කුඤ්ජරෝ, කුඹො * කුද්දාලො" † යනාදියෙහි ශුද්ධනාමපදවූ කුශබ්දතෙමේ, පෘථිවියෙහිවැටේ; (කුතො භූමිතො ජාතොතිකුජෝ, කුතොයි සේයි, භූමිතො, පෘථිවියෙන්; ජාතොඉති, උපදින ලද්දේනුයි, කුජෝ කුජනම්; (කුජනම් වෘක්ෂයි) කුංපඨවිං තදභිඝාතෙන ජරයතීති කුඤ්ජරෝ, කුංයිසේයි, පඨවිං, පෘථිවිය, තදභිඝාතෙන, එය තැලීමෙන්, ජරයති ඉති, ජීර්ණයකෙරේනුයි; කුඤ්ජරෝ, කුඤ්ජරනම්; (කුඤ්ජරනම් හස්තියි) කුංපඨවිංධාරෙතීති කුඹො, කුංයි සේයි, පඨවිං, පෘථිවිය ධාරෙතීඉති, දරනුයි, කුඹො, කුඹනම්, (කුඹනාම් උපචිකයි) කුංපඨවිං දලති භින්දති එතෙනාතිකුද්දාලො, කුංයිසේයි, පඨවිං, පෘථිවිය; දලතියිසේයි, එතෙන, මේකරණකොටගෙණ භින්දතිඉති, බිඳීනුයි, කුද්දාලො, කුද්දාලනම්,) "උත්තරකුරුදීපොකුරුරට්ඨං" යනාදියෙහි පාපයෙහිවැටේ, (සභාවෙන සුද්ධපක්ඛ සීලස්සානුභාවෙන කුංපාපංරුන්ධතී එත්ථාතිකුරු, කුරුනංරට්ඨං, කුරුරට්ඨං, එත්ථ, මෙහි; සභාවෙන, ස්වභාවයෙන්; සුද්ධපක්ඛසීලස්ස, පිරිසිදුවූ පක්ඛසීලයාගේ, ආනුභාවෙන, ආනුභාවය කරණකොටගෙණ; කුංයිසේයි, පාපං, පාපය; රුන්ධතීඉති, වලකානුයි; කුරු, කුරුනම්;(කුරුනම් උත්තරදීපයි) කුරූනං, කුරුන්ගේ; රට්ඨං, රට; කුරුරට්ඨං, කුරුරට්ඨ නම්) සතකාරෙකා පුරිසංහනති" යනමෙහි කාපුරිසංයනපෙදෙහිද. කුශබ්දතෙමේ පාපවාචකය, (කුපාපකො පුරිසො කාපුරිසො, කුයිසේයි, පාපකො, ලාමකවූ; පුරිසො, පුරුෂතෙමේ;

---

* කුණ්ඩො සීත් පාඨයි.

† කුදාලො—සමහර.

කාපුරිසො, කාපුරිසනම්,(මෙහි 'කු' ශබ්දයහට 'කා' යනාදෙශවී) "කුසලං" යනමෙහිද 'කු' ශබ්දතෙමේ පාපවාචකය,(:කුංපාපං සාති, තනුංකරොතීති කුසං, තෙනලාතබ්බං පවත්තෙතබ්බන්ති කුසලං:, කුංයි සෙයි; පාපං, පාපය; සාතිසි සෙයි; තනුං කරොති ඉති, තුනීකෙරේනුයි;කුසං, කුසනම්;(කුසනම් ඥානයි) තෙන, එයින්; ලාතබ්බං යිසෙයි, පවත්තෙතබ්බංඉති, පැවැත්වියයුතෙත්නුයි; කුසලං, කුසලනම්) "අසිකොසො–කුඨාරි * කුනෙත්තා—කුසො" යනාදියෙහි ආවුධයෙහි වැටේ,(:කුස්ත්‍රං සයතිතං වාසිනොති. බන්ධති එත්ථාතිකොසො:, කුයිසෙයි, සත්ථං, ශස්ත්‍රයනෙමේ; එත්ථ, මෙහි; සයතිඉතිවා, හොවීනුයි හෝ, තං, එය; සිනොතිසි සෙයි, බන්ධතිඉතිවා, බඳීනුයි හෝ; කොසො, කොසනම්, (මෙහි කකාරසථ උකාරයහට ඔකාරත්වය වී) :කුභාවෙන සත්ථ භාවෙන ධාරීයතීති කුඨාරි:, කුභාවෙන සිසෙයි; සත්ථ භාවෙන, ශස්ත්‍රභාවයෙන්; ධාරීයති ඉති, දරණුලැබේනුයි; කුඨාරි, කුඨාරිනම්; (කුඨාරි නම් යොධයන්ගේ පොරවයි) :කුවිය අසිවිය පච්චාමිත්තානං සරීරංතියති ඡිඤතීතිකුනෙත්තා:, කුවියසිසෙයි, අසිවිය, ඛඩනයක්මෙන්, පච්චාමිත්තානං, පසමිතුරන්ගේ, සරීරං, සිරුර; තියතියි සෙයි, ඡිඤති ඉති, සිඳීනුයි; කුනෙත්තා, කුනත්තනම්, (කුනත්තනම් මහාසත්නියි) :කුවියසත්ථං වියගණ්හානතානංහත්ථපදෙසං සියති ඡිඤතීති කුසො:, කුවියයි සෙයි; සත්ථංවිය, ශස්ත්‍රයක් මෙන්, ගණ්හනතානං, ගන්නවුන්ගේ, හත්ථපදෙසං, හස්තප්‍රදෙශය; සියතියි සෙයි, ඡිඤතිඉති, සිඳීනුයි; කුසො, කුසනම්; (කුසනම් උභයභාගය ඉතා තීක්‍ෂණවූ තෘණ විශෙෂයෙක) "කදන්නං–කුප්පුතෙත්තා–කුදෑසො" යනාදියෙහි නිපාතපදවූ 'කු' ශබ්ද තෙමේ නින්දිතාර්ථයෙහි වැටේ, (:කුච්ජිතං අන්නං කදන්නං: කුච්ජිතං, නින්දිතවූ; අන්නං, බත; කදන්නං, කදන්න නම්; (මෙහි 'කු' ශබ්දයහට 'කද' යනාදෙශවී) :කුච්ජිතො පුත්තො යස්ස සො කුප්පුත්තො:, කුච්ජිතො, නින්දිතවූ; පුත්තො, පුත්‍රතෙමේ; යස්ස, යමක්හුගේද; සො, හේතෙමේ; කුප්පුත්තො, කුපුත්තනම්;('කුදෑ සො' යන්නෙහිද වාක්‍යය මෙසේයි)"කාලවනං" යනාදියෙහි අල්පාර්ථයෙහිවැටේ(:අප්පකං ලවනං, කාලවනං: අප්පකං, ස්වල්පවූ; ලවනං, ලුන; කාලවනං, කාලවනනම්; (මෙහි ගුණනාමපද 'කු' ශබ්දය පෘථිවියෙහි වැටෙනකල්හි සත්‍රී

* කුඨාරි—යීත් පාඨයි.

**23** ඛමින්ද්‍රියෙසුඛෙසග්ගෙ සුඤ්ඤකාසෙචවිවරෙ
නිග්ගහීතන්තං පණ්ඩක ලිඞ්ගංඛන්ති පදංමතං.

---

ලිඞ්ගය, සෙසු දෙතැන්හි වැටෙනකල්හි නපුංසකලිඞ්ගයයි. දතයුතු,)

(දැන් 'ඛං' ශබ්දයාගේ අර්ථ විශෙෂ දක්වන පිණිස 'ඛමින්ද්‍රියෙසුඛෙසග්ගෙ' යනාදී කීය)

**23** ඛං, 'ඛං'ශබ්දතෙමේ; ඉන්ද්‍රියෙ, චක්ඛින්ද්‍රියාදියෙහිද; සුඛෙ, සුවයෙහිද; සග්ගෙ, ස්වර්ගයෙහිද; සුඤ්ඤෙ, ශූන්‍යයෙහිද; ආකාසෙච, ආකාශයෙහිද; විවරෙ, අතරෙහිද; (වේ) ඛංඉති පදං, 'ඛං' යනමේ පදතෙමේ; නිග්ගහීතන්තං, නිග්ගහීතාන්ත වූ; පණ්ඩකලිඞ්ගං, නපුංසකලිඞ්ගය,(යි) මතං, (පණ්ඩිතයන්විසින්) දන්නාලද්දේය.

(එහි "පඤ්චක්ඛන්ධා" යනාදියෙහි 'ඛං' ශබ්දතෙමේ චක්ඛින්ද්‍රියාදියෙහිද ශූන්‍යයෙහිද වැටේ (:ඛානි චක්ඛුන්ද්‍රියාදීනි ධාරෙන්තීති ඛන්ධා, ඛංඅත්තනිච්චාදීහි * සුඤ්ඤං ධාරෙන්තීතිපි ඛන්ධා:, ඛානීසිසේයි; චක්ඛුන්ද්‍රියාදීනි, චක්ඛින්ද්‍රියාදීන්; ධාරෙන්තිඉති, දරත්නුයි; ඛන්ධා, ඛන්ධනම්වෙත්; ඛංයි සේයි, අත්තනිච්චාදීහි, ආත්මනිත්‍යාදිවශයෙන්; සුඤ්ඤං, ශූන්‍යය; ධාරෙන්තීතිපි, දරත්නුයිද; ඛන්ධා, ඛන්ධනම්වෙත්)"ඛඤ්ජනා"යනාදියෙහි සුවයෙහිවැටේ (:පසන්නානං ඛංසුඛං ජනෙතීති ඛඤ්ජනා:; පසන්නානං, දක්නවුන්ට; ඛං,යිසේයි; සුඛං, සුවය; ජනෙතිඉති, උපදවාතුයි; ඛඤ්ජනා, ඛඤ්ජනානම් (ඛඤ්ජනා නම් පක්ෂිවිශෙෂයෙක) "ඛනෙධා" යනාදියෙහි ස්වර්ගයෙහි වැටේ(:ඛංසග්ගං ධාතිවිදධාතීති ඛනෙධා:, ඛංයිසේයි; සග්ගං, ස්වර්ගය; ධාතියිසේයි; විදධාතිඉති, දරාතුයි; ඛනෙධා, ඛනධනම්; (ඛනධනම් හරපුත්‍රවූ ලොකසම්මතදෙව විශෙෂයෙක) "ඛගො—ඛෙතිමිඞ්ගිතො" යනාදියෙහි ආකාශයෙහි වැටේ; (:ඛෙ ආකාසෙගච්ඡතීති ඛගො:, ඛෙයිසේයි; ආකාසෙ, ආකාශයෙහි, ගච්ඡතිඉති, යාතුයි; ඛගො, ඛගනම්; (ඛගනම් සකුණයි) "ඛලිනො" යනාදියෙහි අතරෙහි වැටේ (:ඛෙමුඛවිවරෙලීනාතීති ඛලිනො:, ඛෙයිසේයි; මුඛවිවරෙ, මුවවිවරයෙහි; ලීනාතිඉති, ඇලේනුයි; නොහොත්, සැඟවේතුයි; ඛලිනො, ඛලිනනම්; (ඛලිනනම් කවිකායි) වැලිඳු

---

* අත්තනිච්චාදිසුඤ්ඤං – සමහර.

**24** ගොගොණෙපීපුමෙසෙසෙ, පුමින්ද්‍රියෙජලෙකරෙ
සග්ගෙවජිරවාචායං, භූම්‍යංඤාණෙචසූරියෙ. †

**25** ගීතරිඛනෙඛගන්ධබ්බෙ චන්දෙදුක්ඛීසගායනෙ
සරස්සතිදිසායඤ්ච, ගොසද්දොසමුදීරිතො.

---

“කතපුඤ්ඤාරතාඛම්හි, විඤ්ඤාණාඛෙසුනිස්සිතා
පක්ඛිනොඛම්හිගච්ඡන්ති, ඛමිච්ඡන්තිදුක්ඛට්ටිතා
යොගිනොඛෙභිරමන්ති * භමරාවංසඛෙරතා.”

(යන මෙහිද ‘ඛං’ ශබ්දතෙමේ යථා ක්‍රමයෙන්
සවර්ගේන්ද්‍රිය ආකාශ සුවශූන්‍ය විවරයන්හිවැටේ.)

(කතපුඤ්ඤා, කළපින් ඇත්තෝ; ඛම්හි, සවර්ගයෙහි; රතා, ඇලෙනලද්දාහුය; විඤ්ඤාණා, චක්ෂුර්විඥානාදීහු, ඛෙසු, චක්ෂුරින්ද්‍රියාදීන් කෙරෙහි; නිස්සිතා, නිශ්‍රිත වෙත්; පක්ඛිනො, පක්ෂීහු; ඛම්හි, ආකාශයෙහි; ගච්ඡන්ති, යත්; දුක්ඛට්ටිතා, දුකින් පීඩිතවූවෝ; ඛං, සුවය; ඉච්ඡන්ති, කැමති වෙත්; යොගිනො, ශ්‍රමණයෝ; ඛෙ, ශූන්‍ය (ස්ථාන)යෙහි; අභිරමන්ති, මනාව ඇලෙත්; භමරා, භෘඞ්ගයෝ; වංසඛෙ, හුනවිවර යෙහි; රතා, ඇලෙනලද්දාහුය.)

(දැන් ‘ගො’ ශබ්දයාගේ අර්ථවිශෙෂ දක්වනපිණිස ‘ගොගොණෙපී පුමෙසෙසෙ’ යනාදිකීය.)

**24** පීපුමෙ, ස්ත්‍රීලිඞ්ග පුල්ලිඞ්ග දෙක්හි (වැටෙන්නා)වූ; ගො, ‘ගො’ ශබ්දතෙමේ; ගොණෙ, ගවයා කෙරෙහි; (වේ) සෙසෙ, සෙසු, අපුමෙ, පුල්ලිඞ්ගයෙන් අන්‍යලිඞ්ගයෙහි, (වැටෙන්නා)වූ; ගොසද්දො, ‘ගො’ ශබ්දතෙමේ, ඉන්ද්‍රියෙ, චක්ෂුරින්ද්‍රියාදියෙහිද; ජලෙ, ජලයෙහිද; කරෙ, රශ්මියෙහිද; සග්ගෙ, සවර්ගයෙහිද; වජිර, වජ්‍රායුධය; වාචායං, වචනය යනමෙහිද; භූම්‍යං, පෘථිවියෙහිද; ඤාණෙච, ඥානයෙහිද; සූරියෙ, හිරු කෙරෙහිද.

**25** ගීතරි, ගායනා කරන්නහු කෙරෙහිද; ඛනෙඛ, සකන්ද දෙවයා කෙරෙහිද; ගන්ධබ්බෙ, ගන්ධර්වයා කෙරෙහිද; චන්දෙ, චන්ද්‍රයා කෙරෙහිද; දුක්ඛ, දුඃඛය; ඊස, අධිපතිය; ගායනෙ, ගායනාක්‍රිමය යනමෙහිද; සරස්සති, සරස්වතීනම් දෙව දුහිතෘය; දිසායඤ්ච, (පූර්වදක්ෂිණාදි) දිශාය යනමෙහිද; (වේ යයි) සමුදීරිතො, කියනලද්දේය.

---

* රම්මන්ති—සමහර.

† සූරියෙ—තිපි කාර්ච් දිස්සතෙ.

(එහි "ගො' සුදු යහමානාසු ගතො–'ගො' පඤ්චමො–උසභො'ගො" යනාදියෙහි 'ගො' ශබ්දතෙමේ ගවයාකෙරෙහි වැවේ,('ගොසුදුයහමානා සුගතො' යනමෙහි 'ගො' ශබ්දය ස්ත්‍රීලිඞ්ගය, සෙසු දෙතැන්හි පුල්ලිඞ්ගයි)"ගො' චරො" යනාදියෙහි චක්ඛින්ද්‍රියාදියෙහි වැවේ, (:ගාවො ඉන්ද්‍රියානි චරන්ති එත්ථාති ගොචරො:, ගාවොයිසේයි; ඉන්ද්‍රියානී, චක්ඛින්ද්‍රියාදීහු; එත්ථ,මෙහි;චරන්තිඉති,හැසිරෙත්නුයි; ගොචරො,ගොචරනම්;)"ගොසීතචන්දනං" * යනාදියෙහි ජලයෙහි වැවේ;(:ගොවිය උදකං විය සීතං චන්දනන්ති ගොසීතචන්දනං:, ගොවියයි සේයි; උදකංවිය, ජලයමෙන්; ශීතං, සීතලවූ; චන්දනං ඉති, සඳුනනුයි; ගොසීතචන්දනං, ගොසීතචන්දනනම්;)"උණ්හගු–සීතගු" යනාදියෙහි රශ්මියෙහි වැවේ; (:උණ්හාගාවොරංසියො එතස්සාති උණ්හගු:; උණ්හා, උෂ්ණවූ; ගාවොයිසේයි; රංසියො, රශ්මීහු; එතස්සඉති, මොහුගේනුයි; උණ්හගු, උණ්හගුනම්; (උණ්හගු නම් සූර්‍ය්‍යයි) :සීතාසීතලාගාවො රංසියො එතස්සාතිසීතගු:; සීතායිසේයි; සීතලා, ශීතලවූ ගාවොයිසේයි; රංසියො, රශ්මීහු; එතස්සඉති; මොහුගේනුයි; සීතගු, සීතගුනම්; (සීතගුනම් චන්ද්‍රයි;) "ගන්ධබ්බො" යනාදියෙහි සවගීයෙහි වැවේ; (:ගොමහිසඟෙගධුනාති කම්පතිගායන නටනා † දිවසෙනාති ගන්ධබ්බො:, ගොමහියිසේයි; සඟෙග, සවගීයෙහි; ගායන නටනාදිවසෙන, ගනුනැටුම්ආදි වශයෙන්; ධුනාතියිසේයි; කම්පතිඉති, කම්පාවේනුයි; ගන්ධබ්බො, ගන්ධබ්බනම්;) "ගදා"යනාදියෙහි වජ්‍රායුධයෙහි වැවේ; (:ගො විය වජිරො විය පරෙසං දුක්ඛං දදාතීති ගදා:, ගොවියයි සේයි, වජිරොවිය, වජ්‍රායුධයමෙන්; පරෙසං, අනුන්ට; දුක්ඛං, දුක; දදාතිඉති, දේ නුයි; ගදා, ගදානම්; (ගදානම් වෙසමුණු මහරජහුගේ ආයුධ භූත ගදායි;)"ගො'ත්ත වසෙන ගොතමං"යනාදියෙහි වචනයෙහිද ඥානයෙහිද වැවේ; (:ගංතායතීති ගොත්තං:, ගං, (ගෞතම යසිපැවති) වචනයද. ඥානයද;තායතිඉති,(එකාංසික විෂයභාවයෙන්)රක්ෂාකෙරේනුයි; ගොත්තං, ගොත්තනම්; "ගො'මතිං

* අභිධාන ප්‍රදීපිකා ටීකාවෙහි. "ගොසීස සණ්ඨාන පබ්බතෙසම්භූතචන්දනත්තා ගොසීස චන්දනං"යි කියනලදී.

† නාටනාදි—සමහර.

ගොතමං නමෙ—'ගො' රක්ඛං" යනාදියෙහි පෘථිවියෙහි වැ වේ; (ගොමහිං, පෘථිවිය හා සමාන ප්‍රඥා ඇති; ගොතමං, ගෞතම සර්‍වඥයන්වහන්සේ; වන්‍දෙ, වඳිම්—ගොරක්ඛං, පෘථිවි රක්‍ෂණයයි) "ගණ්ඨිපදං" යනාදියෙහි ඥානයෙහි වැවේ; (:ගො ඤාණං තිට්ඨන්ති එත්ථාති ගණ්ඨි: ගණ්ඨිවතං පදංඤ්චාති ගණ්ඨිපදං:; ගොයි සේයි; ඤාණං, ඥානය; එත්ථ, මෙහි; තිට්ඨන්ති ඉති, සිටිනුයි; ගණ්ඨි, ගණ්ඨිනම්; ගණ්ඨිවතං, ගණ්ඨිවූයේද ඒ තෙමේය; පදංඤ්චඉති, පදවූයේද ඒ තෙමේනුයි; ගණ්ඨිපදං, ගණ්ඨිපද නම්; (ගණ්ඨිපද නම් පෙළ අටුවාදියෙහි ගම්භීර ඥානයට විෂයවූ දුකසේ උගතයුතු ස්ථානයි) "ගො' ගොත්තං ගොතමං නමෙ–'ගො'කණ්ටකො" යනාදියෙහි හිරුකෙරෙහි වැවේ; (ගොගොත්තං, සූර්‍ය්‍යවංශ ඇති; ගොතමං, ගෞතම සර්‍වඥයන්වහන්සේ; වන්‍දෙ, වඳිම්;—:ගොස්සසූරියස්ස කණ්ට කො ගොකණ්ටකො:; ගොස්සයි සේයි; සූරියස්ස, සූර්‍ය්‍යයා ගේ; කණ්ටකො, කණ්ටකතෙමේ; ගොකණ්ටකො, ගොකණ්ටකනම්) "ගීතං—ගායනං" යනාදියෙහි ගායනාකරන්නහු කෙරෙහි වැවේ; (:ගොහිගීතරෙහි ඊයතෙ උච්චාරීයතෙති ගීතං:; ගොහියි සේයි; ගීතරෙහි, ගායනාකරන්නන් විසින්; ඊයතෙයි සේයි; උච්චාරීයතෙඉති, කියනුලැබේනුයි; ගීතං, ගීතනම්;—:ගොතං ගායනතානං ඉයනං උච්චාරණන්ති ගායනං: ගොතංයි සේයි; ගායනතානං, ගයනා කරන්නන්ගේ; ඉයනංයි සේයි; උච්චාරණං ඉති, කීමනුයි; ගායනං, ගායන නම්;) වැලිඳු.

> "ගායතිගොහරපුත්තෙතා, ගොඉන්‍දපරිචාරිකො
>
> ගොපුප්පෙඵතිකුමුදංගො, ගායතෙගොපජීයතෙ
>
> ගොමිජ්ඣිසිප්පසිද්ධංගොසු, පාකටොසජ්ජනොසදා."

(යනාදියෙහි'ගො'ශබ්දතෙමේ යථාක්‍රමයෙන් ගායකසක්‍ර දෙව ගන්‍ධර්‍ව චන්‍ද්‍රගායනා සරස්වතීදිශාවන් කෙරෙහි වැවේ;) (ගො, ගායකතෙමේ;ගායති, ගායනාකෙරේ; හරපුත්තෙතා, ඊශ්වරපුත්‍රවූයේ; ගො, සක්‍රදෙවයි; ඉන්‍දපරිචාරිකො, ශක්‍රයාගේ පරිචාරිකවූයේ; ගො, ගන්‍ධර්‍වදෙවයි; ගො, චන්‍ද්‍රතෙමේ; කුමුදං, කෞමුදය; පුප්ඵෙති, විකශනය කෙරේ; ගො, ගායනාතොමෝ; ගායතෙ, ගායනා කරණුලැබේ; ගොමහි, සරස්වතිය හෙතුකොට ගෙණ; සිප්ප සිද්ධං, සිල්පාරම්භය;

26 ගුසද්දුග්ගමෙකරීස, උස්සග්ගෙගෙතුච්චාරණෙ
සොසණ්ඨිකාපච්චයෙසු, සාකිඩ්ඩිණ්යමුච්චතෙ.

---

පත්ථීයතෙ, පතනුලැබේ; ගොසු, දිශාවන්හි; සජ්ජනො, සත් පුරුෂතෙමේ; සද, හැමකල්හි; පාකටො, ප්‍රකටවේ.)

("අලගද්දො, *—අගද්දො" යනාදියෙහි දුඃඛයෙහි වැටේ; (:ගොවුච්චති දුක්ඛං තං දෙතීති ගදං: අලං පරිපුණ්ණං ගදං එතස්සාති අලගද්දො:, ගො, ගොයනු; දුක්ඛංවුච්චති, දුකැයිකියනුලැබේ; තං, ඒ දුක; දෙතිඉති, දේනුයි; ගදං, ගදනම්; (ගදනම් විෂයි) අලංයි සේයි; පරිපුණ්ණං, සම්පූණ්වූ; ගදං, විෂය; එතස්සඉති, මොහුගේනුයි; අලගද්දො, අලගදනම්; (අලගදනම් සර්පයි) :ගොවුච්චතිදුක්ඛං තංදෙතීතිගදො: ගදස්ස රොගස්ස පටිපක්ඛොති අගදො:; ගො, ගොයනු; දුක්ඛං වුච්චති, දුකැයිකියනුලැබේ; තං, ඒ දුක; දෙතිඉති, දේනුයි; ගදො, ගදනම්; (ගදනම් රොගයි) ගදස්සයිසේයි; රොගස්ස, රොගයට; පටිපක්ඛොඉති, ප්‍රතිපක්ෂනුයි; අගදො, අගදනම්; (අගදනම් ඖෂධයි) "මුනිපුඞ්ගවො—පුරිසපුඞ්ගවො" යනාදියෙහි අධිපතියා කෙරෙහි වැටේ; (:පුමොචසොගො අධිපතිචාති පුඞ්ගවො: මුනිචසො පුඞ්ගවොචාති මුනිපුඞ්ගවො:; පුමොචසො, පුරුෂවූයේද හේතෙමේය; ගොයිසේයි; අධිපතිච ඉති, අධිපතිවූයේද හේතෙමේනුයි; පුඞ්ගවො, පුඞ්ගවනම්; මුනිචසො, මුනිවූයේද හේතෙමේය; පුඞ්ගවොච ඉති, පුඞ්ගව වූයේද හේ තෙමේනුයි; මුනි පුඞ්ගවො, මුනිපුඞ්ගව නම්) ('පුරිසපුඞ්ගවො' යනමෙහිද වාක්‍යය මෙමනායයි දතයුතු )

(මෙසේ ශුද්ධනාමපදවූ 'ගො' ශබ්දයාගේ අර්ථවිශෙෂ දක්වා දැන් ධාතුපදවූ 'ගු–ගෙ' ශබ්දයන්ගේද 'ස' ශබ්දයාගේද, අර්ථ විශෙෂ දක්වනපිණිස 'ගුසද්දුග්ග මෙ කරීස' යනාදිකීය.)

26 ගු, 'ගු'(යන)ධාතුතෙමේ; සද්දෙ, ශබ්දකිරීමෙහිද; උග්ගමෙ, නැගීමෙහිද; කරීස උස්සග්ගෙ, මලගැරීමෙහිද; (වේ) ගෙතු, 'ගෙ' (යන) ධාතුතෙමේ වනාහි; උච්චාරණෙ, කීමෙහි (වේ) සො, 'ස' ශබ්දතෙමේ; සණ්ට, (කාංසලොහමය) මහා

---

* අලගද්දො—සීත් පාඨයි.

ඝණ්ටය; ඊසා, නඟුල්දණ්ඩුයුගමය; ආපච්චයෙසු, (‘ඉත්ථියමතො ආප්පච්චයො’ යනමෙයින්කළ) ආප්‍රත්‍යය යනමෙහි, (වේ) ඝා, ඝාශබ්දතෙමේ; කිඞ්කිණියං, (අශ්වස්කන්ධ සත්‍රිඅලඞ්කාරාදියෙහි ලඟනකළ) කුද්‍රඝණ්ටිකාවෙහි, (වේයයි) උච්චතෙ, කියනුලැබේ.

(එහි ‘‘කඞ්ගු—ඓඞ්ගු’’ යනාදියෙහි ‘ගු’ යනධාතු තෙමේ ශබ්දකිරීමෙහි වැටේ, (:කෙනඋදකෙන ගුණාතිසද්දං කරොතීතිකඞ්ගු:, කෙනසිසේයි, උදකෙන, ජලයකරණකොටගෙණ, ගුණාතිසිසේයි, සද්දංකරොතීඉති, ශබ්දකෙරේනුයි; කඞ්ගු, කඞ්ගුනම්; (කඞ්ගුනම් සිපුම්[illegible]ලඇති ධාන්‍යවිශෙෂයෙක) :ඓවාතෙ වාතනිමිත්තම්හි ගුණාතිසද්දං කරොතීතිඓඞ්ගු:, ඓසිසේයි, වාතෙසිසේයි, වාතනිමිත්තම්හි, වාතයනිමිත්ත කොටගෙණ, ගුණාතියිසේයි, සද්දංකරොතීඉති, ශබ්දකෙරේනුයි; ඓඞ්ගු, ඓඞ්ගුනම්, (ඓඞ්ගුනම් හරරඟිත වෘක්ෂස්කන්ධ විශෙෂයෙක)* ‘‘උඞ්ගාරො’’ යනාදියෙහි නැඟීමෙහි වැටේ; (:උඞ්ගුණාති උඞ්ගමතීති උඞ්ගාරො:, † උඞ්ගුණාති සිසේසි, උඞ්ගමතීඉති නඟීනුයි; උඞ්ගාරො, උඞ්ගාරනම්, (උඞ්ගාරනම් තැලිනැඟීමයි;) මෙහි උපුව්වූ ‘ගු’ යනධාතුනුකෙරෙන් ‘ණ’ ප්‍රත්‍යයද; ධාත්වන්ත උකාරයහට ‘ආර’යනාදෙශද, විත්තද කොට ‘උඞ්ගාරො’යනු සිඬයි)‘‘ගුරං’’ යනාදියෙහි මලහැරීමෙහි වැටේ, (:ගුණාතිග වතිවා උස්සජ්ජති කරීසමෙතෙනාතිගුරං:, ගුණාතිසිසේයි; ගවති සිහෝසේයි, එතෙන, මේ කරණකොටගෙණ, කරීසං, මල; උස්සජ්ජති ඉති, හරීනුයි; ගුරං, ගුරනම්; (ගුරනම් මලමාගීයි,) මෙහි ‘ගු’යනධාතුනුකෙරෙන් ‘ර’ප්‍රත්‍යයවී) ‘‘සඞ්ගීතා—සඞ්ගීති’’ යනාදියෙහි ‘ගෙ’ ධාතුතෙමේ කීමෙහිවැටේ,(:සඞ්ගායතෙ කථීයතෙති සඞ්ගීතා: සඞ්ගායතෙසි සේයි, කථීයතෙඉති, කියනුලැබේනුයි, සඞ්ගීතා, සඞ්ගීතානම්; :සඞ්ගායනං කථනං සඞ්ගීති:, සඞ්ගායනං සිසේයි, කථනං, කීම; සඞ්ගීති, සඞ්ගීතිනම්)

‘‘පහතෙපුත්තකාලෙඝො, කට්ඨුංඝොබන්ධතෙපුගෙ
ඝතෙචඝතොනාදීනං, ඝාරවෙරමතෙනරො’’

යනාදියෙහි ‘ඝ’ ශබ්දතෙමේ යථාක්‍රමයෙන්, මහාඝණ්ටයෙ

* එනම්, කොටදිඹුලා යි

† උඞ්ගුණාතිඋඞ්ගමතිඋඩ්ඩඞ්ගමංවාතවූළුහවසෙනාති උඞ්ගාරා—ඊත් වාක්‍යයි.

**27** ඝොකාරාසහනෙරඤ්ඤෙ, ඝායනවඩ්ඪනෙසුඝා
ඝිගත්‍යක්ඛිපනෙඝුතු, සද්දෙඝිගමනෙභවෙ,

---

හිද, නඟුල්දඬු යුගමයෙහිද, ආප්‍රත්‍යයෙහිද, වැටේ. ඝාශබ්ද තෙමේ ක්‍ෂුද්‍රඝණ්ටිකාවෙහි වැටේ.

යුනත්තකාලෙ, (කර්මකරණඵලාදි භාජන කාල වශයෙන්) පැමිණි කාලයෙහි, ඝො, ඝණ්ටයතෙමේ; පහතෙ, ගසනු ලැබේ; කට්ඨිං, (ගොවියන්විසින් ක්‍ෂෙත්‍රය) සාන්ට, යූගෙ, විය(මධ්‍ය) යෙහි; ඝො, නඟුල්දඬුයුගමය; බන්ධතෙ, බඳිනුලැබේ; ඝතො, ඝසංඥ(වූ ආ ප්‍රත්‍ය)යාකෙරෙන්; එව,(ආලපන එක වචනසිහට) එකාරාදෙශදවේ; ඝතො, ඝසංඥ(වූ ආ ප්‍රත්‍ය)යා කෙරෙන්; නාදීනං, නාආදිවිභක්තීන්ට; (ආය යනාදෙශවේ) නරෙ, මිනිස් තෙමේ, ඝාරවෙ, ක්‍ෂුද්‍රඝණ්ටිකා ශබ්දයෙනි; රමතෙ, ඇලේ.)

**27** ඝො, ඝයනධාතුතෙමේ; කාරාසහනෙ, (වෛරීජනය න්ගේ) පීඩානොඉවසීමෙහි; අඤ්ඤෙ, වේ; ඝා, ඝායනධාතුතෙ මේ; ඝායන, සුවඳගැන්මය; වඩ්ඪනෙසු; නැසීමය යනාමෙහි, (වේ)ඝි, ඝියනධාතුතෙමේ; ගත්‍යක්ඛිපනෙ, නැගීමෙහි,(වේ) ඝුතු, ඝු යන ධාතුතෙමේ වනාහි; සද්දෙ, ශබ්දකිරීමෙහිද; අඝි ගමනෙ, විඳීමෙහිද; භවෙ, වන්නේය.

("ආඝාතංබන්ධිත්වා-නවආඝාතවන්තු" යනාදියෙහි 'ඝ' යන ධාතුතෙමේ, වෛරීජනයන්ගේ පීඩා නොඉවසීමෙහි වැටේ. (:පරවෙරී ජනෙහි කතං ආ අට්ටං පීළනං ඝායති නසහතීති ආඝාතො:, පරවෙරීජනෙහි, පරවෛරීජනයන් විසින්; කතං, කරණලද; ආසිසේසි, අට්ටංසි සේසී, පීළනං, පෙළීම; ඝායති සිසේසි, නසහතීඉති, නොඉවසානුයී;.ආඝාතො, ආඝාතනම්; (චිතියාඅංව ආඝාතංතිවේ-සෙසසහිද වාක්‍යය මෙමනයසි) "ඝා නං-ගන්ධංඝත්වා සමුට්ඨාති-ගන්ධංඝායිත්වා" යනාදියෙහි 'ඝා' යනධාතුතෙමේ, සුවඳගැන්මෙහි වැටේ, (:ඝායතිගන්ධොපාදා නංකරොතීතිඝානං:, ඝායතිසිසේසි, ගන්ධොපාදානං, සුවඳගැ න්ම; කරොතීඉති, කෙරේනුයි; ඝානං, ඝානනාම්, (මෙහි'ඝා'ය නධාතුහුකෙරෙන් 'යු'ව 'අන'ව 'ඝානං'යනුසිඬයි-'ගන්ධංඝත්වා සමුට්ඨාති' යනාමෙහි 'ඝා' යනධාතුහුකෙරෙන්හෙත්වත්ථියෙහි 'ත්වා'ද 'අ'විකරණදකොට,'ඝත්වා'යි සිඬයි-'ගන්ධංඝායිත්වා'යන මෙහි 'ඝා' යනධාතුහුකෙරෙන් 'ත්වා' ද "චුරාදිතොණෙණ යා"යනසූත්‍රයෙන් 'ණය' ප්‍රත්‍යයදකොට, 'ඝායිත්වා'යනුසිඬයි,)

28 වුත්තාපෙය්‍යකක්ඛරකොසෙ, පොරාණෙඪස්සත්‍ථෙ නිධ
වුත්තාසන්තාපාලියට්ඨ, කථාදිස්වත්‍ථභෙදකා.

---

“කොධං සත්‍වාසුඛංසෙති”යනාදියෙහි නැසීමෙහිවැටේ. (මෙහි ‘සත්‍වා’ යන්නගේ සිද්ධිය ‘ගන්ධංසත්‍වා සමුට්ඨාති’ යනුයෙහි ‘සත්‍වා’යන්නටකීවාක්මෙනි) ‘‘සති’’ යනාදියෙහි ‘සි’ යනධාතුතෙමේ නැඟීමෙහි වැටේ. (‘සති’යනුනගීයනඅර්ථයි)මෙහි ‘සි’ යනධාතුහුකෙරෙන් ‘ති’ විභක්තිද ‘අ’ විකරණදකොට ‘සති’යිවේ)‘‘සොති–සවති’’ යනාදියෙහි ‘සු’ යනධාතුතෙමේශබ්දකිරීමෙහිවැටේ.(‘සොති–සවති’යනුශබ්දකරයියනඅර්ථයි)මෙහි‘සු’ යනධාතුහු කෙරෙන් ‘ති’විභක්තිද ‘අ’විකරණද ‘උ’කාරයහට ‘ඔ’කාරත්‍වයද එක්පක්‍ෂයෙක්හි ‘ඔ’කාරයහට ‘අව’යනාදෙශද් කොට ‘සොති–සවති’ යනුවේ)‘‘සො–සාවකො–සවනං’’ යනු කිතක ප්‍රත්‍යයන්ගේයොගයටඋදාහරණයි)“සම්පත්තිංසොති–සුඛස්සසවනං’’ යනාදියෙහි‘සු’ යනධාතුතෙමේ විඳීමෙහිවැටේ. (‘සොති’යනමෙහිද පදසිද්ධිතොමෝ කීවාක්මෙනි-‘ඔ’කාරයහට ‘අව’යනාදෙශකළකල්හි ‘සවති’කියාදවේ) ‘සවනං’ යනමෙහි ‘සු’ යනධාතුහුකෙරෙන් ‘යු’ප්‍රත්‍යයද ‘උ’ කාරයහට ‘ඔ’කාරත්‍වයද ඕහට ‘අව’ යනාදෙශද ‘යු’ හට ‘අන’ යනාදෙශදකොට ‘සවනං’ යනුසිද්ධයි—‘ණ්වු’ ප්‍රත්‍යයවශයෙන් “සාවකො’’ යන ප්‍රයොගය දතයුතු)

(‘ඪ’ කාරතෙමේ වනාහි ඉදිනුදුපුරාතන එකාක්‍ෂරකොෂයෙහි “ඪකාරොභෙරවඃ ඛ්‍යාතො ඪකාරො විෂයස්පෘහා’’ යි අර්ථවයෙක්හි ප්‍රවෘත්තිතොමෝ කියනලද්දීද කච්චායනාදියෙහිද ස්වරූප වශයෙන් වෙනම කියනලද්දීද ස්වභාව නිරුක්ති මාගධීභාෂාවූ පාල්‍යර්ථකථාදියෙහි වනාහි වෙනවෙනම අවිද්‍යමානහෙයින් ඒ ‘ඪ’ කාරයාගේ අර්ථවිශෙෂයෝ මෙහි නොකියනලද්දාහුයයි දක්වන්නේ ‘වුත්තාපෙය්‍ය කක්ඛරකොසෙ’ යනාදිකීය)

**28** පොරාණෙ එකක්ඛරකොසෙ, පුරාතන එකාක්‍ෂරකොෂයෙහි; ඪස්ස, ‘ඪ’ කාරයාගේ; අත්ථෙ, අර්ථ(ව)යෙක්හි; වුත්තාපි, (ප්‍රවෘත්තිතොමෝ) කියනලද්දීද; පාලියට්ඨකථාදීසු, පෙළඅටුවාදියෙහි; අසන්තා, අවිද්‍යමානහෙයින්; ඉධ, මේ (මාගධීභාෂායෙන් රචනාකරණලද) එකක්ඛරකොසයෙහි; අත්ථභෙදකා, (‘ඪ’ කාරයාගේ) අර්ථවිශෙෂයෝ; නවුත්තා, (මා විසින්) නොකියන ලද්දාහුය.

4

29 කවග්ගමොලිඅලිනං, සෙවිතපාදපඞ්කජං
කින්දතිකින්දස්ස, මුනිසෙට්ඨස්ස සාසනෙ.

30 කවග්ගපච්චෙකත්ථානං, නිච්ඡයංසාරසම්භවං
සද්ධාඤාණදයොපෙතා, සජ්ජනාමොදයන්තුනො.

# කවග්ගං නිට්ඨිතං.

——000——

(මෙසේ 'ඞ' කාරය මෙහි නොකියනලද කාරණකියා දැන් තමාගේ ප්‍රකරණයාගේ සංවර්ණිතව්‍යතිශ්‍රය භූතපර්‍ය්‍යාප්ති ධර්මයට උත්පත්තිස්ථානවූ ශාස්තෘන්වහන්සේගේ ගුණ සඞ්කීර්තන පූර්වඞ්ගමවූ ශ්‍රොතෲජනානු ශාසනය කරන්නේ 'කවග්ගමොලි අලිනං' යනාදිකීය)

29 කවග්ග, බ්‍රහ්ම සමූහයාගේ; මොලිඅලිනං, කිරීටනමැති භෘඞ්ගයන් විසින්; සෙවිත, සෙවනාලද; පාදපඞ්කජං, පාපියුම් ඇති; කින්ද, (බ්‍රහ්මපාරිසජ්ජාදි) බ්‍රහ්මයන්ට ඉන්ද්‍රවූ මහා බ්‍රහ්මයා; අතිකින්ද, (ඔවුන්ට) අතිරෙක (පරිත්තාභාදි විතීය ධ්‍යානභූමික බ්‍රහ්මයන්ට) ඉන්ද්‍රවූ (අකනිෂ්ඨ බ්‍රහ්මයන් අවසන් කොටඇති තෘතීයධ්‍යානභූමිකාදි) බ්‍රහ්මයා; කින්දස්ස, (ඔවුන් ගෙන් අධිකවූ වඩනලද සමාපත්තීන්ඇති අග්‍රශ්‍රාවකාදි) බ්‍රහ්මයා යන මොවුන්ට ඉන්ද්‍රවූ; මුනිසෙට්ඨස්ස, සර්වඥ ශ්‍රෙෂ්ඨ යාගේ; සාසනෙ, (පර්‍ය්‍යාප්ති) ශාසනයෙහි.

30 කවග්ග, ක (කාරයෙන් උපලක්ෂිතවූ) වර්ගයාගේ; පච්චෙකත්ථානං; වෙන්වෙන්වූ අර්ථ (ඇති අභිධෙය) යන්ගේ; සාරසම්භවං, සාරයට හෙතුවූ; නො, අපගේ; නිච්ඡයං, විනිශ්චයට; සද්ධාඤාණදයොපෙතා, සැදැහැ නැණ කුළුණෙන් යුක්තවූ; සජ්ජනා, සත්පුරුෂ ජනයෝ; මොදයන්තු, සතුටු වෙත්වා.

# කවර්ගය සමාප්තයි.

——000——

(මෙසේ කවර්ගයාගේ අර්ථවිශෙෂ දක්වා දැන් කච්චායනාදි යෙහි කියනලද ක්‍රමයෙන් චවර්ගයාගේ අර්ථවිශෙෂ දක්වන් නේ 'චන්දචොර නිම්මලෙසු' යනාදි කීය.)

31 චන්දචොරනිම්මලෙසු චොතන්තිමෙසුචංමතං
කාරියෙකාරිනොත්‍යස්ස පදිස්සති පයොගතො.

31 චො, (පුල්ලිඞ්ග) 'ච' කාරතෙමේ; චන්ද, චන්ද්‍රය; චොර, චෞරය; නිම්මලෙසු, නිර්මලය යනමොවුන් කෙරෙහි; (වේ) චං, (නපුංසකලිඞ්ග) 'ච' කාරතෙමේ; තන්තිමෙසු, අන්ධකාරයෙහි, (වේයයි) මතං, දන්නාලද්දේය; කාරිනො, කාර්‍ය්‍යඵලලබන්නාවූ; ත්‍යස්ස, ත්‍යකාරයාගේ; කාරියෙ, කාර්‍ය්‍යයෙහි; පයොගතො, (කච්චායනාදියෙහි) ප්‍රයොගවශයෙන්; පදිස්සති, දක්නා ලැබේ.

(එහි "චන්දදෙවී" යනාදියෙහි 'ච' කාරතෙමේ චන්ද්‍රයාකෙරෙහි වැටේ; (:චොවිය චන්දෙවිය පසන්නානං ඵුසන්තානක්ඛව පුරිසානං රාග පීති සොමනස්සයුත්තං මනංදෙතීති චන්දෝ:, චොව්යයි සේයි; චන්දෙව්ය, චන්ද්‍රයාමෙන්; පසන්නානං, දක්නාවූද; ඵුසන්තානක්ඛව, ස්පර්ශකරන්නාවූද; පුරිසානං, පුරුෂයන්ට; රාග පීති සොමනස්සයුත්තං, රාග ප්‍රීති සෞමනස්‍යයෙන් යුක්තවූ; මනං, සිත; දෙතිඉති, දේනුයි; චන්දෝ, චන්ද්‍රනම්;(මෙහි 'චඳ'යි කියනුකෙනෙහි නිඝණ්ඨාගමද ඕහට තදවගීනනාදෙශද කොට 'චන්ද' යනු වේ) "චක්කාවුධං-චක්කංභවතිමත්ථකෙ" යනාදියෙහි සොරහු කෙරෙහි වැටේ;(:චං චොරං කිනාති හිංසති එතෙනාති චක්කං:, එතෙන, මේකාරණකොටගෙණ; චංයි සේයි; චොරං, සොරාට; කිනාතියි සේයි; හිංසතිඉති, හිංසාකෙරේනුයි; චක්කං, චක්කනම්) "අනුත්තරං ධම්මචක්කං" යනාදියෙහි නිර්මලයෙහි වැටේ (:වෙනෙය්‍යසන්තානෙසු අජ්ඣාසය සීලාදීනං චං නිම්මලං පරිසුද්ධං කරෙති එතෙනාති චක්කං:; එතෙන, මේ කාරණකොට ගෙණ; වෙනෙය්‍යසන්තානෙසු, විනෙයජන සන්තානයන්හි; අජ්ඣාසයසීලාදීනං. අධ්‍යාසයසීලාදීන්ගේ; චංයි සේයි; නිම්මලංයි සේයි; පරිසුද්ධං කරෙතිඉති, පිරිසිදුකෙරේනුයි; චක්කං, චක්කනම්;)"ධම්මචක්කං" යනමෙහිම චකාරතෙමේ අන්ධකාරයෙහිදවැටේ(:වෙනෙය්‍යසන්තානෙසුචංතන්තිමං අවිජ්ජන්ධකාරං කිනාති හිංසති එතෙනාති චක්කං:; එතෙන, මේ කාරණකොටගෙණ; වෙනෙය්‍යසන්තානෙසු, විනෙයජන සන්තානයන්හි; චංයි සේයි; තන්තිමංයි සේයි; අවිජ්ජන්ධකාරං, මොහාන්ධකාරයට; කිනාතියි සේයි; හිංසතිඉති, හිංසාකෙරේනුයි; චක්කං, චක්කනම්.) වැලිදු.

**32** චිචයෙචියනෙධංසෙපගුණුච්චිනනෙතථා
චඩ්ඪනෙචුතුචචනෙ පදිස්සතිපයොගතො.

"කුමුදංචොපුප්ඵයතිචෙනෙනතිචාපරධනං
චංසීලංසුද්ධසත්තානංදීපාලොකෙනචංහතං."

(යනාදියෙහි 'ච' කාරතෙමේ යථා ක්‍රමයෙන් චන්‍ද්‍රචෞර නිර්මල අන්ධකාරයන්හි වැටේ.)

චො, චන්ද්‍රතෙමේ; කුමුදං, කෞමුදය; පුප්ඵයති, විකශනය කෙරේ; චා, සොරහු; පරධනං, අනුන්ගේ ධනය; චෙනෙන්ති, සොරකම් කෙරෙත්; සුද්ධසත්තානං, ලජ්ජීපෙසල භික්ෂු ආදීන්ගේ; සීලං, සීලයතෙමේ; චං, පිරිසිදුවේ; දීපාලොකෙන, ප්‍රදීපාලොකය විසින්; චං, අන්ධකාරයතෙමේ; හතං, නසනලද්දේය.

"සබ්බො'ච' න්ති—යවතංතලන දකාරානං බ්‍යඤ්ජනානි 'ච' ල ඤ ජකාරත්තං" යනාදි සූත්‍රයන්හි 'ච'කාරතෙමේ කාය්‍ය්‍යීය ලබන්නාවූ න්‍යකාරයාගේ කාය්‍ය්‍යීයෙහි වැටේ. (මෙහි 'ච' කාරතෙමේ. "ඉචණ්ණුචණ්ණොජ්ඣලා" යනාදියෙහි 'ඣල' ශබ්දාදීන්මෙන් රූඪිශබ්දයෙකැයි දතයුතු.)

**32** චි, 'චි'යන ධාතුතෙමේ; චයෙ, රැස්කිරීමෙහිද; චියනෙ, ඉෂ්ටකාදීන් රැස්කිරීමෙහිද; ධංසෙ, නැසීමෙහිද; පගුණෙ, ප්‍රගුණකිරීමෙහිද; උච්චිනනෙ, මල් නෙලීමෙහිද; තථා, එසේම; චඩ්ඪනෙ; වැඩීමෙහිද, (වේ) චුතු, 'චු' යන ධාතුතෙමේ වනාහි; චවනෙ, චුතවීමෙහි, (වේයයි) පයොගතො, (පෙල අටුවාදීයෙහි) ප්‍රයොගවශයෙන්; පදිස්සති, දක්නා ලැබේ.

("සමුචිනොති-උපචිතංපුඤ්ඤං—කම්මස්ස උපචිතත්තා—ආචිනාතිචතංපුඤ්ඤං" යනාදියෙහි 'චි' යනධාතුතෙමේ රැස්කිරීමෙහි වැටේ; "චිනාති—පාකාරෙචිතො" යනාදියෙහි ඉෂ්ටකාදීන් රැස්කිරීමෙහි වැටේ. "අපචයගාමිනො ධම්මා" යනාදියෙහි නැසීමෙහි වැටේ. "පරිචිතා" යනාදියෙහි ප්‍රගුණකිරීමෙහි වැටේ. "පුප්ඵානිඔචිනිත්වාති—සමෙපුරිසානුචූතෙන සබ්බ ඒකෙකනිච්චිතා" * යනාදියෙහි මල්නෙලීමෙහි වැටේ. "සංයමතො වෙරං නචීයති" යනාදියෙහි වැඩීමෙහි වැටේ. "සතෙනාචචතිච උපපජ්ජතිච-චුතිචිත්තං-දරතොපබ්බතා තොවා රුක්ඛාතො පතිතො නාරෙ 'චුතො' පතිට්ඨංලභති" යනාදීයෙහි 'චු' යන ධාතුතෙමේ චුතවීමෙහි වැටේ.

* ඒකෙකනිච්චිතා—සමහර.

33 සමුච්චයෙබ්‍යතිරෙකෙ විකප්පත්ථාවධාරණෙ
වාක්‍යාරම්භානුකඩ්ඪනෙ පදපූරෙච දිස්සති
සංසයත්ථෙච නිපාතො චෙකාරෙතිපකිත්තිතො.

---

33 ච, (නිපාතවූ) ‘ච’ කාරතෙමේ; සමුච්චයෙ, සමුච්චයාර්ථයෙහිද; බ්‍යතිරෙකෙ, ව්‍යතිරෙකාර්ථයෙහිද; විකප්පත්ථෙ, විකල්පාර්ථයෙහිද; අවධාරණෙ, අවධාරණයෙහිද; වාක්‍යාරම්භ, උපන්‍යාසයෙහිද; අනුකඩ්ඪනෙ, අනුකඩ්ඪනයෙහිද; පදපූරෙ, පදපූරණයෙහිද; දිස්සති, (පෙලඅටුවාදියෙහි ප්‍රයොග වශයෙන්) දක්නාලැබේ; නිපාතො, නිපාතවූ; චෙකාරෙ, ‘චෙ’කාරතෙමේ; සංසයත්ථෙචඉති, සංශයාර්ථයෙහි; (චේයයි) පකිත්තිතො, කියනලද්දේය.

(“මිත්තාමච්චා ‘ච’ භත්තා ‘ච’ පුත්තදාරා ‘ච’ බන්ධවො” යනාදියෙහි නිපාතවූ ‘ච’ කාරතෙමේ සමුච්චයාර්ථයෙහි වැටේ.)

“යො ‘ච’ බුද්ධඤ්ච ධම්මඤ්ච සංඝඤ්ච සරණංගතො
චත්තාරි අරියසච්චානි සම්මප්පඤ්ඤාය පස්සති.

එතංඛො සරණංඛෙමං එතංසරණ මුත්තමං
එතංසරණ මාගම්ම සබ්බදුක්ඛාපමුච්චති.

නවෙකදරියා දෙවලොකං වජන්ති
බාලාහවෙනප්පසංසන්තිදානං
ධීරො ‘ච’ දානං අනුමොදමානො
තෙනෙවසො හොති සුඛී පරත්ථ.

යනාදියෙහි ‘යොච’ යනුයෙහිද, ‘ධීරොච’ යනු යෙහිද ව්‍යතිරෙකාර්ථයෙහි වැටේ. “ආරොහිම්හිච” යනාදියෙහි විකල්පාර්ථයෙහි වැටේ. “ඝණොච” යනාදියෙහි අවධාරණයෙහි වැටේ. “පඨමසඞ්ගීතිනාමචෙසා” යනාදියෙහි වාක්‍යාරම්භයෙහි වැටේ. “පුබ්බොච—සමයෙච” යනාදියෙහි අනුකඩ්ඪනයෙහි වැටේ. “යථාචවන්දෙ බුද්ධස්සපාදපඞ්කෙරුහම්පිච” යනාදියෙහි පදපූරණයෙහි වැටේ. “නිට්ඨිතචීවරස්මිං පන භික්ඛුනා උබ්භතස්මිං කඨිනෙ එකරත්තම්පි ‘චෙ’ භික්ඛු තිචීවරෙන විප්පවසෙය්‍ය අඤ්ඤත්‍රභික්ඛුසම්මුතියා නිස්සග්ගියං පාචිත්තියං” යනාදියෙහි නිපාතවූ ‘චෙ’කාරතෙමේ සංශයාර්ථයෙහි වැටේ.)

34 ඡො පච්චයෙ කාරියෙච ඡෙදනෙ ආහුරුළ්හියා
ඡාතු ඛුද්දාපිපාසාසු ඡිදිත්තිසිත නිච්ඡයෙ
පටිච්ඡනෙ ඡෙදනෙච ඡුතින්ත ඡීනඡෙදනෙ.

---

(මෙසේ 'ච' කාරයාගේ නානාර්ථත්වය දක්වා දැන් 'ඡ' කාරයාගේ නානාර්ථත්වය දක්වන්නේ 'ඡො පච්චයෙකාරියෙච' යනාදිය කීය.)

34 ඡො, 'ඡ' ශබ්දතෙමේ; පච්චයෙ (නවවිධ ධාතු ප්‍රත්‍යයන්හි අන්තර්ගතවූ) ප්‍රත්‍යයෙහිද; කාරියෙච, ('ගමුරමු' යනාදීන් සම්බන්ධවූ ධාත්වන්ත මකාරාදියගේ) කාර්‍ය්‍යයෙහිද; ඡෙදනෙ, සිඳීමෙහිද; රුළ්හියා, රුළ්හිවශයෙන්; (වේයයි) ආහු, කියත්; ඡාතු; 'ඡා' යන ධාතුතෙමේ වනාහි; ඛුද්දාපිපාසාසු, සා පිපාසා දෙක්හි; (වේ) ඡී, 'ඡී' යන ධාතුතෙමේ; දිත්ති, බැබලීමය; සිත, සංසිඳීමය; නිච්ඡයෙ, නිශ්චයකිරීමය යනමෙහිද; පටිච්ඡනෙ, පිළිගැන්මෙහිද; ඡෙදනෙච, සිඳුමෙහිද; (වේ) ඡු, 'ඡු' යන ධාතුතෙමේ; තින්ත, වැගිරීමය; ඡීන, පිරිහීමය; ඡෙදනෙ, සිඳීමය යනමෙහි; (වේ.)

(එහි "තිජ්ජුපකිතමානෙහිඛ 'ඡ' සාවා" යනාදියෙහි 'ඡ'කාරතෙමේ නවවිධ ධාතු ප්‍රත්‍යයන්හි අන්තර්ගතවූ ප්‍රත්‍යයෙහි වැටේ. "ගම්ස්සනෙතා 'ඡො' වා–ඉසුයමූ තමනෙතා 'ඡො' වා * යනාදියෙහි 'ගමුරමු' යනාදීන් සම්බන්ධවූ ධාත්වන්ත මකාරාදියගේ කාර්‍ය්‍යයෙහි වැටේ. "රුක්ඛඡල්ලි" යනාදියෙහි සිඳීමෙහි වැටේ. (:ඡං කුච්ඡිරොගාදිකස්ස ඡෙදනං ලාතීති ගණ්හාතීති ඡල්ලි:, ඡං සිසේයි; කුච්ඡිරොගාදිකස්ස, කුක්ෂිරෝගාදියගේ; ඡෙදනං, සිඳීම; ලාතියි සේයි; ගණ්හාතිඉති, ගනීනුයි; ඡල්ලි, ඡල්ලිනම්) "භත්තච්ඡාතො–උදකච්ඡාතො" යනාදියෙහි 'ඡා' ධාතුතෙමේ ක්‍රමයෙන් සාපිපාසාදෙක්හි වැටේ. "කිරීටරතනච්ඡායානුවිද්ධාතපවාරණෙ" යනාදියෙහි 'ඡී' ධාතුතෙමේ බැබලීමෙහි වැටේ. (:ඡීයති දිප්පතීති ඡායා:; ඡීයතියි සේයි; දිප්පතිඉති, බබලානුයි; ඡායා; ඡායානම්; (ඡායානම් ප්‍රභායි) "පබ්බතච්ඡායා–රුක්ඛච්ඡායා" යනාදියෙහි සංසිඳීමෙහි වැටේ. (:ඡීයති සරීරං උපසමෙති අත්තප්පතිට්ඨානං සත්තානන්ති ඡායා:; අත්තප්පතිට්ඨානං, තමා පිහිටකොට ඇති; සත්තානං, සත්වයන්ගේ; සරීරං, සිරුර; ඡීයතියි සේයි; උපසමෙතිඉති, සංසිඳේ

---

* { ගම්ස්සනෙතාවෙඡාවා / ඉසුයමූනමනෙතාවෙඡවා } තිපිටකපොත්ථකෙසු—දිස්සති.

35 ජෙජෙතරිකාරියෙච වෙගිතෙ ජාභිවෙජිතෙ
ජයෙ පරාජයෙඤ්ඤතු ජෙය්‍යදීත්තිගතිසුච
ජෙඛයෙජෙතුසාමීනං දූසීනාමනන්තනෙභවෙ.

---

නුයි; ජායා, ජායානම්;) "තත්‍රායං විනිච්ඡයො—නිච්ඡයක්ඛු නිපුනත්‍ථවිනිච්ඡයනන්ති" යනාදියෙහි නිශ්චයකිරීමෙහි වැටේ. "සම්පටිච්ඡනච්චිත්තං—සම්පටිච්ඡි" යනාදියෙහි පිළිගැන්මෙහි වැටේ. "තත්‍රායං විනිච්ඡයො" යනාදියෙහි සිඳීමෙහිදවැටේ. (:විනිච්ඡිනොති එතෙනාති විනිච්ඡයො:; එතෙන, මේකරණ කොටගෙණ; විනිච්ඡිනොතිඉති, සිඳිනුයි; විනිච්ඡයො, විනිච්ඡයනම්; (විනිච්ඡයනම් සංශයච්ඡෙදක ඥනයි) "ජවස්සස යනංසුසානං—ජවසරීරෙ" යනාදියෙහි 'ජු' ධාතුතෙමේ වැගිරීමෙහි වැටේ. (:ජවති තිනතති අවස්සවති ලොහිතාසව පුබ්බාදීති ජවො:; ජවතියි සේයි; තිනතතියි සේයි; ලොහිතාසවපුබ්බාදි, රුධිරාසව පූයාදිය; අවස්සවතිඉති, වැගිරේනුයි; ජවො, ජවනම්;) "ජවජනො-ජවසතෙනා" යනාදියෙහි පිරිහීමෙහි වැටේ. (:ජවතිහායතිසාසවජ්ජාදනාදීහි සද්ධාදිගුණෙහි චාති ජවො:; ජවතියි සේයි, සාසවජ්ජාදනාදීහි, කැමැළිමාදියෙන්ද; සද්ධාදිගුණෙහිච, ශ්‍රද්ධාදි ගුණයෙන්ද; හායතිඉති, පිරිහේනුයි; ජවො, ජවනම්;) "ජවසරීරං" * යනාදියෙහි සිඳීමෙහි වැටේ. (:ජවති ජිනාති පසන්නානං සායන්තානඤ්ච ජනානං පීති සොමනස්සයුත්තං මනන්ති ජවො:; ජවතියි සේයි; පසන්නානං, දක්නාවූද; සායන්තානඤ්ච, සිඹින්නාවූද; ජනානං, ජනයන්ගේ; පීතිසොමනස්සයුත්තං, ප්‍රීතිසෞමනස්‍යයෙන් යුක්තවූ; මනං, සිත; ජිනාතිඉති, සිඳිනුයි; ජවො, ජවනම්; (මෙහි ප්‍රත්‍යයෙහිද කාර්‍ය්‍යයෙහිද සිඳීමෙහිද පැවති 'ජ' ශබ්දතෙමේ රූඪිශුද්ධ නාමපදයෙක-ඤ්ඤුධාදියෙහි වැටෙන්නාවූ 'ජා' ජි 'ජු' යන ශබ්දයෝ ධාතුපදයෝයයි දතයුතුහ)

(මෙසේ 'ජ' කාරයාගේනානාර්ත්‍ථවයදක්වා දැන් 'ජ' කාරයාගේ නානාර්ත්‍ථවය දක්වන්නේ 'ජෙ ජෙතරිකාරියෙච' යනාදිකිය.)

35 ජෙ, 'ජ'කාරතෙමේ; ජෙතරි, (වෛරීන්) දිනන්නහුකෙරෙහිද; කාරියෙච, (වුද්ධශබ්දාදීන්ගේ) කාර්‍ය්‍යයෙහිද; වෙගිතෙ, යුහුව යාමෙහිද; (වේ) ජි, 'ජි' යනධාතුතෙමේ; අභිවෙජි

---

* සමහරු චනාභි ගත්‍යර්ත්‍ථවූ 'ජව' ධාතුවෙන් 'ජව' ශබ්දය සිද්ධයයි කියත්.

නෙ, අභිභවනයෙහිද; ජයෙ, දිනීමෙහිද; පරාජයෙ, පැරදීමෙහිද; (වේ) ජූතු, 'ජු'යනධාතුතෙමේ වනාහි; ථෙය්‍ය, සොරකම් කිරීමය; දිතති, බැබළීමය; ගතිසූච, යාමය යනමෙහිද; (වේ) ජෙ, 'ජෙ' යනධාතුතෙමේ; ඛයෙ, ක්ෂයවීමෙහි; (වේ) ජෙතු, 'ජෙ' යන නිපාතතෙමේ වනාහි; සාමීනං. ස්වාමීන්ගේ දාසීනං, දාසීන්ට; අමන්තනෙ, අමන්ත්‍රණය කිරීමෙහි; භවෙ, වන්නේය.

(එහි "ජනතාසරං"යනාදියෙහි'ජ'කාරතෙමේ වෛරීන්දිනන්නාහුකෙරෙහිවැටේ. (:ජෙරොගවෙරිජෙතාරෙජනෙතායතීතිජනතා; ජනතාවතංසරඤ්ඤාතිජනතාසරං: ජෙයි සේයි;රොගවෛරිජෙතාරෙ, රොගවෛරීන් දිනන්නාවූ; ජනෙ, ජනයන්; තායති ඉති, රක්ෂාකෙරේනුයි; ජනතා, ජනතානම්; ජනතාවතං, ජනතාවූයේද ශේතෙමේය; සරඤ්ඤව ඉති, ගෘහවූයේද ශේතෙමේනුයි, ජනතාසරං, ජනතාසරනම්) "වුද්ධස්ස 'ජො' ඉසිවෙඨස්සු" යනාදියෙහි වෘද්ධශබ්දාදීන්ගේ කාර්‍ය්‍යයෙහි වැටේ; (ඉසිවෙඨස්සු, 'ඉය-ඉට්ඨ' ප්‍රත්‍යයන් පරකල්හි; වුද්ධස්ස, වුද්ධශබ්දයන්හට, ජො, 'ජ'කාරාදේශ වේ—එසින්ම–"ජෙය්‍යො–ජෙට්ඨො" යනාදි සිද්ධයි)—"මිගජාලං-මච්ඡජාලං" * යනාදියෙහි යුහුව යාමෙහි වැටේ. (:ජෙසීඝගතෙධාවනෙත මිගාදයොලාති ගණ්හාති එතෙනාති ජාලං:; ජෙයි සේයි; සීඝගතෙයි සේයි; ධාවනෙත, දිවත්නාවූ; මිගාදයො, මෘගාදීන්; එතෙන, මේ කරණකොටගෙණ; ලාතියි සේයි; ගණ්හාති ඉති; ගනිනුයි, ජාලං, ජාලනම්;) "කිලෙසවෙරීජිනො" යනාදියෙහි 'ජි'ධාතුතෙමේ අභිභවනයෙහි වැටේ. "ජිනො-මාරජී" යනාදියෙහි දිනීමෙහි වැටේ. "බුද්ධසමාපරාජෙන්ති අක්ඛුතිත්ථියා" යනාදියෙහි පැරදීමෙහි වැටේ. "ජූතංකීළති—ජූතකාරකො" † යනාදියෙහි 'ජු' ධාතුතෙමේ සොරකම් කිරීමෙහි වැටේ. (:ජවතිථෙය්‍යං කරොති එතෙනාති ජූතං:; ජවතියි සේයි; එතෙන, මේ කරණකොටගෙණ; ථෙය්‍යං කරොති ඉති, සොරකම් කෙරේනුයි; ජූතං ජූතනම්; (ජූතනම් ජූතකෘත්‍යයි;) "විජ්ජු—ජොති" යනාදියෙහි බැබළීමෙහි වැටේ.

---

* ඇතැම් ආචාර්‍ය්‍යයෝ මෙය 'ජලපාවනෙ' යන ධාතුවෙන් සිද්ධයයි කියත්.

† ජූතංකීළති—ජූතකාරකො–යී හාස්‍ය වශයෙනුදු සමහරු ව්‍යවහාර කරති.

36 සඞ්ඛායකුව ඛොවාත්‍යඛ නවෙඨගීතරිවාපරෙ
ඛෙතු උජ්ඣානඩයහනෙ සූණදිත්තිවිනතාසුව
සජ්ඣායොප නිජ්ඣානෙසුවෙදිතබ්බො විභාවිනා.

(:ඛණෙඛණෙ විසෙසෙන ජවති දිප්පතීති විජ්ජු:; ඛණෙ ඛණෙ, ක්‍ෂණ ක්‍ෂණයෙහි; විසෙසෙන, වෙසෙසින්; ජවතිධි සේධි; දිප්පතීති, බබලාතුයි; විජ්ජු, විජ්ජුනම්; (විජ්ජුනම් විදුලියයි) :ජවති ඔභාසතීති ජෙති:; ජවතිධි සේධි; ඔභාසති ඉති, බබලාතුයි; ජෙති, ජෙතිනම්; (ජෙතිනම්-ප්‍රභායි-ගිනි හෝ වේ;) "සනතක්ඛන්තං ජවනා නිමගතාඞ්ක්ෂු සකිංමතා" යනාදියෙහි යාමෙහි වැටේ. (:ජවන්ති ගච්ඡන්ති පවත්තන්ති ති ජවනානි:; ජවන්තිධි සේධි; ගච්ඡන්තිධි සේධි; පවත්තන්ති ඉති, පවතිත්තුයි; ජවනානි, ජවනයෝනම් වෙත්;) "ජයපා නං"යනාදියෙහි 'ජෙ'ධාතුතෙමේ ක්‍ෂයවීමෙහි වැටේ;(:ජයෙ වෙරීඛයෙපිවිතබ්බං පානං, ජයපානං:, ජයෙධි සේධි; වෙරී ඛයෙ, වෛරීන් ක්‍ෂයවූකල්හි; පිවිතබ්බං, පියයුතුවූ; පානං, පානයතෙමේ; ජයපානං, ජයපානනම්;) "වෙදනං එරුසං ජනි" යනාදියෙහිද 'ජෙ'ධාතුතෙමේ ක්‍ෂයවීමෙහි වැටේ. "ස චෙ'ජෙ' සච්චං භණසි අදුසිතංකරොමි" යනාදියෙහි නිපාතවූ 'ජෙ' කාරතෙමේ ස්වාමීන්විසින් දැසීන්ට ආමන්ත්‍රණය කිරීමෙහි වැටේ.)

(මෙසේ 'ජ'කාරයාගේ නානාර්ථයදක්වා දැන් 'ඛ' කාරයාගේ නානාර්ථයදක්වන්නේ 'සඞ්ඛායකුවඛොවාත්‍යඛ' යනාදි කීය.)

36 ඛො, 'ඛ' කාරතෙමේ; සඞ්ඛායකුව, සන්ධ්‍යාවෙහිද; වාතෙ, වාතයෙහිද; නවෙඨ, නැසීමෙහිද; අපරෙ, අන්‍යවූ; ගීතරිච, ගායනාකරන්නාහුකෙරෙහිද;අඛ වේ; ඛෙතු, 'ඛෙ' යනධාතුතෙමේ වනාහි; උජ්ඣාන, කිපීමය; ඩයහනෙ, ඩැහැමය යනමෙහිද; සූණ, දූනිමය; දිත්ති, බැබලීමය; විනතාසුව, සිනිමය යනමෙහිද; සජ්ඣාය, හැදෑරීමය; උපනිජ්ඣානෙසු, උපන්ද්‍ධ්‍යානය යනමෙහිද; (වේයයි) විභාවිනා, පණ්ඩිතයා විසින්; වෙදිතබ්බා, දතයුත්තේය.

(එහි "සඞ්ඛාතුරගිනා * විජ්ජුජ්ජලජලිතීකුවාපාවනඛෙන" යනාදියෙහි "සඞ්ඛා" යනමෙහි 'ඛා' ශබ්ද තෙමේ

* සජ්ඣාතුරගිනා-සීත් පාඨයි.

සන්ධ්‍යාවෙහි වැටේ. (:සංසොභාඣාසඤ්ඣා:; සංයි සේයි; සොභා, යහපත්වූ; ඣා, සන්ධ්‍යාතොමෝ; සඤ්ඣා, සඤ්ඣානම්;) "ඣේරිතොව වනප්පති" යනාදියෙහි 'ඣ'කාර තෙමේ වාතයෙහිවැටේ. (:ඣෙනවාතෙනාඊරිතො කම්පිතො ඣේරිතො:; ඣෙනයි සේයි; වාතෙන, වාතය කරණකොටගෙණ; ඊරිතොයි සේයි; කම්පිතො, කම්පාවනලද්දේ; ඣේරිතො, ඣේරිතනම්;) "වඤ්ඣාභූතී" යනාදියෙහි විනාසයෙහි වැටේ. (:වොපූතෙනා ඣොනට්ඨායායසාවඤ්ඣා:; වොයි සේයි; පූතෙනා, පුත්‍රතෙමේ; ඣොයිසේයි; නට්ඨා, නැසුනේ; යාය, යමක්හුගේද; සා, හෝතොමෝ; වඤ්ඣා, වඤ්ඣානම්;) වැලිඳු.

"ඣාතූරඟී හෙමාචලො මන්දජ්ඣාවායතී සදා,
ඣාභොගා අනිබ්බුතානං ඣොසූත්‍යං ගායතීසමං."

(යනමෙහි 'ඣ' කාරතෙමේ යථාක්‍රමයෙන් සන්ධ්‍යාවාතවිනාස ගායනා කරන්නන්කෙරෙහි වැටේ )

හෙමාචලො, ස්වර්ණ(මෙරු)පර්වතතෙමේ; ඣාතූරඟී, සන්ධ්‍යාතූරඟීවේ; මන්දජ්ඣා, මන්දමාරුතතෙමේ; සදා, හැමකල්හි; වායති, යේ; අනිබ්බුතානං, (සන්නිබ්බුතාදිවශයෙන්) අනිබ්බුතජනයන්ගේ; භොගා, සම්පත්තීහු; ඣා, විනාසවෙත්; ඣො, ගායකතෙමේ; සූත්‍යං, යහපත්වූ ගීතය; සමං, සමකොට; ගායති, ගයනාකෙරේ.

"දෙවුජ්ඣාපනං—උජ්ඣානසඤ්ඤී" යනාදියෙහි 'ඣෙ'යන ධාතු තෙමේ කිපීමෙහි වැටේ. "කම්මාරානං යථාඋක්කා අන්තො ඣායතිනොබහි" යනාදියෙහි ඩැහැමෙහි වැටේ. "නනිජ්ඣානං ඛමන්ති—නිජ්ඣානං පඤ්ඤං—නිජ්ඣානබලාපණ්ඩිතා" යනාදියෙහි දැනීමෙහි වැටේ. "පදීපොඣායති" යනාදියෙහි බැබලීමෙහි වැටේ. "ඣානංභාවෙති—දුක්ඛී දුම්මනො විප්පටිසාරී පජ්ඣායති" යනාදියෙහි සිතීමෙහි වැටේ. "අසජ්ඣායමලා මන්තා" යනාදියෙණ් හැදෑරීමෙහි වැටේ. "උපජ්ඣායො" යනාදියෙහි උපනිධ්‍යානයෙහි වැටේ. (:අන්තෙවාසික සද්ධිවිහාරිකානං වජ්ජාවජ්ජං උපනිජ්ඣායතීති උපජ්ඣායො:; අන්තෙවාසික සද්ධිවිහාරිකානං, අතවැසි සද්ධිවිහාරිකයන්ගේ; වජ්ජාවජ්ජං, වරදනිවරද; උපනිජ්ඣායතිඉති, උපනිධ්‍යානය කෙරේනුයි; උපජ්ඣායො, උපජ්ඣායනම්;)

(මෙසේ 'ඣ' කාරයාගේ අනෙකාර්ථවාචකත්වය දක්වා

37 ඤකාරෙඝොරරවෙථ පච්චයෙන්‍යස්සකාරියෙ
ඤාත්වාවධාරණෙඤාණෙ සඤ්ඤාණෙ ච විජානනෙ
මාරණෙතොසනෙචාපි නිසෙනිසාමනෙ තථා.

---

දැන් 'ඤ' කාරයාගේ අනෙකාර්ථවාචකත්වය දක්වන්නේ 'ඤකාරෙඝොරරවෙථ' යනාදි, කිය.)

37 ඤකාරෙ, (නාමපදවූ) 'ඤ'කාරතෙමේ; ඝොරරවෙ, දරුණුශබ්දයෙහිද; පච්චයෙ, (තද්ධිත) ප්‍රත්‍යයෙහිද; න්‍යස්ස, න්‍යකාරයාගේ; කාරියෙ, කාර්‍ය්‍යයෙහිද; අථ, වේ; ඤාතු, 'ඤා' යන ධාතුතෙමේ වනාහි; අවධාරණෙ, අවධාරණයෙහිද, ඤාණෙ, දැනීමෙහිද; සඤ්ඤාණෙච, හැඳිනීමෙහිද; විජානනෙ, විජානනයෙහිද; මාරණෙ, මැරීමෙහිද; තොසනෙචඅපි, සතුටුවීමෙහිද; නිසෙ, තියුනුකිරීමෙහිද; තථා, එසේම; නිසාමනෙ, (භාණ්ඩ) තැබීමෙහිද; (වේ.)

(එහි "ධඤ්ඤ පුඤ්ඤලක්ඛණ සම්පණ්ණා" යනමෙහි 'ධඤ්ඤං' යනපෙදෙහි 'ඤ' කාරතෙමේ දරුණුශබ්දයෙහි වැටේ. (:ධරතිපවත්තති ඤෙ අබ්භුග්ගතකිත්තිඝොසසඞ්ඛාතො ඝොරරවොඑතෙනාති ධඤ්ඤං:; ඤෙයිසේසි; අබ්භුග්ගතකිත්ති ඝොස සඞ්ඛාතො, නැංගාවූ කීර්ත්තිඝොෂ සඞ්ඛ්‍යාතවූ; ඝොරරවො, දරුණුශබ්ද තෙමේ; ධරතියි සේයි; එතෙන, මේ කරණකොට ගෙණ; පවත්තතිඉති, පවතීනුයි; ධඤ්ඤං, ධඤ්ඤනම්; (ධඤ්ඤනම් ශූනයි) "කොණ්ඩඤ්ඤො" * යනාදියෙහි තද්ධිත ප්‍රත්‍යයෙහි වැටේ. "යවතං තලනාදකාරානං බ්‍යඤ්ජනානි 'ච' ලඤ ජකාරත්තං" යනාදියෙහි න්‍යකාරයාගේ කාර්‍ය්‍යයෙහි වැටේ. "එවංජානාති ධානිය" යනාදියෙහි 'ඤා' ධාතු තෙමේ අවධාරණයෙහි වැටේ. "පඤ්ඤා—ඤාණං" යනාදියෙහි දැනීමෙහි වැටේ. "එසෙසා වෙදනා සඤ්ඤා" යනාදියෙහි හැඳිනීමෙහි වැටේ. "විඤ්ඤාණං" යනාදියෙහි විජානනයෙහි වැටේ. "ජපඤ්ඤත්තියො—ධනධපඤ්ඤත්ති—පෙ—පූගලපඤ්ඤත්ති" යනාදියෙහිද—"විනයපඤ්ඤත්ති" යනාදියෙහිද, මැරීමෙහිද, සතුටුවීමෙහිද, තියුනුකිරීමෙහිද; තැබීමෙහිද, වැටේ. (:පකාරතො වෙනෙය්‍යසන්තානෙ සුපවත්තං කිලෙසජාලං ඤත්තිමාරෙති: නානප්පකාරතොවා පවත්ති නිවාරණෙන අකුසලානං ධම්මානං ඤත්තිමාරණං

---

* මෙය කච්චායනාදියෙහි 'ණ්‍ය' ප්‍රත්‍යයෙන් සිද්ධයයි කියත්.

පඤ්ඤුත්ති:; පකාරතො, ප්‍රකාරයෙන්; වෙනෙය්‍යසන්තානෙසු, විනෙයජන සන්තානයන්හි; පවත්තං, පැවැත්තාවූ; කිලෙසජාලං, කෙලෙස්සමූහය; ඤූතිසි සේයි; මාරෙතිවා, මරානුයි හෝ; නානප්පකාරතො, නොයෙක් ප්‍රකාරයෙන්; පවත්තිනිවාරණෙන, ප්‍රවෘත්ති වැලැක්මෙන්; අකුසලානං ධම්මානං, අකුශල ධර්මයන්ගේ; ඤූත්තිසි සේයි; මාරණංවා, මැරීම හෝ; පඤ්ඤුත්ති, පඤ්ඤුත්තිනම්; (:පකාරතො වෙනෙය්‍යජනෙ ඤූතිතොසෙති: ධම්මංවා සුණන්තානං ධම්මදෙසනාය චිත්තෙන අනෙකවිධෙන ඤූත්තිභාසනං සොමනස්සුප්පාදනං පඤ්ඤුත්ති: පකාරතො, ප්‍රකාරයෙන්; වෙනෙය්‍ය ජනෙ, විනෙයජනයන්; ඤූතිසි සේයි; තොසෙතිවා, සතුටුකෙරේනුයි හෝ; ධම්මං, ධර්මය; සුණන්තානං, අසන්නවුන්ගේ; චිත්තෙන, සිතෙනි; ධම්මදෙසනාය, දහම්දෙසීමෙන්; අනෙකවිධෙන, නොයෙක්ප්‍රකාරයෙන්; ඤූත්තිසි සේයි, භාසනංසි සේයි; සොමනස්සුප්පාදනංවා, සොම්නස් ඉපදවීම හෝ; පඤ්ඤුත්ති, පඤ්ඤුත්තිනම්;) :පකාරතො වෙනෙය්‍යානං ඤාණං ඤූතිතිසෙතිතික්ඛභාවං කරොති: අතිඛිණබුද්ධීනංවා අනෙකවිධෙන ඤූත්තිනිසානං ඤාණතිඛිණකරණං පඤ්ඤුත්ති:; පකාරතො, ප්‍රකාරයෙන්; වෙනෙය්‍යානං, විනෙය(ජන)යන්ගේ; ඤාණං, ඥානය; ඤූතිසි සේයි; නිසෙතිසි සේයි; තික්ඛභාවං කරොතිවා, තියුනුබැව් කෙරේනුයි හෝ; අතිඛිණබුද්ධීනං, තියුනුනොවූ ප්‍රඥාඇත්තවුන්ගේ; අනෙකවිධෙන, නොයෙක් පරිද්දෙන්; ඤූත්තිසි සේයි, නිසානංසි සේයි; ඤාණතිඛිණකරණංවා; නුවන තියුනුකිරීම හෝ; පඤ්ඤුත්ති, පඤ්ඤුත්ති නම්;) :පකාරතො වෙනෙය්‍ය සන්තානෙසු සද්ධම්මං ඤූතිනිසාමෙති ඨපෙති:, ධම්මංවා සුණන්තානං ධම්මදෙසනාය අනෙකවිධෙන චිත්තෙන සද්ධම්මංඤූත්තිනිසාමනං ඨපනං පඤ්ඤුත්ති:; පකාරතො, ප්‍රකාරයෙන්; වෙනෙය්‍යසන්තානෙසු, විනෙයජන සන්තානයන්හි; සද්ධම්මං, සද්ධර්මය; ඤූතිසි සේයි; නිසාමෙතිසි සේයි; ඨපෙතිවා, තබානුයිහෝ; ධම්මංසුණන්තානං, බණඅසන්නවුන්ගේ; චිත්තෙන, සිතෙහි; ධම්මදෙසනාය, දහම් දෙසීමෙන්; අනෙකවිධෙන, නොයෙක් පරිද්දෙන්; සද්ධම්මං, සද්ධර්මය; ඤූත්තිසි සේයි; නිසාමනංසි සේයි; ඨපනංවා, තැබීම හෝ; පඤ්ඤුත්ති, පඤ්ඤුත්තිනම්;) "කඤ්ඤූ" යනාදියෙහිද 'ඤූ' ධාතුතෙමේ සතුටුවීමෙහි වැටේ.-වාක්‍යය පෙරසේමැයි-මෙහි තථාශබ්දයෙන් 'ඤූ' ධාතුතෙමේ—සිනිකිරීමෙහිද, අනුභවකිරීමෙහිද, අනුඥනීමෙහිද

38 චක්කාතිචක්ක චක්කිඳ චක්කරාජ සම්බන්ධිනො
චක්කසෙට්ඨ චවග්ගත්ථ නිච්ඡයං සාරසම්භවං
සද්ධාඤ්ඤාණ දයොපෙතා සජ්ජනාමොදයන්තුනො.

## චවග්ගං නිට්ඨිතං.

——000——

---

පැවැත්වීමෙහිද, වැටේයයි ගැණේ;) "නත්වංතාතපුදිනනකිඤ්චිදුක්ඛස්ස ජානාසි" යනාදියෙහි සිහිකිරීමෙහිද අනුභව කිරීමෙහිද වැටේ. "අනුඤ්ඤාතොසි මාතාපිතූහි" යනාදියෙහි අනුදැනීමෙහි වැටේ. "පූරාණදුතිකාය තික්ඛත්තුං මෙථුනං ධම්මං අභිවිඤ්ඤාපෙසි" යනාදියෙහි පැවැත්වීමෙහි වැටේ.)

(මෙසේ 'ච'කාරාදි 'ඤ'කාරාන්ත තාලුජ චවග්ගීයාගේ අර්ථවිශෙෂදක්වා දැන් චකාරොපලක්ෂිත තාලුජවග්ගීයාගේ උපලක්ෂිත ආද්‍යක්ෂරපදයෙන් තමාගේ නිශ්‍රය සංවර්ණිතව්‍යවූ ශාස්තෘත්වහන්සේගේ ගුණ සඞ්කීර්තන පූර්වඞ්ගමවූ අනුරූපස්තුතියද ශ්‍රොතෘජනානුශාසනයද කරන්නේ 'චක්කාතිචක්ක චක්කිඳ' යනාදි කීය.)

38 චක්ක, (ප්‍රදෙශෙශ්වර රජුන්ගේ) චක්‍ර (ලක්ෂණ)ය; අතිචක්ක, (ඒ ප්‍රදෙශෙශ්වර රජුන්ට) අතිශයවූ (එකද්වීපෙශ්වර රජුන්ගේ) චක්‍ර (ලක්ෂණ)ය; චක්කිඳ, (චක්‍රරත්නය පවත්වන හෙයින්) අධිපතිවූ (චතුර්ද්වීපෙශ්වරවූ සක්විතිරජුන්ගේ) චක්‍ර (ලක්ෂණ) ය යනමොවුන්ට; චක්කරාජසම්බන්ධිනො, රාජභූතවූ (අෂ්ටාධිකශත) චක්‍ර (ලක්ෂණ) යෙන් යුත් ශ්‍රීපාදයුගමඇති සර්වඥයන්වහන්සේගේ; චක්කසෙට්ඨ, ශ්‍රෙෂ්ඨවූ (ආඥා) චක්‍ර (සඞ්ඛ්‍යාත ශාසන) යෙහි; නො, අපගේ; සාරසම්භවං, සාරයට හෙතුවූ; චවග්ගත්ථ නිච්ඡයං, චවග්ගීයාගේ අභිධෙයාර්ථ සඞ්ඛ්‍යාත විනිශ්චයට; සද්ධාඤ්ඤාණදයොපෙතා, සැදැහැ නැණ කුළුණෙන් යුක්තවූ; සජ්ජනා, සත්පුරුෂජනයෝ; මොදයන්තු, සතුටුවෙත්වා;.

## චවග්ගීය සමාප්තයි.

——000——

(මෙසේ චවග්ගීයාගේ නානාර්ථවාචකත්වය දක්වා දැන් ටවග්ගීයාගේ නානාර්ථවාචකත්වය කච්චායනාදියෙහි දක්වනලද

39 වොරවෙවනතුපුබ්බ්‍යං ඛුරකොටෙපකිත්තිතං
විතුපක්ඛන්දනෙරතෙ ගමනෙතික්ඛණෙ තථා.
40 කම්මකෙඛුවසියා දක්ඛෙ බ්‍යත්තෙ අවජාදනෙපිච
වූතචාභිපීළනෙ ධංසෙ විරූහෙචපකිත්තිතො *

ක්‍රමයෙන් දක්වන්නේ 'වොරවෙවනතුපුබ්බ්‍යං' යනාදිකීය.)

39 වො, (පුල්ලිඞ්ග) 'ව' කාරතෙමේ; රවෙ, ශබ්දයෙහි; අත්, වේ; වංතු, (නපුංසකලිඞ්ග) වකාරතෙමේවනාහි; පුබ්බ්‍යං, පෑවිවියෙහිද; ඛුරකොටෙ, උසුපරිත්‍රානයෙහිද;(වේයයි) පකිත්තිතං, කියනලද්දේය; විතු, 'වි' යනධාතු තෙමේ වනාහි; පක්ඛන්දනෙ, අහසින් යාමෙහිද; ගමනෙ, පසින්යාමෙහිද; තික්ඛණෙ, තියුනුකිරීමෙහිද; තථා, එසේම.

40 කම්මකෙඛුව, කර්මන්‍යයෙහිද; දක්ඛෙ, දක්‍ෂවීමෙහිද; බ්‍යත්තෙ, ව්‍යක්තවීමෙහිද; අවජාදනෙඅපිච, හැඳීමෙහිද; සියා, වන්නේය; වූතු, 'වූ'යනධාතුතෙමේ වනාහි; අභිපීළනෙ, අතිශයින් පෙළීමෙහිද; ධංසෙ, නැසීමෙහිද; විරූහෙච, හට ගැන්මෙහිද; (වේයයි) පකිත්තිතො, කියනලද්දේය.

(එහි "ඛවේවාමිගො" යනාදියෙහි 'ව' කාරතෙමේ ශබ්ද යෙහි වැටේ. (:උග්ගතොවොරවො එතස්සාති ඛවේවා:; උග්ගතො, නැංගාවූ; වොයි සේයි; රවො, ශබ්දතෙමේ; එතස්සඉති, මොහුගේනුයි; ඛවේවා, ඛවවනම්;) වැලිදු.

"කිත්තිවො අබ්භුග්ගතොහොති හරිතාවම්හිරූහතා
ඨපෙ සූවංපාකාරම්හි සරාදිපරිතානකං."

(යනමෙහි 'ව' කාරතෙමේ යථාක්‍රමයෙන් ශබ්දපෑවිවිඋසුප රිත්‍රානයන්හි වැටේ.)

කිත්තිවො, කීර්තිශබ්දතෙමේ; අබ්භුග්ගතොහොති, නැංගේවේ; හරිතා, තනගස්ආදීහු; වම්හි, පෑවිවියෙහි; රූහතා, හටගත්නාලද්දාහුවෙත්; පාකාරම්හි, (නුවර) ප්‍රාකාරයෙහි; සරාදිපරිතානකං, ශරසත්තිආදිය රක්නාවූ; සූවං, යහපත්වූ උසුපරිත්‍රානය; ඨපෙ, තබත්නේය.

"ආකාසෙසකුණාවෙන්ති" යනාදියෙහි 'වි' යනධාතුතෙමේ අහසින්යාමෙහි වැටේ. "වෙන්ති" යනමෙහිපසින් යාමෙහි වැ

* පකිත්තිතා—තිපි කාර්ච් දිස්සති.

**41** මහාරවෙහරෙ සුඤ්ඤෙ චන්දබිම්බෙචඔසියා
ඔම්හි ධාතුම්හිතස්සචකාරියෙඔපකිත්තිතො.

---

වේ. "පටුබ්හොගා" යනාදියෙහි තියුනුකිරීමෙහි වැටේ. "පටුරොගො ජනො" යනාදියෙහි කම්නෘයෙහි වැටේ. "පටුපුරිසො" යනාදියෙහි දක්ෂ බවෙහි වැටේ. "පටුපඤ්ඤ" යනාදියෙහි ව්‍යක්තබවෙහි වැටේ. "නීලොපටො" යනාදියෙහ් හැඳීමෙහි වැටේ. (:පකාරෙන වියන්ති අවජාදීයන්ති එතෙනාති පටො:; පකාරෙණ, ප්‍රකාරයෙන්; වියන්තියි සේයි; ඒතෙන, මේකරණකොටගෙණ; අවජාදීයන්ති ඉති, හඳිනුලැබේනුයි; පටො, පටනම්;) "අටවියොසමුප්පන්නා" යනාදියෙහි 'ටු'ධාතුතෙමේ අතිශයින් පෙළීමෙහිද නැසීමෙහිද වැටේ. (:ධනසාමිනො ගාමනිගමාදයොවා අභුසොටවන්ති පටිපීළෙන්ති විධංසෙන්තීතිවා අටවයො:; ධනසාමිනොවා, ධනස්වාමින් හෝ; ගාමනිගමාදයොවා, ගම් නියම්ගම්ආදීන් හෝ; ආයි සේයි; භුසො, අතිශයින්; ටවන්තියි සේයි; පටිපීළෙන්තීතිවා, පෙළත්නුයි හෝ; විධංසෙන්තීතිවා, නසත්නුයි හෝ; අටවයො, අට්වීනූනම්වෙත්) (අට්වි නම් සොරුයි) "අටවි" යනාදියෙහි හටගැන්මෙහි වැටේ. (:උද්ධංටවන්ති විරූහන්ති අටවි:; උද්ධං, මත්තෙහි; ටවන්තියි සේයි; විරූහන්තීති, හටගනීනුයි; අටවි, අට්විනම්; (අටවිනම් මහාරන්‍යයි.)

(මෙසේ 'ට' කාරයාගේ අනෙකාර්ථවාචකත්වය දක්වා දැන් 'ඔ' කාරයාගේ අනේකාර්ථවාචකත්වය දක්වන්නේ 'මහාරවෙහරෙසුඤ්ඤෙ" යනාදිකීය.)

**41** ඔ, 'ඔ' කාරතෙමේ; මහාරවෙ, මහත්වූ ශබ්දයෙහිද; හරෙ, ඊශ්වරයාකෙරෙහිද; සුඤ්ඤෙ, ශූන්‍යයෙහිද; චන්දබිම්බෙච, චන්ද්‍රමණ්ඩලයෙහිද; සියා, වන්නේය; ඔ, 'ඔ' ශබ්දතෙමේ; ඔම්හිධාතුම්හි, ඔධාතුවෙහිද; තස්ස, ත ප්‍රත්‍යයාගේ, කාරියෙච, කාර්‍ය්‍යයෙහිද; (වේයයි) පකිත්තිතො, කියනලද්දේය.

(එහි "ජිතවෙරසුරෙහෙවකතඔතාසතෙදිසෙ
මාපතිඔ දුක්ඛඔහුචන්දඔසිතභාකරෙ."

(යනමෙහි ඔකාරතෙමේ යථාක්‍රමයෙන් මහාශබ්ද ඊශ්වර ශූන්‍යචන්ද්‍රමණ්ඩලයන්හි වැටේ.)

ජිතවෙරසුරෙහි එව; වෙර දිනනලද දෙවියන්විසින්ම; කතඔ, කරණලද මහත්ශබ්දතෙමේ; දිසෙ, සතුරන්; තා

42 ඨාතුරුප්පජ්ජනෙඨානුට්ඨානුපට්ඨානසන්තිසු
ධායනෙගත්‍යත්ථෙසෙවෙභවන්තීති පකිත්තිතො.

43 සඞ්කරෙතාසසද්දෙසු ඞකාරෙසමුදීරිතො
ඞීතුපච්සනාකාස ගමනෙ පවත්‍යානෙ තථා
උපන්‍යාසෙසීයාහිංසෙ ආදානෙච යථාරහං.

---

සනෙ, බියපත්කෙරේ; මාපති, උමයගනගේ සැමිවූ; ඨො, ඊශ්වරතෙමේ; දුක්ඛට්ඨෙඅනූ, දුකින් හිස්වූයේය; චන්දට්ඨො, චන්ද්‍රමණ්ඩලතෙමේ; සිනහාකරෙ, ශුභ්‍රරශ්මිකරන්නේවේ·)

“ඨානි—ඨෝනි” යනාදියෙහි ඨාශබ්දතෙමේ ‘ඨා’ ධාතුවෙහි වැටේ· “සාදිසන්තපුච්ඡභඤ්ජහංසාදීහිට්ඨො” * යනාදියෙහි ත ප්‍රත්‍යයාගේ කාර්‍ය්‍යයෙහි වැටේ.)

42 ඨාතු, ‘ඨා’ ධාතුතෙමේ වනාහි; උප්පජ්ජනෙ, ඉපදීමෙහිද; ඨාන, සිටීමය; උට්ඨාන, නැඟීසිටීමය; උපට්ඨාන, උවටැන්කිරීමය; සන්තිසු, ඇලීමය යනමෙහිද; ධායනෙ, වැටහීමෙහිද; ගත්‍යත්ථෙ, ගමනාර්ථයෙහිද; සෙවෙ, සෙවීමෙහිද; භවන්තිඉති, වේයයි; පකිත්තිතො, කියනලද්දේය.

(“පඤ්චට්ඨානානි කණ්ඨතාලුමුද්ධදන්තොට්ඨවසෙන” යනාදියෙහි ‘ඨා’ ධාතුතෙමේ ඉපදීමෙහි වැටේ. (:ඨන්ති උප්පජ්ජන්තිඑත්ථඅක්ඛරානීති ඨානානි:; එත්ථ, මෙහි; අක්ඛරානි, අක්ෂරයෝ; ඨන්තිසි සේයි; උප්පජ්ජන්තිඉති, උපදිත්නුයි; ඨානානි, ඨානනම්වෙත්;) “එකමන්තංඨිතාඛොසාදෙවතා” යනාදියෙහි සිටීමෙහි වැටේ. “ආසනාවුට්ඨාය—ඣානා වුට්ඨහිත්වා-මග්ගාවුට්ඨහිත්වා” යනාදියෙහි නැගිටීමෙහි වැටේ. “යාපනහිඤ්ඤ්වුනිච්ඡිජනෙනවා පානීයෙනවා උපට්ඨහෙය්‍ය සක්‍යපුත්තානං” යනාදියෙහි උවටැන්කිරීමෙහි වැටේ. “ධම්මෙට්ඨිතා සමණබ්‍රාහ්මණා” යනාදියෙහි ඇලීමෙහි වැටේ “වොදානං පච්චුට්ඨානං කුසලං” යනාදියෙහි වැටහීමෙහි වැටේ. “ගොට්ඨා—පට්ඨානං” යනාදියෙහි යාමෙහි වැටේ. “රජ්ජුපට්ඨානං ගන්ත්වා” යනාදියෙහි සෙවීමෙහි වැටේ.

(මෙසේ ‘ඨ’ කාරයාගේ අනෙකාර්ථවාචකත්වය දක්වා දැන් ‘ඞ’ කාරයාගේ අනෙකාර්ථවාචකත්වය දක්වන්නේ ‘සඞ්කරෙතාසසද්දෙසු’ යනාදි කීය·)

43 ඞකාරෙ, ‘ඞ’කාරතෙමේ; සඞ්කරෙ, ඊශ්වරයා කෙරෙහි

---

* මේ උදාහරණය ප්‍රාඥයන්විසින් විමසියයුතු.

ද; තාස, උත්‍රාසය; සද්දෙසු, ශබ්දය යනමෙහිද; (වෙයයි) සමුදීරිතො, කියනලද්දේය; ඩීතු, 'ඩී' ධාතුතෙමේ වනාහි; පවිසනෙ, ප්‍රවිෂ්ටවීමෙහිද; ආකාසගමනෙ, අහසින් යාමෙහිද; පවත්තනෙ, පැවතීමෙහි ද; තථා, එසේම; උපහාසෙ, උපහාශයෙහිද; හිංසෙ, පෙළීමෙහිද, ආදානෙච, ගැනීමෙහිද; යථාරහං, සුදුසු පරිද්දෙන්; සියා, වන්නේය.

(එහි "මාධවොඩොදිසංඩෙන මහඩ්ඩො ජායතෙ තදා" යනාදියෙහි 'ඩ' කාරතෙමේ යථාක්‍රමයෙන් ඊශ්වර උත්‍රාස ශබ්දයන්හි වැටේ.

මාධවො, උමයගනගේ සැමිවූ; ඩො, ඊශ්වරතෙමේ; දිසං, සතුරා; (බියපත්කෙරේ;) තදා, එකල්හි; ඩෙන, උත්‍රාසයෙන්; මහඩ්ඩො, මහත්වූ ශබ්දතෙමේ; ජායතෙ, උපදී.)

"ඩාකො" යනාදියෙහි 'ඩී' ධාතුතෙමේ ප්‍රවිෂ්ටවීමෙහි වැටේ. (:ඩෙතිපවිසති හත්තමෙතෙනාති ඩාකො:; ඩෙතියි සේයි; එතෙන, මේකරණකොටගෙණ; හත්තං, බත; පවිසතිඉති, ප්‍රවිෂ්ටවේනුයි; ඩාකො, ඩාකනම්; (ඩාකනම් සූපයට උපකරණවූ යම්කිසි පත් ආදියෙකි) "ආකාසෙසකුණාඩෙන්ති" යනාදියෙහි අහසින්යාමෙහි වැටේ. "පණ්ඩුපලාසො" යනාදියෙහි පැවත්මෙහි වැටේ, (:සෙතරත්තමිස්සප්පකාරෙනපතනාභිමුඛභාවෙනවාඩෙති පවත්තතීති පණ්ඩු: පණ්ඩුචසො පලාසොචාති පණ්ඩුපලාසො:; සෙතරත්තමිස්සප්පකාරෙනවා, සුදු රතුමුසු ප්‍රකාරයෙන් හෝ; පතනාභිමුඛභාවෙනවා, හීමට අබිමුවබැවින් හෝ:; ඩෙතියි සේයි; පවත්තතිඉති, පවතීනුයි; පණ්ඩු, පණ්ඩුනම්; පණ්ඩුචසො, පාණ්ඩුවූයේද හේතෙමේය; පලාසොචඉති, පලාසවූයේද හේතෙමේනුයි; පණ්ඩුපලාසො, පණ්ඩුපලාසනම්;) "උපඩෙන්ති" යනාදියෙහි උපහාශයෙහි වැටේ. "පණ්ඩුරොගො" යනාදියෙහි පෙළීමෙහි වැටේ. (:පකාරෙන තංසම්බන්ධිපුග්ගලං ඩෙති හිංසතීති පණ්ඩු:; පකාරෙන, ප්‍රකාරයෙන්; තංසම්බන්ධිපුග්ගලං, එයින්යුත් පුද්ගලයාට; ඩෙතියි සේයි; හිංසතිඉති, පෙළානුයි; පණ්ඩු, පණ්ඩුනම්;) "පණ්ඩුකම්බලං" යනාදියෙහි ගැනීමෙහි වැටේ. (:මුදුසිනිද්ධපභස්සරතාදිපකාරෙහි දෙවතානාමනං ඩෙතිආදදාතීති පණ්ඩු:; මුදුසිනිද්ධපභස්සරතාදි පකාරෙහි, මෘදු සනිගධ ප්‍රභාස්වරතාදි ප්‍රකාරයෙන්; දෙවතානං, දෙවතාවන්ගේ; මනං, සිත; ඩෙතියි සේයි: ආදදාති ඉති, ගනීනුයි; පණ්ඩු, පණ්ඩුනම්.)

44 ඪක්කානිග්ගුණසද්දෙසු ඪකාරො සමුදීරිතො
ඪීතුමුය්හනත්ථෙහොති ජනිතබ්බො විභාවිනා *
ඤාණස්මිං නිග්ගමනෙච ණකාරොසමුදීරිතො.

---

(මෙසේ 'ඩ' කාරයාගේ අනෙකාර්ථවාචකත්වය දක්වා දැන් 'ඪ' කාර 'ණ' කාරයන්ගේ අනෙකාර්ථවාචකත්වය දක්වන්නෙන් "ඪක්කානිග්ගුණසද්දෙසු" යනාදි කීය.

44 ඪකාරො, 'ඪ' කාරතෙමේ; ඪක්කා, ඪක්කායනශබ්දය; නිග්ගුණසද්දෙසු, නුගුණශබ්දය යනමොවුන් කෙරෙහි; (වේයයි) සමුදීරිතො, කියනලද්දේය; ඪීතු, 'ඪී' යනධාතුතෙමේ වනාහි; මුය්හනත්ථෙ, මුය්හනාර්ථයෙහි; හොති, වේ; (යයි)විභාවිනා; පණ්ඩිතයාවිසින්; ජනිතබ්බො, දතයුතුකොත්ය; ණකාරො, 'ණ' කාරතෙමේ; ඤාණස්මිං, ඥානයෙහිද; නිග්ගමනෙච, නික්මෙහිද; (වේයයි) සමුදීරිතො, කියනලද්දේය.

(එහි "සපරඪං ජනංවිඤ්ඤූ වදන්තිඪංහිතෙසිනො
ඉස්සුයකාසගුණානං වදන්ති ඪංසඪාජනා.

(යනාදියෙහි 'ඪ' කාරතෙමේ යථාක්‍රමයෙන් ඪක්කායන ශබ්ද නුගුණශබ්දයන්හි වැටේ.)

(හිතෙසිනො,හිතෙසීවූ; විඤ්ඤූ,පණ්ඩිත(ජන)යෝ;සපරඪං, (කායවාග්ද්වාරයන්හි පැවති) දොෂසහිතවූ; ජනං, ජනයාට; ඪං, ඪක්කායන (තර්ජනයකළ) ශබ්දය; වදන්ති, කියත්; ඉස්සුයකා. ඊර්ෂ්‍යාවෙන් මඩනලද්දාවූ; සඪා, (ආක්‍රොෂපරිභාෂණාදි) නුගුණශබ්දසහිතවූ; ජනා, (දුර්) ජනයෝ; සගුණානං, ගුණසහිතවූ සත්පුරුෂයන්ගේ; ඪංවදන්ති, නුගුණ කියත්.)

("සහොඪංචොරං ගණ්හථා" යනාදියෙහි 'ඪී' ධාතුතෙමේ මුය්හනාර්ථයෙහි වැටේ. (:උද්ධං ඪීයන්ති මුය්හන්ති දලිද්දා එතෙනාති ඪං: සහඪෙනයොවත්තතීති සහොඪො:; උද්ධං, මත්තෙහි; දලිද්දා, දිළින්දෝ; එතෙන, මේකරණකොටගෙණ; ඪීයන්තියි සේයි; මුය්හන්තීති, මුළාවෙත්නුයි; ඪං, ඪනම්; (ඪනම් ධනයි) ඪෙනසහ, ධනයහා සමග; යො, යමෙක්තෙමේ; වත්තතීති, පවතීනුයි; සහොඪො, සහොඪනම්;) "ණටෙඨාතිවුච්චතෙ බුද්ධොගාමණෙණො සමණෙණො හවෙ" යනාදියෙහි 'ණ' කාරතෙමේ යථාක්‍රමයෙන් ඥානයෙහිද නික්මෙහිද වැටේ.)

---

* ජනිතබ්බාවිභාවිනා—තිපි කත්ථචි දිස්සති.

45 තිලොකමුද්ධභූතස්ස මුනිමුද්ධඤ්ඤු මුද්ධිනො
මුනිනොසාසනෙසෙය්‍යොටාදිවග්ගමුඛාජනං.

46 නානත්ථනිච්ඡයං සාරං සද්ධම්මසාරමෙසිනො
පසන්නචිත්තා සබ්බෙපි නිසාමයථසාධවො.

## ටවග්ගං නිට්ඨිතං.

—000—

(බුධො, පණ්ඩිතතෙමෙ; ණටෙඨාඉති, ඥානයෙහි සිටියේ යයි; වුච්චතෙ, කියනුලැබේ; සමණො, ශ්‍රමණතෙමේ; ගාමණීහවෙ, ගමින්නික්මුනේ වන්නේය.)

(මෙසේ ටකාරාදි ණකාරාන්ත මූර්ධන්‍ය ටවර්ගාන්තර්ගත ඒකී ඒකී අක්ෂරයාගේ අර්ථප්‍රභෙදදක්වා දැන් මූර්ධප්‍රභවහෙයින් ඔවුන්ගේ තත්ප්‍රභවස්ථානසන්දීපකවූ මූර්ධශබ්ද ප්‍රධානපදයෙන් තමාවිසින් විනිතප්‍රකරණයාගේ නිශ්‍රයසංවර්ණිතව්‍යප්‍රභවවූ ශාස්තෲන්වහන්සේගේ ගුණ සඞ්කීර්තන සන්දර්ශික පූර්වාඞ්ගම සරූපවූ ස්තොත්‍රමුඛයෙන් ශ්‍රොතෘජනයන්ගේ තද්දෙශගෞරව ප්‍රශාදොත්පත්තිය පිණිසද ඔවුන්ගේ ශ්‍රවණොද්ග්‍රහණ ධාරණාදියෙහි මනාවොත්සාහොත්පත්තිය පිණිසද උයොජනය කරන්නේ "තිලොකමුද්ධභූතස්ස" යනාදි කීය.)

45 තිලොකමුද්ධභූතස්ස, ත්‍රිවිධ (සත්වලොකයන්ට අන්තර්ගතවූ ඒ ඒ භූමිප්‍රදෙශයෙහි අධිපතිවූ මනුජෙන්ද්‍රාදි) සත්ව (විශෙෂ) යන්ට මූර්ධයක්වැනිවූ; මුනි, (මොනෙය්‍යධර්මයෙන් යුක්තවූ අගාරමුනි අනාගාරමුනි සඞ්ඛ්‍යාත) මුනීන්ට; මුද්ධ, මස්තකාරවූ; ඉන්ද, (ඔවුන්ට) අධිපතිවූ; (සෙඛමුනි අසෙඛමුනි සඞ්ඛ්‍යාත අෂ්ටායඝීපුද්ගල) මුනීන්ට; මුද්ධිනො, කිරුළුබඳුවූ; මුනිනො, සර්වඥයන්වහන්සේගේ; සෙය්‍ය, අතිශයින් ප්‍රශස්තවූ; සාසනෙ; ශාසනයෙහි; ටාදිවග්ගමුඛාජනං, මූර්ධන්‍ය ටකාරාදි (අක්ෂර) සමූහයන්ගේ.

46 සාරං, සාරවූ; නානත්ථනිච්ඡයං, වෙන්වෙන්වූ අර්ථයාගේ විනිශ්චය; සද්ධම්මසාරං, සද්ධර්මසාරය; එසිනො, සොයනසුලුවූ; සබ්බෙපිසාධවො, සියළුම සත්පුරුෂයෙනි, පසන්නචිත්තා, ප්‍රසන්නවූසිත්ඇතිව; නිසාමයථ, අසව්.

## ටවර්ගය සමාප්තයි.

—000—

47 චොරසිඞ්ගාලවාලෙසු පච්චයෙසබ්බනාමිකෙ
තකාරෙතාතුධාතුම්හි පච්චයෙසබ්බනාමිකෙ.

48 තිතුධාතුම්හිපච්චයෙ සඞ්ඛ්‍යායචපකිත්තිතො
තුකාරෙපච්චයෙබ්‍යයෙ පවත්තතීයථාරහං.

---

(මෙසේ මූර්ධන්‍ය ටවර්ගීයාගේ අනෙකාර්ථ වාචකත්වය දක්වා දැන් දන්ත්‍ය තවර්ගීයාගේ අනෙකාර්ථ වාචකත්වය දක්වන්නේ "චොරසිඞ්ගාලවාලෙසු" යනාදි කීය.)

**47** තකාරෙ, 'ත' කාරතෙමේ; චොර, සොරය; සිඞ්ගාල, හිවල්ය; වාලෙසු, (හස්ත්‍යශ්වාදීන්ගේ) ලොම්ය යනමෙහිද; පච්චයෙ, (ත) ප්‍රත්‍යයෙහිද; සබ්බනාමිකෙ, සර්වනාමයෙහිද; (වේ) තාතු, 'තා'කාරතෙමේ වනාහි; ධාතුම්හි, (තා) ධාතුවෙහිද; පච්චයෙ, (තා) ප්‍රත්‍යයෙහිද; සබ්බනාමිකෙ, සර්වනාමයෙහිද; (වේ)

(එහි "ථෙනෙනත්තිතාපරධනං තොතුසිඞ්ගාලනාමකො
තවෙඨිකොධනුග්ගහො රාජප්පියොතිසඤ්ඤිතො"

(යනාදියෙහි 'ත'කාරතෙමේ යථාක්‍රමයෙන් චෞරශෘගාල හස්ත්‍යශ්වාදීන්ගේ ලොමයන් කෙරෙහි වැටේ.)

(තා, සොරහු; පරධනං, අනුන්ගේධනය; ථෙනෙනත්ති, සොරකම්කරත්; තොතු, හිවල්තෙමේවනාහි; සිඞ්ගාලනාමකො, සිඞ්ගාලනම්වේ; තවෙඨිකො, (හස්ත්‍යශ්වාදීන්ගේ)ලොමවෙඨකාවූ; ධනුග්ගහො, ධනුර්ධරතෙමේ; රාජප්පියොඉති, රජුන් විසින් ප්‍රියකටයුතුයයි; සඤ්ඤිතො, දන්නාලද්දේය.)

("භාවකම්මෙසු'ත'—සාසදිසතො තස්සරිටෙඨාච" යනාදියෙහි'ත' ප්‍රත්‍යයෙහිවැටේ."එතතෙසනෙතා–තස්සවානත්තං සබ්බත්ථ" යනාදියෙහි සර්වනාමයෙහි වැටේ, "තාපාලනෙ" යනාදියෙහි 'තා' කාරතෙමේ 'තා' ධාතුවෙහි වැටේ. "ණ්‍ය තත 'තා' භාවෙතු—ගාමජනබන්ධු සහායාදීහි 'තා'" යනාදියෙහි 'තා' ප්‍රත්‍යයෙහි වැටේ, "තතො 'තා' එතා ඉමාතො" යනාදියෙහි සර්වනාමයෙහි වැටේ.)

48 තිතු, 'ති' කාරතෙමේවනාහි; ධාතුම්හි,(ති)ධාතුවෙහිද; පච්චයෙ, (ති) ප්‍රත්‍යයෙහිද; සඞ්ඛ්‍යායච, සඞ්ඛ්‍යාවෙහිද; සඞ්ඛ්‍යා ශබ්දයෙහිද; (වේයයි) පකිත්තිතො, කියනලද්දේය; තුකාරෙ, 'තු' කාරතෙමේ; පච්චයෙ, (තු) ප්‍රත්‍යයෙහිද; අබ්‍යයෙ,

49 පච්චත්තෙතූපයොගෙච කරණෙසම්පදානියෙ
සාමිවචනිචාතිතෙසද්දො, පඤ්චස්වත්ථෙසුදිස්සති.

50 පඤ්චම්‍යත්ථෙපච්චයම්හි තොකාරෙසමුදීරිතො
උපයොගෙචතංසද්දො, වයජෙතිපකිත්තිතො.

---

නිපාතයෙහිද; යථාරහං, සුදුසුපරිද්දෙන්; පවත්තති, පවතී.

(‘‘තිජෙදනෙ’’ යනාදියෙහි ‘ති’ කාරතෙමේ ‘ති’ ධාතුවෙහි වැටේ; ‘‘ඉත්ථියම ‘ති’ යවොචා’’ යනාදියෙහි ‘ති’ ප්‍රත්‍යයෙහි වැටේ; ‘‘තිලොකං’’ යනාදියෙහි සඞ්ඛ්‍යාවෙහි වැටේ; ‘‘ති චතුන්නං තිස්සො චතස්සො තයො චත්තාරො තිණ්ණි චත්තාරි’’ යනාදියෙහි සඞ්ඛ්‍යාශබ්දයෙහි වැටේ; ‘‘සබ්බතො ණ්වුත්වා වීචා’’ යනාදියෙහි ‘තු’ කාරතෙමේ ‘තු’ ප්‍රත්‍යයෙහි වැටේ; (මෙහි ‘‘සබ්බතො-ණ්වු ‘තු’ ආවී[illegible] ’’ යනුපදච්ඡෙදයි) ‘‘‘තු’ ඉති එකංසත්ථෙ’’ යනාදියෙහි නිපාත[illegible]ාහි වැටේ.)

49 තෙසද්දො, ‘තෙ’ ශබ්දතෙමේ; පච්චත්තෙ, ප්‍රථමාර්ථයෙහිද; උපයොගෙච, විතීයාර්ථයෙහිද; කරණෙ, කරණාර්ථයෙහිද; සම්පදානියෙ, සම්ප්‍රදානාර්ථයෙහිද; සාමිවචනිචඉති, ස්වාම්‍යර්ථයෙහිද යන; පඤ්චසු අත්ථෙසු, පඤ්චාර්ථයන්හි; දිස්සති, දක්නා ලැබේ.

(‘‘න ‘තෙ’ සුඛංපජානන්ති යෙනපස්සන්ති නන්දනං’’ යනාදියෙහි ‘තෙ’ ශබ්දතෙමේ ප්‍රථමාර්ථයෙහි වැටේ, ‘‘න ‘තෙ’ පස්සාමිදූරකෙ’’ යනාදියෙහි විතීයාර්ථයෙහි වැටේ; ‘‘කිං ‘තෙ’ දිට්ඨංඋපධිතෙසමතික්කන්තා—ආසවාතෙ පදාලිතා’’ යනාදියෙහි කරණාර්ථයෙහිවැටේ; ‘‘නමො ‘තෙ’ පුරිසාජඤ්ඤනමො ‘තෙ’ පුරිසුත්තම’’ යනාදියෙහි සම්ප්‍රදානාර්ථ යෙහි වැටේ. ‘‘කිංතෙවතං කිංපන බ්‍රහ්මචරියං’’ යනාදියෙහි ස්වාම්‍යර්ථයෙහි වැටේ; (මෙහිප්‍රථමා විතීයාර්ථයන්හි පැවති ‘තෙ’ ශබ්දතෙමේ සර්වනාමික තශබ්දජය—සෙසු තුන්අර්ථයන්හි පැවති ‘තෙ’ ශබ්දතෙමේ තුම්හශබ්දජයයි දතයුතු)

50 තොකාරො, ‘තො’ කාර තෙමේ; පඤ්චම්‍යත්ථෙ, පඤ්චමීඅර්ථයෙහිවූ; පච්චයම්හි, (තො) ප්‍රත්‍යයෙහි; (වේයයි) සමුදීරිතො, කියනලද්දේය; වයජෙ, (තුම්හශබ්දය සර්වනාම තශබ්දය යන ශබ්ද) දෙකින් උපන්නාවූ; තංසද්දො, ‘තං’ ශබ්දතෙමේ; උපයොගෙච ඉති, විතීයාර්ථයෙහිද; (වේ) යයි; පකිත්තිතො, කියන ලද්දේය.

51 තාතුපාලනත්ථෙතිතු ඡෙදනත්ථෙපකිත්තිතො
භෙදාවධාරණෙකංසෙ පූරණත්ථෙබ්‍යයංතුතු.

52 මඞ්ගලෙභයතාණෙච ගිරිම්හිපච්චයම්හිච
චතුසේවතෙසුඅත්ථෙසු ථකාරොසමුදීරිතො.

---

(''ඣවි 'තො' පපක්ඛචම්‍යත්ථෙ'' යනාදියෙහි 'තො' කාරතෙමේ පඤ්චම්‍යර්ථයෙහිවූ 'තො' ප්‍රත්‍යයෙහි වැටේ; ''කථං ජානෙමු 'තං' මයං'' යනාදියෙහි 'තං' ශබ්දතෙමේ තුම්හ ශබ්දජවශයෙන් විතියාර්ථයෙහි වැටේ; ''තස්ස 'තං' වචනංසුත්වා'' යනාදියෙහි 'තං' ශබ්දතෙමේ 'ත' ශබ්ද සර්වනාමවශයෙන් විතියාර්ථයෙහි වැටේ.)

51 තාතු, 'තා' ධාතුතෙමේ වනාහි; පාලනත්ථෙ, පාලනාර්ථයෙහි; (වේ) තිතු, 'ති' ධාතුතෙමේ වනාහි; ඡෙදනත්ථෙ, ඡෙදනාර්ථයෙහි, (වේයයි) පකිත්තිතො, කියනලද්දේය; අබ්‍යයං, නිපාතවූ; තුතු, 'තු' කාරතෙමේ වනාහි; භෙදෙ, විශෙෂාර්ථයෙහිද; අවධාරණෙ, අවධාරණාර්ථයෙහිද; එකංසෙ, ඒකාංසාර්ථයෙහිද; පූරණත්ථෙ, (පද) පූරණාර්ථයෙහිද; (වේයයි කියනලද්දේය.)

(''තාතාලෙනාච පාණීනං—තානංලෙනං පරායනං-අම්මතාතවදන්තිනං'' යනාදියෙහි 'තා' ධාතුතෙමේ පාලනාර්ථයෙහි වැටේ. ''රතති'' යනාදියෙහි 'ති' ධාතුතෙමේ ඡෙදනාර්ථයෙහි වැටේ, (:රාසදෙදුතියති පරිවජ්ජති එත්ථාති රතති:, එත්, මෙනි; රායිසේයි සඳෙදු, ශබ්දතෙමේ, තියතියි සේයි, පරිවජ්ජතිඉති, පිරිසිඳුනු ලැබේනුයි; රතති, රතනි නම්;) ''තුලෙ‍යතචමසිභෙදෙ 'තු' සරීරෙනදිසෙනතෙ'' යනාදියෙහි නිපාතවූ 'තු' කාරතෙමේ විශෙෂාර්ථයෙහි වැටේ. ''සරලොපො මාදෙසප්පච්චයාදිම්හි සරලොපෙ 'තු' පකති'' යනාදියෙහි අවධාරණාර්ථයෙහි වැටේ, ''අපි 'තු' බළු'' යනාදියෙහි ඒකාංසාර්ථයෙහි වැටේ. ''සමුද්දෙදකාදෙසෙ 'තු' සමුද්දිරචොයථා'' යනාදියෙහි වචනාලඞ්කාර සඞ්ඛ්‍යාත පද පූරණාර්ථයෙහි වැටේ.)

(මෙසේ 'ත' කාරයාගේ අනෙකාර්ථ වාචකත්වයදක්වා දැන් 'ථ' කාරයාගේ අනෙකාර්ථ වාචකත්වය දක්වන්නේ 'මඞ්ගලෙභයතාණෙච' යනාදිකිය.)

52 ථකාරෙ, 'ථ' කාරතෙමේ; මඞ්ගලෙ, මඞ්ගල්‍යයෙහිද;

**53 ථාපච්චයෙපකාරෙචා කාරෙකොට්ඨාසකෙථ්රපි
පීත්ථිත්ථියංථූකාරෙතු, නිබ්බත්තෙනපච්චයෙරපි.**

---

භයත්තාණෙච, බියරැක්මෙහිද; ගිරිම්හි, පර්වතයෙහිද; පච්ච යම්හිච, (ථ) ප්‍රත්‍යයෙහිද; (යන) එතෙසු චතුසු අත්ථෙසු, මේ සතරඅර්ථයන්හි, (වේයයි) සමුදීරිතො, කියනලද්දේය.

(එහි "ථත්ථංවිහිතොපණාමො ථකාරෙසමත්ථොභවෙ
ථනාමධෙය්‍යපබ්බතො සමාදිහිථමාතිච"

(යනාදියෙහි 'ථ' කාරතෙමේ යථාක්‍රමයෙන් මඞ්ගල්‍යයෙහිද, බියරැක්මෙහිද, පර්වතයෙහිද, 'ථ' ප්‍රත්‍යයෙහිද, වැටේ.)

(ථත්ථං, මඞ්ගල්‍යයපිණිස; පණාමො, ප්‍රණාමයතෙමේ; විහිතො, කරණලද්දේය; ථකාරෙ, බියරැක්මකිරීමෙහි; සමත්ථොභවෙ, සමර්ථවන්නේය; පබ්බතො, පර්වතතෙමේ; ථනාමධෙය්‍ය, 'ථ' යනනාමධෙයයක් ඇත්තේය; සමාදිහි, සමශබ්දාදීන්කෙරෙන්; ථමාඉතිච, 'ථ' ප්‍රත්‍යය 'ම' ප්‍රත්‍යයයන මොහුද වෙතියි )

**53** ථා, 'ථා' කාරතෙමේ; පච්චයෙ, (ථා) ප්‍රත්‍යයෙහිද; පකාරෙච, ප්‍රකාරයෙහිද; ආකාරෙ, ආකාරයෙහිද; කොට්ඨාසකෙථ් අපි, භාගාර්ථයෙහිද; (වේ) පීතු, 'පී' කාරතෙමේ වනාහි; ඉත්ථියං, ස්ත්‍රියකෙරෙහි, (වේ) ථූකාරෙතු, 'ථූ' කාරතෙමේ වනාහි; නිබ්බත්තෙන, ඉපැද්මෙහිද; පච්චයෙඅපි, (ථූ) ප්‍රත්‍යයෙහිද, (වේ.)

("සබ්බනාමෙහි පකාරවචනෙහිතු 'ථා' යනාදියෙහි 'ථා' කාරතෙමේ 'ථා' ප්‍රත්‍යයෙහි වැටේ; "යථා-තථා" යනාදියෙහි ප්‍රකාරයෙහි වැටේ. "යථාසූජ්ජති තථාගහෙත්වා" යනාදියෙහි ආකාරයෙහි වැටේ; "සහස්සථා අත්තානං නිම්නාති" * යනාදියෙහි භාගාර්ථයෙහි වැටේ; "පියාගුයභා නසංසයා" † යනාදියෙහි 'පී' කාරතෙමේ ස්ත්‍රියකෙරෙහි වැටේ; "වෙපථූ" යනාදියෙහි 'ථූ' කාරතෙමේ ඉපැද්මෙහි වැටේ. "ථූතනිමනිමා නිබ්බත්තත්ථෙ" යනාදියෙහි 'ථූ' ප්‍රත්‍යයෙහි වැටේ.)

---

* නිම්මිනාති—සමහර

† පියංගුයභා නසංසයා—සමහර.

54 ථං පච්චයෙ තතියත්ථෙ පකාරත්ථෙච දිස්සති
ථුතුධාතුම්හිථුතිම්හිථෙසද්දෙසඞ්ඛාතෙ'පි.

55 දා කලත්තම්හි ධාතුම්හි දානාදානෙච ඛණ්ඩනෙ
සමාදානෙහබ්‍යදානෙකුගතෙනිද්දසුජ්ඣනෙ.

---

54 ථං, 'ථං' කාරතෙමේ; පච්චයෙ, (ථං) ප්‍රත්‍යයෙහිද; තති යත්ථෙ, තෘතීයාර්ථයෙහිද; පකාරත්ථෙච, ප්‍රකාරාර්ථයෙහිද;(වේ යයි) දිස්සති, දක්නාලැබේ; ථුතු, 'ථු' කාරතෙමේ වනාහි; ධාතුම්හි, (ථු) ධාතුවෙහිද; ථුතිම්හි, ස්තුතිකිරීමෙහිද; (වේ) ථෙ, 'ථෙ' ධාතුතෙමේ වනාහි; සද්දෙ, ශබ්දකිරීමෙහිද; සඞ්ඛා තෙඅපි, රැස්වීමෙහිද; (වේ)

(''කිම්මෙහි 'ථ'ං'' යනාදියෙහි 'ථං' කාරතෙමේ; 'ථං' ප්‍රත්‍ය යෙහි වැටේ. ''කථං'' යනාදියෙහි තෘතීයාර්ථයෙහි වැටේ. ''ඉත්ථම්භූතො—ඉත්ථංසුදං ආයස්මා සීවලිත්ථෙරො'' යනාදියෙ හි ප්‍රකාරාර්ථයෙහි වැටේ. ''ථු' අභිත්ථවෙ'' යනාදියෙහි 'ථු'කා රතෙමේ 'ථු' ධාතුවෙහි වැටේ. ''ථුතිඝොසො—ථුතිං කරො නෙතා නිඥනෙතා'' යනාදියෙහි ස්තුතිකිරීමෙහි වැටේ. ''ථය ති'' * යනාදියෙහි 'ථෙ' ධාතුතෙමේ ශබ්දකිරීමෙහි වැටේ. ''ථියොනං පරිභාසිංසු'' යනාදියෙහි රැස්වීමෙහි වැටේ. (:ථ යති සංඝාතං ගච්ඡතිගබ්භොඑත්ථසාතිථී:, ථයතියි සේයි; එ ත්ථසා, මෑගේ; ගබ්භො, ගර්භයතෙමේ; සඞ්ඛාතං, රැස්වීමට; ගච්ඡතිඉති, යේතුයි; ථී, ථීනම්—ප්‍රථමා 'යො' ව හෘස්වව 'ථියො' යනුවේ.)

(මෙසේ 'ථ' කාරයාගේ අනෙකාර්ථවාචකත්වය දක්වා දැන් 'ද' කාරයාගේ අනෙකාර්ථවාචකත්වය දක්වන්නේ 'දාකලත්ත ම්හි ධාතුම්හි' යනාදි කීය.)

55 දා, 'දා' කාරතෙමේ; කලත්තම්හි, භාර්‍ය්‍යාවකෙරෙහිද; ධා තුම්හි, (දා) ධාතුවෙහිද; දානෙ, දීමෙහිද; ආදානෙ, ගැනීමෙ හිද; අවඛණ්ඩනෙ, සිඳීමෙහිද; සමාදානෙ, සමාදන්වීමෙහි ද; හබ්‍යදානෙ, යාගදීමෙහිද; කුගතෙ, නින්දිත ගමනෙහිද; නිද්ද, නිදීමය; සුජ්ඣනෙ, පිරිසිදුකිරීමය යනමෙහිද; (වේ)

(එහි ''කුදායංසුමාවජ්ජය්‍යමතිමාසතිමාදීරෙ
තතොසුඛංධිගච්ඡෙය්‍ය සම්පරායෙචසුග්ගතිං.''

---

* ථියති—කියාත් ඇතම්පොතක තිබේ.

**56 දීතුඛයෙ දුක්කටම්හිදූතුගතිම්හි පීළනෙ**
**දෙතුපාලනතෙහොති වෙදිතබ්බොවිභාවිනා.**

---

(යනාදියෙහි 'දෘ' කාරතෙමේ භායඝ්‍රාවකෙරෙහි වැටේ.)
මතිමා, නුවණැත්තාවූ; සතිමා, සිහිඇත්තාවූ; වීරොපුමා, වීරපුරුෂතෙමේ; ඝුදෘයං, නිඤ්දිතභායඝ්‍රාව; වජ්ජෙය්‍ය, හරණේය; තතො, ඒ හෙතුකොටගෙණ; සුඛං, (මෙලොව්හි) සැපය ටද; සම්පරායෙ, පරලොව්හි; සුගතිංච, සුගතියටද; අධිගච්ඡෙය්‍ය, මනාව යත්තේය.

("දෘ දෘනෙ" යනාදියෙහි'දෘ' කාරතෙමේ'දෘ' ධාතුවෙහිවැටේ. "දෘනං-දෙති-පච්චයදෘයකො"යනාදියෙහිදීමෙහිවැටේ."මච්චු අදෘයගච්ඡති-පත්තච්වරමාදෘය" යනාදියෙහිගැනීමෙහිවැටේ. "සම්පදෘනං—පරිදං-වීහිංලූනාතිදෘතෙතන" යනාදියෙහි සිඳීමෙහි වැටේ. (මෙහි 'සම්පදෘන' නම් මනාව සිඳීමය—'පරිද' නම් හාත්පසින් සිඳීමයි;) :දෘතිඅවඛණ්ඩති වීහයො ජීඥති එතෙනාතිදෘත්තං:; දෘතියි සේයි; අවඛණ්ඩතියි සේයි; වීහයො, වීහීන්; එතෙන, මේකරණකොටගෙණ; ජීඥතිඉති, සිඳීනුයි; දෘත්තං, දෘත්තනම්;) "සමාදෘයසික්ඛති සික්ඛාපදෙසු—සීලංසමාදියති" යනාදියෙහි සමාදන්වීමෙහි වැටේ. "නාරායනස්ස බලිං දදෘති" යනාදියෙහි යාගදීමෙහි වැටේ. "සුදෙදෘ-සුදදී" යනාදියෙහි නිඥිතගමනෙහි වැටේ. (:පරගිංසනාදි ලූදදෘචාරකම්මුනා * දෘරුහරණාදි බූදදෘචාරකම්මුනාංවලහුං ලහුං ඝුච්ජිතාකාරෙන දෘතිගච්ඡතීති සුදෙදෘ:; පරගිංසනාදි ලූදදෘචාරකම්මුනාච, අනුන්ට පෙළීමාදි පුළීනූචාර කර්මයෙන්ද; දෘරුහරණාදි බූදදෘචාරකම්මුනාච, දඬුගෙණඊමාදි ක්‍ෂුද්‍රාචාර කර්මයෙන්ද; ලහුංලහුං, සුහුසුහුව; ඝුච්ජිතාකාරෙන, නිඥිතවූ ආකාරයෙන්; දෘතියි සේයි; ගච්ඡතිඉති, යේනුයි; සුදෙදෘ, සුදදනම්) :සුදදස්සභරියා සුදදී:; සුදදස්ස, ශුද්‍රයාගේ; භරියා, භායඝ්‍රාතොමෝ; සුදදී, සුදදීනම්; (මෙහි 'සු' යනු සීඝ්‍රාර්ථවාචක නිපාතයි) "නිදදෘබනුලො-නිදදෘයති" යනාදියෙහි නිඳීමෙහි වැටේ. "බාලොඅව්‍යත්තොනපටිබලො අනුයොගං 'දෘතුං'—ආචරියස්ස අනුයොගං 'දත්වා' පච්ඡා ගච්ජි" යනාදියෙහි පිරිසිඳු කිරීමෙහි වැටේ. (මෙහි භායඝ්‍රාධාතුදෙක්හි වැටෙන්නාවූ 'දෘ' කාරතෙමේ රූඪිනාමපදයෙක—සෙසුතැන්හි වැටෙන්නාවූ 'දෘ' කාරතෙමේ ධාතුපදයයි දතයුතු )

56 දීතු; 'දී' (යන)ධාතුතෙමේ චනාශි;ඛයෙ, ක්‍ෂයවීමෙහිද; දුක්කටම්හි, දුක්වීමෙහිද; (වේ) දූතු, 'දූ' (යන) ධාතුතෙමේ

---

* බූදදෘචාර කම්මුනා—සමහර.

වනාහි; ගතිමහි, යාමෙහිද; පීලනෙ, පෙළීමෙහිද;(වේ)දෙතු, 'දෙ' (යන) ධාතුතෙමේ වනාහී; පාලනයෙහි, රක්නාඒයෙහි; හොති, වේ; (යයි) විභාවිනා, (ශබ්දඥයා) විශෙෂයෙන් දත් නාහු විසින්; වෙදිතබ්බො, දතයුතුකොත්ය.

("ඔලොකෙන්තු 'දිනෙ දිනෙ'—'දිවා'චරන්තාච-උද්ධරෙ 'දින'මත්තානං" යනාදියෙහි 'දී' යනධාතුතෙමේ ක්ෂයවීමෙ හි වැටේ. (:දීයති ඛීයති සත්තානංආයු එතෙනාති දිනං:, එ තෙන, මේකරණකොටගෙණ; සත්තානං, සත්වයන්ගේ; ආ යු, ආයුසයතෙමේ; දීයතියි සේයි; ඛීයතිඉති, ක්ෂයවේනුයි; දිනං, දිනනම්; (දිනනම් දවසයි) :දීයති ඛීයති අන්ධකාරො එ තෙනාතිදිවා:; * එතෙන, මේකරණකොටගෙණ; අන්ධකා රො, අන්ධකාරතෙමේ; දීයතියි සේයි;ඛීයතිඉති, ක්ෂයවේනුයි; දිවා, දිවානම්;) :දීයන්ති ඛීයන්ති ධනධඤ්ඤාදයො අස්මින්ති දිනො:; අස්මිං, මොහුකෙරෙහි; ධනධඤ්ඤාදයො, ධනධාන්‍යා දීහු; දීයන්තියි සේයි; ඛීයන්තිඉති, ක්ෂයවෙත්නුයි; දිනො, දි නනම්; (දිනනම් ආතුමයි) "දිනො" යනමෙහිම දුක්වීමෙහිද වැටේ. (:දීයති දුක්ඛතීති දිනො:; දීයතියි සේයි; දුක්ඛතිඉති, දුක්වේනුයි; දිනො, දිනනාම්;) "දුමො-දවති" යනාදියෙහි'දු' යනධාතුතෙමේ යාමෙහි වැටේ. (:දවති ගච්ඡති මූලඛන්ධ සාඛාවිටපපත්තපල්ලව පුප්ඵඵලෙහිවුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාතීති දුමො:; දවතියි සේයි;ගච්ඡතියි සේයි; මූල, මුල්ය; ඛන්ධ, කඳය; සාඛා, සාය; විටප, වෙළෙප්ය; පත්ත, පත්ය; ප ල්ලව, පළුය; පුප්ඵ, මල්ය; ඵලෙහි, ඵලයයනමෙයින්; වුඩ්ඪිං, වෘද්ධියටද; විරූළ්හිං, පතලබවටද; වෙපුල්ලං, විපුලබවටද; පාපුණාතිඉති, පැමිණේනුයි; දුමො, දුමනම්;) "උපද්දවො- දුනොතිකාමචණ්ඩාලො" යනාදියෙහි පෙළීමෙහි වැටේ. (:උපගන්ත්වාදවතිපීළතීති උපද්දවො:; උපගන්ත්වා, එළැඹ; ද වතියි සේයි; පීළතිඉති, පෙළාතුයි; උපද්දවො, උපද්දව න ම්;-කාමචණ්ඩාලො; කාම(සඞ්ඛ්‍යාත) චණ්ඩාලතෙමේ; දුනො ති; පෙළයි;) "දානං—උද්දානං" යනාදියෙහි 'දෙ' යනධාතුතෙ මේ රක්නාඒයෙහි වැටේ; (:දුග්ගතිතො දායති රක්ඛතීති දානං:; දුග්ගතිතො, දුගතියෙන්; දායතියි සේයි; රක්ඛතිඉති, රක්ෂාකෙරේනුයි; දානං, දානනම්; (දානනම් දානචෙතනායි) :වුත්තස්ස අත්ථස්ස වක්ඛමානස්සවාපකිණ්ණක භාවෙන නස්සි

* දිබ්බති ඔභාසතීති දිවා-සීත් 'දිවු' ධාතුවශයෙන් සමහරු විග්‍රහකෙරෙති.

**57 දුකුච්ඡිතීසදත්ථෙසු * විරූපත්ථෙප්‍යසොභනෙ
සීලාභාවා සමිද්ධීසු කිච්ඡෙචානන්දනාදිකෙ.**

---

තුං අදත්වා උද්ධංදනං රක්ඛණං උදානං:; වුත්තස්සඅත්ථස්සවා, කියනලද අර්ථයාගේ හෝ; වක්ඛමාණස්ස අත්ථස්සවා, කියනු ලබන අර්ථයාගේ හෝ; පකිණ්ණකභාවෙන්, ප්‍රකීර්ණකභාව යෙන්; නස්සිතුංඅදත්වා, නැසෙන්ටනොදී; උද්ධං, මත්තෙහි; දනංති සේයි; රක්ඛණං, රැකීම; උදානං, උදානනම්; (උදාන නම් සඞ්ග්‍රහ වචනයි.)

(මෙසේ රූඪී නාමපද ධාතුපදයන්ගේ අර්ථවිශෙෂදක්වා දැන් උපසර්ගපදවූ 'දු' ශබ්දයාගේ අර්ථවිශෙෂ දක්වන්නේ; 'දු කුච්ඡිතීසදත්ථෙසු' යනාදී කීය.)

57 දු, 'දු' ශබ්දතෙමේ; කුච්ඡිත, නින්දිතාර්ථය; ඊසදත්ථෙසු ඊෂාර්ථය යනමේ අර්ථයන්හිද; විරූපත්ථෙඅපි, විරූපාර්ථයෙහි ද; අසොභනෙ, අශොභනාර්ථයෙහිද; සීලාභාව, සීලයාගේ නොවීමය; අසමිද්ධීසු, අසමෘද්ධිය යනමෙහිද; කිච්ඡෙච, දුඃඛ යෙහිද; අනන්දනාදිකෙ, අසන්තොසාදියෙහිද; (වේ)

(එහි "දුග්ගතං–දුග්ගති–දුක්ඛං" යනාදියෙහි 'දු' ශබ්දතෙමේ නින්දිතාර්ථයෙහි වැටේ. (:කුච්ඡිතංගතනාති දුග්ගතං:; කුච්ඡිතං, නින්දිතවූ; ගතංඉති, ගමන නුයි; දුග්ගතං, දුග්ගත නම්;) :කුච්ඡිතාගතිති දුග්ගති:; කුච්ඡිතා, නින්දිතවූ; ගතිඉති, ගතියනුයි; දුග්ගති, දුග්ගතිනම්; ):කුච්ඡිතංඛං සුඛන්තිදුක්ඛං:; කුච්ඡිතං, නින්දිතවූ; ඛංයි සේයි; සුඛංඉති; සුවයනුයි; දුක්ඛං, දුක්ඛනම්.)

"දුබ්භික්ඛකාලෙවස්සකතං සුභික්ඛං දුබ්භික්ඛං" යනාදියෙහි ඊෂාර්ථයෙහි වැටේ. (:අප්පකාභික්ඛා † යස්මිනති සො දුබ්භික්ඛො:; අප්පකා, මදවූ; භික්ඛා, භික්ෂාතොමෝ; යස්මිංඉති, යමක්හුකෙරෙහිනුයි; සො, හේතෙමේ; දුබ්භික්ඛො, දුබ්භික්ඛ නම්; (දුබ්භික්ඛනම් කාලයි) "දුබ්බණ්ණො—දුම්මුඛො" යනාදී යෙහි විරූපාර්ථයෙහි වැටේ; (:විරූපො වණ්ණො යස්සාති සො දුබ්බණ්ණො:; විරූපො, විරූපවූ; වණ්ණො, වර්ණතෙමේ; යස්සඉති, යමක්හුගේනුයි; සො, හේතෙමේ; දුබ්බණ්ණො; දුබ්බණ්ණනම්;—:විරූපංමුඛං යස්සාති සො දුම්මුඛො:; විරූපං, විරූපවූ; මුඛං, මුවයතෙමේ; යස්සඉති, යමක්හුගේනුයි; සො, හේතෙමේ; දුම්මුඛො, දුම්මුඛනම්;) "දුග්ගන්ධො" යනාදියෙහි

---

* දුකුච්ඡිතීසප්පත්ථෙසු-තිපි කත්ථචි දිස්සති.
† අප්පකං භික්ඛං—සමහර.

58 බන්ධනෙච ධනෙසෙච ධාතරිධාපකිත්තිතො
ධීමත්‍යං ධූතුභාරෙභූ ධෙවෙසෙ චින්තනෙසියා.

---

අශොභනාර්ථයෙහි වැටේ. (:අසොභනො ගන්ධො දුග්ගන්ධො:; අසොභනො, අයහපත්වූ; ගන්ධො, ගන්ධයතෙමේ; දුග්ගන්ධො, දුග්ගන්ධනම්;) "දුසණ්ඨානං" යනාදියෙහිද අශොභනාර්ථයෙහි වැටේ. "දුස්සීලොහිකබ්බු" යනාදියෙහි සීලාභාවයෙහි වැටේ. "දුස්සස්සං" යනාදියෙහි අසමෘද්ධියෙහි වැටේ- "දුක්කරං" යනාදියෙහි දුඃඛයෙහි වැටේ. "දුක්ඛීදුම්මනො" යනාදියෙහි අසන්තොසයෙහි වැටේ.)

(මෙසේ 'ද' කාරයාගේ අනෙකාර්ථවාචකත්වය දක්වා දැන් 'ධ' කාරයාගේ අනෙකාර්ථ වාචකත්වය දක්වන්නේ 'බන්ධනෙච ධනෙසෙච' යනාදි කීය.)

58 ධා, 'ධා' ශබ්දතෙමේ; බන්ධනෙච, බැඳීමෙහිද; ධනෙසෙච, (හිරණ්‍යසුවර්ණාදි) වස්තුසෙවීමෙහිද; ධාතරි, බ්‍රහ්මයා කෙරෙහිද; (වේයයි) පකිත්තිතො, කියනලද්දේය; ධී, 'ධී' ශබ්දතෙමේ; මත්‍යං, ප්‍රඥාවෙහි; (වේ) ධූතු, 'ධූ' ශබ්දතෙමේ වනාහි; භාරෙ, (ඉසිලිය යුතු) භාරයෙහි; අභූ, වී; ධෙ, 'ධෙ' ශබ්දතෙමේ; වෙසෙ, වෙශයෙහිද; චින්තනෙ, සිතීමෙහිද; සියා, වන්නේය.

(එහි "ථෙය්‍යධාජනධාරක්ඛා කතාධාඅව්ජපූජිතො
ධීරොබන්ධධංවොහාය සුධයොසුධයංකරෙ."

(යනාදියෙහි ශුද්ධනාමපදවූ 'ධා' ශබ්දතෙමේ යථාක්‍රමයෙන් වස්තුසෙවීමෙහිද බැඳීමෙහිද බ්‍රහ්මයාකෙරෙහිද වැටේ. "ධීරො" යනමෙහි 'ධී' ශබ්දතෙමේ ප්‍රඥාවෙහි වැටේ. "බන්ධධංවොහාය" යනමෙහි 'ධූ' ශබ්දතෙමේ භාරයෙහි වැටේ. "සුධයො" යනමෙහි 'ධෙ' ශබ්දතෙමේ වෙශයෙහි වැටේ. "සුධයං" යනමෙහි 'ධෙ' ශබ්දතෙමේ සිතීමෙහි වැටේ.)

(රක්ඛා, රජහුවිසින්; ථෙය්‍යධා, චෞරභාවයෙන් වස්තුසොයන්නාවූ; ජනා, ජනයෝ; ධාකතා, බන්ධනයකළාහුය; ධා, බ්‍රහ්මතෙමේ; අව්ජපූජිතො, බමුණන් විසින් පුදනලද්දේය; සුධයො, යහපත්වෙශ ඇත්තාවූ; ධීරො, ප්‍රාඥතෙමේ; බන්ධධං, ස්කන්ධභාරය; ඔහාය, හැරීමපිණිස; සුධයංකරෙ, මනාවූ සිතීම කරන්නේය.)

59 ධාධාරණෙකරහාසනාසාරොපන සන්ධිසු
පිදහනෙනිධානෙච සද්දහනුද්දිසෙසියා.

60 ධූතුගතිථෙරියෙසු කම්පනෙචනික්ඛමනෙ
පපෙපාටෙධංසනෙධොවෙ ආතුරරවනෙරපි·
ධෙපානෙඩිනිපාතොඝු ගරහාජ්ජෙපකිත්තිතො.

---

59 ධා, ‘ධා’ (යන) ධාතුතෙමේ; ධාරණෙ, දැරීමෙහිද; කර, කිරීමය; හාස, කීමය; නාස, නැසීමය; ආරොපන, නැත්වීමය; සන්ධිසු, ගැටීමය යනමෙහිද; පිදහනෙ, පියීමෙහිද; නිධානෙච, නිදන්කිරීමෙහිද; සද්දහනෙ, ඇදහීමෙහිද; උද්දිසෙ, උදෙසීමෙහිද; සියා, වන්නේය.

(“පඨවීධාතු-පනධාතු-කරධාතු” යනාදියෙහි ‘ධා’ යනධාතුතෙමේ දැරීමෙහි වැටේ. “විධානං—විධායති” යනාදියෙහි ‘වි’ පූර්වවූ ‘ධා’ ධාතුතෙමේ කිරීමෙහි වැටේ. “අභිධානං—අභිධාති” යනාදියෙහි ‘අභි’ පූර්වවූ ‘ධා’ ධාතුතෙමේ කීමෙහි වැටේ. “අනාධි-අනිද්ධනො-ගොතම්නිද්ධසති” යනාදියෙහි නැසීමෙහි වැටේ. “විසෙසාධානං—සමාධි” යනාදියෙහි නැත්වීමෙහි වැටේ. (විසෙසාධානනම් වෙනසට නැත්වීමයි.) :සම්මාආදධාතිචිත්තංආරම්මණං ආරොපෙතීති සමාධි:; ආදධාතියි සේයි; චිත්තං, සිත; ආරම්මණං, අරමුණට; සම්මා, මනාකොට; ආරොපෙතීඉති, නත්වාතුයි; සමාධි, සමාධිනම් ) “සන්ධි—පටිසන්ධි” යනාදියෙහි ගැටීමෙහි වැටේ. (:සම්මාධියති ඝටීයතීති සන්ධි:; ධීයතියි සේයි; සම්මා, මනාකොට; ඝටීයතීඉති, ගටතුලැබෙතුයි; සන්ධි, සන්ධිනම්;) :භවතො භවන්තරස්ස පටිසන්ධානතො ඝටනතො පටිසන්ධි:; භවතො, භවයෙන්; භවන්තරස්ස, භවාන්තරයට; පටිසන්ධානතොයි සේයි; ඝටනතො, ගැටෙනහෙයින්; පටිසන්ධි, පටිසන්ධිනම්;) “ද්වාරංපිදහිත්වා—පිහිතද්වාරො” යනාදියෙහි පියීමෙහි වැටේ. (මෙහි “අපිදහිත්වා—අපිහිතද්වාරො” යි කියයුතුතෙනහි ‘අපි’ යන උපසර්ගයාගේ ‘අ’ කාරයහට නිත්‍යලොපත්වයෙව “පිදහිත්වා—පිහිතද්වාරො” යි වේ;) “නිධිංනිධෙති-නිදහති-නිධීනංවපවත්තාරං-නිදහිත්වාන ධාතුයො” යනාදියෙහිනිදන්කිරීමෙහි වැටේ· “සද්ධා—සද්දහනා” යනාදියෙහිඇදහීමෙහි වැටේ. “සන්ධායභාසිතං” යනාදියෙහි උදෙසීමෙහි වැටේ. (‘සන්ධාය’ යනු උදෙසා යන අර්ථයි;)

60 ධූතු, ‘ධූ’ (යන) ධාතුතෙමේ වනානි; ගති, යාමය; ථෙරි

යෙසු, තිරබවය යනමෙහිද; කම්පනෙච, කම්පාවීමෙහිද; නික්ඛමනෙ, කෙලෙසීමෙහිද; පප්ඵොටෙ, පප්ඵොටනයෙහිද; ධංසනෙ, නැසීමෙහිද; ධොවෙ, පිරිසිදුකිරීමෙහිද; අතුරරව නෙඅපි, ශ්ලනුන්ගේහැඬීමෙහිද; (වේ) ධෙ, 'ධෙ'(යන) ධාතු තෙමේ; පානෙ, පීමෙහි; (වේ) ධිනිපාතො, 'ධි' (යන)නිපාත තෙමේ; ගරහණෙ, ගර්හාඊයෙහි; අභූ, වේ;.(යයි) පකිත්ති තො, කියනලද්දේය.

("ධුවඤ්ච භික්ඛවෙ දෙසිස්සාමි—ධුවගාමිනඤ්ච පටිපදං" යනාදියෙහි 'ධු' ධාතුතෙමේ සාමෙහිවැටේ. (:ජරාමරණෙහි මුඤ්චිතු කාමෙහිධවිතබ්බං ගන්තබ්බන්ති ධුවං:, ජරාමරණෙහි, ජරාමරණයන්කෙරෙන්; මුඤ්චිතුකාමෙහි, මිදෙනුකැමැත්ත න් විසින්; ධවිතබ්බංයි සේයි, ගන්තබ්බංඉති, යායුතෙත්නුයි; ධුවං, ධුවනම්; (ධුවනම් නිර්වානයි) "නිච්චොධුවො සස්සතො අවිපරිණාමධම්මො" යනාදියෙහි තිරබවෙහි වැටේ. (:ධවති ථිරතීති ධුවො:, ධවතියිසේයි; ථිරතිඉති, ස්ථිරවේනුයි; ධුවො, ධුවනම්.)

"ධජෝරථස්සපඤ්ඤාණං 'ධූමො' පඤ්ඤාණමග්ගිනං
රාජාරට්ඨස්සපඤ්ඤාණං භත්තාපඤ්ඤාණමිත්ථීනං" *

(යනමෙහි "ධූමො" යනපෙදෙහි 'ධූ' ධාතුතෙමේ කම්පා වීමෙහි වැටේ. (:ධුනාතිකම්පතීති ධූමො:, ධුනාතියි සේයි, කම්පතිඉති, කම්පාවේනුයි; ධූමො, ධූමනම්;) "සුවිජානිතො ජෙගුච්ඡිතබ්බො දිස්වා නිද්ධුයති—නිද්ධුසිත්වා" † යනාදියෙහි කෙලෙසීමෙහි වැටේ.)

"මහානුභාවපිසුනො මුනින්දමඥමාරුතො
සබ්බාතුතපයංවායි 'ධුනනෙතා' කුසුමංසමං."

(යනමෙහි "ධුනනෙතා" යනපෙදෙහි 'ධු' ධාතුතෙමේ. පප්ඵොටනයෙහි වැටේ. "ධුතධජං සමාදියි—ධුත ගුණෙණා—ධුතො—ධුනිත්වා" යනාදියෙහි නැසීමෙහි වැටේ. (:අකුසලෙ ධම්මෙ ධුනාතිධංසතීතිධුතො:; අකුසලෙ ධම්මෙ, අකුශල ධර්මයන්, ධුනාතියිසේයි, ධංසතිඉති, නසානුයි; ධුතො, ධුතන ම්;—"ධුනිත්වා" යනු නසායනාඅර්ථයි) "පත්තං ධොවති ‡—පාදෙ ධොවිත්වා" යනාදියෙහි පිරිසිදුකිරීමෙහි වැටේ.)

---

* අත්තාපඤ්ඤාණමිත්ථීනං—සමහර.

† ජෙගුච්ඡිතබ්බං දිස්වානිද්ධුයති-නිද්ධුසිත්වා-සමහර.

‡ වත්ථංධොවති—සමහර.

61 නකාරෙසුගතෙබන්‍ධෙ සම්පුණ්ණෙතස්සකාරියෙ
නාපච්චයෙච්ඡිහත්‍තිම්හි පුමෙනිනෙතරීහවෙ
නිධාතුම්හිඋපසග්ගෙ පදිස්සතිපයොගතො.

"අසිභොසීගමානෙන යොඅත්ථානංචිකුබ්බති
ගජ්ජෙනතිගතොභූම්‍යං සෙතිඅන්තු 'ධුතො' මිගො."

("බාලභගිලානො 'නිද්ධුනනෙතා' සයති" යනාදියෙහි ශීල
න්තුත්ගේ හැඬිමෙහි වැටේ. "සතතධෙනුසතෙදුහා" යනාදි
යෙහි 'ධෙ' ධාතුතෙමේ පීමෙහි වැටේ. (:ධයතිපිවතී ඉතොඛී
රං පොතකොති ධෙනු:, පොතකො; පැටිතෙමේ; ඉතො,
මෑගෙන්; ඛීරං, කිරි; ධයතියි සේයි; පිවතිඉති, බෝනුයි;
ධෙනු, ධෙනුනම්.)

("ධිරත්ථුතං ජනපදං යත්ථිත්ථී පරිනායිකා" යනාදියෙහි 'ධි'
යන නිපාතතෙමේ ගර්හාර්ථයෙහි වැටේ.)

(මෙසේ 'ධ' කාරයාගේ අනෙකාර්ථ වාචකත්වය දක්වා දැන්
'න' කාරයාගේ අනෙකාර්ථ වාචකත්වය දක්වන්නේ 'නකා
රෙ සුගතෙබන්‍ධෙ' යනාදිකීය.)

61 නකාරෙ, (නාමපදවූ) 'න' කාරතෙමේ; සුගතෙ, සර්
ඥයාකෙරෙහිද, යහපත්ගතියෙහි හෝ; බන්‍ධෙ, බන්‍ධනයෙ
හිද; සම්පුණ්ණෙ, සම්පූර්ණාර්ථයෙහිද; තස්ස, 'ත' ශබ්දයාගේ;
කාරියෙ, ('තස්සවානත්තං සබ්බත්ථ' යනමෙසිත්කළ.) කාර්‍ය්‍ය
(නකාර) යෙහිද; (වේ) නා, 'නා' කාරතෙමේ; පච්චයෙ, ('කි
යාදිතොනා' යනමෙසිත්කළ විකරණනා) ප්‍රත්‍යයෙහිද; වි
හත්තිම්හි, ('කරණෙතතියා' යනාදියෙන් කළනා) විභක්ති
යෙහිද; පුමෙ, පුරුෂයාකෙරෙහිද; (වේ) නි, 'නි' කාරතෙ
මේ; නෙතරි, (සුරනායකාදි) ජනප්‍රධානියා කෙරෙහිද; නි
ධාතුම්හි, 'නි' (යන) ධාතුවෙහිද; උපසග්ගෙ, (නි යන) උප
සර්ගයෙහිද; භවෙ, වන්නේය; (සි) පයොගතො, ප්‍රයොග
වශයෙන්; පදිස්සති, දක්නාලැබේ.

එහි "නමත්‍ථයාසාවකා නාගනාතුකෙසු නං කරෙය්‍ය
චොරාදිනංසපරාධජනානං නංකරෙය්‍යුංඅනුසාසකා
මහාමච්චා."

(යනාදියෙහි නාමපදවූ 'න' කාරතෙමේ යථාක්‍රමයෙන් ස
ර්ඥයාකෙරෙහිද, යහපත්ගතියෙහිද, බන්‍ධනයෙහිද, වැටේ)
සාවකා, ශ්‍රාවකයෝ; නමතං, සර්ඥයන් වහන්සේගේ අධි

62 නුථුත්‍යංනොතුනාවායං නොසද්දෙ අම්හජෙපන
පච්චත්තෙ උපයොගෙච කරණෙසම්පදානියෙ.

63 සාමිත්තවධාරණෙචෙව නුසද්දත්ථෙනිවාරණෙ
තථානිපාතමත්තම්හි නොසද්දෙසම්පවත්තති.

---

ප්‍රාය; අන්වයා, අනුවගියාහුය; නාගන්තුකෙසු, යහපත්වූගති ඇති ආගන්තුකයන් නිමිතිකොටගෙණ; චොරාදීනං, සොරු ආදීන්; නංකරෙය්‍යුං, බන්ධනය කරත්තේය; අනුසාසකා, අනුශාසනා කරන්නාවූ; මහාමච්චා, මහාමාත්‍යයෝ; සපරාධ ජනානං, අපරාධසහිතවූ ජනයන්; නංකරෙය්‍යුං, බන්ධනය කරන්නාහුය.)

("නගරං" යනාදියෙහි 'න' කාරතෙමේ සම්පූර්ණාර්ථයෙහි වැටේ. (:නං සම්පුණ්ණං ඝරංඑත්ථාති නගරං:; නංසිසේයි; සම්පුණ්ණං, සම්පූර්ණවූ; ඝරං, ගෘහය; එත්ථඉත්, මෙහිනුයි; නගරං, නගරනම්—මෙහි 'නඝරං' යි කියයුතුකෙතහි; 'දෙ ධ සස ච' යනාසූත්‍රයෙහි 'ච' ග්‍රහණයෙන්හෝ; මහාප්‍රදෙශ සූත්‍රයෙන්හෝ; 'ඝ' කාරයහට 'ග' කාරාදෙශකොට 'නගරං' සිවේ) "තස්සවානත්තං සබ්බඤ්ඤූ" යනමෙහි තශබ්දයාගේ කාර්‍යයෙහිවැටේ. (එසින්ම-'නෙ-නෙ-නෙන' යනාදි සිද්ධයි) "කියාදිතොනා" යනාදියෙහි 'නා' කාරතෙමේ විකරණප්‍රත්‍යයවූ 'නා' ප්‍රත්‍යයෙහිවැටේ' (එසින්ම-කිනාති-වික්කිනාති-යනාදිසිද්ධයි) "ස්මියො අංයොනාහි" යනාදියෙහි 'නා' විභක්තියෙහි වැටේ. (එසින්ම—මුනිනා—ආදිච්ච බන්ධුනා—යනාදි සිද්ධයි) "සෙනානිමහාමච්චා" යනාදියෙහි 'නි' කාරතෙමේ සෙනානායකාදි ජනප්‍රධානියා කෙරෙහි වැටේ. "නීනයෙ" යනාදියෙහි 'නි' ධාතුවෙහි වැටේ. "පපරානිනි" යනාදියෙහි උපසර්ගයෙහි වැටේ.

**62** නු, 'නු' කාරතෙමේ; ථුත්‍යං, සතුතිකිරීමෙහි; (වේ) නොතු, 'නො' කාරතෙමේ වනාහි; නාවායං, නවුකාවෙහි, (වේ) අම්හජෙ, අම්හශබ්දයෙන් ජනිතවූ; නොසද්දෙපන, 'නො' ශබ්දතෙමේ වනාහි, පච්චත්තෙ, ප්‍රථමාවෙහිද; උපයොගෙච, විතියාවෙහිද; කරණෙ, කරණයෙහිද; සම්පදානියෙ, සම්ප්‍රදානයෙහිද.

**63** සාමි, සවාමි විභක්තියෙහිද; (වේ) නොසද්දෙ, (අම්හශබ්දජ 'නො' ශබ්දයෙන් අන්‍යවූ)'නො' ශබ්දතෙමේ; අවධාරණෙචෙව, අවධාරණයෙහිද; නුසද්දත්ථෙ, නුශබ්දයාගේ අර්ථ

## 64 නීනයෙ * දමනෙනාසෙ කස්සනෙපවත්තනෙපි
## නිදස්සනෙනමනෙපි පවත්තතියථාරහං.

යෙහිද; නිවාරණෙ, වැලක්මෙහිද; තථා, එසේම; නිපාත
මත්තම්හි, නිපාත මාත්‍රයෙහිද; සම්පවත්තති, පවතී.

("නුගුණෙනගරු" යනාදියෙහි 'නු' කාරතෙමේ ස්තුතිකිරී
මෙහිවැටේ.(:ථොමිතබ්බාගුණෙ නුගුණො:; ථොමිතබ්බා,
ස්තුතිකාට්යුතුවූ; ගුණෙ, ගුණතෙමේ; නුගුණො, නුගුණනමී;)
"නොතරිතො නදීපාරංපත්තො" යනාදියෙහි 'නො' කාර
තෙමේ නවුකාවෙහි වැටේ. (නොතරිතො; නැවෙන්එතරව
නාලද පුරුෂතෙමේ; නදීපාරං, ගංපරතෙරට; පත්තො, පැමි
ණියේය;) "නාමං 'නො' ගවෙජයාම" යනාදියෙහි අම්හ
ශබ්දජ 'නො' ශබ්දතෙමේ ප්‍රථමාවෙහි වැටේ. "මා 'නො'
අජ්ජවිකන්තිංසු රඤ්ඤො සූදමහානසෙ" යනාදියෙහි විතීයා
වෙහි වැටේ. "න 'නො' විවාහො නාගෙහි කතපුබ්බො
කුදාචනං" යනාදියෙහි කරණසඞ්ඛ්‍යාත අනුක්තකර්තෘඅර්ථයෙහි
වැටේ. "සංවිභජෙථ 'නො' රජ්ජෙන" යනාදියෙහි සම්ප්‍රදාන
යෙහි වැටේ. "සත්ථා 'නො' භගවා අනුප්පත්තො" යනාදි
යෙහි ස්වාම්‍යර්ථයෙහි වැටේ. "න 'නො' සමං අත්ථිතථාගතෙ
න" යනාදියෙහි අම්හශබ්දජ 'නො' ශබ්දයෙන් අන්‍යවූ 'නො'
ශබ්දතෙමේ අවධාරණයෙහි වැටේ. "අභිජානාසි 'නො' ත්වං
මහාරාජ" යනාදියෙහි නුශබ්දාර්ථයෙහි වැටේ. (නුශබ්දාර්ථ
නම් ප්‍රශ්නාර්ථයි) "සුභාසිතඤ්ඤෙව භාසෙය්‍ය, 'නො' දුබ්භා
සිතං" යනාදියෙහි වැලක්මෙහි වැටේ. "න 'නො' සභායංක
රොන්ති කිඤ්චි" යනාදියෙහි නිපාත මාත්‍රයෙහි වැටේ.)

**64** නී, 'නී' ධාතුතෙමේ; නයෙ, පැමිණීමෙහිද; දමනෙ, ද
මනයකිරීමෙහිද; නාසෙ, නැසීමෙහිද; කස්සනෙ, සීසෑමෙ
හිද; පවත්තනෙඅපි, පැවැත්මෙහිද; නිදස්සනෙ, දැක්වීමෙහිද;
නමනෙඅපි, නැම්මෙහිද; යථාරහං, සුදුසුපරිද්දෙන්; පව
ත්තති, පවතී.

("අජං ගාමංනෙති—නීයමානොපිසාචෙන කිංනුලුද්දිකාසි" යනාදියෙහි 'නී' ධාතුතෙමේ පැමිණීමෙහි වැටේ. "ධ
ම්මවිනයො—විනායකො—වෙනෙය්‍ය බන්ධවො" යනාදියෙ
හි දමනයකිරීමෙහි වැටේ. (:කායවාචායොවිනෙතී දමෙතී
තිවිනයො:; කායවාචායො, කයවචනයන්; විනෙති සිසේ

* ණී පාපනෙ—ධාතුමඤ්ජූසා.

65 නුතුථුතියමබ්‍යයං පඤ්හසංසයනෙරිතං
පටිසෙධොපමානෙන නිපාතොසමුදීරිතො
නාමත්ථෙනන්ති නිපාතො පදිස්සතිපයොගතො.

---

සි, දමෙතීඉති, දමනයකෙරේනුයි; විනයො, විනයනම්—:සත්තෙවිනෙති දමෙතීති විනායකො:; සත්තෙ, සත්වයන්; විනෙති යිසේයි, දමෙතිඉති, දමනයකෙරේනුයි; විනායකො, විනායක නම්—:විනයනෙත දමයනෙතති වෙනෙයෙ‍්‍යා:, * විනයනෙතයිසේයි; දමයනෙතඉති, දමනයකරණු ලැබෙත් නුයි; වෙනෙය්‍යො, වෙනෙය්‍යනම්;) "විනෙය්‍යලොකෙ අභිජ්ඣාදෙමනස්සං" යනාදියෙහි නැසීමෙහි වැටේ ('විනෙය්‍ය' යනු නසායනඅර්ථයි) "නෙත්තිකා" යනාදියෙහි සීසෑමෙහි වැටේ. "චක්ඛායතනං-සොතායතනං" යනාදියෙහි පැවැත්මෙහි වැටේ (:අනමතග්ගෙසංසාරෙ පවත්තං අතිවආයතං සංසාරදුක්ඛං යාවනිවත්තති තාවනායතෙ වත්තතෙති ආයතනං:; අනමතග්ගෙ, නොදන්නාලද අග්‍රයඇති; සංසාරෙ, සසරෙහි; පවත්තං, පැවැත්නාවූ; අතිවආයතං, ඉතා දික්වූ; සංසාරදුක්ඛං, සසරදුක; යාව, යම්තාක්; නිවත්තති, නවතිද; තාව, ඒතාක්; නයතෙයි සේයි; වත්තතෙඉති, පවතිනුයි; ආයතනං, ආයතනනම්;) "ජාතිකුමාරං මගධනායකාකාවා" යනාදියෙහි දක්වීමෙහි වැටේ. "තනති නතා තදෙපාණා" යනාදියෙහි නැමීමෙහි වැටේ. (:නයති නමතීති නිතෙතා: නයතියිසේයි, නමතිඉති, නැමේනුයි; නිතෙතා නිතානනම්. †)

65 නුතු, 'නු' ධාතුතෙමේ වනාහි; ථුතියං, සතුතිකිරීමෙහි; (වේ) අබ්‍යයං, අව්‍යය (නුකාර) තෙමේ; පඤ්හ, ප්‍රශ්ණයෙහිද; සංසයනෙ, සැකකිරීමෙහිද; (වේයයි) ඊරිතං, කියනලද්දේය; නනිපාතො, 'න' (යන) නිපාතතෙමේ; පටිසෙධ, ප්‍රතිෂෙධය; උපමානෙ, උපමාය යනමෙහි; (වේයයි) සමුදීරිතො, කියනලද්දේය; නංඉතිනිපාතො, 'නං' යන නිපාතතෙමේ; නාමත්ථෙ, නාමාර්ථයෙහි; (වේයයි) පයොගතො, ප්‍රයොගවශයෙන්; පදිස්සති, දක්නාලැබේ.

---

* මේ විග්‍රහවාක්‍යය වැදගත් ග්‍රන්ථ කීපයක මෙසේම දක්නට ලැබුනුහෙයින් අපිද එසේමලියා අර්ථකිමු-එය ප්‍රාඥයන් විසින් විමසිය යුතු.

† සමහරුවනාහි 'නිතත' ධාතුවෙන් සිද්ධයයිකියත්

66 නිස්සෙසාභාවසන්‍යාස භුසත්ථමොක්ඛරාසිසු
ගෙහාදෙසොපමාහීන පසාදනිග්ගතච්චයෙ

67 දස්සනොසානනික්ඛන්තා ධොභාගෙසවධාරණෙ
සමීපෙබන්ධනෙඡෙකා නොන්තාභාගොපරතිස්සුච.

68 පාතුභාවෙවියොගෙච නිසෙධාදො නිදිස්සති †
අථොනීහරණෙචෙවා වරණාදොච නීසියා.

("නොති—නවති—නුතො"යනාදියෙහි 'නු' ධාතුතෙමේ ස්තුතිකිරීමෙහි වැටේ. "කස්මානුතුමෙහ * දහරානම්යරෙ" යනාදියෙහි අව්‍යයපදවූ 'නු' කාරතෙමේ ප්‍රශ්ණයෙහි වැටේ. "අහන්නුඛොඅස්මි—නොනුඛොඅස්මි" යනාදියෙහි සැකකිරීමෙහි වැටේ. "න'චාහං පණ්ණං භුඤ්ජාමි—'න' හෙතං මය්හං භොජනං" යනාදියෙහි 'න' යන නිපාතතෙමේ ප්‍රතිෂෙධයෙහි වැටේ. "යං 'න' කඤ්චරෙපිවජ අනෙධන තමසාකතං" යනාදියෙහි උපමාවෙහි වැටේ. (මෙහි 'කතං 'න' යනුක රණලදමෙනි යනඅර්ථයි) "ගිහීපි 'නං' ගිහිස්සාපි" යනාදියෙහි 'නං' යන නිපාතතෙමේ නාමාර්ථයෙහි වැටේ. (මෙහි 'ගිහීපිනං' යනු ගෘහස්ථයෙක්ද නම්වේ යනඅර්ථයි.)

66 නි, 'නි' (යන) උපසර්ගතෙමේ, නිසෙසස නිරවශෙෂාර්ථය; අභාව, අභාවාර්ථය; සන්‍යාස, ව්‍යපනාර්ථය; භුසත්ථ, අතිශයාර්ථය; මොක්ඛ, නිර්වාණය; රාසිසු, සමූහය යනමෙහිද; ගෙහ, ගෘහය; ආදෙස, ආදෙශය; උපමා, උපමාය; හීන, හීනය; පසාද, ප්‍රශාදය; නිග්ගත, නික්මීමය; අච්චයෙ, ඉක්මීමය යනමෙහිද.

67 දස්සන, දර්ශනය; ඔසාන, අවසානය; නික්ඛන්ත, නිෂ්ක්‍රාන්තය; අධොභාගෙසු, අධඃභාගය යනමෙහිද; අවධාරණෙ, අවධාරණයෙහිද; සමීපෙ, සමීපයෙහිද; බන්ධනෙ, බන්ධනයෙහිද; ඡෙක, දක්ෂය; අනොත්තාභාග, අනන්තභාගය; උපරතිසුච, වැලකීමය යනමෙහිද.

68 පාතුභාවෙ, පහළවීමෙහිද; වියොගෙච, වියොගයෙහිද; නිසෙධාදො, නිෂෙධාදියෙහිද; (වේයයි) දිස්සති, දක්නා ලැබේ; අථො, නැවත; නී, නී (යන) උපසර්ගතෙමේ; නීහර

* කස්මානිතුමෙධා—මහාධම්මපාලජාතක.

† නිසෙධාදිමනි දිස්සති—තිපිකාත්ථ්වි දිස්සති.

ණෙචෙව, නීහරණයෙහිද, ආවරණෙදෙච, ආවරණාදී යෙහිද; සියා, වත්තේය.

(“නිරවසෙසං” යනාදියෙහි ‘නි’ යන උපසර්ගතෙමේ නිරවශෙෂාර්ථයෙහි වැටේ. “නිම්මක්ඛිකං” යනාදියෙහි අභාවාර්ථයෙහි වැටේ. “නිකඛනෙතා” යනාදියෙහි ව්‍යාපනාර්ථයෙහි වැටේ. “නිඝොසො ජයතෙබහු” යනාදියෙහි අතිශයාර්ථයෙහි වැටේ. “නිබ්බානං” යනාදියෙහි නිර්වාණයෙහි වැටේ. “නිචයො-නිකරො” යනාදියෙහි සමූහයෙහි වැටේ. “ආනම්මසකං නිකෙතනං” යනාදියෙහි ගෘහයෙහි වැටේ. “නිදානං” යනාදියෙහි ආදෙශයෙහි වැටේ. “නිදසසනං” යනාදියෙහි උපමාවෙහි වැටේ. “නිහීයතිපුරිසො—නිහීනසෙවී” යනාදියෙහි හීනයෙහි වැටේ. “නියාසො” යනාදියෙහි ප්‍රශාදයෙහි වැටේ. (:පසනෙනාභුත්වා යසති· පඬසරතීති නියාසො:; පසනෙනා භුත්වා, ප්‍රසන්නව; යසතිසිසේසි, පඬසරතිඉති, වැගිරේනුයි; නියාසො, නියාසනම්;) “නියාති—නිගගතො” යනාදියෙහි නික්මීමෙහි වැටේ. “නිකකමෙබා—නිකකසාවො” යනාදියෙහි ඉක්මීමෙහි වැටේ. “නිදසෙසනෙතා—නිද්දිසසති” යනාදියෙහි දර්ශනයෙහි වැටේ. “නිට්ඨිතං” යනාදියෙහි අවසානයෙහි වැටේ. “නිබ්බානං” යනාදියෙහි නිෂ්ක්‍රාන්තයෙහිද වැටේ. “නිකඛාතො—නිඛණිත්වා” යනාදියෙහි අධඃභාගයෙහි වැටේ. “නිච්ඡයො—විනිච්ඡයො” යනාදියෙහි අවධාරණයෙහි වැටේ. “නිස්සයො” * යනාදියෙහි සමීපයෙහි වැටේ. “නිබබනෙධා” යනාදියෙන් බන්ධනයෙහි වැටේ. “නිපුණො” යනාදියෙහි දක්ෂබවෙහි වැටේ. “නිසාමෙති—නිසාමනං” † යනාදියෙහි අනතාඝීභයෙහි වැටේ. “නිරසො—නිප්පාපො” යනාදියෙහි වැළකීමෙහි වැටේ (:නිරතො විරතො ආසාශිරාගසමා එසොති නිරසො:; එසො, මේතෙමේ; ආසායයිසේසි; රාගසමා, රාගයකෙරෙන්; නි්තොයිසේසි; විරතොඉති, වැලැක්කේනුයි, නිරසො, නිරසනම්—:නිරතො විරතො පාපසමා එසොති නිප්පාපො:; එසො, මේතෙමේ; පාපසමා, පාපයකෙරෙන්; නිරතොයි සේසි; විරතොඉති, වැලැක්කේනුයි; නිප්පාපො, නිප්පාපනම්;) “නිම්මිනි—නිම්මිනාති” යනාදියෙන් පහළවීමෙහි වැටේ. “ධම්මතො නිගගතො—නිරාලයො—නිකකී

* නිසසාය—සමහර.

† නිසාමෙති—නිසාමීනං,—සමහර.

69 දන්තාතිදන්තිඥ විරාජිතස්ස
තාදීඥතාදී ගුණමණ්ඩිතස්ස
ඉන්දාතිඉන්දිඥ මුනිස්සරස්ස
චක්ඛාතිචක්ඛිඥ වරෙසුසොභෙ.

---

ලෙසො" යනාදියෙහි වියොගයෙහි වැටේ. "නිසෙධෙති නිවාරෙති" යනාදියෙහි නිෂෙධයෙහි වැටේ. (මෙහි 'ආදි' ශබ්දයෙන් අවවාදාදිය ගැණේ;—"ගච්ඡපුත්ත නිවාදකො" යනාදියෙහි අවවාදයෙහි වැටේ "නීහරති" යනාදියෙහි 'නි' යන උපසර්ගතෙමේ නිහරණයෙහි වැටේ. "නීවරණං" යනාදියෙහි ආවරණයෙහි වැටේ. (මෙහි 'ආදි' ශබ්දයෙන් නිග්ගමනාදිය ගැණේ—"නීයානිකං සත්ථුසාසනං" යනාදියෙහි නිග්ගමනයෙහි වැටේ.)

(මෙසේ තකාරාදි නකාරාන්ත දන්ත්‍යතවර්ගයාගේ අනෙකාර්ථ ප්‍රභෙදදක්වා තත්මූලකාරණවූ ශාස්තෘන් වහන්සේට ද. තත්නිශ්‍රයවූ පර්‍ය්‍යාප්ති ධර්මයටද. සෙනාත්‍රමුඛයෙන් තත්නිශ්‍රයවූවන්ගේ ප්‍රශාදෙත්පත්තිය පිණිසද. ඔවුන්ගේ එහිශ්‍රවණොද්ග්‍රහණ ධාරණාදියෙහි උත්සාහොත්පත්තිය පිණිසද. උයොජනයකරන්නේ 'දන්තාති දන්තිඥ විරාජිතස්ස' යනාදි කීය.)

69 දන්ත, (ප්‍රකෘතිසත්වයන්ගේ) දන්තයන්ටද; අතිදන්ත, (ශ්වෙත සූමන නිරන්තර ප්‍රභාස්වරාදි ගුණවශයෙන්) අතිරෙකවූ (සත්විනිරාජාදීන්ගේ) දන්තයන්ටද; ඉන්ද, (යථොක්ත ගුණාතිශයවශයෙන්ද. විනෙයජනයන්ගේ මාර්ගඵලූපනිශ්‍රය දන්ත්‍යාක්ෂර ප්‍රවෘත්ති සද්ධර්මජනන ස්ථානත්ව ගුණවශයෙන්ද. ඔවුන්ට;) අධිපතිවූ (සමසතළිස්) දන්තයෙන්; විරාජිතස්ස, භ්‍රාජිතවූ; තාදී, (සියළුශ්‍රාවක ප්‍රත්‍යෙක සර්වඥයන්ගේ ඉෂ්ටානිෂ්ටයන්හි අනූනය ප්‍රතිඝාභාවයෙන්හෝ, අවිකාරාපත්ති සඞ්ඛ්‍යාත අෂ්ටලොක ධර්මයෙන් හෝ) අකම්ප්‍යමාන (භාවසඞ්ඛ්‍යාත අනෙක ප්‍රකාරක්ෂාන්ති මෛත්‍රී දයාමුදාදි) ගුණයන්ට; ඉන්ද, අධිපතිවූ; තාදීගුණ, (ඔවුන්ගෙන් අතිශයවූ නිරතිශයාභාවයෙන් අනන්‍ය සාධාරණ ඉෂ්ටානිෂ්ටයන්හි අනූනය ප්‍රතිඝාභාවයෙන් හෝ; අවිකාරාපත්ති සඞ්ඛ්‍යාත අෂ්ටලොක ධර්මයෙන් හෝ;) අකම්ප්‍යමාන (භාවසඞ්ඛ්‍යාත අනෙකප්‍රකාර අප්‍රමෙය ක්ෂාන්ති මෛත්‍රී දයාමුදාදි) ගුණයෙන්; මණ්ඩිතස්ස, විභූසිතවූ; ඉන්ද, ශක්‍රයාටද; අතිඉන්ද, (ඔහුගෙන්) අතිරෙක

70 මුනින්දදන්තා වරසම්භවානං
නොසානතාදීන මෙකක්ඛරානං
භෙදත්ථදීපො ජලිතොමයෙවං
ධීරක්ඛිනික්ඛන්තු තදීපසාරී.

## තවග්ගං නිට්ඨිතං.

———000———

71 වාතුණ්හපරමත්ථෙ පොරොගෙච්ඡෙඅපායකෙ.
ගිරිකොපීනපඩෙකසු පාතුවාතෙචපිතරි.

---

ඉන්ද්‍රවූ බ්‍රහ්මයන්ටද; ශ්‍රාවක ප්‍රත්‍යෙක සර්‍වඥයන්ට හෝ ඉන්ද, අධිපතිවූ; මුනිස්සරස්ස, මුනීන්ද්‍රයන් වහන්සේගේ; චක්ඛා, (මනුෂ්‍යරාජාදීන්ගේ ආඥ) චක්‍රයටද; අතිචක්ඛා, (ඔවුන්ගෙන්) අතිරෙකවූ (මහෙශාක්‍ය දෙවරාජාදීන්ගේ ආඥ) චක්‍රයටද; ඉන්ද, අධිපතිවූ; වරෙ, (දිව්‍යමනුෂ්‍යයන් විසින් ලෞකික ලොකොත්තර හිත ප්‍රතිලාභයට හෙතුභාවයෙන්) ප්‍රාර්ථනාකටයුතුවූ; සුසොභෙ, (ශ්‍රවණොද්ග්‍රහණ ධාරණාදි වශයෙන් අර්ථශෙවක සත්වයන්ගේ ලෞකික ලොකොත්තරනිෂ්පාදක භාවයෙන්) ඉතාශොභපත්වූ; (පය්‍යාප්තිශාසනයෙහි.)

70 මුනින්ද, මුනීන්ද්‍රයන් වහන්සේගේ; දන්තාවර, ඉතා උතුම්වූ දන්ත (ස්ථාන) යෙහි; සම්භවානං, උපන්නාවූ; නොසානං, නකාරය අවසන්කොට ඇති; තාදීනං, තකාරාදිවූ; එකක්ඛරානං, එකාක්‍ෂරයන්ගේ; භෙදත්ථදීපො, නානාර්ථ (ප්‍රකාශකවූ) ප්‍රදීප (සදෘශග්‍රන්ථ) තෙමේ; එවං, මේ (‘චොරසි ඛගාලවාලෙසු’ යනාදි යථොක්ත) ක්‍රමයෙන්; මයා, මාවිසින්; ජලිතො, දල්වනලද්දේද; තං, ඒ (මාවිසින් යථොක්ත) ප්‍රදීපය; සාරී, (පණ්ඩිතවූ) ශ්‍රොතෘජනයෝ; ධීරක්ඛිනා, ප්‍රඥ නමැති ඇසින්; ඉක්ඛන්තු, බලත්වා.

## තවර්ගීය සමාප්තයි.

———000———

(මේසේ දන්ත්‍යතවර්ගීයාගේ අනෙකාර්ථ වාචකත්වයදක්වා දැන් පවර්ගීය සම්බන්ධිවූ ආදි පකාරයාගේ අනෙකාර්ථ වාචකත්වය දක්වන්නේ “වාතුණ්හ පරමත්ථෙපො” යනාදිකීය)

71 පො, (ශුද්ධනාමපදවූ) ‘ප’ කාරතෙමේ; වාතෙ, වාත

යෙහිද; උණ්හ, උෂ්ණයෙහිද; පරමත්‍ථෙ, පරමාර්‍ථයෙහිද; රොගෙ, රොගයෙහිද; විසෙ, විෂයෙහිද; අපායකෙ, අපාය යෙහිද; ගිරිකොපීන, අඞ්ගජාතය පඩෙකෂු, මඩයයනාමෙ හිද; (වේ) පාතු, 'පා' කාරතෙමේ වනාහි; වාතෙච, වාත යෙහිද; පිතරි, පියාකෙරෙහිද; (වේ.)

(එහි "පලාසො" යනාදියෙහි 'ප' කාරතෙමේ වාතයෙහි වැටේ. (:පෙනවාතෙන ලසති සතණ්ඩුල ධඤ්ඤතො අප ගච්ඡතීති පලාසො:, පෙනයි සේයි; වාතෙන, වාතයකරණ කොටගෙණ; ලසතියි සේයි; සතණ්ඩුලධඤ්ඤතො, සවිකි යසාල් ධාන්‍යයෙන්; අපගච්ඡතීඉති, පහවයේනුයි; පලාසො, පලාසනම්; (පලාසනම් සාල්රහිතවූ තුච්ඡමාත්‍රධාන්‍ය විශෙෂ යෙකි) "පදරඵලං" * යනාදියෙහි උෂ්ණයෙහි වැටේ. (:අජ්ඣත්තික බාහිරාදි තික්ඛ තෙජොධාතු සඞ්ගමෙනපවත්තං කායදරථසඞ්ඛාතං උණ්හංදරති පදාලෙති විනාසෙතීති පදරං:; අජ්ඣත්තිකබාහිරාදි, ආධ්‍යාත්මික බාහිරාදිවූ; තික්ඛතෙ ජොධාතු සඞ්ගමෙන, තියුනුවූ තෙජොධාතුවගේ සඞ්ගමයෙ න්; පවත්තං, පැවැත්තාවූ; කායදරථ සඞ්ඛාතං, ශරීරපරිදා හයයි කියනලද; උණ්හං, උෂ්ණය; දරතියි සේයි; පදාලෙ තියි සේයි; විනාසෙතීඉති, විනාසකෙරේනුයි; පදරං, පදර නම්; (පදරනම් ඩෙබරඵලයි) "පඝාහො" යනාදියෙහි ප රමාර්‍ථයෙහි වැටේ. (:අත්තනො නිස්සයං පංපරමත්‍ථං ගණ්හා පෙතීති පඝාහො:; අත්තනො, තමාගේ; නිස්සයං, නිශ්‍ර යවූ; පංයිසේයි; පරමත්‍ථං; පරමාර්‍ථය; ගණ්හාපෙතීඉති, ග න්වානුයි; පඝාහො, පඝාහනම්.) "පදොලො" † යනාදි යෙහි රොගයෙහිද විෂයෙහිද වැටේ. (:පංසීසරොගාදිකංඋ රගවිසාදිකංවා දවති දූනොතිවා හිංසති විනාසෙතීති පදො ලො:; පංයි සේයි; සීසරොගාදිකංවා, සීසරොගාදියහෝ; උරග විසාදිකං වා, සර්පවිෂාදිය හෝ; දවතියි සේයි; දූනොතියිහෝ සේයි, හිංසතියි සේයි, විනාසෙතී ඉති, විනාසකෙරේනුයි; ප දොලො, පදොලනම්; (පදොලනම් කොෂඵල සදෘශඵලඇති අධිකකටුක රසයෙන් යුත් ලතාවිශෙෂයෙකි ¶) "යදාච පචු තිපාපං" යනාදියෙහි අපායෙහි වැටේ. (:පංඅපායංපෙති ග ච්ඡති එතෙනාතිපාපං:; එතෙන, මේ කාරණකොටගෙණ;

* බදරඵලං—සීත්පාඨයි:

† පටොලො—සීත්පාඨයි:

¶ එනම්—දුම්මැල්ලයි

72 පිහන්තරිකලන්තම්හි පූකරීසම්හිනිරයෙ
පාතුපානාවනෙපතෙන පූරණෙපීනුතප්පණෙ †

73 කන්තුන්නතම්හිපූධාතු ‡ සොධනෙනොනතගමනෙ.
පෙතුගති සොසනම්හි වූඩ්ඪියඤ්ච පදිස්සති.

පංයි සේයි; අපායං, අපායට; පෙතිධිසේයි, ගච්ඡතීඉති, යේ නුයි; පාපං, පාපනම්; (මෙහි 'ප' ශබ්දූපපද 'පෙ' යන ධාතුනූකෙරෙන් 'ණ' ප්‍රත්‍යව 'පාපං' යනුසිද්ධයි *) "පටො" යනාදියෙහි අඞ්ගජාතයෙහි වැටේ. (:පංහිරිකොපීනාංවෙති පටිච්ඡාදෙතීති පටො:; පංසිසේයි; හිරිකොපීනං, අඞ්ගජාතය; වෙතිසිසේයි, පටිච්ඡාදෙතීඉති, වසාතුයි; පටො, පටනම්; (පටනම් අඞ්ගජාත ප්‍රතිච්ඡාදක වස්ත්‍රයි) "පදුමං" යනාදියෙහි මඩෙහි වැටේ. (:පම්හි පඞ්කම්හි දවති රුහතීතිපදුමං:; පම්හිසිසේයි; පඞ්කම්හි, මඩෙහි; දවතීයිසේයි; රුහතීඉති, හටගනීනුයි පදුමං, පදුමනම් (:මෙහි 'ප' ශබ්දූපපද 'දු' යන ධාතුහූකෙරෙන් 'ම' ප්‍රත්‍යයව 'පදුමං' යනුසිද්ධයි) "පාවාරො" යනාදියෙහි 'පා' කාරතෙමේ වාතයෙහි වැටේ. (:පාඉතිසඞ්ඛාතෙ වාතෙවාරෙතීති පාවාරො:; පාඉති සඞ්ඛාතෙ, පායිකියනලද; වාතෙ, වාතයන්; වාරෙතීඉති, වලකානුයි; පාවාරො, පාවාරනම්. (පාවාරනම් නිරන්තර දික්වූලොම යෙත්යුත් පොරවියයුතු වස්ත්‍රවිශෙෂයෙකි—පිතෘවාචක 'පා' කාරයට උදාහරණ මතුදක්වනු ලැබේ.)

72 පි, 'පි' ශබ්දතෙමේ; සන්තරි, සැමියාකෙරෙහිද; කලන්තම්හි, භාර්‍ය්‍යාව කෙරෙහිද; (වේ) පූ, 'පූ' ශබ්දතෙමේ; කරීසම්හි, මලයෙහිද;; නිරයෙ, නරකයෙහිද; (වේ) පාතු, පා' ධාතුතෙමේ වනාහි; පානෙ, පීමෙහිද; අවනෙ, රැකීමෙහිද; පතෙන, පැමිණීමෙහිද; පූරණෙ, පිරීමෙහිද; (වේ) පීතු, 'පී' ධාතුතෙමේ වනාහි; තප්පණෙ, පිනාවීමෙහිද;

73 කනෙත, කැමතිවීමෙහිද; උන්නතෙ, නැගීමෙහිද;(වේ) පූධාතු, 'පූ' ධාතුතෙමේවනාහි; සොධනෙ, පිරිසිදුකිරීමෙහිද; ඔනත, නැම්මය; ගමනෙ, යාමය යනමෙහිද; (වේ) පෙතු, 'පෙ' ධාතුතෙමේ වනාහි; ගති, යාමය; සොසනම්හි, වියලීමය යනමෙහිද; වුඩ්ඪියඤ්ච, වැඩීමෙහිද; පදිස්සති, දක්නාලැබේ.

* සමහරුවනාහි 'ප'පූර්වවූ 'අප' යනධාතුවෙන් සිද්ධයයිකියත්
† පිතුතප්පණෙ—තිපිකාඑවි දිසසති.
‡ පූ ධාතු—තිපිකාඑවි දිසසති.

‘‘පියන්තිපාපුත්තෙත පීනං, පියොපියොචසූපියො
මෙත්තාවසෙනතංපියං, චක්කවත්තිකරංභවෙ.’’

(යනමෙහි ‘පා’ ශබ්දතෙමේ, පියාකෙරෙහි වැටේ. ‘පි’ ශබ්දතෙමේ, යථා ක්‍රමයෙන් සැමියා කෙරෙහිද, භාර්‍ය්‍යාව කෙරෙහිද, වැටේ )

(පා, පියෝතුමූ; පුත්තෙ, පුත්‍රයන්ට; පියන්ති, ප්‍රියකෙරෙත්; පීනං, සැමියන්ට; පියො, භාර්‍ය්‍යාවෝද; සූපියො, යහපත් භාර්‍ය්‍යාවන්ට; පියොච, සැමියෝද; (ප්‍රියකෙරෙත්) මෙත්තාවසෙන, මෛත්‍රීවශයෙන්; තංපියං, ඒ (යථොක්ත පුත්‍රාදීන්කෙරෙහි) ප්‍රියකිරීම; චක්කවත්තිකරං, සක්විති රජබව කරන්නේ; භවෙ, වන්නේය.)

(‘‘පුක්කුසො’’ යනාදියෙහි ‘පු’ශබ්දතෙමේ මලයෙහිවැටේ. :පුවුච්චති කරීසං තං කුසතිඅපනෙතීති පුක්කුසො:, පු, පුය නු; කරීසං වුච්චති; මලැයිකියනුලැබේ; තං,ඒමලය; කුසතියි සේයි; අපනෙතිඉති, පහකෙරේනුයි; පුක්කුසො, පුක්කුස නම්; (පුක්කුසනම් මලහැරදමන ලාමක මනුෂ්‍යයි)

(“පූගහලො” යනාදියෙහි නරකයෙහි වැටේ. (:පුංනිරයං ගච්ඡතීති පූගහලො:; පුංයිසේයි, නිරයං,නාරකයට; ගච්ඡති ඉති, යේනුයි; පූගහලො, පූගහලනම්.) ‘‘කච්ඡපො-සීසපො- පාදපො— ද්විපො—ථනපො—උදපානො’’ යනාදියෙහි ‘පා’ ධාතුතෙමේ පීමෙහි වැටේ. (:කච්ඡෙන පිවතීති කච්ඡපො:, කච්ඡෙන, කැසින්; පිවතිඉති, බෝනුයි; කච්ඡපො, කච්ඡප නම්; (කච්ඡපනම් කුම්යි) :සීසෙනපිවතීති සීසපො:, සීසෙන, හිසෙන්; පිවතිඉති, බෝනුයි; සීසපො, සීසපනම්; (සීසපනම් වෘක්ෂ විශෙෂයෙකි) :පාදෙන පිවතීති පාදපො:, පාදෙන, මුලින්; පිවති ඉති, බෝනුයි; පාදපො, පාදපනම්. (පාදපනම් සාමාන්‍ය වෘක්ෂයි) :මුඛෙන සොණ්ඩායචාති ද්වීහිපිවතීති ද්විපො:, මුඛෙන, මුවෙන්ද; සොණ්ඩායච ඉති, සොඬෙන්ද යන; ද්වීහි, දෙකින්; පිවති ඉති, බෝනුයි; ද්විපො, ද්විපනම්, (ද්විප නම් හස්තියි) :ථනාඛීරං * පිවතීති ථනපො:. ථනා, තනයෙන්; ඛීරං, කිරි; පිවතිඉති, බෝනුයි; ථනපො, ථනපනම්;(ථන පනම් ළදරුකුමාරයි) :උදකංපිවති එත්ථාති උදපානො:, එත්ථ, මෙහි; උදකං, ජලය; පිවතිඉති, බෝනුයි; උදපානො, උදපා

* ථනංඛීරං—සමහර.

නානම්; (උදපානනම් තඩාගාදියි) "භූපො— යූථපො—ප
ජාපති—භූපති—පිතා" යනාදියෙහි රැකීමෙහි වැටේ. (:භූං
භූමිංපාති රක්ඛතීතිභූපො:; භූංයිසේයි; භූමිං, පෘථිවිය; පා
තියිසේයි; රක්ඛතිඉති, රක්ෂාකෙරේනුයි; භූපො, භූපනම්;
(භූපනම්, රජයි) :යූථං ගණංපාති රක්ඛතීතියූථපො:, යූථංයි
සේයි; ගණං, (සවජාතිය) සමූහයා, පාතියිසේයි; රක්ඛතිඉති,
රක්ෂාකෙරේනුයි; යූථපො, යූථපනම්; (යූථපනම්, හස්තිරාජාදි
යි) :පජංපුත්තං පාතිරක්ඛතීති පජාපති:, පජංයිසේයි, පු
ත්තං, පුත්‍රයා; පාතියිසේයි, රක්ඛතිඉති, රක්ෂාකෙරේනුයි;
පජාපති, පජාපති නම්; (පජාපතිනම්, භාය්‍යායායි) :භූංපඨවිං
පාති රක්ඛතීති භූපති:, භූංයිසේයි; පඨවිං, පෘථිවිය; පාතියි
සේයි, රක්ඛතිඉති, රක්ෂාකෙරේනුයි; භූපති, භූපතිනම්; (භූ
පතිනම්, රජයි) :පුත්තෙපාති රක්ඛතීතිපිතා: පුත්තෙ, පුත්‍ර
යන්; පාතියිසේයි, රක්ඛතිඉති, රක්ෂාකෙරේනුයි; පිතා, පිතෘ
නම්) "නදිපාරං" යනාදියෙහි පැමිණීමෙහි වැටේ. (:පායන්ති
නාවාදීහි පාපුණීයන්තීතිපාරං:; පායන්තියිසේයි; නාවාදීහි, නැ
ව්ආදියෙන්; පාපුණීයන්තිඉති, පැමිණෙනු ලැබේනුයි; පාරං,
පාරනම්; (මෙහි 'පා' යනධාතුහුකෙරෙන්, 'ණ' ප්‍රත්‍යයද
,ර' කාරාගමදකොට 'පාරං' යනුසිද්ධයි) "ජනොවිප්පකුලෙ
අහං" යනාදියෙහි පිරීමෙහි වැටේ. (:විපායන්ති පූරෙන්ති විසි
ට්ඨනවෙදුච්චාරණාදිනා බ්‍රාහ්මණකම්මෙන අත්තනො ලො
කස්සච අජ්ඣාසයන්ති විප්පො:; විපායන්තියිසේයි; විසිට්ඨෙ
න, විශිෂ්ටවූ; වෙදුච්චාරණාදිනා, වෙදෙච්චාරණාදිවූ; බ්‍රාහ්ම
ණකම්මෙන, බ්‍රාහ්මණකර්මයෙන්; අත්තනො, තමාගේද; ලො
කස්සච, ලොකයාගේද; අජ්ඣාසයං, අද්‍යාසය; පූරෙන්තිඉති,
සම්පූර්ණකෙරේනුයි; විප්පො, විප්පනම්; (විප්පනම් බ්‍රාහ්ම
ණයි—මෙහි 'වි' පූර්වවූ 'පා' යන ධාතුහු කෙරෙන් කර්තෘයෙහි
'ණ' ප්‍රත්‍යයව 'විප්පො' යනු සිද්ධයි) "මය්හං පීනයතං ම
නං" යනාදියෙහි 'පී' ධාතුතෙමේ පිනවීමෙහි වැටේ. "පු
ත්තා පියා මනුස්සෙසු සායමාලිඞ්ගනෙපියා" යනාදියෙහි කැ
මතිවීමෙහි වැටේ. "පීනීඤ්ඤියා—පීනොරක්ඛස බාහවො" *
යනාදියෙහි නැඟීමෙහි වැටේ. "පුනෙන්තා—පූමා—පූසකුං"
යනාදියෙහි 'පූ' ධාතුතෙමේ පිරිසිදුකිරීමෙහි වැටේ. (:අත්ත
නොකුලං පවන්ති පුනාතිවා සොධෙන්තීති පුනෙන්තා:; අත්ත
නො, තමාගේ, කුලං, කුලය; පවන්තියිසේයි; පුනාතියිහෝ

* { පී නී ති ඤ්ඤි යා / රක්ඛංසබහවො. } සමහර.

**74** දස්සනෙ තප්පරෙ සඞ්ඝෙ පසංසාගතිසුද්ධිසු
හිංසාපකාරනෙත්තාගාච වියොගාවයවෙසු පො
භුසත්ථෙපභවෙසුඤ්ඤෙ පසන්නපත්තනාදිසු.

සේයි; සොභෙතීති, පිරිසිදුකෙරේනුයි; පූනනො, පූනන නම්,—:අත්තනො කුලං පවති පුනාතිවා සොභෙතීති පූමා: අත්තනො, තමාගේ; කුලං, කුලය; පවතිසි සේයි; පුනාතිසිහෝසේයි; සොභෙතීති, පිරිසිදුකෙරේනුයි; පූමා, පූම නම්—:අත්තනොකාරකං ජනංපවති පුනාතිවා සොභෙතීතිපුඤ්ඤං:; අත්තනොකාරකං, තමාකරන්නාවූ; ජනං, ජනයා; පවතිසිසේයි; පුනාතිසිහෝසේයි; සොභෙතීති, පිරිසිදුකෙරේනුයි; පුඤ්ඤං, පුඤ්ඤනම්.) "තත්තිනෙහා තප්පොණතප්පබ්භාරො" යනාදියෙහි නැම්මෙහි වැටේ. (:පවතිපුනාතිවා ඔනමතීති පොණො: තං පොණො තප්පොණො:; පවතිසි සේයි; පුනාතිසි හෝසේයි; ඔනමතීති, නැමේනුයි; පොණො, පොණනම්; තං, එයට; පොණො, නැමුනේ; තප්පොණො, තප්පොණනම්) "පොතො" යනාදියෙහි යාමෙහි වැටේ. (:පවතිපුනාතිවා ගච්ඡති නදීපාරං එතෙනාතිපොතො:, පවතිසිසේයි; පුනාතිසි හෝසේයි; එතෙන, මේකරණකොටගෙණ; නදීපාරං, ගංපරතෙරට; ගච්ඡතීති, යේනුයි, පොතො, පොතනම්; (පොතනම් නවුකායි) "ඉධභික්ඛවෙ එකච්චො අස්සඛලුඞ්කො * 'පෙති' තිවුත්තො විද්ධො සමානො චොදිතො සාරථි † පච්ජතොරථං නිවත්තෙති උම්මග්ගං ගණ්හාති" යනාදියෙහි 'පෙ' ධාතුතෙමේ යාමෙහි වැටේ. "නිපකො" යනාදියෙහි වියල්මෙහි වැටේ. (:නිපයති නිස්සෙසතො විසොසෙති පටිපක්ඛන්ති නිපකො:; නිපයති සිසේයි; පටිපක්ඛං, ප්‍රතිපක්ෂවූවහු; නිස්සෙසතො, නිරවශෙෂයෙන්; විසොසෙතීති, වියලීමකෙරේනුයි; නිපකො; නිපකනම්; (නිපකනම් ප්‍රඥයි) "අපායො" යනාදියෙහි වෘද්ධියෙහි වැටේ. (:නත්ථිපායොවුඩ්ඪි එත්ථාතිඅපායො:; එත්ථ, මෙහි; පායොසිසේයි, වුඩ්ඪි, වෘද්ධිතොමෝ; නත්ථීති, නැත්තේනුයි; අපායො, අපායනම්; (අපායනම් සතරඅපාය භූමිහුයි.)

(මෙසේ ශුද්ධනාමපද ධාතුපදවූ 'ප' කාරයාගේ අනෙකාර්ථ වාචකත්වයදක්වා දැන් උපසර්ගපදවූ 'ප' කාරයාගේ අනෙකාර්ථ වාචකත්වය දක්වන්නේ 'දස්සනෙ තප්පරෙ සඞ්ඝෙ' යනාදිකිය.)

**74** පො, (උපසර්ගපදවූ) 'ප' කාරතෙමේ; දස්සනෙ, දර්ශන

* අස්සබලුඞ්කො—සමහර ——† සාධූන්—සමහර.

**75** යක්ඛූසාධනවාතෙසු තික්ඛාතෙතපුක්කාතෙචචො
නිප්ඵලවචනෙපස්ස කාරියෙඑාතුඩාතුයං.

---

යෙහිද; තප්පරෙ, තත්පරයෙහිද; සඞ්ග, ඇලීමෙහිද; පසංසා, ප්‍රසංසාය; ගති, යාමය; සුද්ධිසු, ශුද්ධිය යනමෙහිද; හිංසා, හිංසාය; පකාර, ප්‍රකාරය; අනෙතාභාව, අනන්තර්භාවය; වියොග, වියොගය; අවයවෙසු, අවයවය යනමෙහිද; භුසත්ථෙ, අතිශයාර්ථයෙහිද; පභවෙ, ප්‍රභවයෙහිද, සුඤ්ඤෙ, ශූන්‍යයෙහිද; පසන්න, ප්‍රසන්නය; පත්ථනාදිසු, ප්‍රාර්ථනාය යනමේ ආදියෙහිද; (වේ)

(එහි "පදිස්සති" යනාදියෙහි උපසර්ගපදවූ 'ප' කාරතෙමේ දර්ශනයෙහි වැටේ. "පාචරියො" යනාදියෙහි තත්පරයෙහි වැටේ. "පසඞ්ගා—පසජ්ජනං" යනාදියෙහි ඇලීමෙහි වැටේ. "පසංසා—පසංසිතො" යනාදියෙහි ප්‍රසංසාවෙහි වැටේ. "පගතො—පගච්ඡති" යනාදියෙහි යාමෙහි වැටේ. "පසුද්ධා—පසුජ්ඣති" යනාදියෙහි ශුද්ධියෙහි වැටේ. "ඉස්සා පකතො" යනාදියෙහි හිංසාවෙහි වැටේ. "පඤ්ඤ" යනාදියෙහි ප්‍රකාරයෙහි වැටේ. "පක්ඛිත්තං" යනාදියෙහිඅනන්තර්භාවයෙහි වැටේ. "චිරප්පවාසිං" යනාදියෙහි වියොගයෙහි වැටේ. "සප්පදෙසසත්තවිසෙසො—නිප්පදෙස සත්තවිසෙසො" යනාදියෙහි අවයවයෙහි වැටේ. "පවද්ධකායො" * යනාදියෙහි අතිශයාර්ථයෙහි වැටේ. "හිමවතා ගඞ්ගාපභවන්ති" යනාදියෙහි ප්‍රභවයෙහි වැටේ. "පවිවෙකො—පවිවෙකතරො" † යනාදියෙහි ශූන්‍යයෙහි වැටේ. "පසන්නමුදකං" යනාදියෙහි ප්‍රසන්නයෙහි වැටේ. "තංතංආනිසංසං පත්ථෙන්තෙහි ආහරියතෙති පාභතං—පණිධානං" යනාදියෙහි ප්‍රාර්ථනාවෙහි වැටේ. ( 'ආදි' ග්‍රහණයෙන් 'ඩීති—චින්ති' යනාදිය ගැණේ.)

(මෙසේ 'ප' කාරයාගේ අනෙකාර්ථ වාචකත්වයදක්වා දැන් 'එ' කාරයාගේ අනෙකාර්ථ වාචකත්වය දක්වන්නේ 'යක්ඛූසාධනවාතෙසු' යනාදිකිය.)

**75** එො, 'එ' කාරතෙමේ; යක්ඛූසාධන, භූනන්(කිස) සිදුකිරීමය; වාතෙසු, වාතය යනමෙහිද; තික්ඛාතෙත, තීක්ෂ්ණොච්චාරණයෙහිද; පූක්කාතෙච, පූයන ශබ්දකිරීමෙහිද; නිප්ඵල

---

* පස්සද්ධකායො—සම්භර

† පවිවෙකතරෙ—සම්හර

**76 ඵාඵාළෙවඩ්ඪනෙජීතු උන්නානෙගමනෙතථා
ජුතුපොටෙපදිස්සති තත්‍ථතත්‍ථප්පයොගතො.**

---

වචනෙ, නිෂ්ප්‍රයොජන වචනයෙහිද; පස්ස, පකාරයාගේ; කාරියෙ, කාර්‍ය්‍යයෙහිද; (වේ) ඵාතු, ‘ඵා’ කාරතෙමේ වනාහි; ධාතුයං, (ඵා.) ධාතුවෙහි, (වේ)

(එහි “බාහිරජන සම්මතං සූඵං’ ලාභස්සකාරණං
මාඵනො ‘ඵො’ තිසඞ්ඛාතො කොධනො
[‘ඵස්ස’ වාචකො”

(“සා‘ඵො’ බාලොතු ‘ඵ’ වචො” යනාදියෙහි ‘ඵ’ කාරතෙමේ; යථා ක්‍රමයෙන් භූනත්කිස සිදුකිරීමෙහි ද, වාතයෙහිද, තීක්‍ෂණොච්චාරණයෙහිද, ජුගුප්සනශබ්දකිරීමෙහිද, නිෂ්ප්‍රයොජන වචනයෙහිද, වැටේ.)

(සූඵං, යහපත්වූ (ආකාරයෙන් නිපදවනලද) යාගසාධනය; ලාභස්ස කාරණං, ලාභයට කාරණයයි; බාහිරජනසම්මතං, (සර්වඥශාසනයෙන්) බාහිර ජනයන් විසින් සම්මතකරණලද්දේය; මාඵනො, වාතතෙමේ; ඵොඉති සඞ්ඛාතො, ඵ යයිකියනලද්දේය; කොධනො, ක්‍රොධයෙන් මඬනලද ජනතෙමේ; ඵස්සවාචකො, තියුණු වචනකියන්නේය.)

(සා, බල්ලාතෙමේ;ඵො, ජුගුප්සනශබ්දකරන්නේය;බාලොතු, බාලතෙමේවනාහි; ඵවචො, නිෂ්ප්‍රයොජන වචනකියන්නේය.)

(“ඵෙනගු” යනාදියෙහිද වාතයෙහි වැටේ.(:ඵෙනවාතෙන ඉඤ්ජතිතිඵෙගගු:, ඵෙනයිසේයි; වාතෙන, වාතයෙන්; ඉඤ්ජතිඉති, කම්පාවේනුයි; ඵෙනගු, ඵෙනගුනම්; (මෙහි ‘ඵ’ ශබ්දූපපද ‘ඉඤ්ජ’ යනධාතුහුකෙරෙන් ‘ණු’ ප්‍රත්‍යයද ‘ජ’ කාරයහට ‘ග’ කාරාදෙශද ද්විත්තදකොට අසවර්ණාදෙශකළ කල්හි ‘ඵෙනගු’ යනුසිද්ධයි) “ඵොපස්සයථා—නිපඵනති” යනාදියෙහි ‘ප’ කාරයාගේ කාර්‍ය්‍යයෙහි වැටේ. “ඵාඵාළනෙ” යනාදියෙහි ‘ඵා’ කාරතෙමේ ‘ඵා’ ධාතුවෙහි වැටේ.)

76 ඵා ‘ඵා’ ධාතුතෙමේ; ඵාළෙ, පැළීමෙහි ද; වඩ්ඪනෙ, වැඩීමෙහිද; (වේ) ජීතු, ‘ජී’ ධාතුතෙමේ වනාහි; උන්නානෙ, උඩටනැම්මෙහිද; හෙවත්. නැගීමෙහිද; තථා, එසේම; ගමනෙ, යාමෙහිද; (වේ) ජුතු, ‘ජු’ ධාතුතෙමේ වනාහි; ඵොටෙ, විසිරීමෙහි; තත්‍ථ තත්‍ථ, ඒඒ තන්හි; පයොගතො, ප්‍රයොගවශයෙන්; පදිස්සති, දක්නාලැබේ.

77 නාගසඤ්ඤවග්ගෙවස්ස හස්සාපිකාරියෙසුවෙ
බොධාතුකාරියෙද්විස්ස බ්‍රූබ්‍රූධාතුම්හිබ්‍යත්තියං.

(“සම්ඵප්පලාපො” * යනාදියෙහි ‘ඵා’ ධාතුතෙමේ පැළීමෙහිවැටේ. (:සංහිතංසුඛඤ්ච ඵාතිඵාළෙති භින්දතීතිසම්ඵං: සම්ඵං පලපතීඑතෙනාති සම්ඵප්පලාපො:, සංයිසේයි; හිතං, හිතයද; සුඛඤ්ච, සුවයද; ඵාතියිසේයි, ඵාළෙතියිසේයි; භින්දතිඉති, බිඳිනුයි; සම්ඵං, සම්ඵනම්, (සම්ඵනම් නිෂ්ඵලවචනයි) සම්ඵං, නිෂ්ඵලවචනය; එතෙන, මේකරණකොටගෙණ; පලපතිඉති, කියානුයි; සම්ඵප්පලාපො, සම්ඵප්පලාපනම්,) “ඵාතිකම්මං”යනාදියෙහි වැඩීමෙහි වැටේ. (:ඵාතිවඩ්ඪති එතෙනාකම්මෙනාති ඵාතිකම්මං:, ඵාතියිසේයි; එතෙනකම්මෙන, මේකර්මය කරණකොටගෙණ; වඩ්ඪතිඉති, වැඩේනුයි; ඵාතිකම්මං, ඵාතිකම්මනම් ) “ඵෙනං” යනාදියෙහි ‘ඵි’ ධාතුතෙමේ උඩට නැමීමෙහිවැටේ. (:ඵියති උග්ගච්ඡති උන්නාමතීතිඵෙනං:; ඵියතියි සේයි; උග්ගච්ඡතියිසේයි, උන්නාමතිඉති, උඩටනැමේනුයි; හෙවත්. නැගේනුයි; ඵෙනං, ඵෙනනම්; (ඵෙනනම් දියපෙනඅදියි—මෙහි ‘ඵි’ යනධාතුහුකෙරෙන් ‘යු’ ප්‍රත්‍යය කොට ඔහට, ‘අන’ යනාදෙශ කළ කල්හි ‘ඵෙනං’ යනුසිද්ධයි) “ඵියෙනගච්ඡතිනාවා” යනාදියෙහි යාමෙහි වැටේ. (:ඵියතිගච්ඡති නාවා එතෙනාතිඵියො: ඵියතියිසේයි, එතෙන, මේකරණකොටගෙණ; නාවා, නවුකාතොමෝ; ගච්ඡති ඉති, යේනුයි; ඵියො, ඵියනම්,) “පාදූනාවඵොටානි” යනාදියෙහි ‘ඵු’ ධාතුතෙමේ විසිරීමෙහි වැටේ. (:ඵුනන්ති උපගච්ඡන්ති ඵොටභාවං ගච්ඡන්තීති ඵොටානි: ඵුනන්තියි සේයි; උපගච්ඡන්තියි සේයි; ඵොටභාවං, විසිරෙණබවට; ගච්ඡන්ති ඉති, යෙත්නුයි; ඵොටානි, ඵොටනම්වෙත්—මෙහි ‘ඵු’ යන ධාතුහුකෙරෙන් ‘ත’ ප්‍රත්‍යයද ඔහට ‘ට’ කාරාදෙශද වෘද්ධිද කොට සිද්ධවූ “ඵොට” ශබ්දයකෙරෙන් ‘යො’ විභක්තිද ඔහට, ‘නි’ යනාදෙශදකොට ‘ට’ කාරසථ ‘අ’ කාරයහට දීඝ කළකල්හි ‘ඵොටානි’ යනුසිද්ධයයි දතයුතු)

(මෙසේ ‘ඵ’ කාරයාගේ අනෙකාර්ථ වාචකත්වය දක්වා දැන් ‘බ’ කාරයාගේ අනෙකාර්ථ වාචකත්වය දක්වන්නේ ‘නාගසඤ්ඤවග්ගෙවස්ස’ යනාදි කීය)

**77** බො, ‘බ’ කාරතෙමේ; නාගසඤ්ඤවග්ගෙ, නාරජහුගේ

* සම්ඵලාපො—බුරුම්පොත්.

78 භොහිඩෙහජඤ්ඤගණෙච සම්බොධෙනාතුජ්ජුතියං
ධාතුඦිත්තිම්හිබායනෙ භංතාරෙහිතුධාතුයං.

ආයුබ යුගම්මයෙහිද; වසස, වකාරයාගේද; භසසඅපි, භකාර යාගේද; කාරියෙ, කායඹියෙහිද; කලෙ, කලයෙහිද; (වේ) බාතු, 'බා' කාරතෙමේ වනාහි; ද්විසස, ද්විශබ්දයාගේ; කාරියෙ, කායඹියෙහි; (වේ) බ්‍රෑ, 'බ්‍රෑ' ශබ්ද තෙමේ, බ්‍රෑධාතුම්හි, බ්‍රෑධාතුවෙහිද; බ්‍යත්තියං, ව්‍යක්තවචනයෙහිද; (වේ)

(එහි "නාගබොජන භූසංකරොති" යනාදියෙහි 'බ' කාර තෙමේ නාරජනූගේ ආයුබයුගම්යෙහි වැටේ (නාගබො, නා රජනූගේ ආයුබයුගම්තෙමේ; ජනභූසංකරොති, ජනයාඅල ඞ්කාරකෙරේ) "දෙබසසචාති සූතෙන චසඤ්ඤගහභණෙන 'බො' වසසයථා 'කුබ්බතො" යනාදියෙහි වකාරයාගේ කායඹි යෙහි වැටේ. "නෙනෙවහි වසඤ්ඤගහභණෙන 'බො' භසස යථා 'ලබ්භති" යනාදියෙහි භකාරයාගේ කායඹියෙහි වැ ටේ. "උදබො" යනාදියෙහි කලයෙහි වැටේ. (උදබනම් උදකකඨවයි) "වීසතිදසෙසු 'බා' ද්විසසනු" යනාදියෙහි 'බා' කාරතෙමේ ද්විශබ්දයාගේ කායඹියෙහි වැටේ. (වීසතිදසෙ සු, 'විසති' ශබ්ද 'දස' ශබ්දයන් පරකල්හි; ද්විසසනු, ද්විශබ්ද යහටවනාහි බා, බායනාදෙශවේ—එයින්ම "බාවීසති-බාර ස" යනාදිසිද්ධයි) "බ්‍රෑහූනමාහ ගූවා පරොක්ඛායං" යනාදියෙ හි 'බ්‍රෑ'ශබ්දතෙමේ, බ්‍රෑධාතුවෙහි වැටේ. (පරොක්ඛායං, පරො ක්ෂාවිභක්ති පරකල්හි, බ්‍රෑභූනං, 'බ්‍රෑ' ධාතු 'භූ' ධාතුදෙදෙනා හට, ආහභූවා, 'ආහ භූව' යනාදෙශයෝවෙත්-එයින්ම "ආ හ-ආහු-බභූව-බභූවු" යනාදිසිද්ධයි) "අබ්‍රැවී" යනාදියෙහි 'බ්‍රෑ' ධාතුතෙමේ ව්‍යක්තවචනයෙහි වැටේ)

(මෙසේ 'බ' කාරයාගේ අනෙකාර්ථ වාචකත්වයදක්වා දැන් 'භ' කාරයාගේ අනෙකාර්ථ වාචකත්වය දක්වන්නේ 'භොහි ඩෙහජඤ්ඤ ගණෙච' යනාදිකිය)

78 භො, 'භ' කාරතෙමේ; හිඩෙහ, භෘඞ්ගයාකෙරෙහිද; ජඤ්ඤගණෙච, (භගණසඞ්ඛ්‍යාත) ජඤ්ඤසගණයෙහිද;(වේ—භො, 'භො' ශබ්දතෙමේ) සම්බොධෙ, ආමන්ත්‍රණයෙහි; (වේ) භාතු, 'භා' කාරතෙමේ වනාහි; ජුතියං, රශ්මියෙහිද;ධාතු,(භා)ධාතු ය; දිත්තිම්හි, බැබලීමය යනමෙහිද; බායනෙ, වැටහීමෙහිද; (වේ) භං, (නපුංසකලිඞ්ග) 'භ' කාරතෙමේ; තාරෙ, නක්ෂත්‍ර යෙහි; (වේ) භීතු, 'භී' කාරතෙමේ වනාහි; ධාතුයං, (භී) ධාතුවෙහිද.

79 භායනෙ භූතු ධාතුම්හි පත්තෙ භූසත්තවඩ්ඪනෙ
පාතුභාවෙ නිප්ඵන්නෙ චාභිමද්දෙනුභවෙ’පි.

---

79 භායනෙ, බියවීමෙහිද; (වේ) භූතු, ‘භූ’ කාරතෙමේ වනාහි; ධාතුම්හි, (භූ) ධාතුවෙහිද; පත්තෙ, පැමිණීමෙහිද; භූ, පෘථිවිය; සත්ත, වීමය; වඩ්ඪනෙ, වැඩීමය යනමෙහිද; පාතුභාවෙ, පහළුවීමෙහිද; නිප්ඵන්නෙච, නිපදවීමෙහිද; අභිමද්දෙ, මැඩීමෙහිද; අනුභවෙඅපි, අනුභවකිරීමෙහිද;(වේ)

(එහි “බකුලො” * යනාදියෙහි ‘භ’ කාරතෙමේ; භෘඞ්ගයා කෙරෙහි වැටේ. (:භාභමරා ආකුලන්ති පක්ඛරන්ති පිවත්ථාය එත්ථාති බකුලො:, භායිසේයි; භමරා, භෘඞ්ගයෝ; පිවත්ථාය, කිම්පිණිස; එත්ථ, මෙහි; ආකුලන්තියි සේයි; පක්ඛරන්ති ඉති, ආකුලවෙත්නුයි; බකුලො, බකුලනම්; (බකුලනම් කෙසර සඞ්ඛ්‍යාතසුගන්ධ පුෂ්පයෙන්යුත් වෘක්ෂ විශෙෂයෙකි † මෙහි “භාකුලො”යි කියයුතුතෙනෙහි ‘භ’ කාරයහට ‘බ’ කාරද‘ආ’කාර යහට හ්‍රස්වදකොට “බකුලො” සිවේ) “වුත්තාවසන්තතිලකා ත‘භ’ ජජගාගො”යනාදියෙහි භගණසඞ්ඛ්‍යාත ඡන්දසාණයෙ හි වැටේ. (“සමණොබල්ලුභොගොතමො” යනාදියෙහි ‘භො’ ශබ්දතෙමේ ආමන්ත්‍රණයෙහිවැටේ.)“රංසිමා ‘භාකරො’භාතු” යනමෙහි ‘භාකරො’ යනපෙදෙහි ‘භා’ කාරතෙමේ; රශ්මියෙ හි වැටේ. (:භායොපභායො කරොතිති භාකරො:, භායොයි සේයි; පභායො, ප්‍රභාවන්;කරොතිඉති, කෙරේනුයි; භාකරො, භාකරනම්. (භාකරනම් සූර්‍ය්‍යයි) “භාදිත්තියං—භාබායනො” යනාදියෙහි ‘භා’ධාතුවෙහි වැටේ. “චන්දෙභාති” යනාදියෙ හි ‘භා’ ධාතුතෙමේ බැබලීමෙහි වැටේ. “පඤ්ඤාභාති—ප ඤ්ඤාමංපටිභාති” යනාදියෙහි වැටහීමෙහි වැටේ. “භාභා නි දිනකරකිරණතිභානි” යනමෙපෙදෙහි නපුංසකලිඞ්ග ‘භ’ කාරතෙමේ නක්ෂත්‍රයෙහි වැටේ. (:රත්තියංභාති දිප්පතිති භං: තස්සනක්ඛත්තස්ස ආභා ති භාභානි:, රත්තියං, රාත්‍රියෙ හි; භාතියිසේයි; දිප්පතිඉති, බබලානුයි; භං, භනම්; (භනම් නක්ෂත්‍රයි) තස්ස නක්ඛත්තස්ස, ඒ නක්ෂත්‍රයාගේ; ආභානි, ප්‍රභාවෝ, භාභානි, භාභනම්වෙත්;) “භීතයෙ” යනාදියෙහි ‘භී’ කාරතෙමේ ‘භී’ ධාතුවෙහි වැටේ. “භායන්තං—භීතො—ස බ්බෙභායන්තිමච්චුනො” යනාදියෙහි ‘භී’ ධාතුතෙමේ බිය

---

* වකුලො—සීත්, පාඨයි.

† එනම්—මුහුනමල්ය.

80 පරිසාපායසිවෙසු විහත්තිපච්චයෙසුච
ජන්තුගණෙඅන්ධකාරෙ නිග්ගහීතස්සකාරියෙ.
මකාරබ්‍යඤ්ජනෙචෙව මකාරොසමුදීරිතො

වීමෙහි වැටේ "භූසත්තායං" යනාදියෙහි 'භූ' ශබ්දතෙමේ 'භූ' ධාතුවෙහිවැටේ "ඉත්ථම්භූතාක්ඛ්‍යානෙ" යනාදියෙහි 'භූ' ධාතුතෙමේ පැමිණීමෙහි වැටේ. (:ඉත්ථං ඉමං පකාරං භූතො පත්තො ආපන්නො ඉත්ථම්භූතො:, ඉත්ථංයිසේයි; ඉමං පකාරං, මේප්‍රකාරයට; භූතොයිසේයි, පත්තොයි සේයි; ආපන්නො, පැමිණියේ; ඉත්ථම්භූතො, ඉත්ථම්භූතනාම්) "භූපති-භූපාලො-භූනාථො" යනාදියෙහි 'භූ' ශබ්දතෙමේ පෘථිවියෙහි වැටේ. (:භුයා පඨවියා පතීති භූපති:, භුයායිසේයි; පඨවියා, පෘථිවියට; පතීති, අධිපති නුයි; භූපති, භූපතිනාම්. (භූපතිනාම් රජයි) :භූං පඨවිං පාලෙතීති භූපාලො:, භූංයිසේයි; පඨවිං, පෘථිවිය; පාලෙතීති, රක්‍ෂාකෙරේනුයි; භූපාලො, භූපාලනාම්; (භූපාලනාම් රජයි) :භුයා පඨවියා තට්ඨානිකානං වා සත්තානං නාථොති භූනාථො:; භුයායිසේයි; පඨවියාවා, පෘථිවියටහෝ; තට්ඨානිකානං සත්තානංවා, ඒ ස්ථානකොටඇති සත්‍වයන්ටහෝ; නාථොති, නායකනුයි; භූනාථො, භූනාථනාම්; (භූනාථනාම් රජයි) "භවො—භවති" යනාදියෙහි 'භූ' ධාතුතෙමේ වීමෙහි වැටේ. "සුවිජානො 'භවං' හොති සුවිජානො පරාභවො" යනාදියෙහි වැඩීමෙහි වැටේ. "ඉත්ථිලිඞ්ගං පාතුභූතං" යනාදියෙහි පහළවීමෙහි වැටේ. "අත්ථංඅභිසම්භූනොති" යනාදියෙහි නිපදවීමෙහි වැටේ. "අභිභවති" යනාදියෙහි මැඩීමෙහි වැටේ. "අනුභවති" යනාදියෙහි අනුභවකිරීමෙහි වැටේ.)

(මෙසේ 'භ' කාරයාගේ අනෙකාර්ථ වාචකත්‍වයදක්වා දැන් 'ම' කාරයාගේ අනෙකාර්ථවාචකත්‍වයදක්වන්නේ 'පරිසාපායසිවෙසු' යනාදිකීය.)

80 මකාරෙ, 'ම' කාරතෙමේ; පරිසා, පිරිසය; අපාය, අපායය; සිවෙසු, ඊශ්වරය යනමොවුන්කෙරෙහිද; විහත්ති, (ආක්ඛ්‍යාත 'ම') විභක්තිය; පච්චයෙසුච, (කිතක 'ම') ප්‍රත්‍යය යනමොවුන් කෙරෙහිද; ජන්තුගණෙ, (මගණසඞ්ඛ්‍යාත) ජන්තු සඝණයෙහිද; අන්ධකාරෙ, (රාත්‍රි) අන්ධකාරයෙහිද; නිග්ගහීතස්ස, නිග්ගහීතයාගේ; කාරියෙ, කාර්‍ය්‍ය (මකාර) යෙහිද; මකාර බ්‍යඤ්ජනෙචෙව, මකාර (සඞ්ඛ්‍යාත) බ්‍යඤ්ජන (විශෙෂ) යෙහිද; (වේයයි) සමුදීරිතො, කියනලද්දේය.

(එහි “මසක්කසාරංවාසවස්ස” යනමෙහි “මසක්කසාරං” ය
නපෙදෙහි ‘ම’ කාරයතෙමේ පිරිසෙහි වැටේ. (:මාපරිසාච ස
ක්කාචාති මසක්කා: තෙ සරන්ති ගච්ඡන්ති කීළාවසෙන
එත්ථාති මසක්කසාරං:; මායි සේයි; පරිසාච, පිරිසද; සක්කා
චඉති, ශක්‍රතෙමේද යනමොහු; මසක්කා, මසක්කනම්වෙත්;
තෙ, ඔව්හු; එත්ථ, මෙහි; කීළාවසෙන, ක්‍රීඩාවශයෙන්; සර
න්ති සි සේයි; ගච්ඡන්ති ඉති, යත්තුයි; මසක්කසාරං, මස
ක්කසාරනම්; * (මසක්කසාරනම් ශක්‍ර භවනයි) “මඞ්ගලං”
යනමෙහි “මඞ්ගං” යනපෙදෙහි අපායෙහි වැටේ. (:මංඅ
පායං ගච්ඡන්ති පාපකාරිනො සත්තා එතෙනාති මඞ්ගං: තං
ලුනාති ඡින්දතීති මඞ්ගලං:; එතෙන, මේ කරණකොට ගෙ
ණ; පාපකාරිනො, පව්කරණසීලිවූ; සත්තා, සත්වයෝ; මංයි
සේයි; අපායං, අපායට; ගච්ඡන්තිඉති, යත්තුයි; මඞ්ගං, මඞ්ග
නම්; (මඞ්ගනම් අකුශලයි)තං, ඒඅකුශලය; ලුනාතියි සේයි; ඡි
න්දතිඉති, සිඳීතුයි; මඞ්ගලං, මඞ්ගලනම්) “මද්දරට්ඨං” යනමෙ
හි “මද්දං” යනපෙදෙහි ඊශ්වරයා කෙරෙහිවැටේ. (:මංසිවං
දදන්තිබලිං එත්ථාතිමද්දං: මද්දඤ්චතංරට්ඨඤ්චාති මද්දරට්ඨං:;
මංසි සේයි; සිවං බලිං, ශිවබලිය; එත්ථ,මෙහි; දදන්තිඉති;
දෙත්තුයි; මද්දං, මද්දනම්; මද්දඤ්චතං, මද්දවූයේද ශේ
තෙමේය; රට්ඨඤ්ච ඉති, රටවූයේද ශේතෙමේතුයි; මද්දර
ට්ඨං, මද්දරට්ඨනම්) “චත්තමානා තිඅන්තිසිථමි ‘ම’—පඤ්චමී
තුඅන්තුහිථමි ‘ම” යනමෙහිආඛ්‍යාත ‘ම’ විභක්තියෙහිවැටේ.
එයින්ම ‘පචාම’ යනාදිසිද්ධයි“(සමාදිහිථමා)”යනමේසූත්‍රයෙ
හිකිතක ‘ම’ප්‍රත්‍යයෙහිවැටේ. (සමාදීහි, සම ශබ්දාදීන්කෙරෙ
න්;ථමා, ‘ථ’ප්‍රත්‍යය ‘ම’ප්‍රත්‍යයෝවෙත්-එයින්ම ‘භීමො’ යනාදි
සිද්ධයි)“මො මොඝනොඝො විජ්ජුම්මාලා” යනාදියෙහි මගණ
සඞ්ඛ්‍යාත ඡන්දසගණයෙහි වැටේ. “මණ්ඩපො” යනාදියෙහි
රාත්‍ර්‍යන්ධකාරයෙහි වැටේ. (:මංරත්තන්ධකාරං ඩෙති විනා
සෙතීති මණ්ඩො: තංමණ්ඩංපාතිරක්ඛතීති මණ්ඩපො:, මංයි
සේයි;රත්තන්ධකාරං, රාත්‍ර්‍යන්ධකාරය;ඩෙතියි සේයි;විනාසෙ
තිඉති, විනාශකෙරේතුයි; මණ්ඩො, මණ්ඩනම්; (මණ්ඩනම්
හිරුරැසයි) තංමණ්ඩං, ඒහිරුරැස; පාතියි සේයි; රක්ඛතිඉති,
රකීතුයි; මණ්ඩපො, මණ්ඩපනම්) “මදූසරෙ” යනමේ සූත්‍ර

---

* මෙහි ‘මසක්කසාර’ ශබ්දය නපුංසකලිඞ්ගනමුදු අභිධාන
ප්‍රදීපිකාවෙහි “මසක්කසාරො වසොකසාරාචෙවා ‘මරු
වනී” කියා ‘මසක්කසාර’ශබ්දය පුල්ලිඞ්ගිකයයි කියනලදී.

81 මා ඉන්දු මාස ධාතුසු මා මාතු හිඩග සිරිසු
මානනෙ අබ්‍යයෙචාහු පටිසෙධෙ තදබ්‍යයං
ම නා මානස්ස කාරියෙ මං අම්හජනති සම්මතං.

---

යෙහි නිගෘහීතයාගේ කාය්‍ර්‍යයෙහි වැටේ. (සරෙ, ස්වරයා පරකල්හි (නිගෘහීතයහට) මද, (විකල්පයෙන්) මකාර දකාර යෝවෙත්—එයින්ම 'එවමස්ස' යනාදි සිද්ධයි) "වග්ගාපක්ඛපක්ඛවසො ම නා" යනමේ සූත්‍රයෙහි මකාර බ්‍යඤ්ජනයෙහි වැටේ. (:මො අනෙනා යෙසගෙනා මනානා:; මො, මකාර තෙමේ; අනෙනා, අනානවූයේ; යෙසං, යම්කෙණෙකුන්ටද; නෙ, ඔව්හු;මනානා, මනානනම් වෙත්.)

81 මා, 'මා' කාරතෙමේ; ඉන්දු, චන්ද්‍රය; මාස, (රැදුවල්තිසක් එක්වූ) මාසය;ධාතුසු, (මා) ධාතුය යනමෙහිද; මා, ශ්‍රීකාන්තාය; * මාතු, මව්ය; හිඩග, භාණ්ඩගය; සිරිසු, සම්පත්තියයනමෙහිද; † මානනෙ, ආදරකිරීමෙ ද; අබ්‍යයෙච, නිපාතයෙහිද; අහු, වී; පටිසෙධෙ, (ඒ 'මා' ශබ්දතෙමේ, යම්කලෙක්හි) ප්‍රතිෂෙධයෙහි; (වේද) තද, එකල්හි; අබ්‍යයං, නිපාත; (වේ) මංතු, 'මං' ශබ්දතෙමේ වනාහි; ම නස්ස, මානශබ්දයගේ; කාරියෙ, කාය්‍ර්‍යයෙහි; (වේයසිද) මං, 'මං' ශබ්දතෙමේ; අම්හජංඉති, අම්හශබ්දයෙන් ජනිතයසිද; සම්මතං, සම්මතකාරණ ලද්දේය.

("පුණ්ණමා—පුණ්ණමී" යනාදියෙහි 'මා' ශබ්දතෙමේ චන්ද්‍රයාකෙරෙහි වැටේ, (:පුණ්ණො මා චන්දො එත්ථාති පුණ්ණමා: පුණ්ණමීවා:; පුණ්ණො, සම්පූර්ණවූ; මාහි සේයි; චන්දො, චන්ද්‍රතෙමේ; එත්ථඉති, මෙහිනුයි; පුණ්ණමා, පුණ්ණමානම්; පුණ්ණමීවා, පුණ්ණමීනම් හෝ වේ ⁋ ) "පුණ්ණමා—පුණ්ණමී" යනමෙහිම 'මා' ශබ්දතෙමේ මාසයෙහිද වැටේ. (:පුණ්ණොමාමාසො එත්ථාති පුණ්ණමා: පුණ්ණමීවා:; පුණ්ණො, සම්පූර්ණවූ; මායි සේයි; මාසො, මාසතෙමේ; එත්ථඉති, මෙහිනුයි; පුණ්ණ

---

* මෙහි 'මා' ශබ්දය සම්පත්තිවාචකයයි කියත්-අමරකොෂයෙහි "ඉන්දිරාලොකමාතා'මා'ක්ෂීරාබ්ධිතනයාරමා"යි කී හෙයින් අපවිසින් 'මා'යනුශ්‍රීකාන්තායයි අර්ථ කියනලදී.

† මෙහි 'සිරි' ශබ්දය පාවීනිවාචකයයි කියත්-නිඝණ්ඩුයෙහි "සම්පත්තිසම්පදලක්ඛී සිරි" යි කී හෙයින් මෙහි 'සිරි' ශබ්දය සම්පත්තිවාචකවේ.

⁋ මෙහි චන්ද්‍රවාචක 'මා' ශබ්දය ආකාරාන්ත සූනබවාචක 'සා' ශබ්දයමෙන් වරනැගියයුතු.

මා, පූණ්ණමානම්; පූණ්ණමිවා, පූණ්ණමිනම් ගෝ වේ. * ) "මාමානෙ" යනාදියෙහි 'මා' ධාතුවෙහි වැටේ. "අප්පමෙමා ධවො ඤෙයෙත පටිසෙධෙතද්බ්‍යයං" යනමෙහි "මාධවො" යනපෙදෙහි ශ්‍රීකාන්තාවකෙරෙහි වැටේ. (:මායස්සිරියාධවො පතීති මාධවො:; මායයි සේයි; සිරියා, ශ්‍රීකාන්තාවගේ; ධ වොයි සේයි; පතිඉති, ස්වාමීනුයි; මාධවො, මාධවනම්; (මා ධවනම් විෂ්ණුයි) "මාතලි—මාඝො" යනාදියෙහි මවකෙරෙ හි වැටේ. (:මාමාතාවියසත්තානං හිතසුඛංතලතිවිදධාතීති මාතලි:; මායි සේයි; මාතාවිය, මවමෙන්; සත්තානං, සත්වයන් ට; හිතසුඛං, හිතයහාසුවය; තලන්ති සේයි; විදධාතීඉති, දරා නුයි; මාතලි, මාතලිනම්; (මාතලිනම් දෙවපුත්‍රවිශෙෂයෙකි) :මාමාතාවිය පරජනානං හිතසුඛංඝරති ආසිංසතීති මාඝො:; මායිසේයි; මාතාවිය, මවමෙන්; පරජනානං, පරජනයන්ට; හිතසුඛං, හිතයහා සුවය; ඝරතියිසේයි; ආසිංසතීඉති, ප්‍රාර්ථනා කෙරේනුයි; මාඝො, මාඝනම්; (මෙහි 'මා' ශබ්දපපද 'ඝර' ය නධාතුනුකෙරෙන් 'ක්වි'ප්‍රත්‍යයව 'මාඝො' යනු සිද්ධයි—මාඝන ම් මනුෂ්‍යවිශෙෂයෙකි) "මාලා" යනාදියෙහි භෘඞගයා කෙ රෙහිවැටේ. (:මාභමරාලලන්ති කීළන්ති අභිරමන්තිපිවනෙන එත්ථාතිමාලා:; මායි සේයි; භමරා, භෘඞගයෝ; පිවනෙන, පීමෙ න්; එත්ථ, මෙහි; ලලන්තියි සේයි; කීළන්තියි සේයි; අභිරමන්ති ඉති, මනාවඇලෙත්නුයි; මාලා, මාලානම්; (මෙහි 'මා' ශබ්ද පපද 'ලල' යන ධාතුනුකෙරෙන් 'ක්වි' ප්‍රත්‍යයව 'මාලා' යනු සිද්ධයි) "මන්ධාතා" යනාදියෙහි සම්පත්තියෙහි වැටේ. (:මං සිරිං ධාරෙති විදධාතීති මන්ධාතා:; මංයි සේයි; සිරිං, සම්ප ත්තිය; ධාරෙතියි සේයි; විදධාතීඉති, දරානුයි; මන්ධාතා, ම න්ධාතුනම්, (මන්ධාතුනම් ඉතාමහත්වූ භොගඇති අපගේ බොධිසත්වවූ සක්විතිරජෙකි)"මා-මනී" යනාදියෙහි 'මා'ධාතු තෙමේ ආදරකිරීමෙහි වැටේ.(:මීයතිසබ්බජනෙහීතිමා:, සබ්බ ජනෙහි, සියලුජනයන් විසින්; මීයතිඉති, ආදරකරණුලැබේ නුයි; මා, මානම්;(මානම් ශ්‍රීකාන්තායි):මීයති අතිමානීයතිආභ රණං එතෙනාති මනී:; මීයතියි සේයි; එතෙන, මේ කරණ කොටගෙණ; ආභරණං, ආභරණතෙමේ; අතිමානීයතීඉති, ඉතා ආදරකරණුලැබේනුයි; මනි, මනිනම්; (මනිනම් රතන

* දඹදිවහි චනාහි මාසයාගේ පෞණීම් පැළවියදින පට න් අපරමාසයාගේ පෞණීම්දිනය යම්තාක්ද, ඒතාක් එක මාසයෙකැයි සලකුණු කෙරෙති, ඒ පෞණීම් දින යෙහිවූ මාසය 'පූණ්ණ' නම් වේ.

82 මිතුධාතු විභත්තිසු පච්චයෙහිංසනෙ තථා
අන්තොපක්ඛිපනෙ චෙව පවත්තන්ති යථාරහං.

සි) "මායොගෙ සබ්බකාලෙච" යන මේ සූත්‍රයෙහි 'මා' ශබ්ද තෙමේ නිපාතයෙහි වැටේ. "මාගමී—මාවදී—මානවජානී—මා මං ආයස්මන්තො කිඤ්චි අවචුත්ථ—මා ආයස්මන්තො එතං භික්ඛුංකිඤ්චිඅවචුත්ථ" යනාදියෙහි නිපාත පදවූ 'මා' ශබ්ද තෙමේ ප්‍රතිෂෙධයෙහි වැටේ. "තතො පාමානානංවා'මං'ගෙසසූ" යනමෙහි 'මං' ශබ්දතෙමේ 'මාන' ශබ්දයාගේ කාර්‍ය්‍යයෙහි වැටේ. "එතෙගාමන්ති 'මං' ලෙනා—'මං' පටිසරණා—'මං' පාති" යනාදියෙහිද "කරෙමිතෙතංවචනං යං 'මං' භණසිසාරථි" යනාදියෙහිද 'මං' ශබ්දතෙමේ අම්හශබ්දයෙන් ජාතයයි දතයුතු.)

82 මිතු, 'මි' කාරතෙමේ වනාහි; ධාතු, (මි) ධාතුය; විභත්තීසු, (ආඛ්‍යාත) විභක්තිය යනමෙහිද; පච්චයෙ, (මි)ප්‍රත්‍යයෙහිද; හිංසනෙ, හිංසාකිරීමෙහිද; තථා, එසේම; අන්තොපක්ඛිපනෙචෙව, ඇතුලත බහා ලීමෙහිද; යථාරහං, සුදුසු පරිද්දෙන්; පවත්තන්ති, පවති.

("මිහිංසනෙ" යනාදියෙහි 'මි' කාරතෙමේ 'මි' ධාතුවෙහි වැටේ. "තිඅන්ති සිථ මි 'ම'—තුඅන්තු හිථ මි 'ම'" යනාදියෙහි ආඛ්‍යාත විභක්තියෙහි වැටේ. "නෙමි—භූමි" යනාදියෙහි 'කාලෙවත්තමානාතීතෙණ්වාදයො' යනාදියෙන් කළ 'මි' ප්‍රත්‍යයෙහි වැටේ. "මෙසො—මිගො—ආමයො" යනාදියෙහි 'මි' ධාතුතෙමේ හිංසාකිරීමෙහි වැටේ. (:මීයතිමංසංඛාදිතුකාමෙහි ජනෙහි හිංසීයතීති මෙසො:; මීයතියි සේයි; මංසංඛාදිතුකාමෙහි, මස්කනු කැමැත්තාවූ; ජනෙහි, ජනයන් විසින්; හිංසීයතීඉති, හිංසාකරණුලැබේනුයි; මෙසො, මෙස නම්; (මෙසනම් එළුයි) :මීයති හිංසීයති මංසංඛාදිතුකාමෙහි මනුස්සෙහි සීහව්‍යග්ඝදීපිවාළමිගෙහිචාති මිගො:; මීයතියි සේයි; මංසංඛාදිතුකාමෙහි; මස්කනුකැමැත්තාවූ; මනුස්සෙහි, මිනිසුන් විසින්ද; සීහව්‍යග්ඝදීපිවාළමිගෙහිච, සිංහව්‍යාඝ්‍රදිවි ව්‍යාලමෘගයන් විසින්ද; හිංසීයතීඉති, හිංසාකරණුලැබේනුයි; මිගො, මිගනම්; (මිගනම් මෘගයි) :ආගුසොමිනොති හිංසති අත්තසම්බන්ධිනරන්ති * ආමයො:; ආයි සේයි; භූසො, අතිශයින්; මිනොතියි සේයි; අත්තසම්බන්ධිනරං, ආත්මයෙන් යුත් මනුෂ්‍යයාට; හිංසතීඉති, හිංසාකෙරේනුයි; ආමයො, ආ

* අත්ථසම්බන්ධී නරන්ති—සමහර.

83 කරණෙ සම්පදානෙච සාමිඅත්ථෙච ආගතො
අම්හජොමෙසද්දො ඤෙය්‍යො විඤ්ඤූනානයදස්සිනා

84 මූධාතුයං බන්ධනෙච ජනනෙ සම්මනෙරපි
මෙධාතුපටිදානෙච ආදානෙචයථාරහං.

---

මයනම්; (ආමයනම් රොගයි) “මිත්තො” යනාදියෙහි ඇතුලත බහා ලීමෙහි වැටේ. (:මිනොති අන්තොපක්ඛිපතීති මිත්තො:; මිනොතියි සේයි; අන්තොපක්ඛිපතිඉති, ඇතුලත බහාලාතුයි; මිත්තො, මිත්තනම්.)

83 අම්හාජො, අම්හශබ්දයෙන් ජනිතවූ; මෙසද්දො, 'මෙ' ශබ්දතෙමේ; කරණෙ, කරණ (සඞ්ඛ්‍යාත අනුක්තකර්තෘ) යෙහිද, සම්පදානෙච, සම්ප්‍රදානයෙහිද; සාමිඅත්ථෙච, ස්වාම්‍යර්ථ යෙහිද; ආගතො, ආයේ; (යයි) නයදස්සිනා, (ශබ්දශාස්ත්‍ර) ක්‍රමදක්නාසිලිවූ; විඤ්ඤුනා, පණ්ඩිතයා විසින්; ඤෙය්‍යො, දත යුතුකොත්ය.

(“කිච්ඡෙන 'මෙ' අධිගතං අලංදානිපකාසිතුං” යනාදියෙහි අම්හශබ්දයෙන් ජනිතවූ 'මෙ' ශබ්දතෙමේ කරණසඞ්ඛ්‍යාත අනුක්තකර්තෘයෙහි වැටේ. ('මෙ' යනු මාවිසින් යන අර්ථයි) “තස්ස'මෙ'භගවා සඞ්ඛිත්තෙන ධම්මංදෙසෙතු” යනාදියෙහි සම්ප්‍රදානයෙහි වැටේ. “පුබ්බෙවතිකක්වෙ සම්බොධා අනභිසම්බුද්ධස්ස 'මෙ' වසතො” යනාදියෙහි ස්වාම්‍යර්ථයෙහි වැටේ.)

84 මූ, 'මූ' කාරතෙමේ; ධාතුයං, (මූ) ධාතුවෙහිද; බන්ධනෙච, බැඳීමෙහිද; ජනනෙ, දැනීමෙහිද; සම්මනෙඅපි, සම්මතකිරීමෙහිද; (වේ) මෙ, 'මෙ' කාරතෙමේ; ධාතු, (මෙ) ධාතුය; පටිදානෙච, නැවතදීමය යන මෙහිද; ආදානෙච, ගැන්මෙහිද; යථාරහං, සුදුසුපරිද්දෙන්; (වේ)

(“මූබන්ධනෙ” යනාදියෙහි 'මූ' කාරතෙමේ 'මූ' ධාතුවෙහි වැටේ. “මවති-මූනාති-හත්ථමුට්ඨි” යනාදියෙහි 'මූ' ධාතුතෙමේ බැඳීමෙහි වැටේ. ('මවති' යනුද 'මූනාති' යනුද බඳියන අර්ථයි):මවීයන්ති මූනීයන්තිවා අඞ්ගුලියො සඞ්කොචියන්තීති මුට්ඨි: හත්ථස්සමුට්ඨීති හත්ථමුට්ඨි:; මවීයන්තියි සේයි; මූනීයන්තියි හෝසේයි;අඞ්ගුලියො, ඇඟිලි; සඞ්කොචියන්තිඉති, හකුළුවනු ලැබෙත්නුයි; මුට්ඨි, මුට්ඨිනම්; හත්ථස්ස, හස්තයාගේ;මුට්ඨිඉති, මිටනුයි; හත්ථමුට්ඨි, හත්ථමුට්ඨිනම්; (මෙහි'මූ'යනධාතුහුකෙරෙන් 'ති' ප්‍රත්‍යයද ඕහට 'ඨ' කාරද ද්විත්තදකොට 'මුට්ඨි' යනුසිද්ධයි) “මොනං වුච්චතිඤාණං” යනමෙහි “මොනං” යන පෙ

85 පාමොක්ඛ ධාතාදි නරා නරින්ද *
මොලිට්ඨපාදම්බුජජෙන චක්ක
මොසානපාදීන ධරානමත්ථ
නානත්ථදීපො රචිතො මයෙවං.

දෙහි 'මු' ධාතුතෙමේ දැනීමෙහි වැටේ. "සම්මුති" යනාදියෙහි 'සං' පූර්වවූ 'මු' ධාතුතෙමේ සම්මතකිරීමෙහි වැටේ.) "මෙප විදූනඤ්ඤෙසු" යනාදියෙහි 'මෙ' කාරතෙමේ 'මෙ' ධාතුවෙහි වැටේ. "මෙරු" යනමෙහි 'මෙ' ධාතුතෙමේ ගැන්මෙහිද නැවත දීමෙහිද වැටේ. (:මෙන්තිමයන්තිවා ආදදන්ති පටිදදන්ති එත්ථ දෙවරාජ දෙවරාජිනී ආදයො අඤ්ඤමඤ්ඤං අභිරතින්ති මෙරු:; මෙන්තියි සේයි; මයන්තියි හෝ සේයි; එත්ථ, මෙහි; දෙවරාජ දෙවරාජිනී ආදයො, දිව්‍යරාජ දිව්‍යරාජිනී ආදීහු; අඤ්ඤ මඤ්ඤං, ඔවුනොවුන්ට; අභිරතිං, අභිරතිය; ආදදන්තිඉති, ගනිත්තුයිද; පටිදදන්තිඉති, නැවතදෙත්තුයිද; මෙරු, මෙරුනම්; (මෙරුනම් සිනෙරුපර්වතරාජයි—මෙහි 'මෙ' යන ධාතුහු කෙරෙන් 'රු' ප්‍රත්‍යයව 'මෙරු' යනු සිද්ධයි) "මෙධා" යනාදියෙහිද ගැන්මෙහි වැටේ. (:සුඛුමම්පි අත්ථං ධම්මඤ්ච ඛිප්පමෙවමෙති ආදදාතිච ධාරෙතිචාතිමෙධා:; සුඛුමංඅත්ථංඅපි, සියුම්වූ අර්ථයද; ධම්මඤ්ච, ධර්මයද; ඛිප්පංඑව, වහාම; මෙතියි සේයි; ආදදාති ඉතිච, ගනීනුයිද; ධාරෙති ඉතිච, දරානුයිද; මෙධා, මෙධානම්; (මෙධානම්ප්‍රඥායි)

(මෙසේ පවර්ගාන්තගත එකීඑකී අක්ෂරයාගේ වෙන්වෙන් වඅර්ථප්‍රභෙද දක්වා දැන් පකාරය ඒවර්ගයට ආදිහෙයින් පකාර ප්‍රධාන පදයෙන් භාග්‍යවතුන්වහන්සේට ස්තොත්‍රකොට තමා විසින්විහිත මේ පවර්ගාර්ථ විනිශ්චයාගේ ගුණද ප්‍රකාශකොට ශ්‍රොතෘජනයන් එහි ශ්‍රවණොද්ග්‍රහණ ධාරණාදියෙහි යොදවනපිණිස 'පාමොක්ඛධාතාදි නරනරින්ද' යනාදි කීය.)

85 පාමොක්ඛ, ජ්‍යෙෂ්ඨවූ; ධාතාදි, (සහම්පතිආදි) බ්‍රහ්මාදීන්ගේද; නරනරින්ද, නරෙන්ද්‍රයන්ගේ හා දෙවෙන්ද්‍රයන්ගේද; මොලිට්ඨ, (ශිඛාමකුටසඞ්ඛ්‍යාත භෘඞ්ගයන්ගේ ප්‍රතිශෙවනයට ස්ථානහෙයින් ශිඛා) කිරීටයෙහි පිහිටියාවූ; පාදම්බුජ, (අෂ්ටොත්තරශතචක්‍ර ලක්ෂණයෙන්යුත්) ශ්‍රීපාද (යුගමසඞ්ඛ්‍යාත) පද්මඇත්තාවූ; ජෙන, පඤ්චමාරයා ජයගත්තාවූ සර්වඥයන්වහන්සේගේ; චක්ක, (විනෙයයන්ගේ අධ්‍යාසයද. සීලාදියද. නිර්මලකිරීමට හෙතුභාවයෙන්) චක්‍ර (සම්මත ත්‍රිවිධශා

* පාමොක්ඛධාතාදිමරුනරින්ද-ඉතිපිපාඨො කත්ථචිදිස්සති.

86 මොහන්ධකාරවිධමං කවිසෙට්ඨපෙය්‍යං
සොතූනමත්ථවිපුලප්පභවං සුඛීරං
ඤාණාතිඤාණපටුභාවකරං සුචිරං
ධාරෙථතං තවිරතං සහිතං සුධීරා.

87 අත්ථභෙදං ජානමෙතං ඤාණචක්ඛු විසොධනං
මොහක්ඛිපටලුද්ධාරිං අනුයුඤ්ජෙ සදාසතො.

## පවග්ගං නිට්ඨිතං.

———000———

සන) යෙහි; පාදීනං, පකාරයආදිකොටඇති; මොසානං, මකාරය අවසන්කොටඇති; අක්ඛරානං, (පඤ්චවිධ) අක්ෂරයන්ගේ; අත්ථානානත්ථදීපො, වෙන්වෙන්වූ අර්ථ(විශෙෂ)ප්‍රකාශකවූ (යම්) පවග්ගාර්ථ විනිශ්චයෙක් තෙමේ; එවං, මේ ('වාතුණ්හ පරමත්ථෙපො' යනාදි) ක්‍රමයෙන්; මයා, මාවිසින්; රචිතො රචනාකරණලද්දේද.

86 මොහන්ධකාරවිධමං, මොහාන්ධකාරය විද්ධවංශනය කරන්නාවූ, කවිසෙට්ඨපෙය්‍යං, ශ්‍රෙෂ්ඨවූ පණ්ඩිතයන් විසින් ප්‍රෙමකටයුතුවූ; සොතූනං, ශ්‍රොතෘජනයන්ගේ; අත්ථවිපුලප්පභවං, අර්ථ (විනිශ්චයඥාන)ය විශිෂ්ටප්‍රකාරයෙන් පැවත්මටහෙතුවූ; සුඛීරං, යහපත්; (රසයෙන් යුත්) ක්ෂීරසමාන අර්ථ ඇත්තාවූ; ඤාණ, (මන්දයන්ගේ) ඥානයද; අතිඤාණ, (තීක්ෂණයන්ගේ) අතිරෙකඥානයද; පටුභාවකරං, ව්‍යක්තභාව කරන්නාවූ; සහිතං, හිතසහිතවූ; තංතු, ඒ (පවග්ගාර්ථ විනිශ්චය) වනාහි; සුධීරා, යහපත් ප්‍රඥාවෙන් යුක්ත (ශ්‍රොතෘජන) යෙනි, (තෙපි) අවිරතං, නිරන්තරයෙන්; සුචිරං, ඉතාදීර්ඝකාලයක් මුලුල්ලෙහි; ධාරෙථ, දරව්.

87 ඤාණචක්ඛුවිසොධනං, නුවණනමැති ඇස වෙසෙසින් පිරිසිදුකරන්නාවූ; මොහක්ඛිපටලුද්ධාරිං, මොහනමැති නෙත්‍ර පටලය උදුරණ සීලීවූ; එතංඅත්ථභෙදං, මේ (යථොක්තප්‍රකාරවූ පවග්ගීයාගේ) අර්ථප්‍රභෙදය; ජානං, දන්නාවූ; සතො, ශ්‍රොතෘ (ජන) තෙමේ; සදා, හැමකල්හි; අනුයුඤ්ජෙ, අනුයොග කරන්නේය.

## පවග්ගීය සමාප්තයි.

88 පඤ්චපඤ්චක්ඛරවන්ත වග්ගානං දස්සිතො නයො
භෙදවන්තො වුච්චතෙ සාධුං අවග්ගානං නයොධුනා.
89 යානෙයාතරිචායුම්හි කිත්තිසද්දෙච ථොමනෙ
පච්චයෙආගමෙයොහු එදන්තස්සාපිකාරියෙ
සබ්බනාමෙ බ්‍යඤ්ජනෙච ඡන්දගණෙ යථාරහං.

---

(මෙසේ කවර්ගාදි පඤ්චවර්ගයන්ගේ අනේකාර්ථ වාචකත්වය දක්වා දැන් යකාරාදි අවර්ගයන්ගේද අනේකාර්ථවාචකත්වය දක්වමින් පූර්වාපර නු සන්ධිවශයෙන් පූර්වාපර නු සම්බන්ධය දක්වන්නේ 'පඤ්චපඤ්චක්ඛරවන්ත' යනාදිකිය.)

88 පඤ්චපඤ්චක්ඛරවන්ත, පසක්පසක් අක්ෂරයන් ඇත්තාවූ; වග්ගානං, (කවර්ගය, චවර්ගය, ටවර්ගය, තවර්ගය, පවර්ගය, යන පඤ්ච) වර්ගයන්ගේ; භෙදවන්තො, විශෙෂාර්ථ ඇත්තාවූ; නයො, ('කොබ්‍රහ්ම නනානි ලක්ඛගහි' යනාදි) ක්‍රමතෙමේ, දස්සිතො, (මා විසින් ජිනවචනයට අවිරොධකොට) දක්වන ලද්දේය; අධුනා, දැන්; අවග්ගානං, (යකාරාදි) අවර්ගයන්ගේ; නයො, (විශෙෂාර්ථ) ක්‍රමතෙමේ; සාධුං, යහපත්කොට, වුච්චතෙ, කියනුලැබේ.

(මෙසේ ප්‍රතිඥකරණලද අවර්ගයන්ගේ විශෙෂාර්ථය දක්වමින් කච්චායනාදියෙහි තබනලද ක්‍රමයෙන් පළමුකොට 'ය' කාරයාගේ අනේකාර්ථ වාචකත්වය දක්වන්නේ 'යානෙ යාතරිචායුම්හි' යනාදි කිය.)

89 යො, 'ය' කාරතෙමේ; යානෙ, (හස්ත්‍යශ්ව රථාදි) වාහනයෙහිද; යාතරිච, යන්නහු කෙරෙහිද; ආයුම්හි, ආයුෂයෙහිද; කිත්තිසද්දෙච, කීර්තිශබ්දයෙහිද; ථොමනෙ, ප්‍රසංශාවෙහිද; පච්චයෙ, (විකරණ, රූපසිද්ධි) ප්‍රත්‍යයෙහිද; ආගමෙ, ආගම (යකාර) යෙහිද; එදන්තස්ස, අන්තවූ 'එ' කාරයාගේ; කාරියෙඅපි, ('යමෙදන්තස්සා දෙසො' යනමෙයින් කළ) කාර්‍ය්‍ය (යකාර) යෙහිද; සබ්බනාමෙ, ('සබ්බනාමකාරතෙප ඨමො' යන මෙයින් සඞ්ගෘහීත) සර්වනාම (යකාර) යෙහිද; බ්‍යඤ්ජනෙච, (යකාර) ව්‍යඤ්ජනයෙහිද; ඡන්දගණෙ, (යගණ සඞ්ඛ්‍යාත) ඡන්දසගණයෙහිද; යථාරහං, සුදුසුපරිද්දෙන්; අහු, වී;
එහි "යායාස්තා දිඝයාසන්නා පඤ්චටයො සගුණතො
යොසජ්ජනධිමනෙනහි විසෙසඤ්ඤුහිසාධුකං." *
(යනාදියෙහි 'ය' කාරතෙමේ යථාක්‍රමයෙන් වාහනයෙහි

---

* යතොවිඤ්ඤූහි—පොත්.

90 යාතු ධාතුම්හි නාදීනං කාරියෙ සබ්බනාමිකෙ
යාත්‍රා යඤ්චාහු චානෙච ගතිපාපුණනෙසුච.

ද, යන්නාහු කෙරෙහිද, ආයුසයෙහිද, කීර්ත්තිශබ්දයෙහිද, ප්‍රසංශාවෙහිද, වැටේ.)

(යා, * (හස්ත්‍යශ්ව රථාදි) වාහනයෙන්; යා, † යන්නාවූ; සත්තා, සත්වයෝ; දීඝයා ‡ ආයූං, දීර්ඝායුෂ්කාවූවාහූය; සගුණතො, තම්‍යාගේ ගුණය හෙතුකොටගෙණ; පත්ථටයො, පතළාවූ කීර්ත්තිශබ්ද (ඇති ගුණවත් ජන) තෙමේ; විසෙසඤ්ඤුහි, (අනුන්ගේ ගුණ) විශෙෂ දන්නාවූ; සජ්ජනධීමනෙතහි, සත්පුරුෂ පණ්ඩිතයන් විසින්; සාධුකං, යහපත්කොට; යො, ප්‍රසංශා කරණ ලද්දේය.)

("දිවාදිතො'යො'–භාවකම්මෙස්ව'යො'' යනාදියෙහි 'ය'කාරතෙමේ විකරණ රූපසිද්ධිප්‍රත්‍යයෙහි වැටේ. (එයින්ම "දිබ්බති–සිබ්බති—පච්චති—පච්යති'' යනාදි සිද්ධයි) "ය'වමදනතර ලා චාගමා'' යනමෙහි ආගම 'ය' කාරයෙහි වැටේ. (එයින්ම 'නගීමයස' යනාදි සිද්ධයි) "ය'මෙදනතස්සාදෙසො'' යනමෙහි අන්තවූ 'එ'කාරයාගේ කාර්‍ය්‍ය'ය'කාරයෙහි වැටේ (එයින්ම 'තය්‍යස-තයාහං' යනාදි සිද්ධයි–'එදනතස්සාපි'යනමෙහි 'අපි' ශබ්දයෙන් 'සබ්බෙහි තුනාදීනං'යො' යනමෙහි තුනාදීන්ගේ කාර්‍ය්‍ය 'ය'කාරය සම්පිණ්ඩනය කෙරේ)"යො' සො. කො. අමු කො. අඤ්ඤ. ති ආදීනි සබ්බනාම පදානි නාම'' යනාදියෙහි සර්වනාම ය'කාරයෙහි වැටේ. "ය' රලවසහලළඅං''යනාදියෙහි 'ය' කාරව්‍යඤ්ජනයෙහි වැටේ "මනො 'යො' හොයදිපණ්වො තබ්බතො'' යනාදියෙහි යගණසඞ්ඛ්‍යාත ඡන්දසගණයෙහි වැටේ.)

91 යාතු, 'යා' කාරතෙමේ වනානි; ධාතුම්හි, (යා) ධාතුවෙහිද; නාදීනං, නා විභක්ත්‍යාදීන්ගේ; කාරියෙ, කාර්‍ය්‍යයෙහිද; සබ්බනාමිකෙ, සර්වනාමපදයෙහිද; යාත්‍රාය ඤ්ච, යැපීමෙහිද; චානෙච, හැරීමෙහිද; ගති, යාමය; පාපුණනෙසුච, පැමිණීමය යනමෙහිද; (වේයයි) ආහු. කියත්.

("යා' ගතිපාපුණනෙසු'' යනාදියෙහි 'යා' කාරතෙමේ 'යා' ධාතුවෙහි වැටේ "පතො'යා'' යනාදියෙහි නා විභක්ත්‍යාදීන්

* :යන්තියායන්තිවා ගච්ඡන්තිඑතෙහි රාජරාජමහාමත්තාදයොතියා: (තස්මා)

† :යන්ති යායන්තිවා ගච්ඡන්තීති යා:

‡ :දීඝො යො ආයුයෙසන්තෙති දීඝයා:

91 යුතුධාතුම්හි පච්චයෙ ගතියං මිස්සනෙරපි
විභත්තියන්තු යොකාරෙ පවත්තති යථාරහං.

---

ගේ කාය්‍යයෙහි වැටේ. (එසින්ම 'රත්තියා—නදියා—යාගුයා—ජම්බුයා'—යනාදි සිද්ධයි) "යා' සාච ඉත්ථියාලිඞ්ගං" යනාදියෙහි සර්වනාමපදයෙහි වැටේ. "යාත්‍රාචමෙභවිස්සති අනවජ්ජතාච ඵාසුවිහාරොච" යනාදියෙහි 'යා' ධාතුතෙමේ යැපීමෙහි වැටේ. "යා'සීලො සජ්ජනො සඞ්ඝං, ගච්ඡති සුඛට්ඨානියං" යනාදියෙහි 'යා' කාරතෙමේ හැරීමෙහි වැටේ "නීයානිකො" යනමෙහිද 'යා' ධාතුතෙමේ හැරීමෙහි වැටේ. (:නිස්සෙසතො යාති යායතිවා සකලං සංසාරවට්ටං වජතීති නීයානිකො: යාතියි සේයි, යායතියි හෝ සේයි, සකලං සංසාරවට්ටං, සියලු සංසාරවෘත්තය; නිස්සෙසතො, නිරවශෙෂයෙන්; වජතීති, හරීනුයි; නීයානිකො, නීයානික නම්; (මෙහි 'නී' පූර්ව්වූ 'යා වාගෙ' යන ධාතුනු කෙරෙන් 'අනීය' ප්‍රත්‍යයකොට 'අනීය' ප්‍රත්‍යයාගේ 'ය'කාරයහට 'ක' කාරාදෙශකළ කල්හි 'නීයානිකො' යනු සිද්ධයි) "යානං-උපයානං-උය්‍යානං" යනාදියෙහි 'යා'ධාතුතෙමේ යාමෙහිද. පැමිණීමෙහිද. වැටේ. (:යන්තියා යන්තිවා ගච්ඡන්ති ඉච්ඡිතට්ඨානං පාපුණන්ති වා නදිපාරාදිකං එතෙනාතියානං:; යන්තියි සේයි; යා යන්ති යි හෝ සේයි: එතෙන, මේ කරණකොට ගෙණ; ඉච්ඡිතට්ඨානං, කැමති වනලද ස්ථානයකට; ගච්ඡන්තිඉතිවා, යත්නුයි හෝ. නදීපාරාදිකං, ගං පරතෙරාදියකට; පාපුණන්ති ඉතිවා, පැමිණෙත්නුයි හෝ; යානං, යානනම්; (යානනම් හස්ත්‍යශ්ව රථ නාවුකාදි වාහනයි) :උපයන්ති එතෙන ඉස්සරස්ස වා පියමනාපස්ස වා සන්තිකං ගච්ඡන්තීති උපයානං:; උපයන්තියි සේයි, එතෙන, මේ කරණකොට ගෙණ; ඉස්සරස්සවා, ප්‍රධානවූවෙක්හු ගේ හෝ; පියමනාපස්සවා, ප්‍රිය මනාප වූවෙක්හුගේ හෝ; සන්තිකං, සමීපයට; ගච්ඡන්තිඉති, යත්නුයි; උපයානං, උපයානනම් (උපයානනම් සතුටු පඬුරයි;) :සම්පණ්ණදස්සනීය පුප්ඵඵලාදිතාය උද්ධං ඔලොකෙන්තා යන්ති ගච්ඡන්ති එත්ථාති උය්‍යානං:; එත්ථ, මෙහි; සම්පණ්ණ, සම්පූර්ණවූ; දස්සනීය, දැකුම්කටයුතුවූ; පුප්ඵඵලාදීනාය, පුෂ්පඵලාදිය ඇති බැවින්; උද්ධං, උඩ; ඔලොකෙන්තා, බලමින්; යන්තියි සේයි; ගච්ඡන්තිඉති, යත්නුයි; උය්‍යානං, උය්‍යානනාම්.)

91 යුතු, 'යු' කාරතෙමේ වනාහි; ධාතුම්හි, (යු) ධාතුවෙහි ද; පච්චයෙ, (යු) ප්‍රත්‍යයෙහිද; ගතියං, යාමෙහිද; මිස්සනෙ

92 කාමානනෙ අග්ගිම්හිරෙ ජන්තුගණෙ ච පච්චයෙ
ආගමෙ බ්‍යඤ්ජනෙ චෙව පදිස්සති පයොජනෙ.

---

අප්, මුසුකිරීමෙහිද; මුසුවීමෙහි හෝ; (වේ) යොකාරෙතු, 'යො' කාරතෙමේ වනාහි; විභත්තියං, (යො) විභක්තියෙහි; යථාරහං, සුදුසුපරිද්දෙන්; පවත්තති, පවතී

("'යු' ගතිමිස්සනෙසු" යනාදියෙහි 'යු' කාරතෙමේ 'යු' ධාතුවෙහි වැටේ. "සද්දකුධචලමණ්ඩත්ථරුචාදීහි 'යු'—නන්දාදීහි 'යු'" යනාදියෙහි 'යු' ප්‍රත්‍යයෙහි වැටේ. (එසින්ම—"ඝොසනො—වඩ්ඪනො"—"ගහණං-ඤාණං" යනාදි සිද්ධයි) "ආයු—යොනි" යනාදියෙහි 'යු' ධාතුතෙමේ; යාමෙහිද, මුසුකිරීමෙහිද; මුසුවීමෙහිහෝ වැටේ. (:ආයවන්ති ආගච්ඡන්ති පවත්තන්ති තස්මිං සති අරූප ධම්මා ති ආයු: ආයවන්තියි සේයි; ආගච්ඡන්තියි සේයි; තස්මිංසති, ඒ ඇතිකල්හි; අරූපධම්මා, අරූපධර්මයෝ; පවත්තන්තිඉති, පවතිත්නුයි; ආයු, ආයුනම්;—:අථවා ආයවන්ති මිස්සීකරොන්ති භවන්තිසත්තා එතෙනාති ආයු: අථවා, නොහොත්; ආයවන්තියි සේයි; එතෙන, මේ කරණකොටගෙණ, සත්තා, සත්වයෝ; මිස්සී කරොන්ති ඉති, මුසුකෙරෙත් නුයි; මිස්සී භවන්තිඉති, මුසුවෙත්නුයි; ආයු, ආයුනම්—:යවන්ති එත්ථසත්තා එකජාති සම්බන්ධයෙන අඤ්ඤමඤ්ඤං මිස්සිතා හොන්තීති යොනි: යවන්තියි සේයි; එත්ථ, මෙහි; සත්තා, සත්වයෝ; එකජාතිසම්බන්ධයෙන, එක්ජාතියක් හුගේ යුක්තවීමෙන්; අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්; මිස්සිතා හොන්තිඉති, මිශ්‍රවෙත් නුයි; යොනි, යොනිනම්; (යොනිනම් අණ්ඩජාදි සතරකොට්ඨාසයි) :යවන්ති මිස්සන්ති සුක්කසොනිතා එතෙනාති යොනී: යවන්තියි සේයි; සුක්කසොනිතා, ශුක්‍රරුධිරයෝ; එතෙන, මේ කරණකොට ගෙණ; මිස්සන්තිඉති, මිශ්‍රවෙත්නුයි; යොනි, යොනිනම්; (යොනිනම් ඉස්ත්‍රීන්ගේ මූත්‍රමාර්ගයි) :යවන්ති ගච්ඡන්ති පවත්තන්ති ඵලං එතෙනාති යොනි:; යවන්තියි සේයි; ගච්ඡන්තියි සේයි; ඵලං, ඵලයතෙමේ; එතෙන, මේ කරණකොටගෙණ; පවත්තන්ති ඉති, පවතිත්නුයි; යොනි, යොනිනම්; (යොනිනම් කාරණයි) "සි 'යො' අං 'යො'" යනාදියෙහි 'යො' කාරතෙමේ ප්‍රථමා ද්විතීයා 'යො' විභක්තියෙහි වැටේ.)

(මෙසේ 'ය' කාරයාගේ අනෙකාර්ථවාචකත්වය දක්වා දැන් 'ර' කාරයාගේ අනෙකාර්ථවාචකත්වය දක්වන්නේ 'කාමානනෙ අග්ගිම්හිරෙ' යනාදි කීය.)

92 රෙ, 'ර' කාරතෙමේ; කාමෙ, කාමයෙහිද; කැමතිවී

මෙහි හෝ; ආනනෙ, මුඛයෙහිද; අග්ගිම්හි, වහ්නියෙහිද, ඡන්දගණෙච, (රගණසඞ්ඛ්‍යාත) ඡන්දසගණයෙහිද; පච්චයෙ, (ර) ප්‍රත්‍යයෙහිද; ආගමෙ; ආගම (රකාර) යෙහිද; බ්‍යඤ්ජනෙ චෙව; බ්‍යඤ්ජන (රකාර) යෙහිද; (වේයයි) පයොගතො, ප්‍රයොගවශයෙන්; පඬියසනි, දක්නාලැබේ;

(එහි "නීරංරෙ පටිබිරි දස්සිනො" යනාදියෙහි 'නීරං' යන පෙදෙහි 'ර' කාරතෙමේ කාමයෙහි වැටේ. (:නිග්ගතො විගතො රෙ කාමො කාමනං පිපාසා එතෙනාති නීරං:. රෙයි සේයි; කාමොයි සේයි; කාමනංයි සේයි; පිපාසා, පිපාසා තොමෝ; එතෙන, මේ කරණකොට ගෙණ; නිග්ගතොයි සේයි; විගතොඉති, පහවූයේනුයි; නීරං, නීරනම්; (නීරනම් ජලයයි) "අරි" යනමෙහිද කාමයෙහි වැටේ. (:අප්පකො රූපාදි පඤ්චකාමගුණ සඞ්ඛාතොරෙකාමො එතෙනාති අරි:, රෙයි සේයි; රූපාදි පඤ්චකාම ගුණ සඞ්ඛාතො, රූපාදි පඤ්චකාම ගුණ යයි කියනලද; කාමො, කාමයතෙම; එතෙන, මේ කරණකොට ගෙණ; අප්පකොඉති, ස්වල්පවූයේනුයි; අරි; අරිනම්; (අරිනම් පසමිතුරුයි.–මෙහි 'අ'කාර'අල්පාර්ථයි) "අච්ඡරා" යන මෙහි මුඛයෙහි වැටේ. (:අච්ඡං විප්පසන්නං රං මුඛං යායාති සා අච්ඡරා: අච්ඡංයි සේයි; විප්පසන්නං, විප්‍රසන්නවූ; රංයි සේයි, මුඛං, මුඛයතෙම; යායඉති, යමක්හුගේනුයි; සා, හෝ තොමෝ; අච්ඡරා, අච්ඡරා නම්; (අච්ඡරානම් දෙවඞ්ගනාවයි) "රම්භා" යනාදියෙහි වහ්නියෙහි වැටේ. (:දෙවපුත්තානං රං මෙථුන රාගග්ගිං භාති වඩ්ඪෙතීති රම්භා: දෙවපුත්තානං, දිව්‍යපුත්‍රයන්ගේ; රංයි සේයි; මෙථුනරාගග්ගිං, මෛථුනරාග නමැති වහ්නිය; භාතියි සේයි; වඩ්ඪෙතිඉති, වඩානුයි; රම්භා, රම්භානම්; (රම්භානම් ශක්‍රයාගේ පරිචාරික දිව්‍ය කන්‍යා විශෙෂයෙකි) "ආභස්සරෙ" යනමෙහිද වහ්නියෙහි වැටේ. (:ආභුසො භාසො නිස්සටොරෙකප්පවිනාසකග්ගි එතස්මාති ආභස්සරො:. රෙයි සේයි; කප්පවිනාසකග්ගි, කල්පවිනාශක වහ්නියතෙම; එතස්මා, මේකෙරෙන්; ආයි සේයි; භුසො, අතිශයින්; භාසොයි සේයි; නිස්සටොඉති, බස්නාලද්දේනුයි; නොහොත්, වෙන්වූයේනුයි; ආභස්සරෙ, ආභස්සරනම්; (ආභස්සරනම් ද්විතීයධ්‍යාන භූමියි) "රො'නරා ඉභ රතොඛනාලගා" යනමෙහි රගණසඞ්ඛ්‍යාත ඡන්දසගණයෙහි වැටේ. "සාභනඤ්ඤයවා 'රො' සො" යනාදියෙහි 'ර' ප්‍රත්‍යයෙහි වැටේ. "යවමදනත 'ර' ලා චාගමා" යනාදියෙහි ආග

**93 රාතුසොණ්ණ ධනෙසද්දෙ අදෘනෙ ධාතුයංපිච**
**රිතුගතිධාතුයඤ්ච එවාදිකාරියෙ භමෙ.**

ම'ර' කාරයෙහි වැටේ. "ය 'ර' ලව සහළඅං" යනාදියෙහි ව්‍යඤ්ජන 'ර'කාරයෙහි වැටේ.)

**93** රාතු, 'රා' ශබ්දතෙමේ වනාහි; සොණ්ණෙ, සුවර්ණයෙහිද; ධනෙ, ධනයෙහිද; සද්දෙ, ශබ්දයෙහිද; අදෘනෙ, ගැණීමෙහිද; ධාතුයං අපිච, (රා) ධාතුවෙහිද; (වේ) රිතු, 'රි' කාරතෙමේ වනාහි; ගති, යාමය; ධාතුයංච, (රි) ධාතුය යනමෙහිද; එවාදිකාරියෙ, එවශබ්දයාගේ ආදි (එකාර යාගේ) කායණියෙහිද; භමෙ, කරකැවීමෙහිද (වේ).

("රාමො" යනමෙහි 'රා' ශබ්දතෙමේ සුවර්ණයෙහි වැටේ. (:රාවිය සුවණ්ණාව්යමානීයතීති රාමො:; රාවිය සි සේයි; සුවණ්ණංවිය. සුවර්ණයටමෙන්; මානීයතිඉති, ආදරකරණුලැබේනුයි; රාමො, රාමනම්; (රාමනම් එනම් රජයි—මෙහි 'රා' ශබ්දූපපද 'මාන' යන ධාතුහු කෙරෙන් 'ක්වි'ප්‍රත්‍යයද. ධාත්වන්ත ලොපාදියද. කළ කල්හි 'රාමො' යනු සිද්ධයි) "රාති" යනාදියෙහි ධනයෙහි වැටේ. (:වෙරිජනස්ස රා ධනංතියති පරිවජ්ජති පරික්ඛයං පාපෙතීති රාති:. වෙරිජනස්ස, වෛරිජනයාගේ; රාසි සේයි; ධනං, ධනය; තියතිසි සේයි; පරිවජ්ජතිසි සේයි; පරික්ඛයං, ක්ෂයක්රීමට; පාපෙතිඉති,පමුණුවානුයි;රාති, රාතිනම්; (රාතිනම් අමිත්‍රයි*) "රතානි" යනාදියෙහි ශබ්දයෙහි වැටේ (:රාසද්දොතියති පරිවජ්ජති එත්ථාතිරතානි: එත්ථ, මෙහි; රාසි සේයි; සද්දො, ශබ්දයතෙමේ; තියතිසි සේයි; පරිවජ්ජතිඉති, පිරිසිඳිනු ලැබේනුයි; රතානි, රතානිනම්) "සාගරො" යනාදියෙහි 'රා' ධාතුතෙමේ, ගැණීමෙහි වැටේ. (:සඞ්ගං සංසිදනං රාති ගණ්හාතීති සාගරො:; සඞ්ගංයි සේයි; සංසිදනා, සංසිදනය; රාතියි සේයි; ගණ්හාති ඉති, ගනීනුයි; සාගරො, සාගරනම්; (මෙහි 'සංග' ශබ්දූපපද 'රා'යන ධාතුහු කෙරෙන්කතෘයෙහි 'ණ' ප්‍රත්‍යයකොට 'සංග' ශබ්දයාගේ නිග්ගහීතයහටලොපහා සකාරසථ 'අ' කාරයහට දීර්ඝ කළ කල්හි 'සාගරො' යනු සිද්ධයි) "රා' ආ දෘනෙ" යනාදියෙහි 'රා'ශබ්දතෙමේ 'රා' ධාතුවෙහි වැටේ ("රෙති" යනාදියෙහි 'රි' ධාතුතෙමේ යාමෙහි වැටේ.—"රි' ගතියං—'රි'සනතානෙ" යනාදියෙහි 'රි' කාරතෙමේ 'රි' ධාතුවෙහි වැටේ. "එවාදිස්ස 'රි' පුබ්බො ච රස්සො" යනාදියෙහි 'එව' ශබ්දයා

* 'අරාති' යනුදඅමිත්‍රයන්ටනමය.

**94** රුධාතුයංගතිසද්දෙ රූ සද්දෙභයපච්චයෙ
රෙසද්දෙ ධාතුයං ලග්ගෙ විභත්තියමුදීරිතො
රොකාරෙ පච්චයෙ මතො පදිස්සති පයොගතො.

ගේ ආදි 'එ' කාරයාගේ කායෂීයෙහි වැටේ (එයින්ම 'යඑරිව' යනාදි සිද්ධයි) "රෙණු" යනමෙහි 'රි' ධාතුතෙමේ කරකැවී මෙහි වැටේ. (:රයතිභමතීති රෙණු: * රයතියි සේහි; භම තිඉති, කරකැවේනුයි; රෙණු, රේණුනම් )

**94** රු, 'රු' කාරතෙමේ; ධාතුයං (රු) ධාතුවෙහිද; ගති, යාමය; සද්දෙ, ශබ්දකිරීමය යන මෙහිද; (වේ) රූ, 'රූ' කාර තෙමේ; සද්දෙ, ශබ්දයෙහිද; භය, බියය; පච්චයෙ, (රූ) ප්‍රත්‍යය යනමෙහිද; (වේ) රෙ, 'රෙ' කාරතෙමේ; සද්දෙ, ශබ්ද කිරීමෙහිද; ධාතුයං, (රෙ) ධාතුවෙහිද; ලග්ගෙ, ඇලීමෙහිද; විභත්තියං, (ආඛ්‍යාත) විභක්තියෙහිද; (වේයයි) උදීරිතො, කියන ලද්දේය; රොකාරෙ, 'රො' කාරතෙමේ; පච්චයෙ, (රො) ප්‍රත්‍යයෙහි; පයොගතො, ප්‍රයොග වශයෙන්; පදිස්සති, දක්නාලැබේ (යයි) මතො, දන්නාලද්දේය.

("රු'ගතිම්හි" යනාදියෙහි 'රු' කාරතෙමේ 'රු' ධාතුවෙහි වැටේ "රුරු—රවො" යනාදියෙහි 'රු' ධාතුතෙමේ යාමෙහි වැටේ. (:රවතිසීඝවාතවෙගෙන ගච්ඡතීති රුරු: රව තියි සේයි; සීඝවාතවෙගෙන, ශීඝ්‍රවූ වාතවෙගයෙන්; ගච්ඡ තිඉති, යේනුයි; රුරු, රුරුනම්; (රුරුනම් මෘගවිශෙෂයෙකි– මෙහි 'රු' යන ධාතුනු කෙරෙන් 'ණු' ප්‍රත්‍යයද 'ර' කාරාගමද කොට'රුරු' යනුසිද්ධයි) :රවති ගච්ඡති එතෙනාතිරවො: රව තීති සේයි; එතෙන, මේ කරණකොට ගෙණ; ගච්ඡතිඉති, යේනුයි; රවො, රවනම්; (රවනම් ශබ්දයි;) "සකුණානං රුතං සුත්වා" යනාදියෙහි ශබ්ද කිරීමෙහි වැටේ. (:රවී යතෙ සද්දීයතෙති රුතං: රවීයතෙයි සේයි; සද්දීයතෙ ඉති, ශබ්ද කරණු ලැබේනුයි; රුතං, රුතනම්; (රුතනම් ප ක්ෂිආදීන්ගේ රවනයයි) "සීහරූතො රූජනාසුං" යනාදියෙ හි 'රූ' කාරතෙමේ ශබ්දයෙහිද බියෙහිද වැටේ. (සීහරූතො, සිංහශබ්දය හෙතුකොට ගෙණ; ජනා, (මනුෂ්‍යාදි)සත්වයෝ; රූආසුං, බියවූවාහුය;) "පාරාදිගම්මහා 'රූ'" යනාදියෙහි 'රූ' ප්‍රත්‍යයෙහි වැටේ (එයින්ම 'පාරගූ' යනාදි සිද්ධයි) "රන්ති" යන මෙහි 'රා' යන පෙදෙහි 'රෙ' ධාතුතෙමේ ශබ්දකිරීමෙහි වැටේ. (:රසීයති සද්දීයතීති රා:; රසීයතියි සේ

* මේවිග්‍රහ වාක්‍යය මීට වෙනස්වද සමහර පොතකතිබේ.

**95** පච්චයෙ ආගමෙ ලොතු නිග්ගහීතස්ස කාරියෙ
රකාරදකාරානඤ්ච කාරියෙ දෙවරාජිනි.
**96** ඡන්දගණෙ ව්‍යඤ්ජනෙ ච උවණ්ණෙ මාඑතෙසු ච *
ලා ධාතුයං ආදානෙච පවත්තෙතගතියං රජ.

සි; සද්දීයන්තිඉති, ශබ්දකරණු ලැබේනුසි; රා, රානම්—(මෙහි ‘රෙ’ යන ධාතුනු කෙරෙන් ‘ඉත්ථියමතියවොවා’ යනාගම සින් ‘අ’ ප්‍රත්‍යයද, ‘ඉත්ථියමතො ආප්පච්චයො’ යන මෙයින් ‘ආ’ ප්‍රත්‍යයද කොට ‘රා’ යනුසිද්ධයි) “රෙසද්දෙ” යනාදියෙ හි ‘රෙ’ කාරතෙමේ ‘රෙ’ ධාතුවෙහි වැටේ. “ලොපානුබන්ධ රය මත්ථ විභාගතීරං’’’ යනාදියෙහි ‘රයා’ යන පෙදෙහි ‘රෙ’ ධාතුතෙමේ ඇලීමෙහි වැටේ. (:රයන්ති අත්තනො සම්පත්තාවත්ථුස්‍ම ලග්ගන්තීති රයා: රයන්තිසි සේයි; අත්ත නො, තමා; සම්පත්තාවත්ථුසු, පැමිණි වස්තූන් කෙරෙ හි; ලග්ගන්තිඉති, ඇලෙත්නුයි; රයා, රයනම් වෙත්; (රය නම් මඩයි;) “අ. උ. ඒ ත්‍ථ අ. මග-ත්‍ථ. ‘රෙ.’ ගෙත්ථා. වෙහා.ඉ. මෙහ.” යනාදියෙහි ‘රෙ’ කාරතෙමේ’ ආඛ්‍යාත විභක්ති යෙහි වැටේ. (‘එයින්ම පපච්චිරෙ—ජගම්රෙ’ යනාදි සිද්ධයි) “ගම්තො‘රො” යනාදියෙහි ‘රො’ කාරතෙමේ ‘රො’ ප්‍රත්‍ය යෙහි වැටේ.(එයින්ම–‘ගො’යන ප්‍රයොගය සිද්ධයයි දතයුතු)

(මෙසේ ‘ර’ කාරයාගේ අනෙකාර්ථ වාචකත්වය දක්වා දැන් ‘ල’කාරයාගේ අනෙකාර්ථ වාචකත්වය දක්වන්නේ ‘පච්ච යෙ ආගමෙ ලොතු’ යනාදි කීය.)

**95** ලොතු’ ‘ල’ කාරතෙමේ වනාහි; පච්චයෙ, ප්‍රත්‍යයෙ හිද; ආගමෙ, ආගමයෙහිද; නිග්ගහීතස්සකාරියෙ, නිග්ගහී තයාගේ කාර්‍ය්‍යයෙහිද; රකාරදකාරානං; රකාර දකාරයන් ගේ; කාරියෙච, කාර්‍ය්‍යයෙහිද; දෙවරාජිනි, ශක්‍රයා කෙරෙහිද.

**96** ඡන්දගණෙ; ඡන්දසගණයෙහිද; ව්‍යඤ්ජනෙච, ව්‍යඤ්ජන යෙහිද; උවණ්ණෙ, උවර්ණය; මාඑතෙසුච, වාතය යනමෙ හිද; (වේ) ලා, ‘ලා’ කාරතෙමේ; ධාතුයං, (ලා) ධාතුවෙහිද; ආදානෙච, ගැන්මෙහිද; පවත්තෙ, පැවැත්මෙහිද; ගතියං අපි, යාමෙහිද, (වේ)

(එහි “තන්නිස්සිතත්ථෙ ‘ලො’’ යනාදියෙහි ‘ල’ කාරතෙ මේ තද්ධිත‘ල’ ප්‍රත්‍යයෙහි වැටේ. (එයින්ම–‘දුට්ඨුල්ලං’ යනාදි සිද්ධයි) “යවමදනතරලා චාගමා” යනාදියෙහි ආගමයෙහි වැටේ. (එයින්ම–‘ජලභික්ඛූ’ යනාදි සිද්ධයි) “වාඝහගණෙ

* උකාරමාඑතෙසුවා—තිපි පොත්කෙසු දිස්සතෙ.

නිග්ගහීතං බො 'ල' කාරාදෙසො හොති" යනාදියෙහි නිග්ගහීතයාගේ කාර්‍ය්‍යයෙහි වැටේ. (එයින්ම—'පුලලිඞ්ගං' යනාදිය සිද්ධයි) "දෙබ්‍යඤ්ජනානි එත්ථ වග්ගභණ්ණෙන රකාරස්ස 'ල' කාරො—'ල' දරානං" යනාදියෙහි රකාර දකාර යන්ගේ කාර්‍ය්‍යයෙහි වැටේ. (එයින්ම—'මහාසාලො—සොලස—චත්තාලීසං'—යනාදි ප්‍රයොගයෝ සිද්ධවෙති) "සූලී" යනමෙහි ශත්‍රුයාකෙරෙහි වැටේ. (:සූදරෙ ලො ඉනෙන්ති සූලො:—:සූලො එතස්ස අත්ථීති සූලී:; සූදරෙ, යහපත් වූ; ලොයි සේයි; ඉනෙන්ති, ශත්‍රුතෙමේනුයි; සූලො, සූලනම්; සූලො, සූලතෙමේ; එතස්ස, මෝහට; අත්ථිඉති, ඇත්තේනුයි; සූලී, සූලීනම්;(සූලීනම් මහෙශ්වරයි)"සබ්බ ගුලාමිනා දීග ල ගු" යනාදියෙහි ලඝු මාත්‍ර උපචාර ඡන්දසගණයෙහි වැටේ. "යර 'ල' ව සහළු අං" යනාදියෙහි 'ල' කාර ව්‍යඤ්ජනයෙහි වැටේ. ඉවණ්ණුවණ්ණාපඤ්ච'ළා" යනාදියෙහි උවර්ණයෙහි වැටේ. "ළකාරො" යනමෙහි වාතයෙහි වැටේ. (:ලොවාතො * කරීයති සම්පටිච්ඡීයති එතෙනාති ලකාරො:; ලොයි සේයි; වාතො, වාතයතෙම; එතෙන, මේ කරණකොට ගෙණ; කරීයතිසි සේයි; සම්පටිච්ඡීයති ඉති, පිළිගනුලැබේනුයි; ලකාරො, ලකාරනම්. (ළකාරනම් රුවලයි)"ලා' ආදානෙ" යනාදියෙහි 'ලා' කාරතෙමේ 'ලා' ධාතුවෙහි වැටේ "ගරුලො—සීහලො—රාහුලො—බාලො—මහාලි—භද්දාලි" යනාදියෙහි 'ලා' ධාතුතෙමේ ගැන්මෙහි වැටේ. (:ගරුං භාරං ලාති ගණ්හාතීති ගරුලො:; ගරුංස් සේයි; භාරං, බර; ලාතිසි සේයි; ගණ්හාති ඉති, ගනීනුයි; ගරුලො, ගරුලනම්.—:සීහං ලාති ගණ්හාතීති සීහලො: සීහං, සිංහයා ලාතයි සේයි; ගණ්හාති ඉති, ගනීනුයි; සීහලො, සීහලනම්. (සීහලනම් පූර්වපුරුෂයි )—:රාහුවිය ලාති ගණ්හාතීති රාහුලො: රාහුවිය, රාහුමෙන්; ලාතිසි සේයි; ගණ්හාති ඉති, ගනීනුයි; රාහුලො, රාහුලනම්. (රාහුලනම් බුද්ධපුත්‍රයි) :දිට්ඨධම්මිකසම්පරායික සඞ්ඛාතෙ අත්ථෙ අයෙව දෙවදත්ත කො කාලිකාදයො විය ලාති ආදදාතීති බාලො: දිට්ඨධම්මික සම්පරායික සඞ්ඛාතෙ, ඓහලෞකික පාරලෞකික සඞ්ඛ්‍යාතවූ; අත්ථෙ, අර්ථයන්; දෙවදත්ත කො කාලිකාදයො විය, දෙවදත්ත කොකාලිකාදීන් මෙන්; ලාතයි සේයි; ආදදාති ඉති,

* 'ලං වාතං.'—පොත්.

**97** ලිච්ඡන්නාලිඞ්ගනෙ නාසෙ රක්ඛනාලයනෙලූතු
ඡෙදනෙඛායනෙචාපි පවත්තිසමුදීරිතො.

---

ගනීනුයි; බාලො බාලනම්. (මෙහි 'ද්වලො' යි කියයුත්තෙහි 'ද්වි' ශබ්දයහට 'බා' යනාදෙශකළ කල්හි 'බාලො' යිවේ.) :මහන්තං අත්ථං ලාති ගණ්හාතීති මහාලි: මහන්තං, මහත්වූ; අත්ථං, අර්ථය; ලාතියි සේයි; ගණ්හාති ඉති, ගනීනුයි; මහාලි, මහාලි නම්—:භද්දං සුන්දරං අත්ථං ලාති ගණ්හාතීති භද්දාලි:; භද්දංයි සේයි; සුන්දරං, යහපත්වූ; අත්ථං, අර්ථය; ලාතියි සේයි; ගණ්හාති ඉති, ගනීනුයි; භද්දාලි, භද්‍රාලි නම්.) “කුසලා” යනාදියෙහි පැවැත්මෙහි වැටේ. (:කුසෙන කුණෙන ලාතබ්බා පවත්තෙතබ්බාති කුසලා:; කුසෙනයි සේයි; කුණෙන, ඥානයෙන්; ලාතබ්බායි සේයි; පවත්තෙතබ්බා ඉති, පැවැත්විය යුත්තාහුනුයි; කුසලා, කුශලයෝ නම් වෙත්;) “සූරියමණ්ඩලො—චන්දමණ්ඩලො” යනාදියෙහි යාමෙහි වැටේ. (:මණ්ඩොපසන්නො හුත්වා ලාති ගච්ඡති පවත්තතීති මණ්ඩලො:; මණ්ඩොයි සේයි; පසන්නො හුත්වා, ප්‍රසන්නව; ලාතියි සේයි; ගච්ඡතියි සේයි; පවත්තති ඉති, පවතීනුයි; මණ්ඩලො, මණ්ඩලනම්.)

**97** ලි, 'ලි' ධාතුතෙමේ; ඡන්නා, වැසීමය; ආලිඞ්ගනෙ, වැළඳගැන්මය යන මෙහිද; නාසෙ, නැසීමෙහිද; රක්ඛනෙ, රැකීමෙහිද; ආලයනෙ, ආලයකිරීමෙහිද; (වේ) ලූතු, 'ලූ' ධාතුතෙමේ වනාහි; ඡෙදනෙ, සිඳීමෙහිද; ඛායනෙචඅපි, වැටහීමෙහිද; පවත්ති, පවත්නේ; (වේයයි) සමුදීරිතො, කියනලද්දේය.

(“ලිඞ්ගං—ලිච්ඡවිරාජනො” යනාදියෙහි 'ලි' ධාතුතෙමේ වැසීමෙහි වැටේ. (:ලීනාති න ආ වි භවිස්සන්තීති ලීනං:; ලීනං අඞ්ගන්ති ලිඞ්ගං:; ලීනාතියි සේයි; නආවි භවිස්සති ඉති, ප්‍රකාශ නොවන්නේනුයි; ලීනං, ලීනනම්; ලීනං, ලීනවූ; අඞ්ගං ඉති, ශරීරාවයවය නුයි; ලිඞ්ගං, ලිඞ්ගනම්. (මෙහි—'ලීනඞ්ගං'—යි කිය යුත්තෙහි 'නකාර' ලොප්ව 'ලිඞ්ගං' යි වේ.) :ලීනා පටිච්ඡන්නා ඡවියො යෙසන්ති තෙ ලිච්ඡවී:; ලීනායි සේයි; පටිච්ඡන්නා, ප්‍රතිච්ඡන්නාවූ; ඡවියො, ඡවීහු; යෙසං ඉති, යම් කෙණෙකුන්ගේනුයි; තෙ, ඔව්හු; ලිච්ඡවී, ලිච්ඡවි නම් වෙත්, (මෙහිද—'ලීනච්ඡවී' යි කියයුත්තෙහි 'නකාර' ලොප්ව 'ලිච්ඡවී'යි වේ) “තිත්ථකානි පියාලානි” යනාදියෙහි 'පියාලානි' යන පෙදෙහි වැළඳගැන්මෙහි වැටේ

98 චිත්තමාළුත නාගෙසු පච්චයෙ බ්‍යඤ්ජනෙච වො
කාරියෙඹුදන්තානං මානමාකාරියෙ රපි
ලකාරියාගමෙචාපි පදිස්සති පයොගතො.

(:පියො හුත්වා අලියති අලිඩ්ගති එතෙහීතිපියාලානි: * එතෙහි, මොවුන් කරණකොට ගෙණ; පියොහුත්වා, ප්‍රියව; අලියති යි සේයි; අලිඩ්ගති ඉති, වැලඳගනීනුයි, පියාලානි, පියාල නම් වෙත්; (පියාල නම් මිහිරි රස ඇති ඵල විශෙෂයෙකි )"පලයනං—පලයති" යන මෙහි නැසීමෙහි වැටේ. (:පකාරෙරගි අගගි උදක වාතෙහි ලයනං විනාසනන්ති පලයනං:; පකාරෙහියි සේයි; අගගි උදක වාතෙහි; ගිනි දිය වාතයන් කරණකොට ගෙණ; ලයනංයි සේයි; විනාසනං ඉති, විනාශවීමනුයි; පලයනං, පල යන නමි;) (පල යන නම් ගිනි ආදියෙන් කප නැස්මයි.) "ආලය' සමුගඝාතො" යනාදියෙහි රැඳීමෙහි වැටේ, (:අලියන්ති රඤ්ජන්ති එතෙනාති ආලයො:; අලියන්තියි සේයි; එතෙන, මේ කරණකොට ගෙණ; රඤ්ජන්තිඉති, රැඳෙත්නුයි; ආලයො, ආලයනමි. (ආලයනම් තෘෂ්ණායි) "සීමාසම්මුති කාලෙ ච ගෙහානිකතානි පවිසිස්සාමිති 'ආලයො' පි අත්ථි පටිඝගෙහස්සාමීති 'ආලයො'පි අත්ථි පුන ආගමිස්සාමීති 'ආලයො'පි අත්ථි" යනාදියෙහි ආලයකිරීමෙහි වැටේ.) "ලොනං—ලවනං—මඩගලං—දාතෙතන වීහිං ලූනාති" යනාදියෙහි 'ලූ' ධාතු තෙමේ සිඳීමෙහි වැටේ. (:යොගං † ලූනාති ඡින්දතීති ලොනං, ලවනං:, යොගං, යොගය; ලූනාතියි සේයි; ඡින්දති ඉති, සිඳීනුයි; ලොනං, ලොනනමි; ලවනං, ලවන නමුදු වේ—:මඩගං පාපං ලූනාති ඡින්දතීති මඩගලං:; මඩගංයි සේයි; පාපං, පාපය; ලූනාතියි සේයි; ඡින්දති ඉති, සිඳීනුයි; මඩගලං, මඩගලනමි;) "ලවො" යනාදියෙහි වැටනීමෙහි වැටේ. (:ලූනාතිසදිසාකාරෙ න බායතීති ලවො:; ලූනාතියි සේයි; සදිසාකාරෙන, සදෘශාකාරයෙන්; බායති ඉති, වැටගේනුයි; ලවො, ලවනමි. (ලවනම් ලෙසයි)

(මෙසේ 'ල' කාරයාගේ අනෙකාර්ථවාචකත්වය දක්වා දැන් 'ච' කාරයාගේ අනෙකාර්ථ වාචකත්වය දක්වන්නේ, 'චිත්තමාළුතනාගෙසු' යනාදි කීය.)

98 වො, 'ච' කාරතෙමේ; චිත්ත, සිතය; මාළුත, වාතය;

* මීටවෙනස්වද සමහරපොතක තිබේ. † රෙගං—සමහර·

නාගෙසු, නාගය යනමොවුන් කෙරෙහිද; පච්චයෙ, (ව) ප්‍රත්‍යයෙහිද; බ්‍යඤ්ජනෙච, (වකාර) බ්‍යඤ්ජනයෙහිද; ඔදු දන්තානං, අන්තවූ 'ඔ' කාර 'උ' කාරයන්ගේ; කාරියෙ; කාය්‍ය (වකාර) යෙහිද; මානමාකාරියෙඅපි; මාන යන ධාතුහු ගේ 'මා' කාරයාගේ කාය්‍ය (වකාර) යෙහිද; ලකාරියෙ; ල (සංඥ ළ) කාරයාගේ කාය්‍ය (වකාර) යෙහිද; ආගමෙච අපි, ආගම (වකාර) යෙහිද; පයොගතො, ප්‍රයොගවශයෙන්; පදිස්සති, දක්නාලැබේ.

එහි "දුට්ඨ'වො'ස්සජ්ජතෙසා'වං' 'ව'රාජ ජනතාහිතං.
කාතුං සස්ස විනාසාය තතොසස්සාදිනාසනං."

(යනමෙහි 'ව' කාරතෙමේ යථා ක්‍රමයෙන් චිත්ත වාත නාගයන් කෙරෙහි වැටේ.)

(දුට්ඨවො, දුෂ්ටවූ සිත්ඇති; වරාජ, නාගරාජතෙමේ; ජනතාහිතං, ජන සමූහයාහට අහිතය; කාතුං, කරන්ට; සස්ස විනාසාය, ශස්‍යවිනාශය පිණිස; සාවං, දැඩිවූ වාතය; ඔස්සජ්ජතෙ, හරී; තතො, ඒ හෙතුකොටගෙණ; සස්සාදිනාසනං, ශස්‍යාදීන්ගේ නැසීම වේ.) වැලිදු.

"සුවො" යනමෙහි 'ව' කාරතෙමේ චිත්තවාචකය, (:සුන්දරං ඡෙකං චිත්තං යස්සාති සො සුවො:; සුන්දරංයි සේයි; ඡෙකං, දක්ෂවූ; චිත්තං, සිතතෙමේ; යස්ස ඉති, යමෙක්හුගේ නුයි; සො, හේතෙමේ; සුවො, සුවනම්. (සුවනම් කිරපක්ෂියි) "චූළනිප්ඵ'වො'–මහානිප්ඵ'වො" යනාදියෙහි වාතයෙහි වැටේ. (:නිප්ඵාදිතො වො වාතො යෙනාතිසො නිප්ඵවො:; නිප්ඵාදිතො, නිපදවනලද; වොයි සේයි; වාතො, වාතතෙමේ; යෙනාඉති, යමෙක්හුවිසින්නුයි; සො, හේතෙමේ; නිප්ඵවො, නිප්ඵවනම්. (නිප්ඵවනම් අපරණ්ණ විශේෂයෙකි) "වරුණො නාගරාජා" යනාදියෙහි නාගයා කෙරෙහි වැටේ. (:වොනාගෙ රුණොති රවති පසාසති අධිපතිභාවෙනාති වරුණො:; වොයි සේයි; නාගෙ, නාගයන්ට; රුණොතියි සේයි; රවතියි සේයි; අධිපතිභාවෙන, අධිපතිභාවයෙන්; පසාසතිඉති, අණවාදකෙරේනුයි; වරුණො, වරුණනම්) "ස්මා'වො'ච–තිස්සකා'වෙ'ච" යනාදියෙහි 'ව' ප්‍රත්‍යයෙහි වැටේ. "යරල'ව' සඟළ අං" යනාදියෙහි 'ව'කාර බ්‍යඤ්ජනයෙහි වැටේ. "'ව' ඔ දුදන්තානං" යනමෙහි අන්තවූ 'ඔ'කාර 'උ' කාරයන්ගේ කාය්‍ය 'ව' කාරයෙහි වැටේ. "'මානකිතානං 'ව'තතතංවා" යනමෙහි 'මාන' යන ධාතුහුගේ 'මා' කාරයා

99 චාතු ධාතු නිපාතෙසු චණ්ඩිම්හි පාසසකාරියෙ
ගතිගන්ධනසමෙසු ආදූනෙපවතෙත රපි.
100 සමුච්චයෙ චොපමායං සංසයෙ පදපූරණෙ
වවත්ථිත විභාසායං වස්සගෙඝච විකප්පනෙ.

ගේ කායසී 'ච'කාරයෙහි වැටේ. "ය'ච' කාරුච" යනමෙහි ල
සංඥවූ 'උ'කාරයාගේ කායසී 'ච'කාරයෙහි වැටේ.''ය'ච'මදන
තරලා චාගමා" යනමෙහි ආගම 'ච'කාරයෙහි වැටේ.)

99 වාතු, 'වා'කාරතෙමේ වනාහි; ධාතු, (වා) ධාතුය; නි
පාතෙසු, නිපාතය යන මෙහිද; චණ්ඩම්හි, උමයඟන කෙ
රෙහිද; පාසස, 'පා'කාරයාගේ; කාරියෙ, කායසී (වාකාර)
යෙහිද; ගති, යාමය; ගන්ධන, ප්‍රකාශකිරීමය; සමෙසු, ස
මානවීමය; යන මෙහිද; ආදූනෙ, ගැන්මෙහිද; පවතෙත
අපි, පැවැත්මෙහිද.

100 සමුච්චයෙච, සම්පිණ්ඩනයෙහිද; උපමායං, උපමා
වෙහිද; සංසයෙ, සන්දෙහයෙහිද; පදපූරණෙ, පදපූරණ
යෙහිද; වවත්ථිත විභාසායං, ව්‍යවස්ථිත විභාෂාවෙහිද; වස්ස
ගෙඝච, නිශ්චයෙහිද; විකප්පනෙ, විකල්පයෙහිද; (වේ.)

("වා'ගතිගන්ධනෙසු" * යනමෙහි 'වා'කාරතෙමේ 'වා'ධා
තුවෙහි වැටේ. "වා'වස්සගෙඝ විකප්පනෙ" යනාදියෙහි නි
පාතයෙහි වැටේ. "සිවො" යනමෙහි උමයඟන කෙරෙහි
වැටේ. (:සෙවනි භාජනිවා චණ්ඩ දෙවතා එතස්මින්ති සිවො:
එතස්මිං, මොහු කෙරෙහි;චණ්ඩදෙවතා,උමාදෙවී තොමෝ;
සෙවනිඉතිවා, සෙවනය කෙරේනුයි හෝ; භජතිඉතිවා,
භජනය කෙරේනුයි හෝ; සිවො, සිවනම්. (සිවනම් මහෙ
ශ්වරයි.) ''තනොපාමානානං'වා'මංසෙසු" යනමෙහි 'පා'කාර
යාගේ කායසී 'වා'කාරයෙහි වැටේ. "වාතො—වායති" යන
මෙහි 'වා' ධාතුතෙමේ යාමෙහි වැටේ. (:වාති සීඝං ගච්ඡ
තීති වාතො:; වාතියි සේසී; සීඝං, ශීඝ්‍රව; ගච්ඡතිඉති, යේ
නුයි; වාතො, වාතනම් (වාතනම් මාරුතයි;) "වාතො" ය
නමෙහිම ප්‍රකාශකිරීමෙහිද වැටේ. (:වාතිගන්ධතිසූචෙති
සුගන්ධ දුග්ගන්ධන්ති වාතො:; වාතියි සේසී; ගන්ධතියි
සේසී; සුගන්ධ දුග්ගන්ධං, සුවඳ දුගඳ; සූචෙතිඉති, ප්‍රකාශ
කෙරේනුයි; වාතො, වාතනම්.) "වානරො" යනාදියෙහි
සමාන වීමෙහි වැටේ. (:වානිසමෙනීති වා: වාසදිසොන

* වාගතිබන්ධනෙසු—ධාතුපාඨ ධාතුමඤ්ජූසා දෙක්හි.

101 වීතු ධාතුපසග්ගෙසු පක්ඛි පක්ඛ්‍යනෙසුච.
සංසිබ්බනෙ විනාසායං පදිස්සති පයොගතො.

රෙ වානරො:; වාතිධි සේයි; සමෙතිඉති, සමානවේනුයි; වා, වානම්; වායි සේසී; සදිසො, සදෘශවූ; නරො, මිනිස් තෙමේ; වානරො, වානර නම්. (වානරනම් මකීටයි.) "ආදීන වො" යනමෙහි ගැන්මෙහි වැටේ. (:ආදීනං අතිවියකපන භාවං වාති ගණ්හාතිති ආදීනවො:; ආදීනංයි සේයි; අතිවි යකපනභාවං, අධිකවූ කෘපන භාවය; වාතියි සේයි; ගණ්හා තිඉති, ගනීනුයි; ආදීනවො, ආදීනව නම්.) "වාසවො–කෙ සවො" යනමෙහි පැවැත්මෙහි වැටේ. (:වාසං ආවාසත්ථං පූරිමත්තභාවෙ ආවාසදාන වසෙන වාති පවත්තෙතීති වාස වො:; වාසං, වාසය; ආවාසත්ථං, ආවාසපිණ්ඩිස; පූරිමත්ත භා වෙ, පූර්වාත්මභාවයෙහි; ආවාසදාන වසෙන, ආවාසදාන වශ යෙන්; වාතියිසේයි; පවත්තෙතීඉති, පවත්වානුයි; වාසවො, වා සවනම්; (වාසවනම් ශක්‍රයි;) :කෙසෙ වාති පවත්තෙතීති කෙ සවො:; කෙසෙ, කෙශයන්; වාතියි සේයි; පවත්තෙති ඉති, පවත්වානුයි; කෙසවො, කෙසවනම්. (කෙසවනම් විෂ්ණුයි;) "පාටලිපුත්තස්ස ඛො ආනන්ද තයො අන්තරායා භවිස්සන්ති අග්ගිතො 'වා' උදකතො 'වා' මිථුභෙදතො 'වා'" යන මෙහි නිපාතවූ 'වා' කාරතෙමේ සම්පිණ්ඩනයෙහි වැටේ.)

"මධු 'වා' මඤ්ඤති බාලො යාවපාපං නපච්චති
යදාච පච්චති පාපං අථබාලො දුක්ඛං නිගච්ඡති."

(යනමෙහි උපමාවෙහි වැටේ. "කො 'වා' ධං කස්ස 'වා' පුත්තො" යනාදියෙහි සන්දෙහයෙහි වැටේ. "ඉමස්ස වච නං සච්චං 'වා' යදි 'වා' මුසා" යනමෙහි පදපූරණයෙහි වැටේ. "අමාපතො සම්ං සමානං 'වා'" යනමෙහි ව්‍යවස්ථිත වි භාෂාවෙහි වැටේ. "'වා' වස්සගෙහ නිපාතො" යනාදියෙහි නිශ්චයෙහි වැටේ. "වණ්ණන්තං 'වා' වනෙහ—'වා'පරො අස රූපා" යනාදියෙහි විකල්පයෙහි වැටේ.)

101 විතු, 'වි' ශබ්දතෙමේ වනාහි; ධාතු, (වි) ධාතුය; උ පසග්ගෙසු, උපසර්ගය යනමෙහිද; පක්ඛි, පක්ෂිය; පක්ඛ්‍ය නෙසුච, අහසින්යාමය යන මෙහිද; සංසිබ්බනෙ, ඇලීමෙ හිද; විනාසායං විනාශවීමෙහිද; පයොගතො; ප්‍රයොගවශ යෙන්; පදිස්සති, දක්නාලැබේ.

("වි'සංසිබ්බනෙ"යනාදියෙහි 'වි'ශබ්දතෙමේ 'වි'ධාතුවෙහි වැටේ. "ප. පරා. නි. නී. උ. දු, සං. 'වි'" යනාදියෙහි උපසර්

102 විවිධාතිසයාභාවෙ භුසත්ථිස්සරියාච්චයෙ
වියොගෙකලහෙ පාතු භාවෙ භාසෙච කුච්ඡනෙ.
103 දූරානභිමුඛත්ථෙසු මොහානවට්ඨිති සුච
පධානදක්ඛතා ඛෙද සහත්ථාදො,විදිස්සති.

---

යෙහි වැටේ. "විනායකො—විනෙන්ද" යනාදියෙහි පක්ෂීහු කෙරෙහි වැටේ. (:වීනං සකුණානං නායකො අධිපතීති වි නායකො:; වීනංයි සේයි; සකුණානං, පක්ෂීන්ට; නායකොයි සේයි; අධිපතීඉති, අධිපතිහුයි; විනායකො, විනායකනම්. (විනායකනම් සුපර්ණයි;) :වීනං සකුණානං ඉන්දො සාමීති විනෙන්ද: වීනංයි සේයි, සකුණානං, පක්ෂීන්ට; ඉන්දොයි සේයි; සාමීඉති, ස්වාමිහුයි; විනෙන්ද, විඳනම්; (විඳනම් සුපර්ණයි) "විනායකො—විනෙන්ද" යන මෙහිම 'වි' ධාතුතෙමේ අහසින් යාමෙහි වැටේ. (:විනාති පක්ඛන්දතීති වි:; විනාත්යි සේයි; පක්ඛන්දති ඉති, අහසින් යේහුයි; වි, විනම්; (විනම් පක්ෂියි;) "නිබ්බානං" යන මෙහි ඇලීමෙහි වැටේ. (:විනාති සංසිබ්බතීති වානං: තතොවානතො නික්ඛන්තන්ති නිබ්බානං:; විනාතියි සේයි; සංසිබ්බතිඉති, ඇලේහුයි; වානං, වානනම්, (වානනම් තෘෂ්ණායි) තතොවානතො, ඒ තෘෂ්ණාවෙන්, නික්ඛන්තංඉති, නිෂ්ක්‍රාන්ත වූයේහුයි; නිබ්බානං, නිබ්බාන නම්;) "උදයබ්බයඤාණං" යන මෙහි 'වයො' යනපෙදෙහි විනාශවීමෙහි වැටේ. (:විනාති විනස්සතීති වයො:; විනාතියි සේයි; විනස්සතිඉති, විනාශවේහුයි; වයො, වයනම්. (වයනම් ස්කන්ධයන්ගේ බිඳීමයි.)

**102** වි,(උපසර්ග) 'වි'කාරතෙමේ;විවිධ, විවිධාර්ථය; අතිසය, අතිශයාර්ථය; අභාවෙ, අභාවය යනමෙහිද; භුසත්ථ, සමන්තාර්ථය; ඉස්සරිය, ඓශ්වර්ය්‍යය; අච්චයෙ, අතික්‍රමය යනමෙහිද; වියොගෙ, විරහයෙහිද;කලහෙ,ඩබරයෙහිද;පාතුභාවෙ,පහළ වීමෙහිද; භාසෙච, ප්‍රකටවීමෙහිද; කුච්ඡනෙ,නින්දාවෙහිද;

**103** දූර, දූරාර්ථය; අනභිමුඛත්ථෙසු, අනභිමුඛාර්ථය යන මේ අර්ථයන්හිද; මොහ, මූළාය; අනවට්ඨිතිසුච, අනවස්ථිතිය යනමෙහිද; පධාන, ප්‍රධානබවය; දක්ඛතා, දක්ෂබවය; ඛෙද, පරිශ්‍රමය; සහත්ථාදො, සහාර්ථය යනමේ ආදියෙහිද; දිස්සති, (ප්‍රයොග වශයෙන්) දක්නා ලැබේ.

("'වි'මති–'වි'චිත්තං" යනාදියෙහි උපසර්ග 'වි'කාරතෙමේ විවිධාර්ථයෙහි වැටේ. "'වි'මුත්ති—'වි'සිට්ඨො" යනාදියෙහි අතිශයාර්ථයෙහිවැටේ."'වි'මලං"යනාදියෙහිඅභාවයෙහිවැටේ.

**104** වූධාතුයං නිබ්බුතිම්හි සංවරෙ වෙතුධාතුයං
තනනවායෙච්ඡයෙ කංසෙ පදපූරෙබ්‍යයංමතං.

---

,'ආරති'ව්'රති" යනාදියෙහි සමන්තාර්ථයෙහි වැටේ. "ව්'රූළ්හකො" යනාදියෙහි ඓශ්වර්‍ය්‍යයෙහි වැටේ. (:ඉස්සරභාවෙන කුම්භණ්ඩෙ රුහති පසාසතීති විරූළ්හකො:; ඉස්සරභාවෙන, ඊශ්වරභාවයෙන්, කුම්භණ්ඩෙ, කුම්භාණ්ඩයන්ට; රුහතියි සේයි; පසාසතිඉති, අවවාදකෙරේනුයි; විරූළ්හකො, විරූළ්හකනම්; (විරූළ්හකනම් දකුණුදිශාවෙහි අනුශාසක මහාරාජයි) "කාලො'වී'තිවතෙතා" යනාදියෙහි අතික්‍රමයෙහි වැටේ. "ව්'ප්පයුතෙතා—'ව්'ප්පයොගො" යනාදියෙහි වියොගයෙහි වැටේ. "ව්'වාදෙ" යනාදියෙහි ඩබරයෙහි වැටේ "ව්'ජාතා—'ව්'ජායිත්වා" යනාදියෙහි පහළවීමෙහි වැටේ. "ව්'භාතාරත්ති—'ව්'වටොඅත්ථො" යනාදියෙහි ප්‍රකටවීමෙහි වැටේ. "ව්'රූපො" යනාදියෙහි නින්දාවෙහි වැටේ (:කුච්ජිතං රූපං යස්සාතිසො විරූපො:; කුච්ජිතං, නින්දිතවූ; රූපං, රූපතෙමේ; යස්සඉති, යමෙක්හුගේනුයි; සො, හේතෙමේ; විරූපො, විරූපනම්;) "ව්'දෙසා ආගතො" යනාදියෙහි දූරාර්ථයෙහි වැටේ. (:දූරෙ දෙසොති විදෙසො:, දූරෙ, දුරුවූ; දෙසොඉති,දෙශතෙමේනුයි; විදෙසො,විදෙසනම්;) "ව්'මුඛො" යනාදියෙහි අනභිමුඛාර්ථයෙහි වැටේ. "වි'මූළ්හො'—'ව්'මොහකො" යනාදියෙහි මූළාවෙහි වැටේ. "ව්'ඛිත්තො-'වි'ක්ඛෙපො" යනාදියෙහි අනවස්ථිතියෙහි වැටේ. "වි'මුත්ති" යනාදියෙහි ප්‍රධාන බවෙහි වැටේ. "ව්'පස්සී—'වි'පස්සති" යනාදියෙහි දක්ෂ බවෙහි වැටේ. "ඵොතං 'ව්'ස්සමිත්වා ගච්ඡති" යනාදියෙහි පරිශ්‍රමයෙහි වැටේ. ('විස්සමිත්වා' යනු 'පරිශ්‍රමය සන්සිඳවා' යන අර්ථයි.) "ව්'ස්සාසො" යනාදියෙහි සහාර්ථයෙහි වැටේ (:සාසනි සන්නක ගහණ කථා භාසනාදිසුනිරාසඞ්කි භාවෙන අක්ඛමක්ඛං අවිමුඤ්චන්තිති විස්සාසො: සාසතියි සේයි; සන්නක ගහණ කථා භාසනාදිසු, සතුදෙය ගැණුම් කථා බිණීමාදියෙහි; නිරාසඞ්කි භාවෙන, සැකනැතිබැවින්; අක්ඛමක්ඛං; ඔවුනොවුන්; අවිමුඤ්චන්ති ඉති, නුමුදානුයි; විස්සාසො, විස්සාස නම්; ('ආදි' ග්‍රහණයෙන් 'ආදිකම් විරුද්ධාර්ථාදීන්' ගැණේ—එනි "ව්'ප්පකතං" යනාදියෙහි ආදිකම්යෙහි වැටේ. "වි'රුජ්ඣති—'ව්'රොධො" යනාදියෙහි විරුද්ධාර්ථයෙහි වැටේ.)

**104** වූ, 'වූ' කාරතෙමේ; ධාතුයං, (වූ) ධාතුවෙහිද; නිබ්බු

105 පච්චත්තෙ උපයොගෙච, කරණෙ සම්පදානියෙ
සාමිස්සවචනෙ චෙව, තථෙව පදපූරණෙ
වෙවොතුකාරියෙයොස්ස,වෙහවෙහාඛ්‍යාතවිභත්තියං.

තිම්හි; නිවීමෙහිද; සංවරෙ, සංවරකිරීමෙහිද; (වේ) වෙතු, ‘වෙ’ කාරතෙමේ වනාහි; ධාතුයං, (වෙ) ධාතුවෙහිද; තන්තවායෙ, හූ තැනීමෙහිද; අවහයෙ, කැඳවීමෙහිද; (වේ) අබ්‍යයං, නිපාතපද (වෙකාර) තෙමේ; එකංසෙ, එකංසාර්ථයෙහිද; පදපූරෙ, පදපූරණාර්ථයෙහිද; මතං, දන්නාලද්දේය.

(“වූ’සංවරණෙ”යනාදියෙහි ‘වූ’කාරතෙමේ ‘වූ’ ධාතුවෙහි වැටේ. “නිබ්බූති–නිබ්බායති” යනාදියෙහි ‘වූ’ ධාතුතෙමේ නිවීමෙහි වැටේ. “සංවූතො–සංවූනොති” යනාදියෙහි සංවර කිරීමෙහි වැටේ.) “වෙ’තන්තූ සන්තානෙ” යනාදියෙහි ‘වෙ’ කාරතෙමේ ‘වෙ’ධාතුවෙහි වැටේ. “තන්තවායො” යනාදියෙහි ‘වෙ’ ධාතු තෙමේ හූ තැනීමෙහි වැටේ. (:තන්තං වායතීති තන්තවායො:; තන්තං, හූය; වායතිඉති, වියාතූසි; තන්තවායො, තන්තවාය නම්. (තන්තවායනම් පෙෂකාරයි) “පඨමවයො—මජ්ඣිමවයො—පච්ඡිමවයො—වයසම්පත්ති” යනාදියෙහි කැඳවීමෙහි වැටේ (:වායතිඅත්‍ථසමඞ්ගි පුග්ගලස්ස අඤ්ඤස්සඤ්ච පස්සන්තානං සුණන්තානංවා ජනානං සම්පත්ති විපත්තිවසෙන. පීතිසොමනස්සං නිබ්බිදඤ්ච සංවෙගඤ්ඤාණඤ්ච අවහායතීති වයො:; වායතියි සේසි; අත්‍ථසමඞ්ගි පුග්ගලස්ස, අර්ථයෙන් යුක්තවූ පුද්ගලයාගේද; පස්සන්තානංවා, දක්නාවූ හෝ; සුණන්තානංවා, අසන්නාවූ හෝ; අඤ්ඤස්සඤ්ච ජනානං, අනික් ජනයන්ගේද; සම්පත්ති විපත්තිවසෙන, සම්පත්ති විපත්ති වශයෙන්; පීතිසොමනස්සං, ප්‍රීති සෞමනස්‍යයද; නිබ්බිදඤ්ච, නිබ්බිදෑවද; සංවෙගඤ්ඤාණඤ්ච, සංවෙගඥානයද; අවහායතිඉති, කැඳවාහුයි; වයො, වය නම්;) “න ‘වෙ’ අනත්‍ථ කුසලෙන, අත්‍ථචරියා සුඛාවහා—නවාහං පණ්ණං භක්ඛාමි—නවායං කුමාරකො මත්තමඤ්ඤසි” * යනාදියෙහි නිපාත ‘වෙ’ කාරතෙමේ එකංසාර්ථයෙහි වැටේ. “ස ‘වෙ’ එතෙන යානෙන, නිබ්බානස්සෙව සන්තිකෙ” යනාදියෙහි පදපූරණයෙහි වැටේ.)

105 (වො, වොකාර තෙමේ) පච්චත්තෙ, ප්‍රථමාර්ථ

* නවාහං කුමාරකො මත්තමඤ්ඤිං—සමහර

**106 සහසමානපසත්‍ථ, සන්ත ත මානංකාරියෙ
පච්චයෙ බ්‍යඤ්ජනෙ අත්ත, නියෙ සොත්තනි බන්ධවෙ.**

---

යෙහිද; උපයොගෙච, ඊතියාත්‍ථ යෙහිද; කරණෙ, (අනු කත්තකත්‍ථසඩ්ඛ්‍යාත) කරණාත්‍ථයෙහිද; සම්පදානියෙ, සම්ප්‍රදානාත්‍ථයෙහිද; සාමිස්සවචනෙවෙච, ස්වාම්‍යත්‍ථයෙහිද; තථෙව, එසේම; පදපූරණෙ, පදපූරණයෙහිද; (වෙ) වෙ, වෙකාර තෙමේද; වොතු, වොකාර තෙමේද වනාහි; යොස්ස, යො විභත්තියගේ; කාරියෙ, කාය්‍ර්‍යයෙහි; (වෙ) වෙහ, වෙහකාර තෙමේද වෙහා, වෙහාකාරතෙමේද; ආඛ්‍යාත විභත්තියං, ආඛ්‍යාත විභත්තියෙහි; (වෙ)

("කච්චි 'වො' අනුරුද්ධ සමග්ගා සම්මොදමානා විහරථ" යනාදියෙහි 'වො' කාරතෙමේ ප්‍රථමාත්‍ථයෙහි වැටේ. "නච්ඡථ භික්ඛවෙ පණාමි 'වො'" යනාදියෙහි ඊතියාත්‍ථයෙහි වැටේ. "න'වො' මම සන්තිකෙ වත්‍ථබ්බං" යනාදියෙහි අනුක්ත කත්‍ථ සඩ්ඛ්‍යාත කරණාත්‍ථයෙහි වැටේ. "වනපත්‍ථපරියායං 'වො' භික්ඛවෙ දෙසිස්සාමි" යනාදියෙහි සම්ප්‍රදානාත්‍ථයෙහි වැටේ. "සබ්බෙ 'වො' සාරිපුත්ත සුභාසිතං" යනාදියෙහි ස්වාම්‍යාත්‍ථයෙහි වැටේ. "යෙහි 'වො' අරියා පරිසුද්ධකම්මන්තා පස්සාමි 'වො' හං අත්තානං යථා ඉච්ඡි තථා අහු" යනාදියෙහි පදපූරණයෙහි වැටේ. (මෙහි ප්‍රථමාදි පඤ්චාත්‍ථයන්හි වැටෙන්නාවූ 'වො' ශබ්දතෙමේ තුම්හ ශබ්දජය, පදපූරණයෙහි වැටෙන්නාවූ 'වො' ශබ්දතෙමේ නිපාත පදයි) "අකතරස්සා ලතො ය්වාලපනස්ස 'වෙ' 'වො'–ලතො'වො'කාරෙච" යනාදියෙහි 'වෙ' කාරතෙමේද 'වො' කාරතෙමේද 'යො' විභත්තියගේ කාය්‍ර්‍යයෙහි වැටේ. (එසින්ම–"භික්ඛ'වෙ'–භික්ඛ'වො'–සයම්භු'වෙ'–සයම්භු'වො'"යනාදි සිද්ධයි)"ති.අ ත්ති.සි.ථ ම් ම–තෙ.අනෙත.සෙ. 'වෙහ' එ.මෙහ" යනාදියෙහි 'වෙහ' කාරතෙමේ ආඛ්‍යාත විභත්තියෙහි වැටේ. (එසින්ම–"පච'වෙහ'–ගච්ඡ'වෙහ" යනාදි සිද්ධයි) "අ ඌ. එ.ත්‍ථ. අ.මහ–ත්‍ථ.රෙ.ත්‍ථො'වෙහා'ඉ.මෙහ"යනාදියෙහි'වෙහා' කාරතෙමේ ආඛ්‍යාත විභත්තියෙහි වැටේ. (එසින්ම—"පපච්'වෙහා'—ජගම්'වෙහා" යනාදි සිද්ධයයි දතයුතු.)

(මෙසේ 'ව' කාරයාගේ අනෙකාත්‍ථ වාචකත්වය දක්වා දැන් 'ස' කාරයාගේ අනෙකාත්‍ථ වාචකත්වය දක්වන්නේ 'සහසමාන පසත්‍ථ' යනාදි කීය.)

106 සො, 'ස'කාරතෙමේ; සහ, සහ ශබ්දය; සමාන, සමා

**107** ඛෙත්තෙච රක්ඛසෙසාතු, සොණෙ සණ්ඨි ධාතුයං
ආදෙස සිරිවිභත්ති, හරියායං පකිත්තිතො.

---

නශබ්දය, පසණ්, පසණ්ශබ්දය, සනාත, සනාතශබ්දය, තමා නං, 'ත'ශබ්දය 'ම'ශබ්දය යන මේ ශබ්දයන්ගේ; කාරියෙ, කාය්‍ය (සකාර) යෙහිද පච්චයෙ, (නාමවිභක්තියෙහි ද ධාතු) ප්‍රත්‍යයෙහිද; බ්‍යඤ්ජනෙ, (සකාර) බ්‍යඤ්ජනයෙහිද; අත්තනි යෙ, තමා සම්බන්ධ වස්තුවෙහිද; අත්තනි, තමාංකෙරෙහිද; බන්ධවෙ, නෑයා කෙරෙහිද;

**107** ඛෙත්තෙච, ක්ෂෙත්‍රයෙහිද; රක්ඛසෙ, රාක්ෂසයාකෙරෙහිද; (චේ) සාතු, 'සා' කාරතෙමේ වනාහි; සොණෙ, බල්ලු කෙරෙහිද; සණ්ඨි, ආචාය්‍යීයා කෙරෙහිද; ධාතුයං, (සා) ධාතුවෙහිද; ආදෙස, ආදෙශ (සාකාර) ය; සිරි, සම්පත්තිය; විභත්ති, (ආඛ්‍යාත) විභක්තිය; හරියායං, භාය්‍යීාය යනමොවුන් කෙරෙහිද; (වේයයි) පකිත්තිතො, කියනලද්දේය;

(එහි "සහස්ස 'සො' ච" යන සූත්‍රයෙහි 'ස' කාරතෙමේ 'සහ' ශබ්දයාගේ කාය්‍ය 'ස'කාරයෙහි වැටේ. (එසින්ම-"'ස'චිත්තකා—'ස'ච්චාරා—'ස'නිදස්සනා" යනාදි ප්‍රයොගයෝ සිද්ධවෙති) "සමානස්ස 'සො' ච" යනාදියෙහි 'සමාන' ශබ්දයාගේ කාය්‍ය 'ස'කාරයෙහි වැටේ. (එසින්ම—"හරිස්සවණ්ණා පඨවිප්පභාසො" යනාදි ප්‍රයොගයෝ සිද්ධවෙති—:හරිණාසුවණ්ණෙන සමානො වණ්ණො හරිස්සවණ්ණො:; හරිණාසි සේයි; සුවණ්ණෙන, සවණියෙන හා; සමානො, සමානවූ; වණ්ණො, වර්ණතෙමේ, හරිස්සවණ්ණො, හරිස්සවණ්ණ නම්-මෙහි 'හරි'සමාන' වණ්ණො'යි කියයුත්තෙහි 'සමාන' ශබ්දය හට 'ස' කාරාදෙශකොට 'හරිස්සවණ්ණො' යි කියන ලදි) "පසණ්ස්ස 'සො' ච" යන මෙහි 'පසණ්' ශබ්දයාගේ කාය්‍ය 'ස'කාරයෙහි වැටේ. (එසින්ම-"සෙය්‍යො-සෙට්ඨො" යනාදි ප්‍රයොගයෝ සිද්ධවෙති) "සනාතසද්දස්ස 'සො' භෙ බොව්ච න්නාත" යනමෙහි 'සනාත' ශබ්දයාගේ කාය්‍ය 'ස'කාරයෙහි වැටේ. (එසින්ම-"ස'බ්භි—'ස'ද්ධම්මං—'ස'ප්පුරිසො"යනාදි ප්‍රයොගයෝ සිද්ධවෙති) "එත තෙ සං තො" යනමෙහි 'ත' කාරයාගේ කාය්‍ය 'ස'කාරයෙහි වැටේ. (එසින්ම—'සො' පුරිසො—'සා' ඉත්ථි" යනාදි ප්‍රයොගයෝ සිද්ධවෙත්) "අමුස්ස මො'සං" යනමෙහි 'ම' කාරයාගේ කාය්‍ය 'ස'කාරයෙහි වැටේ. (එසින්ම—"අසු රාජා—අසු ඉත්ථි" යනාදි ප්‍රයොගයෝ සිද්ධවෙති) "සි.යො. අං.යො.නා.හි 'ස'නා. සමා.හි 'ස'නා.

සම්ං.සූ" යනාදියෙහි නාමවිභක්තියෙහි වැටේ.) "තිජගුප කිතමානෙහි බජ'සා'වා" යනාදියෙහි ධාතු ප්‍රත්‍යයෙහි වැටේ. "යරලව'ස'හළඅං"යනාදියෙහි'ස'කාර බ්‍යඤ්ජනයෙහිවැටේ. "සානි'කම්මානි—'ස'පුත්තො" යනාදියෙහි තමා සම්බන්ධ ව සතුවෙහි වැටේ. "ස'ධනං—'ස'පරිසං" යනාදියෙහි තමාකෙරෙහි වැටේ. "ස'න්දිට්ඨා—'ස'ම්භත්තා" යනාදියෙහි නෑයං කෙරෙහි වැටේ. (:සොවිය බන්ධවොවිය අඤ්ඤමඤ්ඤංවිස්සාසවසෙන දිට්ඨා දිට්ඨපුබ්බාති සන්දිට්ඨා:; සොවියයි සේයි; බන්ධවොවිය, නෑයෙක් මෙන්; අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්; විස්සාසවසෙන, විශ්වාසවශයෙන්; දිට්ඨායි සේයි; දිට්ඨපුබ්බා ඉති, දෘෂ්ටපූර්වනුයි; සන්දිට්ඨා, සන්දිට්ඨ නම්; (සන්දිට්ඨ නම් දෘෂ්ට මිත්‍රයි) :සොවිය බන්ධවොවිය අඤ්ඤමඤ්ඤං විස්සාසවසෙන භජන්තීති සම්භත්තා:; සොවියයි සේයි; බන්ධවොවිය, නෑයෙක්මෙන් අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්; විස්සාසවසෙන, විශ්වාසවශයෙන්; භජන්ති ඉති, භජනය කෙරේනුයි; සම්භත්තා, සම්භත්ත නම්. (සම්භත්තනම් දෘඪ මිත්‍රයි—මෙහි 'සදිට්ඨා—සභත්තා' යි කිය යුත්තෙහි නිග්ගහීතාගමකොට ඕහට තද්වර්ගීයාන්තාදෙශකොට 'සන්දිට්ඨා-සම්භත්තා' යි කියනලදී) "සස්සං—සාලි" යනාදියෙහි ක්ෂෙත්‍රයෙහි වැටේ. (:සෙඛෙත්තෙ සෙන්ති රුහන්තීති සස්සං:; සෙයි සේයි; ඛෙත්තෙ, ක්ෂෙත්‍රයෙහි; සෙන්තියි සේයි; රුහන්තිඉති, උපදිත්නුයි; සස්සං, සස්‍ය නම්;—:සෙඛෙත්තෙ ලියන්ති අලලියන්තීති සාලි:; සෙයි සේයි; ඛෙත්තෙ, ක්ෂෙත්‍රයෙහි; ලියන්තියි සේයි; අලලියන්තිඉති, රැඳෙත්නුයි; සාලි, සාලිනම්.) "ස'පත්තො" යනාදියෙහි රාක්ෂසයාකෙරෙහි වැටේ. (:සොවිය රක්ඛසොවිය අඤ්ඤමඤ්ඤං අහිතා සුඛං පාපෙන්තීති සපත්තා:; සොවියයි සේයි; .රක්ඛසොවිය, රාක්ෂසයෙක් මෙන්; අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්; අහිතාසුඛං, අහිතයටහා අසැපයට; පාපෙන්තිඉති,පමුණුවාතුයි;සපත්තා, සපත්තනම්. (සපත්තනම් පසමිතුරුයි) "යත්ථ'සා'උපට්ඨිතො හොන්ති—භගවතො 'සා' ජාතිම්පි සුත්වා සත්තා අමතභාගී නො භවන්ති."

"අසනානාකිරමං ජම්මා තානතානාති භාසරෙ
රක්ඛසාපුත්තරූපෙන 'සා'වගහාරෙන්ති සූකරං."

(යනාදියෙහි'සා'ශබ්දතෙමේබල්ලාහුකෙරෙහිවැටේ."සිපෙසා" යනාදියෙහි ආචාර්ය්‍යයා කෙරෙහි වැටේ. (:සානි ආචරියෙහිසං

108 සාමත්ථෙ තනූකරණෙ, පාකෙ සිතූ විභත්තියං
පච්චයෙ ධාතුයං සෙවෙ, සයබන්ධනඡෙදනෙ
ගතියං රුහනෙ සීති, සද්දපවත්තනෙ’පි.

---

සි තබ්බොති සිස්සො:; සාහියි සේයි; ආචරියෙහි, ආචාර්යයන් විසින්, සාසි තබ්බොඉති, අවවාද කටයුත්තේනුයි; සිස්සො, සිස්සනම්. (මෙහි ‘සා’ ශබ්දපපද ‘සාස අනුසිට්ඨියං’ යන ධාතුහු කෙරෙන් ‘ස්‍ය’ ප්‍රත්‍යයව ‘සිස්සො’ යනු සිද්ධයි) “සාලො” යන මෙහිද ආචාර්යයා කෙරෙහි වැටේ. :සාහි භෙසජ්ජචරියෙහි නානාරොගස්ස තිකිච්ඡනත්ථාය ලායතෙ ගය්හතෙති සාලො:; සාහියි සේයි; භෙසජ්ජචරියෙහි, භෛෂජ්‍යාචාර්යයන් විසින්; නානාරොගස්ස, නොයෙක්රොගයාගේ; තිකිච්ඡනත්ථාය, පිළියම්කිරීම පිණිස; ලායතෙයි සේයි; ගය්හතෙ ඉති, ගනුලැබේනුයි; සාලො, සාලනම්. (සාලනම් වෛද්‍යයි) “‘සා’ සාමත්ථෙ—‘සා’තනූකරණෙ” යනාදියෙහි ‘සා’ ධාතුවෙහි වැටේ. “සපතො සම්ං සානං සං‘සා’” යනාදියෙහි ‘ස’ විභක්තියට ආදේශවූ ‘සා’ කාරයෙහි වැටේ. “සාමො වණ්ණො” යනාදියෙහි සම්පත්තියෙහි වැටේ. (:සාසිරිමෙ තිසඞ්ගච්ඡති එතෙනාති සාමො:; සායි සේයි; සිරි, සම්පත්තිතොමෝ; මෙතියි සේයි; එතෙන, මේ කරණකොටගෙණ; සඞ්ගච්ඡතිඉති, එක්වේනුයි; සාමො, සාමනම්.) “සසා * සසංසු” යනාදියෙහි ආඛ්‍යාත විභක්තියෙහි වැටේ “සාභාතා” යනාදියෙහි භාර්යාවකෙරෙහි වැටේ. (:සායභරියාය භාතාති සාභාතා:; සායයි සේයි; භරියාය, භාර්යාවගේ; භාතාඉති, භ්‍රාතෘතෙමේනුයි; සාභාතා, සාභාතුනම්.)

108 සාමත්ථෙ, (සා ධාතුතෙමේ) සමර්ථවීමෙහිද; තනූකරණෙ, තුනීකිරීමෙහිද; පාකෙ, පිසීමෙහිද; (වේ) සිතූ, ‘සි’ කාරතෙමේ වනාහි; විභත්තියං, (නාමාඛ්‍යාත) විභක්තියෙහිද; පච්චයෙ, (සි) ප්‍රත්‍යයෙහිද; ධාතුයං, (සි) ධාතුවෙහිද; සෙවෙ, සෙවීමෙහිද; සය, සැතපීමය; බන්ධන, බැඳීමය; ඡෙදනෙ, සිඳීමය යනමෙහිද; ගතියං, යාමෙහිද; රුහනෙ, ඉපදීමෙහිද; සී ඉතිසද්දෙ; සී යන ශබ්දයෙහිද; පවත්තනෙ අපි, පැවැත්මෙහිද; (වේ)

(“නෙසාදපුත්තො භද්දනෙත‘සාමො’ ඉති මං පක්කතො” යනමෙහි ‘සාමො’ යන පෙදෙහි ‘සා’ ධාතුතෙමේ සමර්ථ

---

* මෙය අවිතථවශයෙනැයි දතයුතු.

ඒමෙහි වැටේ. (:සාතිජුතතා ජුතතංගිතාගිතඤ්ච ජානිතුං ස මත්ථෝතිති සාමො:; සාතියි සේයි; ජුතතාජුතතඤ්ච, ජුතක හා අජුතකද; ගිතා ගිතංච, ගිතයහා අගිතයද; ජානිතුං, දැනගන්ට, සමත්ථෝති ඉති, සමර්ථ වේ නුයි; සාමො, සාම නම්.) "සඤ්ඤභසුබුමධම්මං" යන පෙදෙහි තුනී කිරීමෙහි වැටේ. (:සායති තනු කරීයතීති සඤ්ඤාං:; සායතියි සේයි; තනුකරීයතිඉති, තුනීකරණුලැබේනුයි, සඤ්ඤං, සඤ්ඤ නම්.) "සානං භඩගං" යනමෙහි 'සානං' යන පෙදෙහිද තුනීකිරීමෙහි වැටේ. (:සායතිතනු කරීයතීති සානං:; සායතියි සේයි; තනුකරීයති ඉති, තුනීකරනුලැබේනුයි, සානං, සානනම්) "සාකො" යනමෙහි පිසීමෙහි වැටේ (:සායති පච්යතීති සාකො:; සායතියි සේයි; පච්යතිඉති, පිසනුලැබේනුයි; සාකො, සාකනම්. (සාකනම් සූපපතුයි) "සි'යො අං. යො. නා. හි. ස. නං. ස්මා. හි. ස. නං. ස්මිං. සු" යනාදියෙහි 'සි'කාරතෙමේ නාමවිභක්තියෙහි වැටේ. (එසින්ම–"බුද්ධො–අනන්තා" යනාදි සිද්ධයි) "ති. අන්ති. 'සි' ථ. මි. ම" යනාදියෙහි ආඛ්‍යාතවිභක්තියෙහි වැටේ.(එසින්ම-"පච'සි'–නවජ'සි"යනාදි සිද්ධයි) "තපාදිතො'සි" යනාදියෙහි තද්ධිත 'සි' ප්‍රත්‍යයෙහි වැටේ. (එසින්ම—"තපස්සි—යසස්සි" යනාදි සිද්ධයි) "සි' සයෙ" යනාදියෙහි 'සි' ධාතුවෙහි වැටේ. "සිවො—සිවං" යනාදියෙහි 'සි' ධාතුතෙමේ සෙවීමෙහි වැටේ. (:හිතසුඛං පත්ථෙන්තෙහි සෙවීයතෙති සිවො:; හිතසුඛං; හිතය හා සැපය, පත්ථෙන්තෙහි, ප්‍රාර්ථනාකරන්නවුන් විසින්; සෙවීයතෙ ඉති, සෙවනය කරණුලැබේනුයි; සිවො, සිවනම්; (සිව නම් මහෙශ්වරයි) :වට්ටභයභීතෙහි සෙවීයතෙති සිවං:; වට්ටභයභීතෙහි, වටබියෙන් බියවන ලද්දවුන් විසින්; සෙවීයතෙ ඉති, සෙවනය කරණු ලැබේනුයි; සිවං, සිව නම්; (සිවනම් නිර්වාණයි) "නිහීයති පුරිසො නිහීනසෙවී—නචහායෙථ කදාචි තුල්‍ය සෙවී—සෙවමානො—සෙවමානං" යනාදියෙහිද සෙවීමෙහි වැටේ. "සෙය්‍යං—සෙනාසනං—සයනං" යනාදියෙහි සැතපීමෙහි වැටේ. (:සයති එත්ථාති සෙය්‍යං:; එත්ථ, මෙහි; සයතිඉති, හොවීනුයි; සෙය්‍යං, සෙය්‍ය නම්—:සෙවතිච ආසතිච එත්ථාති සෙනාසනං: එත්ථ, මෙහි; සෙවතිඉතිච, හොවීනුයිද; ආසතිඉතිච, හිඳිනුයිද; සෙනාසනං, සෙනාසනනම්—:සයති එත්ථාති සයනං:; එත්ථ, මෙහි; සයතිඉති, හොවීනුයි; සයනං, සයනනම්;) "විසයො—සීමා"

**109 සුධාතුයං විභත්තිම්හි නිපාතුපසග්ගෙසුච**
**සවණ්ණාභිසවෙපාකෙ හිංසෙනබ්භවිමොචනෙ.**

---

යනමෙහි බැඳිමෙහි වැටේ. (:විසයී ධම්මං විසෙසෙන සිනොති බන්ධතීති විසයො:; විසයීධම්මං, විෂයිධර්මය; සිනොතියි සේයි; විසෙසෙන, වෙසෙසින්; බන්ධතීඉති; බඳිනුයි; විසයො, විසයනම්;—:කම්මවාචාදීහි සීයති බන්ධීයතීති සීමා:; කම්මවාචාදීහි, කර්මවාක්‍යාදියෙන්; සීයතියි සේයි; බන්ධීයතීඉති, බඳිනු ලැබේනුයි; සීමා, සීමානම්;) "අරහත්ත මග්ගො වානං සයති" * යනාදියෙහි සිඳිමෙහි වැටේ. (:අරහත්තමග්ගො, අර්හත්මාර්ගතෙමේ; වානං, තෘෂ්ණාව; සයති, සිඳී) "අසි" යන මෙහිද සිඳිමෙහි වැටේ. (:ආකොධවසෙන වෙරි ජනානං මහාපරාධ ජනානඤ්ච සීසාදිකං සයති සමුච්ඡින්දතීති අසි:, ආයි සේයි; කොධවසෙන, ක්‍රොධ වශයෙන්; වෙරිජනානං, වෛරි ජනයන්ගේද; මහාපරාධ ජනානඤ්ච, මහත්වූ අපරාධ ජනයන්ගේද; සීසාදිකං, හිස්ආදිය; සයතියි සේයි; සමුච්ඡින්දතීඉති, සිඳිනුයි; අසි, අසිනම්; (අසිනම් ඛඩ්ගයි—මෙහි 'ආ' පූර්වවූ 'සි' යන ධාතුයි) "සෙතු" යනාදියෙහි යාමෙහි වැටේ. (:සිනොති ගච්ඡතිපාරිමතීරං එතෙනාති සෙතු:; සිනොතියි සේයි; එතෙන, මේ කරණකොට ගෙණ; පාරිමතීරං, පරතෙරට; ගච්ඡතීඉති, යේනුයි; සෙතු, සෙතුනම්; (සෙතුනම් ඒදඬුයි) "කෙසා" යනාදියෙහි ඉපදිමෙහි වැටේ (:කෙසීසෙසෙනාති රුහනාතීති කෙසා:; කෙයි සේයි; සීසෙ, හිසෙහි; සෙනාතියි සේයි; රුහනාති ඉති, උපදිත්නුයි; කෙසා, කෙසනම්වෙත්;) "සින්ධුයානදියාතීරෙ" යනමෙහි 'සින්ධු' යනපෙදෙහි 'සි' යන ශබ්දයෙහි වැටේ. (:සීතිසද්දංකුරුමානාධුනාති කම්පතීති සින්ධු:; සී ඉති සද්දං, සී යන ශබ්දය; කුරුමානා, කරන්නී; ධුනාතියි සේයි; කම්පතීඉති, කම්පාවේනුයි; සින්ධු, සින්ධුනම්; (සින්ධු නම් එනම් නදියි;) "සෙතුඝාතො" යනමෙහි පැවැත්මෙහි වැටේ. (:සිනොති පවත්තති ඵලං එතස්මාති සෙතු:; සිනොතියි සේයි; එතස්මා, මේ හෙතුකොට ගෙණ, ඵලං, ඵලතෙමේ; පවත්තතිඉති, පවතිනුයි; සෙතු, සෙතුනම්, (සෙතුනම් කාරණයි )

109 සු, 'සු' කාරතෙමේ; ධාතුයං, (සු) ධාතුවෙහිද; විභත්තිම්හි, (නාමාඛ්‍යාත) විභක්තියෙහිද; නිපාත, නිපාතය,

---

* සියති—සමහර.

**110** ගතිසඳනතින්තෙතා ප, චිතවිස්සුතයොජනෙ
සොතවිඤ්ඤාණ තද්වාරා, නුසාරවිඤ්ඤාණෙරපි.

---

උපසග්ගෙ සු ච, උපසර්ගය යනමෙහිද; සවණෙ, ඇසීමෙහිද; අභිසවෙ, වැඩීමෙහිද, පාකෙ, පිසීමෙහිද; හිංසෙ, හිංසාකිරී මෙහිද; ගබ්භවිමොචනෙ, ප්‍රසූතියෙහිද.

**110** ගති, යාමය; සඳන, වැගිරීමය; තින්ත, තෙත්වීමය; උපචිත, රැස්කිරීමය; විස්සුත, ප්‍රකටවීමය; යොජනෙ, යෙදීමය යන මෙහිද; සොතවිඤ්ඤාණ, ශ්‍රොතවිඥාන (යෙන් ඇසීම) ය; තද්වාරානුසාර විඤ්ඤාණෙරපි, ඒ ශ්‍රොතද්වාරානු සාර විඥාන (යෙන් දැරීම) ය යන මෙහිද; (වේ)

(“සු’සවණෙ” යනාදියෙහි ‘සු’ ශබ්දතෙමේ ‘සු’ ධාතුවෙහි වැටේ.“සි.යො.අං. යො.නා.හි. ස.නං. ස්මා.හි. ස නං. ස්මිං‘සු’” යනාදියෙහි නාම විභක්තියෙහි වැටේ. “තිස්ස විභත්තිස්ස‘සු’ හොති—අන්තිස්ස ‘ස්සු’ හොති” යනාදියෙහි ආඛ්‍යාතවිභක්තිවූ-‘තිඅන්ති’ විභක්තීන්ගේ කාර්‍ය්‍යයෙහි වැටේ’ (එයින්ම “ගච්ඡ‘සු’—එම‘ස්සු’ වචනීයා” යනාදි ප්‍රයොගයෝ සිද්ධවෙති) “කතමං ‘සු’ මහප්ඵලං” යනමෙහිද—“‘සු’ඉති සීඝත්ථෙ” යන මෙහිද නිපාතයෙහි වැටේ.“‘සු’සොභනෙ සු ධම්මො” යනාදියෙහි උපසර්ගයෙහි වැටේ. “සාවකො—සොතං—සා” යනාදියෙහි ‘සු’ ධාතුතෙමේ ඇසීමෙහි වැටේ. (:සත්ථුනො වචනං සුණාතීති සාවකො:; සත්ථුනො, ශාස්තෘන් වහන්සේගේ; වචනං, වචනය; සුණාතිඉති, අසානුයි; සාවකො, සාවකනම්;—:සුණාතීති සොතං:; සුණාතිඉති, අසානුයි; සොතං, සොතනම්;—:සාමිකස්ස සද්දං සුණාතීති සා:; සාමිකස්ස, ස්වාමියාගේ; සද්දං, ශබ්දය; සුණාතිඉති, අසානුයි; සා, සානම්; (සානම් සුණඛයි) “සුත්තං” යන මෙහි වැඩීමෙහි වැටේ. (:අත්ථෙ අභිසවෙති ජනෙතීති සුත්තං:; අත්ථෙ, අර්ථයන්; අභිසවෙතියි සේයි; ජනෙතිඉති, උපදවානුයි; සුත්තං, සුත්තනම්;) “රඤ්ඤොසූදො, මහානසෙ” යනාදියෙහි පිසීමෙහි වැටේ. (:සවතිසූපොදනබ්‍යඤ්ජනානී පචතීති සූදො:; සවතියි සේයි; සූපොදනබ්‍යඤ්ජනානි, සූපොදන ව්‍යඤ්ජනයන්; පචතිඉති, පිසානුයි; සූදො, සූදනම්; (සූදනම් අරක්කැමියි) “සූරො” යනමෙහි හිංසා කිරීමෙහි වැටේ. (:සුණාතිපරසෙනායොහිංසතීති සූරො:; සුණාතියි සේයි; පර සෙනායො, ශත්‍රුසෙනාවන්ට; හිංසතිඉති, හිංසා

111 සුසද්දත්ථෙච සීඝත්ථෙ,සියාසුන්දරත්ථෙපි
සොභනෙච සුඛෙසම්මා,භුස සුට්ඨුසමිද්ධිසු

කෙරේනුයි; සූරෙ, සූරනම්;(සූරනම්සන්නද්ධයොධයි–මෙහි 'සු'
යනධාතුහුකෙරෙන් 'ණ' ප්‍රත්‍යයද 'ර'කාරාගමද කොට දීඝකළ
කල්හි 'සූරෙ' යනුසිද්ධයි)"වෙරිජනං 'සුණාති'" යනමෙහිද හිං
සාකිරීමෙහිවැටේ "සක්‍ය කුලප්පසූතො–පසූතා ඉත්ථියො" ය
නාදියෙහි ප්‍රසූතියෙහිවැටේ (සුණාති මාතුකුච්ඡිතො විජායතී
තිපසූතො:, සුණාතියිසේයි; මාතුකුච්ඡිතො,මව්කුසින්; විජායති
ඉති, ප්‍රසූතවේනුයි; පසූතො, පසූතනම්;(පසූතනම්පුත්‍රයි)"සෙ
නාය 'සූතො' පතාකීන්–මංචිඤ්ඤාති'සූතං'දිස්වා–දෙව 'සූතො'ච
මාතලි" යනාදියෙහි යාමෙහිවැටේ (:සක්කෙන පෙසිතො හු
ත්වා තෙන පෙසිතට්ඨානං සුණාති ගච්ඡතීති සූතො:, සක්කෙ
න, ශක්‍රයාවිසින්; පෙසිතොහුත්වා, යවනලදුව; තෙන, ඒ ශ
ක්‍රයා විසින්; පෙසිතට්ඨානං, යවනලද ස්ථානයට; සුණාතියි
සේයි; ගච්ඡතිඉති, යේනුයි; සූතො, සූතනම්; (සූතනම්මාතලි
දිව්‍යසාරථියි) "ආසවා–නදී'සවන්ති'" යනාදියෙහි වැගිරීමෙ
හිවැටේ. (:භවතො ආභවග්ගං ධම්මතො ආගොත්‍රභුංසවන්ති
සන්දන්තීති ආසවා:,භවතො, භවයපටන්; ආභවග්ගං, භවාග්‍ර
යදක්වාද; ධම්මතො, ධර්මයපටන්; ආගොත්‍රභුං, ගොත්‍රභුඥා
නයදක්වාද; සවන්තියිසේයි; සන්දන්තිඉති, වැගිරෙත්නුයි; ආ
සවා, ආසවනම්වෙත්) "අවස්සුතො-අවස්සුතාය" යනාදියෙ
හි තෙත්වීමෙහිවැටේ. ('අවස්සුතො' යනු රාගවශයෙන් තෙ
ත්වූ පුරුෂතෙමේයනඅර්ථයි–'අවස්සුතාය' යනු රාගවශයෙන්
තෙත්වූ භික්ෂුණීයගේයන අර්ථයි) "තුම්හෙහි පුඤ්ඤං'පසූතං'
අනප්පකං"යනාදියෙහි රැස්කිරීමෙහිවැටේ "'සූත'ධම්මස්ස–
'පසූතො"යනාදියෙහි ප්‍රකටවීමෙහිවැටේ."යෙඛාන'පසූතා'
ඕරා"යනාදියෙහි යෙදීමෙහි වැටේ."දිට්ඨං'සුතං' මුතං"යනා
දියෙහිශ්‍රොත්‍රවිඥානයෙන්ඇසීමෙහිවැටේ."'සූත'ධරො–'සූත'ස
න්නිචයො"යනාදියෙහි ඒ ශ්‍රොත්‍රද්වාරානුසාර විඥානයෙන්දැරී
මෙහිවැටේ)

111 සුසද්දත්ථෙච, ('සු'යන නිපාතතෙමේ) 'සු'ශබ්දයාගේ
අර්ථයෙහිද; සීඝත්ථෙ,ශීඝ්‍රාර්ථයෙහිද; සුන්දරත්ථෙඅපි, සුන්දරාර්
ථයෙහිද;සියා,වන්නේය; සොභනෙච,('සු'යනඋපසර්ගතෙමේ)
ශොභනයෙහිද; සුඛෙ, සැපයෙහිද; සම්මා, සම්මාශබ්දයා
ගේ අර්ථය; භුස, අතිශයාර්ථය; සුට්ඨු,සුට්ඨුශබ්දයාගේ අර්ථය;
සමිද්ධිසු, සමෘද්ධියයන මෙහිද,(වන්නේය)

**112** සෙත්වාගමෙ විභත්තිම්හි ධාතුයං ගතියංපචෙ
සොතුපච්චයෙනාස්මානං කාරියෙ භාගතස්සත්‍ථෙ

("දානංචාබ්‍රහ්මචරියංචා කතමං'සු'මහප්ඵලං" යනාදියෙහි 'සු'යනනිපාතතෙමේ 'නු'ශබ්දයාගේ අර්‍ථයෙහිවැටේ "සු දෙද්‍ද" යනාදියෙහි ශීඝ්‍රාර්‍ථයෙහ්වැටේ(:සීඝ සීඝං දාරුසුපෙය්‍ය පණ්ණාහරණාදි වසෙනාකුච්ජිතං ගච්ඡතීති සුදෙද්‍ද:, සීඝසීඝං, යුහු යුහුව; දාරුසුපෙය්‍ය පණ්ණාහරණ ඈිවසෙන,දරහාසුපයට සුදුසුවූ පත්ගෙණ ඊම්ආදිවශයෙන්; කුච්ජිතං, නින්දිත බවට; ගච්ඡතිඉති, යේනුයි; සුදෙද්‍ද, සුද්‍දනම්. ('සුද්‍ද'නම්හීන කුල යෙහි උපන් ඉතාදුඃඛිතවූසත්වයි) "සු'සන්ධිකප්පං" යනාදියෙ හි සුන්දරාර්‍ථයෙහිවැටේ."සු'ගන්ධො–'සු'රූපං"යනාදියෙහි'සු' යන උපසර්ගතෙමේ ශොභනාර්‍ථයෙහිවැටේ "සු'කරෙ–'සු' බොධො" යනාදියෙහි සැපයෙහිවැටේ. "සු'ගතො" යනාදි යෙහි 'සම්මා'ශබ්දයාගේ අර්‍ථයෙහි වැටේ. (:සම්මාගතොතිසු ගතො: සම්මා,මනාකොට; ගතොඉති, ගියේනුයි; සුගතො, සුගතනම්)"සු'රතෙතා" යනාදියෙහි අතිශයාර්‍ථයෙහි වැටේ. "වචනත්‍ථවරං 'සු'බොද්ධුං"යනාදියෙහි'සුට්ඨු'ශබ්දයාගේ අර්‍ථ යෙහිවැටේ. "සු'සිත්ඛං"යනාදියෙහි සමෘද්ධියෙහිවැටේ.)

**211** සෙතු,'සෙ'කාරතෙමේ වනාහි; ආගමෙ,ආගමයෙහිද; විභත්තිම්හි, (ආඛ්‍යාත) විභක්තියෙහිද; ධාතුයං, (සෙ)ධා තුවෙහිද; ගතියං, යාමෙහිද; පචෙ, පිසීමෙහිද; (වේ) සොතු, 'සො' කාරතෙමේ වනාහි, පච්චයෙ,(තද්ධිත) ප්‍රත්‍යයෙහිද; නාස්මානං, 'නා' විභක්ති'ස්මා'විභක්තිදෙදෙනාගේ; කාරියෙ, කාර්‍ය්‍ය (සොකාර)යෙහිද; භාග, භාගාර්‍ථය; තස්සත්‍ථෙ, තද ස්සත්‍ථ අර්‍ථය යනමෙහිද,(වේ)

("සෙ' ආගමෙපදං" යනාදියෙහි 'සෙ'කාරතෙමේ ආගමයෙ හි වැටේ. (එසින්ම–"කථං අමෙහ කරෙම'සෙ" යනාදි ප්‍රයො ගයෝසිද්ධවෙති)"ති.අ.න්ති සි.ථ.මි.ම–තෙ.අනෙත.'සෙ'.වෙහ එ.මෙහ"යනාදියෙහිආඛ්‍යාතවිභක්තියෙහිවැටේ."සෙ'පාකෙ 'සෙ'ගතියං"යනාදියෙහි'සෙ'ධාතුවෙහිවැටේ."සෙති–සෙතු" යනාදියෙහි 'සෙ' ධාතුතෙමේ යාමෙහිවැටේ. ('සෙති' යනු 'යේ'යනඅර්‍ථයි–'සෙතු'යනු'යේවා'යන අර්‍ථයි) "සෙදෙද මෙ දෙද" යනමෙහි 'සෙදෙද' යනපෙදෙහි පිසීමෙහිවැටේ. (:සෙ තිපචතීතිසෙදෙද:, සෙතිසිසේයි; පචතිඉති, පිසානුයි;සෙදෙද, සෙදනම්. (සෙදනම් ඛතදියයි–මෙහි'සෙ' යනධාතුහු කෙ රෙන් 'ත'ප්‍රත්‍යයකොට ඕහට 'ද'කාරාදෙශකළ කල්හි 'සෙ

**113** සන්තුහිතසුඛෙ සාධු,ජනෙ අරියපුග්ගලෙ
කාරියෙනංස්මිනං සම්හිනිබ්බානෙති පකිත්තිතො

---

දෙ,'යනුසිද්ධයි) "විභාගෙධාචානි එත් සූත්‍රෙන චග්ගහණෙන 'සො'හොති–තදස්සත්ථිතිවිචෙතිඑත්සූත්‍රෙන චසද්දෙන'සො' පච්චයොහොති" යනමෙහි 'සො'කාරතෙමේ තද්ධිත ප්‍රත්‍යයෙහිවැටේ. "සො'වා" යනමෙහි 'නා' විභක්තියගේ කාර්‍ය්‍යයෙහිවැටේ."දිසොරෙනි"යනමේ සූත්‍රයාගේ වෘත්තියෙහි "දීඝඹරසද්දෙහිස්මාවචනස්ස'සො'හොති"යනමෙහි'ස්මා'විභක්තියගේ කාර්‍ය්‍යයෙහිවැටේ. "පඤ්චපඤ්ච 'සො'' යනමෙහි 'සො' ප්‍රත්‍යයතෙමේ විභාගාර්ථයෙහිද. තදස්සත්ථි අර්ථයෙහි ද.වැටේ.)

**113** සාතු, (නාමපදවූ) 'සං'ශබ්දතෙමේ වනාහි; හිත, හිතය; සුඛෙ, සැපය යනමෙහිද; සාධු ජනෙ, සත්පුරුෂ ජනයා කෙරෙහිද; අරියපුග්ගලෙ, ආර්‍ය්‍යපුද්ගලයාකෙරෙහිද; නංස්මිනං, 'නං'විභක්තිය 'ස්මිං'විභක්තිය යන මොවුන්ගේ, කාරියෙ, කාර්‍ය්‍ය (සංස්කාර) යෙහිද; සම්හි,ධනයෙහිද; නිබ්බානෙ ඉති, නිර්වාණයෙහිද; (වේ)යයි,පකිත්තිතො, කියන ලද්දේය.

("සම්ඵප්පලාපො" යනමෙහි 'සං' ශබ්දතෙමේ හිතයෙහි ද.සැපයෙහිද.වැටේ (:සංහිතංසුඛඤ්චඵාතිවිනාසෙතීති සම්ඵං: :තංපලපති එතෙනාති සම්ඵප්පලාපො: සංසිසේයි; හිතං,හිතයද;සුඛඤ්ච, සැපයද; ඵාතිසිසේයි; විනාසෙතිඉති, විනාශකෙරේනුයි; සම්ඵං,සම්ඵනම්; තං, එය; එතෙන, මේකරණකොටගෙණ; පලපතිඉති, කියානුයි; සම්ඵප්පලාපො, සම්ඵප්පලාපනම්)

"යංයංදෙවොහි භජති,සන්තංවා යදි වාඅ'සං'
සීලවන්තං විසීලංවා,වසංතස්සෙව ගච්ඡති"
"සමෙති සන්තතා සන්තං සමෙති අසතා අ'සං"

(යනාදියෙහි 'සං'ශබ්දතෙමේ සත්පුරුෂයා කෙරෙහිවැටේ.)

(දෙවො, දෙවතෙමේ; සන්තංවා, සත්පුරුෂවූහෝ; යදි ඉදින්, අසංවා, අසත්පුරුෂවූහෝ; සීලවන්තංවා, සිල්වත්වූහෝ; විසීලංවා, දුශ්ශීලවූහෝ, යං යං,යමක් යමක්හු; අතිභජති, ඉතා භජනයකෙරේද; තස්ස එව, ඔහුගේම; වසං, වසගයට; ගච්ඡති,යේ.)

"ස'ද්ධමෙමා" යනාදියෙහි ආර්‍ය්‍ය පුද්ගලයා කෙරෙහි වැටේ. "සබ්බතො නං'සං'සානං" යනමෙහි 'නං' විභක්තියගේ කාර්‍ය්‍යයෙහිවැටේ. (එසින්ම"සබ්බාසං–කතරාසං" යනාදී සි

**114** සංසමොධානසඞ්ඛෙප,සමන්තත්ථ සමිද්ධිසු,
සම්මාභුස සහප්පත්ථා,භිමුඛත්ථෙසු සඞ්ගතෙ
පිධානෙපභවෙ චෙව පූජාපුන ක්‍රියා දිසු*

---

ධාධි)“ සපතෙසම්ං සානං ‘සං’ සා” යනමෙහි‘සම්ං’ විභක්තිය ගේ කාර්‍ය්‍යයෙහිවැටේ (එයින්ම‘සබ්බස්සං-කතරස්සං.’යනාදිසිද්ධාධි)“මනුස්ස‘සං’-පරං‘සං’-‘සා’මි-‘සා’පතෙය්‍යං”-යනාදියෙ ධනයෙහිවැටේ (:සස්සධනස්සපති සම්පති: සම්පතිනොහිතං සාපතෙය්‍යං:, සස්සයිසේයි; ධනස්ස, ධනයට; පති, ස්වාමිවූයේ; සම්පති, සම්පතිනම්; (සම්පතිනම් ධනපතියි) සම්පතිනො, ධනපතියාහට; හිතං, හිතවූයේ; සාපතෙය්‍යං, සාපතෙය්‍යනම්; (සාපතෙය්‍යනම්ධනයි.) “සකලලොක ‘ස’ඞ්කරෙ දීපඞ්කරෙ” යනමෙහි නිර්වාණයෙහිවැටේ.)

**114** සං, ‘සං’ (යන) උපසර්ගතෙමේ; සමොධාන, සමොධානය,සඞ්ඛෙප,සංක්ෂෙපය; සමන්තත්ථ, සමන්තාර්ථය;සමිද්ධිසු, සමෘද්ධිය යන මෙහිද; සම්මා, සම්මාශබ්දයාගේඅර්ථය;භුස, අතිශයාර්ථය; සහ, සහාර්ථය; අප්පත්ථ, අල්පාර්ථය; අභිමුඛත්ථෙසු, අභිමුඛාර්ථය යන මේ අර්ථයන්හිද; සඞ්ගතෙ, සඞ්ගතාර්ථයෙහිද; පිධානෙ, සංවරණයෙහිද; පභවෙචෙව,ප්‍රභවයෙහිද; පූජා, පිදීමය; පුනක්‍රියාදිසු, නැවත කිරීමය යනමේ ආදියෙහිද, (වේ)

(“‘ස’ඞ්ගම්හො-‘ස’මොධානං” යනාදියෙහි ‘සං’ යනඋපසර්ගතෙමේසමොධානයෙහිවැටේ. “ස’මාසො‘-ස’ඞ්ඛෙපො” යනාදියෙහි සංක්ෂෙපයෙහි වැටේ.“ස’ඞ්කිණ්ණා-‘ස’මුපලපනා”යනාදියෙහි සමන්තාර්ථයෙහිවැටේ “ස’මපණ්ණා” යනාදියෙහි සමෘද්ධියෙහිවැටේ. “සිලාතලෙ‘ස’න්නිසින්නො”යනාදියෙහිසම්මාශබ්දයාගේඅර්ථයෙහිවැටේ‘ ‘සා’රත්තො-‘සා’රාගො” යනාදියෙහිඅතිශයාර්ථයෙහිවැටේ.“සං’වාසො”යනාදියෙහිසහාර්ථයෙහිවැටේ.‘ “ස’මග්ඝො” යනාදියෙහිඅල්පාර්ථයෙහිවැටේ‘සම්මුඛා’යනාදියෙහිඅභිමුඛාර්ථයෙහිවැටේ.“ස’ඞ්ගමො” යනාදියෙහිසඞ්ගතාර්ථයෙහිවැටේ. “සං’වුතො-‘සං’වුතං” යනාදියෙහිසංවරණයෙහිවැටේ. “ස’ම්භවො” යනාදියෙහි ප්‍රභවයෙහිවැටේ.“පූතනදූරස්ස‘ස’ඞ්ගහො” යනාදියෙහි පිදීමෙහිවැටේ.‘සං’ධාවති‘සං’සරති”යනාදියෙහිනැවතකිරීමෙහිවැටේ)

---

*පූජායං පුනපුනක්‍රිය-න්ති ජ කත්ථචි දිස්සති-

115 හකාරෙපච්චයෙ ධස්ස,තස්සාපි කාරියෙහවෙ
නිපාතමත්තෙ බ්‍යඤ්ජනෙ,දුම්මනෙනුසිවෙරපි.

116 විසාදෙ භමණෙහාතු හායනෙ චජනෙරපි
නිපාතෙධාතුයංඛෙදෙ සොකදුක්ඛමුදෙරිතො.

---

(මෙසේ 'ස'කාරයාගේ අනෙකාර්ථ වාචකත්වය දක්වා දැන් 'හ'කාරයාගේ අනෙකාර්ථවාච කත්වය දක්වන්නේ 'හකාරෙ පච්චයෙධස්ස' යනාදිකිය)

115 හකාරෙ, 'හ'කාරතෙමේ; පච්චයෙ, (විභක්ති) ප්‍රත්‍යයෙහිද; ධස්ස, 'ධ'කාරයාගේද; තස්සඅපි, 'ත'ප්‍රත්‍යයාගේද, කාරියෙ, කාය්‍ය්‍යයෙහිද, අභවෙ,(අර්ථවිශෙෂ)රහිතවූ; නිපාතමත්තෙ, නිපාතමාත්‍රයෙහිද; බ්‍යඤ්ජනෙ, ව්‍යඤ්ජනයෙහිද; දුම්මනෙ, දුඃඛචිත්තයෙහිද; සිවෙඅපි, ඊශ්වරයාකෙරෙහිද;

116 විසාදෙ, කලාන්තයෙහිද; භමණෙ, භ්‍රමණයෙහිද; අනු,චී; හාතු, 'හා'කාරතෙමේ වනාහි; හායනෙ, පිරිහීමෙහිද; චජනෙඅපි, හැරීමෙහිද; නිපාතෙ,(හායන)නිපාතයෙහිද; ධාතුයං,(හා)ධාතුවෙහිද; ඛෙදෙ, ඛෙදයෙහිද; සොක; ශොකය; දුක්ඛ, දුඃඛය; මුදෙ,සන්තොෂය යනමෙහිද;(වේයයි)ඊරිතො,කියන ලද්දේය.

(එහි "ඉමස්මා 'හ'ධාච-ඉමස්සිත්ථන්ති'හ'තොධෙසුච" යනාදියෙහි 'හ'කාරතෙමේ විභක්ති ප්‍රත්‍යයෙහිවැටේ. (එසින්ම— 'ඉහ' යනාදි ප්‍රයොගයෝ සිද්ධවෙති) "දෙධස්සචාති එත්ථචගහණෙනධස්ස'හ'කාරොහොති" යනමෙහි 'ධකාරයාගේ කාය්‍ය්‍යයෙහිවැටේ.(එසින්ම–"සාහු දස්සන මරියානං" යනාදි ප්‍රයොගයෝ සිද්ධවෙති). "හානෙනහි'හො'හස්සලොවා අදහන හානං" යනමෙහි'ත' ප්‍රත්‍යයාගේ කාය්‍ය්‍යයෙහිවැටේ (එසින්ම "ආරුළෙහා" යනාදිප්‍රයොගයෝ සිද්ධවෙති) "න'හ' * පනහනොත්තහගවා" යනාදියෙහි නිපාත මාත්‍රයෙහිවැටේ. "යරලවස'හ'ළඅං" යනාදියෙහිව්‍යඤ්ජනයෙහිවැටේ,

("රොගාදි'හෙන''හෙහි'ති'හස්ස'යක්ඛංයජෙය්‍යවෙ"යනාදියෙහි'හ'කාරතෙමේ කලාන්ත දුඃඛ චිත්තභ්‍රමණ ඊශ්වරයන් කෙරෙහිවැටේ—රොගාදිහෙන, රොගාදීන්ගේ කලාන්තයෙන්පැවති දුඃඛචිත්තයෙන්; හෙහි, භ්‍රමණයවූවත්කරණකොටගෙණ; හස්ස,ඊශ්වරයාහට; යක්ඛං,යාගය; වෙ,එකාන්තයෙන්; යජෙය්‍යඉති, පුදන්නේයි)

---

* නහි පන—සමහර

117 හිපච්චයෙ බ්‍යයෙධාතු,විභත්තිගතිවුඩ්ඪියං
පවත්තනෙ පතිට්ඨායං, හිංසනෙ නා සනෙරපි.

118 හෙත්වාවධාරණෙ පද,පූරණෙ බ්භුතකම්මනි
විසෙස දුක්ඛසච්චසු, තක්කාධෙගච පකිත්තිතො,

("හාජක්ඛසුකුරුතෙදෙව 'හායන්ති'තත්‍ථවලවා" * යනාදියෙහි 'හා'කාරතෙමේ පිරිහීමෙහිවැටේ. "මමං'ඔහාය' ගච්ඡන්ති–'පහාය'වො ගමිස්සාමි"යනාදියෙහිහැරීමෙහිවැටේ."හා' බෙදෙසොකදුක්ඛිසු" යනාදියෙහි නිපාතයෙහිවැටේ "හා' චාගෙ"යනාදියෙහි'හා'ධාතුවෙහිවැටේ."හා'දීඝතරමද්ධානං' යනාදියෙහි බෙදයෙහිවැටේ. "හා'මට්ඨකුණ්ඩලී—'හා'මට්ඨකුණ්ඩලී" යනාදියෙහි ශොකයෙහිවැටේ"හා'නිරයගති–'හා'නිරයගති" යනාදියෙහිදුඃඛයෙ යහි වැටේ. "හා' හිතසුඛලාභො"යනාදියෙහි සන්තොෂයෙහිවැටේ)

117 හි, 'හි'කාරතෙමේ; පච්චයෙ,(විභක්ති)ප්‍රත්‍යයෙහිද; අබ්‍යයෙ, නිපාතයෙහිද; ධාතු,(හි)ධාතුය; විභත්ති, (නාමාඛ්‍යාත) විභක්තිය; ගති, යාමය; වුඩ්ඪියං, වෘද්ධියයන මෙහිද; පවත්තනෙ, පැවැත්මෙහිද; පතිට්ඨායං; පිහිටීමෙහිද; හිංසනෙ, පෙළීමෙහිද; නාසනෙඅපි, නැසීමෙහිද;

118 හෙතු, හෙතුය; අවධාරණෙ, අවධාරණය යන මෙහිද; පදපූරණෙ,පදපූරණයෙහිද; අබ්භුතකම්මනි, ආශ්චර්‍ය්‍යකර්මයෙහිද; විසෙස, විශෙෂය; දුක්ඛ, දුඃඛය; සච්චසු,සත්‍යය යනමෙහිද;තක්කාධෙගච,තර්කශාස්ත්‍රයෙහිද;(වේයයි) පකිත්තිතො, කියනලද්දේය;

("හිං'හංහිකුවනං—යතො'හිං'–කාලෙ † යනාදියෙහි 'හි'කාරතෙමේ. විභක්ති ප්‍රත්‍යයෙහිවැටේ. "හි'කාරණෙ විසෙසාවධාරණෙ පදපූරණෙ" යනාදියෙහි නිපාතයෙහිවැටේ. "පටිතො'හිස්ස'හෙරඤ්ඤිරඤ්—'හි'ගතිමහි"යනාදියෙහි 'හි'ධාතුවෙහිවැටේ."සි.යො.අං.යො.නා.'හි.'සනං.සමා'හි'සනංසම්ංසු" යනාදියෙහිනාමවිභක්තියෙහිවැටේ,"තුඅන්තු'හි'ඵ.මි.ම.යනාදියෙහි ආඛ්‍යාත විභක්තියෙහි වැටේ. "හයො" යනාදියෙහි 'හි'ධාතුතෙමේ යාමෙහිවැටේ. (:හිනොති සීඝං ගච්ඡතීති හයො:,හිනොතියිසේයි;සීඝං,සුනුව;ගච්ඡතිඉති, යේනුයි; හයො, හයනම්) "හිතසුඛං" යනාදියෙහි වැඩීමෙහිවැටේ. (:හිනොතිවඩ්ඪතීතිහිතං:, හිනොතියිසේයි; වඩ්ඪතිඉති, වැඩේනුයි; හිතං, හිතනම්-(හිතනම් ලෞකික ලොකොත්තර වෘද්ධියි),

* වාලවා-සමහර † මේ නිදර්ශනයන්නිඝණ්ඨුනාතවපැණේ

‘හෙතු’’ යනාදියෙහි පැවැත්මෙහිවැටේ.(:හිනොතිපවත්තති ඵලං එතෙනාතිහෙතු:, හිනොතිසිසේසි; ඵලං,ඵලතෙමේ; එතෙන, මේකරණකොටගෙණ; පවත්තතිඉති,පවතිනුයි; හෙතු,හෙතුනම්; (හෙතුනම්කාරණයි) ‘‘අලොභො‘හතු’–අදොසො‘හෙතු’–අමොහො‘හෙතු–’’යනාදියෙහි පිහිටීමෙහිවැටේ (:හිනොති පතිට්ඨාති සම්පයුත්තධම්මා එත්ථාති‘හෙතු:, හිනොතියිසේසි; සම්පයුත්තධම්මා, සම්ප්‍රයුක්තධර්මතෙමේ;එත්ථ, මෙහි; පතිට්ඨාතිඉති, පිහිටාතුයි; හෙතු, හෙතුනම්;) ‘‘සරදකාලෙ‘හිමං’පතති–‘හිම’වාතසමයෙ’’ යනාදියෙහි පෙළීමෙහිවැටේ;(:අත්තනො සීතලභාවෙන සත්තෙ හිනොති හිංසතීති හිමං:, අත්තනො, තමාගේ; සීතලභාවෙන, සිහිල්බැවින්; සත්තෙ, සත්වයන්ට; හිනොතියිසේසි; හිංසතිඉති, හිංසාකෙරේනුයි; හිමං, හිමනම්) ‘‘හිඞ්ගු’’ යනමෙහි නැසීමෙහිවැටේ; (:රොගංනාසෙන්තො ගච්ඡතීතිහිඞ්ගු:,රොගං, රොගය;නාසෙන්තො, නසමින්; ගච්ඡතිඉති, යේනුයි; හිඞ්ගු, හිඞ්ගුනම්, (හිඞ්ගුනම්සුහගයි) ‘‘වුත්තං‘හි’ භගවතා–පූජ්ජෙච පූජනීයානං එතංමඞ්ගලමුත්තමං–පෙ–සබ්බත්ථසොත්ථිං ගච්ඡන්තීතිච. අථවාතස්ස භයාදූපද්දව කරුපඝාතකත්තා විගත භයාදූපද්දවකරස්ස ච යථාපටිඤ්ඤාතත්ථා හිනිප්ඵාදන සමත්ථතා සම්භාවතො–වුත්තං ‘හි’ භගවතා–එවංබුද්ධං සරන්තානං ධම්මං සංඝඤ්චභික්ඛවො භයංවා ඡම්භිතත්තංවා ලොමහංසො නාහෙස්සති’’ යනාදියෙහි ‘හි’යනනිපාතතෙමේ හෙතුවෙහිවැටේ. ‘‘ජිනවචනයුත්තං‘හි’’යනාදියෙහි අවධාරණයෙහිවැටේ.‘‘කති ‘හි’පිත්‍රයං–තස්මා ‘හි’යං අට්ඨකථාසු වුත්තං’’ යනාදියෙහි පදපූරණයෙහිවැටේ. ‘‘හිඤ්ඤු’’ යනමෙහි ‘හිඤ්ඤං’ යනපෙදෙහි ‘හි’ශබ්දතෙමේ ආශ්චර්‍ය්‍යකර්මයෙහිවැටේ.(:හිඅබ්භුත කම්මංදෙති පවත්තෙතීති එතෙනාතිහිඤ්ඤං: තංගච්ඡතීති හිඤ්ඤු:, හිසිසේසි; අබ්භුතකම්මං; ආශ්චර්‍ය්‍ය කර්මය; දෙතිසි සේසි; එතෙන,මේකරණකොටගෙණ; පවත්තෙතිඉති, පවත්වාතුයි; හිඤ්ඤං,හිඤ්ඤනම්. (හිඤ්ඤනම්මරණයි) තං, එයට; ගච්ඡතිඉති,යේනුයි; හිඤ්ඤු, හිඤ්ඤුනම්. (හිඤ්ඤුනම්සත්වයි.) ‘‘හින්තාලං’’ යනමෙහි විශෙෂයෙහිවැටේ. (:හිවිසෙසංතාලෙති පකාසෙති එතෙනාති හින්තාලං:ති, සිසේසි; විසෙසං,විශෙෂය; තාලෙතිසිසේසි, එතෙන; මේකරණකොටගෙණ; පකාසෙතිඉති; ප්‍රකාශකෙරේනුයි; හින්තාලං,හින්තාලනම් (හින්තාලනම් පුස්තකයි) ‘‘හෙලා–හිදූලං’’ * යනාදියෙහි දුඃඛයෙහි වැටේ (හිඉවජිතා

* හිලාදං—සීත්පාඨයි

119 හු * දානෙ හබ්‍යදානෙතු, පහොනෙ සමත්ථෙපි.
පචුරෙ විත්ථෙ සත්තාය, ආදානෙ ධාතු යම්පිච
හෙ නීචාමන්තණෙ හන්තු, පච්චයෙ සමුදීරිතො.

---

ලාභාදිපවත්තං දුක්ඛං ලුනාති ජිඥතීති හෙලා:, හිසිසේයි; ඉච්ඡිතාලාභාදිපවත්තං, කැමතිදෙය නොලැබීම්ආදියෙන් පැවති; දුක්ඛං, දුක; ලුනාතිසිසේයි, ජිඥතීඉති, සිඳීනුයි; හෙලා, හෙලානම් -:හියථා වුත්තදුක්ඛං දාලයතී විනාසෙතීති හිදාලං: හිසිසේයි; යථාවුත්තදුක්ඛං, යථොක්තදුක; දාලයතිසිසේයි; විනාසෙතිඉති; විනාශකෙරේනුයි; හිදාලං, හිදාලනම්.(හිදාලනම් ප්‍රීතිසෞම්නස්‍යයි) ''හි'පඤ්චවග්ගානංපන අනුක්කමො ඨානානුක්කමෙන වෙදිතබ්බො. පඨමං කණ්ඨට්ඨානං පතිට්ඨිතං-තතොතාලුමුද්ධ දන්තොට්ඨ ඨානානං'' යනාදියෙහි සත්‍යයෙහිවැවේ. ''හි'සත්ථංඅධීතෙවිඤ්ඤූ'' යනාදියෙහි තර්කශාස්ත්‍රයෙහිවැවේ. (විඤ්ඤූ; පණ්ඩිතතෙමේ; හිසත්ථං; තර්කශාස්ත්‍රය;අධීතෙ, හදාරයි)

119 හුතු, 'හු'කාරතෙමේවනාහි; දානෙ,දීමෙහිද; හබ්‍යදානෙ, යාගදීමෙහිද; හෙවත්, සජිතකිරීමෙහිද; පහොනෙ,පහොනයෙහිද; සමත්ථෙඅපි;හැකිවීමෙහිද; පචුරෙ, ප්‍රචුරයෙහිද; විත්ථෙ, පුළුලෙහිද; සත්තාය, වීමෙහිද; ආදානෙ, ගැන්මෙහිද; ධාතුයංඅපිච, (හු)ධාතුවෙහිද; (වේ) හෙ, 'හෙ'කාරතෙමේ; නීචාමන්තණෙ, නීච(පුරුෂ)යන්ට ආමන්ත්‍රණය කිරීමෙහි(වේ)හංතු, 'හං'කාරතෙමේවනාහි; පච්චයෙ, (විභක්ති) ප්‍රත්‍යයෙහි(වේයයි)සමුදීරිතො, කියනලද්දේය;

(''ආහුණෙය්‍යො''යනාදියෙහි 'හු' ධාතුතෙමේ දීමෙහිවැවේ.(:ආදරෙන හූයතෙති ආහුණං:තංඅරහතීති ආහුණෙය්‍යො: ආදරෙන, ආදරයෙන්; හූයතෙඉති, දෙනුලැබේනුයි; ආහුණං, ආහුණනම්; තං, ඒආහුණයට; අරහතිඉති, සුදුසුවේනුයි; ආහුණෙය්‍යො, ආහුණෙය්‍යනම්) ''පාහුණෙය්‍යො'' යනාදියෙහි සජිතකිරීමෙහිවැවේ. (:ආගන්තුකත්ථාය පකාරෙන හූයතෙ සජ්ජීයතෙති පාහුණං: තං අරහතීති පාහුණෙය්‍යො:, ආගන්තුකත්ථාය, ආගන්තුකයන්පිණිස; පකාරෙන,ප්‍රකාරයෙන්; හූයතෙසිසේයි; සජ්ජීයතෙඉති, සජිතකරණුලැබේනුයි; පාහුණං, පාහුණනම්;තං, ඒ පාහුණයට; අරහතිඉති , සුදුසුවේනුයි, පාහුණෙය්‍යො, පාහුණෙය්‍යනම් ) ''චීවර'පහොනකං' දුස්සං'' ය

---

* හුදානෙ —තිපිකාත්ථවිදියසත්.

120 ළකාරෙබ්‍යඤ්ජනෙ ධාතුආදානෙ,අංතු මාධවෙ.
බින්දුනාමවිභත්තිසු, නිග්ගහීතස්ස කාරියෙ.

---

නාමෙහි පහොනයෙහිවැටේ."පූරිසො වෙරංජෙතුං'පහොති' යනමෙහි හැකිවීමෙහිවැටේ. "පහූත'ධනධඤ්ඤං" යනමෙහි ප්‍රචුරයෙහිවැටේ. "පහූත'ජිව්හා" යනමෙහිපුළුලෙහිවැටේ. 'හොති—අහොසි" යනාදියෙහිවීමෙහිවැටේ."හුතාසනං" යනාදියෙහි ගැත්මෙහිවැටේ. (හූයතෙගය්හතෙතිහුතං: තං අසනංභොජනං අස්සාති හුතාසනං:, හූයතෙයිසේසි; ගය්හතෙඉති, ගන්නාලැබ්නුයි; හූතං,හුතනම්. (හුතනම් උපාදානයි,) තං,ඒදර;අසනායිසේසි; භොජනං,භොජනයකිරීම; අස්සඉති, මොහුගේනුයි; හුතාසනං, හුතාසනනම්. (හුතාසනනම්වහ්නියි)"හූ'දානෙ–'හූ'සත්තායං" යනාදියෙහි'හූ'ධාතුවෙහිවැටේ. "හෙ'දාස–'හෙ'දාසා"යනාදියෙහි 'හෙ' කාරතෙමේ නීච පුරුෂයන්ට ආමන්ත්‍රණය කිරීමෙහිවැටේ."හිං'හං'හිඤ්ඩනං" යනාදියෙහි 'හං'කාරතෙමේ විභක්ති ප්‍රත්‍යයෙහිවැටේ. (එසිත්ම–"ක'හං" යනාදි ප්‍රයොගයෝ සිද්ධවෙති.)

(දැන්'ළ' කාර'අං'කාරයන්ගේ අනෙකාර්ථවාචකත්වය දක්වන්නේ 'ළකාරෙබ්‍යඤ්ජනෙ ධාතු' යනාදිකිය.)

**120** ළකාරෙ, 'ළ'කාරතෙමේ; බ්‍යඤ්ජනෙ, (ළකාර) බ්‍යඤ්ජනයෙහිද; ධාතු, (ළා) ධාතුය; ආදානෙ, ගැත්මය යනමෙහිද (වේ)අංතු, 'අං'කාරතෙමේවනාහි; මාධවෙ, විෂ්ණුහූකෙරෙහිද; බින්දු,බින්දුය; නාමවිභත්තිසු, නාමවිභක්තියයනමොවුන් කෙරෙහිද; නිග්ගහීතස්ස, නිග්ගහීතයාගේ; කාරියෙ, කාර්‍ය්‍ය(අංකාර)යෙහිද,(වේ)

(එහි"යරලවසහ'ළ'අං"යනමෙහි'ළ'කාරතෙමේමූර්ධන්‍ය'ළ'කාරබ්‍යඤ්ජනයෙහිවැටේ. "ළා'ආදානෙ" යනාදියෙහි'ළා' ධාතුවෙහිවැටේ."ගරුළො—සීහළො "යනාදියෙහි'ළා'ධාතුතෙමේ ගැත්මෙහිවැටේ. "විප්පණ්ණකාරං" යනාදියෙහි 'අං'කාරතෙමේ විෂ්ණුහූකෙරෙහිවැටේ. (මෙහි 'විප්පණ්ණකාරෙ—අං' ක්‍රියාපදවෙජදයි)"අං'ඉති නිග්ගහීතං" යනමෙහිබින්දුවෙහිවැටේ."සි.යො.'අං.'යො.නා හි .ස.නං.ස්මා.හි.ස.නං.ස්මිං.සු" යනාදියෙහි නාමවිභක්තියෙහිවැටේ, "අං'බ්‍යඤ්ජනෙනිග්ගහීත "යනමෙහිනිග්ගහීතයාගේ කාර්‍ය්‍ය 'අං'ආදෙශයෙහි වැටේ).

---

නිමි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු